

# වුත්තෝදය

## ලංකානන්ද ව්‍යාඛ්‍යාව

"ප්‍රවචනොදය" පිරිවෙන්හි

ආචාර්ය පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද ස්වාමීන් වහන්සේ

වි සි න්

ලියනලද ව්‍යාඛ්‍යා සහිත

ශ්‍රී සඞ්ඝරක්ෂිත මහා ස්වාමිපාද විරචිත

# වුත්තොදය.

මොල්ලිගොඩ "ප්‍රවචනොදය" පරිවෙණාධිපති

සුවිශුද්ධ සද්ධර්ම වාගීශ්වර ශ්‍රී දෙවරක්ෂිත සඞ්කිච්චාභිධාන

එල්ලාවල නායක මාහිමියන් වහන්සේ විසින්

ප්‍ර ති ගෘ හී ත යි.

පණ්ඩිතාචාර්ය මොල්ලිගොඩ සිරි අරියවංසාභිධාන මහා ස්ථවිර

ස්වාමිපාදයන් වහන්සේ හා

පණ්ඩිත ගල්තොට සිරිමානන්දාභිධාන මහා ස්ථවිර

ස්වාමිපාදයන් වහන්සේ විසින්

සදුපදෙශ ප්‍රදානයෙන් අනුගෘහිතයි.

හොරණ "මිථිලා" නිවසෙහි නිවැසි

අභිනීතිඥ ඒ. පී. ජයසූරිය මැතිතුමන් විසින්

මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරනලදී.

1936.

# සංක්ෂෙපනය.

**ඡන්දශ්ශාස්ත්‍රය.**

අර්ථ හෙයින් නිරස වූ වාක්‍යයක් වුව ද ඡන්දොනිබද්ධ වූයේ ලෝවැසියාගේ සිත් සවන් පිණවීමෙහි පොහොසත් වේ. මාත්‍රා – ලඝු – ගුරු සන්නිවෙශ ස්වරූප වූයේ **ඡන්දස්** නම් වේ. ඒ ඡන්දස බොහෝ කලක් වෙදමන්ත්‍ර විෂයෙහි ම පැවැත්තේය. හේ වෛදිකච්ඡන්දස යයි ප්‍රකට වූයේ ගායත්‍රිප්‍රමුඛ ඡන්දස් ස්වල්පයකින් සමන්විතයැ.

පසු කලෙක වාල්මිකි ආදි මහා පඬිවරයන්ගේ මනැසට හමු වූයේ ලෞකිකච්ඡන්දස යයි ප්‍රකටව පවත්නේය. හේ මාත්‍රා – වර්ණ වශයෙන් විවිධ වූයේ විවිධ විභාගයෙන් යුක්ත වේ. මේ වෛදික – ලෞකික යන දෙවැදෑරුම් ඡන්දසුන්ගේ ම ව්‍යුත්පත්ති ක්‍රමාදිය දක්වන ශාස්ත්‍රය ඡන්දශ්ශාස්ත්‍ර නම් වේ. වෛදිකච්ඡන්දස සියලු තැන්හි උපයොගී නො වන හෙයින් එය බැහැර කොට ලෞකික ච්ඡන්දස පිළිබඳ වූයේ ම "ඡන්දශ්ශාස්ත්‍රය" යී මෙහි ලා සැලකිය යුතුයි.

**ඡන්දස්සම්භවය.**

ඡන්දොනිබද්ධ කාව්‍යයන් අතුරෙහි අතිශයින් පුරාතන වූයේ රාමායණ යයි හේ මහර්ෂි වාල්මිකින් විසින් රචිතයැ. එහෙයින් එකල ඡන්දඃප්‍රභවය වී යයි ද, වාල්මිකි ඡන්දශ්ශාස්ත්‍රයාගේ ආදිකර්තෘ යයි ද නිගමනය කිරීම යොග්‍ය වේ. ඡන්දශශාස්ත්‍රය ඊශ්වරයා ප්‍රභව කොට ඇත්තේය යනාදිය පිළිබඳ ව සත්‍යාසත්‍ය විමර්ශන යෙක් උවමනා නො කෙරේ. ලොකය හා ස්වකීය ආත්මය පවා තම ශාස්තෘවරයාගේ නිර්මාණයෙකැයි සලකන සැදැහැතියා කිව යුත්තේ එසේ ම හෙයිනි.

**වර්ධනය.**

වාල්මිකි ප්‍රමුඛයන් විසින් නිපයූ ලෞකික ඡන්දශශාස්ත්‍රයාගේ ශ්‍රෙෂ්ඨත්වය ද එයින් ලොකයට සිදුවිය හැකි මහදර්ථය ද සලකා එය නො නැසී බොහෝ කලක් පවත්නා පිණිස **කාශ්‍යප සෛතව පිඞ්ගල** යනාදී ආචාර්යවරයන් විසින් සූත්‍ර රචනා චාරයෙන් ශාස්ත්‍රය වර්ධනය කරන ලද්දේය. කාශ්‍යපාදීන් විසින් රචනා කළ! යම් යම් ඡන්දො-

ග්‍රන්ථ ඇතිවී යයි නිගමනය කළ හැකි නමුත් එබඳු ග්‍රන්ථයක නාම මාත්‍රය පවා මෙකල ඇසන්ට නො ලැබේ. පිඞ්ගලාචාර්‍යයන්ගේ සූත්‍රරචනාවෙන් පසු එයින් පෙර පැවති ඡන්දශ්ශාස්ත්‍රීය ග්‍රන්ථ අභාවයට ගියාහු යයි සිතිය හැකියි.

**පිඞ්ගලසූත්‍ර.** නාගගොත්‍රොද්භූත වූ පිඞ්ගලයෝ ස්වකීය ඡන්දශ්ශාස්ත්‍රය වෛදික – ලෞකික යයි විභෙද කොට ෂඩක්ෂර ගායත්‍රියෙහි පටන් සූත්‍ර රචනා කළහ. උක්තාදි පූර්වඡන්දස් ලක්ෂණ කථනයෙහි ලා නො ගිණූ නමුත් ප්‍රස්තාරාවස්ථාවෙහි දක්වූ හෙයින් උක්තාදිඡන්දස් ද ඔහුගේ ශාස්ත්‍රයෙන් බැහැර නො වූහ. මීට ම හලායුධභට්ටයන් විසින් කරනලද වෘත්ති ආදියෙන් පොෂිත වූයේ මේ හෙතුකොට ගෙන ඡන්දශ්ශාස්ත්‍රයාගේ වර්ධනය සුස්ථිර විය. දැනට පවත්නා ඡන්දෝ ග්‍රන්ථයන් අතුරෙන් පුරාතන වූයේ ද පිඞ්ගලාචාර්‍යයන්ගේ ඡන්දශ් ශාස්ත්‍රය මැයි· මෙසේ හෙයින් වාල්මිකී ප්‍රභවකොට ඇති ඡන්දස් ශාස්ත්‍රයාගේ ආදිකර්තෘත්වය පිඞ්ගලයන් කෙරෙහි ආරොපණය කිරීම ද යුක්ති යුක්ත වේ.

**ව්‍යාප්තිය.** ඡන්දශ්ශාස්ත්‍රය කෙරෙහි නවීන ප්‍රවීණ වූ සියල්ලන්ගේ ම රුචිය හා ගෞරවය වැඩෙත් වැඩෙත් ම නොයෙක් ආචාර්‍යවරයෝ පිඞ්ගල සූත්‍රයන් ම ඇසිරැ කොට විවිධ ඡන්දෝ ග්‍රන්ථ නිපදවූහ. එහෙයින් ම නන් වැදෑරුම් කාව්‍යයන්ගේ සමුද්භූතිය ද විය. මෙසේ සංස්කෘත භාෂාව ම පිහිට කොට දඹදිව සියලු ප්‍රදෙශයන්හි ඡන්දශ්ශාස්ත්‍රය පැතිර ගියේය. පසුව ප්‍රාකෘතාදි භාෂාන්තරයෙහි හා නොයෙක් දෙශාන්තරයෙහි ද ඡන්දෝව්‍යාප්තිය බෙහෙවින් සිදුවිය. අභිනව නිපද වූ ඡන්දශ්ශාස්ත්‍රයන් අතුරෙහි අග්‍රගණ්‍ය වූයේ කෙදාරභට්ට විරචිත වෘත්තරත්නාකර යයි. එය ලක්දිව්හි ද පතළේය. පසුව **කල්‍යාණමිත්‍ර භද්‍රාදි** ආචාර්‍යවරයෝ සියබසට අනුරූප කොට **එළුසඳස්** ද නිපද වූහ. එහෙත් මේ තාක් මාගධී භාෂාවෙන් ඡන්දෝග්‍රන්ථයක් නො වීය.

**වෘත්තරත්නාකරය.** ආචාර්‍ය ශ්‍රී **කෙදාරභට්ටයෝ** ස්වකීය ග්‍රන්ථය මාත්‍රාවර්ණ වශයෙන් විභෙද වූ ලෞකිකවර්ණඡන්දස ඇසිරැ කොට සියල්ල අධ්‍යාය සයෙක්හි සඞ්ග්‍රහ කරමින් රචනා කළහ. ගෙද ලක්ෂ්‍ය ලක්ෂණචාරයෙන් (=සූත්‍රය ම උදාහරණ කොට) විය. මෙය පිඞ්ගල සූත්‍රයන්ගේ ආශ්‍රයෙන් රචනා කළ නමුත් එකාක්ෂර වර්ණඡන්දසෙහි පටන් වෘත්තලක්ෂණ දක්වමින් කිසිතැනෙක පිඞ්ගල මතයට ද

පරාඞ්මුඛ ව රචිතය. මේ ග්‍රන්ථයාගේ සරලත්වය ද පඨනපාඨනයෙහි සුකරත්වය ද සලකා බොහෝ සෙයින් සියලු පඬිවරයෝ සම්මාදරයෙන් පිළිගත්හ. පරිවාර ග්‍රන්ථ ද නිපදවූහ. ලක්දිවිහි නිපද වූ ග්‍රන්ථ ද වෙති. එයිනුදු පුරාතන සම්භාවනීය පඬිවරයෙකු විසින් කර තිබෙන **සිංහල ව්‍යාඛ්‍යානය** හා බෞද්ධාගම චක්‍රවර්ත්ති ශ්‍රී රාම චන්ද්‍ර නම් බ්‍රාහ්මණ පඬිවරයෙකු විසින් රචිත **පඤ්චිකාව** ද සැලකිය යුතු වෙත්.

**විද්‍යෝදය** පිරිවෙන්හි ආචාර්ය්‍ය **පණ්ඩිත වැලිවිටියේ සොරත** ස්ථවිරයන් වහන්සේ විසින් මූලග්‍රන්ථය ද සංශෝධනය කරමින් ලියූ **සරලාව්‍යාඛ්‍යාව** ලාංකේය ජිඥාසිකයන්ගේ මනෝරථපූරණයෙහි ලා ප්‍රශස්තතර වේ.

ලක්දිව බොහෝ කාලක් ම සංස්කෘත භාෂාධ්‍යයනය කරන්නවුන් කෙරෙහි පමණක් ඡන්දෝඥතය පැවැත්තේය. පෙලබසින් නිපයු ඡන්දෝග්‍රන්ථයක් ඇතිවුව හොත් ශුද්ධමාගධිකයන්ගේ ද හිත වැඩ පිණිස වේ යයි සැලකූ ශ්‍රී සඞ්ඝරක්ඛිත මහා ස්වාමිපාදයන් වහන්සේ **වුත්තෝදය** නම් මාගධිකාඡන්දශ්ශාස්ත්‍රය රචනා කළහ.

**ශ්‍රී සඞ්ඝරක්ඛිත මාහිමියෝ.**

**ශ්‍රී සඞ්ඝරක්ඛිත මාහිමියන් වහන්සේ** වනාහි ශ්‍රී බුද්ධ වර්ෂ එක් දහස් සත්සිය තුන්වැන්නෙහි ලක්රජ පැමිණි මහා පරාක්‍රමබාහු මහරජාණන් දවස ලක්දිව විරාජමාන වූහ. මූන්වහන්සේ **දාඨොපතිස්ස** මහරජාණන්ගේ නප්තෘවරයෙක් වූ හෙයින් ලම්බකර්ණවංශික ක්ෂත්‍රියයෙක් වෙති. එහෙත් ජන්මභූමිය හෝ මාතෘපිතෘහු කවරහු දැ? යි නිශ්චයකළ නො හැක. ටීකාචාර්ය්‍ය වූ **ශාරිපුත්‍ර මාහිමියන්** හා ගලතුරුමූල වැසි **ශීල** නම් ස්ථවිර කෙනෙක් ද මූන්වහන්සේගේ ආචාර්ය්‍ය වූහ· තවද– ප්‍රාතිමෝක්ෂ සංවරාදි ලෞකික ගුණරත්න රත්නාකරයමාන වූ මෙම ආචාර්ය්‍ය පාදයෝ එකශ්‍රැතියෙන් නෛකග්‍රන්ථසහශ්‍රධාරණයෙහි සමර්ථ වූවාහු මේ වුත්තෝදය පමණක් නොව සුසද්දසිද්ධි සුබෝධාලඞ්කාර ඛුද්දකසික්ඛා ටීකා සම්බන්ධචින්තා යන ග්‍රන්ථ රචනාවෙන් ලොකශාසන වයට අතිශයින් උපස්ථම්භක වූහ. සුමඞ්ගල වාගීශ්වර ධර්මකීර්ත්ති නාගසේන ආනන්ද වෛදේහ බුද්ධප්‍රිය අනවමදර්ශී යනාදි මහා පඬිවරයෝ මූන්වහන්සේට සමකාල්ව හා ආසන්නකාලික ව විවිධ ග්‍රන්ථ රචනා කිරීමාදියෙන් ධර්මශාස්ත්‍රචය අතිශයින් බැබලවූහ.

**වුත්තෝදය.**

මෙම **වුත්තෝදය** වනාහි ශුද්ධ මාගධිකයන්ගේ ප්‍රයෝජනය සලකා සංස්කෘත ඡන්දොග්‍රන්ථයන් ම ඇසිරු කොට බොහෝ සෙයින් වෘත්තරත්නාකරයාගේ පරිවර්තනවාරයෙන් රචනා කරන ලද්දකි. හෙද ප්‍රවචනපාලියට උචිත වූ වෘත්තජාති පමණක් සඞ්ග්‍රහ කරමින් ඉතා සරල කොට ලක්ෂ්‍යලක්ෂණවාරයෙන් ම විය. සමහර ඡන්දොජාතීන් පිළිබඳ ව සංස්කෘතයට වඩා විශදශස්ථාන ද මෙහි ඇත්තේය. ප්‍රමාණයෙන් පරිච්ඡෙද සයකි. එයින් ප්‍රථම පරිච්ඡෙදය ඡන්දශ්ශාස්ත්‍රයෙහි උපයෝගී වූ සංඥා – පරිභාෂා දක්වමින් ද, ද්විතීය පරිච්ඡෙදය ආර්‍ය්‍යා – ගීති – වෛතාලීය – මාත්‍රාසම යන ජාති සතරින් උපලක්ෂිත වූ මාත්‍රාවෘත්ත දක්වමින් ද, තෘතීය පරිච්ඡෙදය ෂඩක්ෂරගායත්‍රියෙහි පටන් චාවිංශත්‍යක්ෂර ආකෘතිය තෙක් සමවෘත්ත ඡන්දස් ඇතුලත් කරමින් ද, චතුර්ථ පරිච්ඡෙදය අර්ධසමවෘත්ත සඞ්ග්‍රහ කරමින් ද, පඤ්චම පරිච්ඡෙදය විෂමවෘත්ත නාමයෙන් ගෙන වක්ත්‍රප්‍රභෙද දක්වමින් ද, ෂෂ්ඨ පරිච්ඡෙදය ප්‍රස්තාරාදි ෂට්ප්‍රත්‍යය දක්වමින් ද රචනා කරනලද්දේය.

**පරිවාර ග්‍රන්ථ.**

මේ වුත්තෝදයට පරිවාරවශයෙන් නිපදවූ ග්‍රන්ථ තුනක් වෙති. එයින් සිංහලයෙන් ලියා තිබෙන **ව්‍යාඛ්‍යාව** පැරණි වූවා ද මහත් වූවා ද වේ. එය මාගධී ඡන්දොඥන යෙහි ඉතා ප්‍රයෝජනවත් වූවකි. **විවරණය** වනාහි මාගධී භාෂාවෙන් ම ඉතා ලඝු කොට ලියන ලද්දකි, එය ලඝු වුවත් බොහෝ සෙයින් පැසසිය යුතු වේ. ටීකාව වූ කලී ප්‍රධාන වශයෙන් සමවෘත්ත පිළිබඳ සවිසි ඡන්දසුන්ගේ වුත්තෝදයෙහි දක්වූ ද නො දක්වූ ද බොහෝ වෘත්තයන්ට අමුතු සූත්‍ර ලියා ගුරු – ලඝු වින්‍යාස හා උදාහරණ දක්වමින් ලියන ලද්දකි.

මේ තුන ම කවර කලක කවුරුන් විසින් රචිත දූ? යි කිව නො හේ. ව්‍යාඛ්‍යා – විවරණ – ටීකා යන තුන පිළිවෙළින් වෙන වෙන ආචාර්‍ය්‍යවරයන් විසින් රචිතබැව් හැඟේ. වුත්තෝදය හා මේ ග්‍රන්ථ තුන ද ලෙඛකදොෂයෙන් දූෂිත ව ඉතා ව්‍යාකූල ව පවත්නා කල්හි "ප්‍රවචනොදය" පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය **මොල්ලිගොඩ සිරි අරියවංසාභිධාන** අස්මදාචාර්‍ය්‍යයන් වහන්සේගේ සාහාය්‍යයෙන් රන්දොඹෙ ශ්‍රී පුෂ්පාරාමාධිපති **උඳුම්මිට ශ්‍රී ධර්මරක්ෂිතාභිධාන** අනුනායක ස්ථවිරපාදයන්වහන්සේ විසින් ශුද්ධියට පමුණුවා විසිවර්ෂයකින් පමණ පෙර ප්‍රසිද්ධ කරවනලද්දේය.

**අපගේ ව්‍යාඛ්‍යාව.**

විශෙෂයෙන් මෙකල විද්‍යාර්ථීන්ගේ ප්‍රයොජනයට යොග්‍යවන සේ තවත් ව්‍යාඛ්‍යානයක් කළ මැනවැයි බොහෝ දෙනෙකු විසින් කළ ඉල්ලීම පිළිගත් අප විසින් ග්‍රන්ථශොධනය හා සවිස්තර ව්‍යාඛ්‍යාව කරන ලද්දීය. මෙහි ලා චිරාගත ලෙඛකදොෂ දූෂිත ස්ථානයයි වැටහුනු තැන් කීපයක් බැහැර කරමින් ග්‍රන්ථය ද හැකිතාක් ශොධනයට පමුණුවන ලද්දේය. ව්‍යාඛ්‍යානය ද යුක්තස්ථානයන් විවෘත කරමින් ආධුනිකයන්ගේ ප්‍රයොජනය ම සලකා හැකිතාක් ලිහිල් බසින් ලීවෙමු. ෂට්ප්‍රත්‍යය විභාගය ද විස්තරයෙන් දක්වන ලද්දේය. තුන්වන පරිච්ඡේදයෙහි පරිශිෂ්ට ඡන්දස් හා වෘත්ත ද වෘත්තරත්නාකර වුත්තොදයටීකා ආදියෙන් ගෙන ලක්ෂ්‍ය - ලක්ෂණ වශයෙන් ම සඞ්ග්‍රහ කරන ලද්දැහුය.

මෙහිදී පිඞ්ගල ඡන්දස්සූත්‍ර හලායුධවෘත්ති ඡන්දොමඤ්ජරී වෘත්තරත්නාකර සරලාව්‍යාඛ්‍යා වුත්තොදයෙහි සිංහල ව්‍යාඛ්‍යාව හා විවරණ - ටීකා යනාදි ග්‍රන්ථ අප විසින් ආශ්‍රිතයහ. පාඩම් කරන්නවුන්ගේ පහසුව සඳහා පරිශිෂ්ට වෘත්ත සඞ්ග්‍රහ සහිත සූත්‍රපාඨය වෙන් කොට ද යොදන ලද්දේය.

**අනුග්‍රහය.**

වවුලුගල සිරි ධම්මරක්ඛිතාරාමාධිපති ව වැඩ සිටි මාදම්පේ **සිරි ධම්මරක්ඛිතාභිධාන** මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති ව වැඩසිටි **ශ්‍රී මහා විහාර වංශාලඞ්කාර විමලකිත්ති ශ්‍රී ඉන්දජොත්‍යාභිධාන අස්මද්දාචාර්‍ය්‍ය රඹුකන නායක මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ** විසින් ද, අස්මදචාර්‍ය්‍ය **මොල්ලිගොඩ සිරි අරියවංසාභිධාන** මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් ද, අස්මදචාර්‍ය්‍ය **පණ්ඩිත හල්කොට ගිරිමානන්ද** ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් ද, දෙනලද උපදෙශ සමූහය හා වවුලුගල සිරි ධම්මරක්ඛිතාරාමාධිපති ව වැඩසිටින අස්මදචාර්‍ය්‍ය **එල්ලාවල විමලරතනාභිධාන** මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ කාරුණ්‍ය ගුණමහිමය ද, අප සොහොවුරු **මොල්ලිගොඩ පියරතන** ආයුෂ්මතුන් වහන්සේ විසින් **ශුද්ධපත්‍ර බලාදීම් ආදියෙන් බොහෝ සෙයින් කළ සත්ක්‍රියාවන් ද මේ කෘතියෙහි ලා ඉවහල් වූබව සතුටින් ප්‍රකාශ කරම්හ.**

තවද හොරණ **මිපිලා** මැදුරෙහි නිවැසි පරාර්ථකාමී අධිනීතිඥ **ඒ. පී. ජයසූරිය මැතිතුමන්** විසින් මෙය මුද්‍රණය කරවා "ප්‍රවචනෝදය" පිරිවෙනේ දියුණුව පිණිස හැබ්බැව් එතුමන් කෙරෙහි ගෞරවයෙන් පුණ්‍යානුමෝදනා පූර්වකව සඳහන් කරම්හ.

පොතෙහි මුද්‍රණය ඉතා සැලකිමෙන් පිරිසුදු ලෙස කරවා දුන් හොරණ "විද්‍යාශෙඛර" මුද්‍රණාලයාධිපති **ඒ. ඩී. බර්නාඩ් අප්පුහාමිට** ද අපගේ සතුතිපූර්වක සන්තොෂය දක්වනු ලැබේ.

නැවත මුද්‍රණය ප්‍රවචනෝදය පරිවෙණාධිපතීන් වහන්සේට අභිමත පරිදි වියයුතුයි.

**ලබුගම ලඞ්කානන්ද භික්ෂු.**

ශ්‍රී බුඩ වර්ෂ 2478 උඳුවප්මස පුර අටවක්ලත්
ක්‍රිස්තු වර්ෂ 1936 ජනවාරි මස 1 වෙනි බදාදින
මොල්ලිගොඩ "ප්‍රවචනෝදය"
පිරිවෙනේදීය.

මෙහි කිසි තැනෙක අපගේ ප්‍රමාදයෙන් හා නො පැහැදිලි අක්ෂරයන්ගේ පතනයෙන් ද ඇති වූ අශුඬස්ථාන ඇතත් එයින් අර්ථාවබොධයට බාධාවක් නැතිබැවින් ශුඬිපත්‍රයක් අනවශ්‍ය විය. එහෙත් **අපවාහක** වෘත්තය දක්වූ සූත්‍රය " මො නාතං ජ ච සග ගිති නවරසරසසරයතියුතමපවාහං තං " යි ශුඩ කොට ප්‍රගුණ කළ යුතුයි.

# පටුන.


| | විෂය | | පිට. |
|---|---|---|---|
| | වෘත්තෝදයං 1 – 12 | | |
| | ප්‍රථම පරිච්ඡේදය 13 – 37 | | |
| 1 | ඡන්දශබ්දය | | 15 |
| 2 | ඡන්දස්හුගේ විවිධත්වය | | ,, |
| 3 | ලක්ෂ්‍යලක්ෂණ | | 16 |
| 4 | වෛදිකඡන්දස | | 17 |
| 5 | සංඥාදි පඤ්චකය | | ,, |
| 6 | ගණවිභාගය | | 18 |
| 7 | අක්ෂරපරිභාෂා | | 20 |
| 8 | | | |
| 9 | ආර්යාගණ | | 21 |
| 10 | ගුරු – ලඝු | | 22 |
| 11 | ක්‍රමසංඥය | | 24 |
| 12 | භූතසඞ්ඛ්‍යා | | 25 |
| 13 | පාදය | | 26 |
| 14 | යතිවිභාගය | | ,, |
| 15 | සමාර්ධසමවිෂමවෘත්ත | | 32 |
| 16 | උක්තාදි ඡන්දස් | | 33 |
| 17 | දණ්ඩකවෘත්ත | | 34 |
| 18 | ගාථා | | 35 |
| | ද්විතීය පරිච්ඡේදය 37 – 66 | | |
| 1 | ආර්යා ලක්ෂණ | | 38 |
| 2 | ආර්යා සඞ්ඛ්‍යා | | 40 |
| 3 | ආර්යා යතිස්ථාන | | ,, |
| 4 | පථ්‍යාර්යා | | 42 |
| 5 | විපුලා | | ,, |
| 6 | විපුලාභේද | | 43 |
| 7 | චපලාසඞ්ඛ්‍යා | | 44 |
| 8 | මුඛචපලාසඞ්ඛ්‍යා | | ,, |
| 9 | ජඝනචපලාසඞ්ඛ්‍යා | | 45 |
| 10 | ආර්යාභේද | | ,, |
| 11 | ගීතිභේද හා සඞ්ඛ්‍යා | | 46 |
| 12 | උපගීතිභේද හා සඞ්ඛ්‍යා | | 47 |
| 13 | උද්ගීතිභේද හා සඞ්ඛ්‍යා | | 47 |
| 14 | ආර්යාගීතිභේද හා | ,, | 48 |
| 15 | වෛතාලීය ජාති | | 49 |
| 16 | වෛතාලීය භේද | | 50 |
| 17 | මාත්‍රාසමජාති | | 56 |
| 18 | පාදාකුලක විනිශ්චය | | 62 |
| | තෘතීය පරිච්ඡේදය 66 – 92 | | |
| 1 | උක්තාච්ඡන්දසෙහි වෘත්ත | | 66 |
| 2 | අත්‍යුක්තා | ,, | 67 |
| 3 | මධ්‍යා | ,, | ,, |
| 4 | ප්‍රතිෂ්ඨා | ,, | ,, |
| 5 | සුප්‍රතිෂ්ඨා | ,, | 68 |
| 6 | ගායත්‍රී | ,, | 69 |
| 7 | උෂ්ණික් | ,, | 70 |
| 8 | අනුෂ්ටුභ් | ,, | ,, |
| 9 | බෘහතී | ,, | 72 |
| 10 | පඞ්ක්ති | ,, | ,, |
| 11 | ත්‍රිෂ්ටුභ් | ,, | 75 |
| | ඉන්ද්‍රමාලාව හා උපජාති 75 | | |
| 12 | ජගතීඡන්දසෙහි වෘත්ත | | 79 |
| 13 | අතිජගතී | ,, | 83 |
| 14 | ශක්වරී | ,, | 84 |
| 15 | අතිශක්වරී | ,, | 85 |
| 16 | අෂ්ටි | ,, | 86 |
| 17 | අත්‍යෂ්ටි | ,, | 87 |
| 18 | ධෘති | ,, | 88 |
| 19 | අතිධෘති | ,, | 89 |
| 20 | කෘති | ,, | ,, |
| 21 | ප්‍රකෘති | ,, | 90 |
| 22 | ආකෘති | ,, | ,, |
| 23 | විකෘති | ,, | 91 |
| 24 | සඞ්කෘති | ,, | ,, |
| 25 | අතිකෘති | ,, | 92 |
| 26 | උත්කෘති | ,, | ,, |

| විෂය | පිට. |
|---|---|
| චතුර්ථ පරිච්ඡේදය | 92 – 97 |
| පඤ්චම පරිච්ඡේදය | 96 – 102 |
| ෂෂ්ඨ පරිච්ඡේදය | 103 – 140 |
| ෂට්ප්‍රත්‍යය හැඳින්වීම | 106 |
| ප්‍රස්තාර ප්‍රත්‍යය | 106 – 116 |
| සමවෘත්ත ප්‍රස්තාරය | 106 |
| අර්ධසමවෘත්ත ප්‍රස්තාරය | 108 |
| විෂමවෘත්ත ප්‍රස්තාරය | 111 |
| ආර්‍යා ප්‍රස්තාරය | 113 |
| මාත්‍රා ප්‍රස්තාරය | 114 |
| නෂ්ට ප්‍රත්‍යය | 116 – 124 |
| සමවෘත්ත නෂ්ටය | 116 |
| අර්ධසමවෘත්ත නෂ්ටය | 119 |
| විෂමවෘත්ත නෂ්ටය | 119 |
| ආර්‍යා නෂ්ටය | 120 |
| මාත්‍රාවෘත්ත නෂ්ටය | 123 |
| උද්දිෂ්ට ප්‍රත්‍යය | 125 – 130 |
| සමවෘත්ත උද්දිෂ්ටය | 125 |
| අර්ධසම – විෂම වෘත්ත උද්දිෂ්ටය | 126 |
| ආර්‍යා උද්දිෂ්ටය | 126 |
| මාත්‍රාවෘත්ත උද්දිෂ්ටය | 129 |
| එකාද්‍යාදි ගුරුක්‍රියාව | 130 – 137 |
| සමවෘත්ත ගුරුක්‍රියාව | 130 |
| ගුරුක්‍රියාව අන්‍යක්‍රමයකින් | 132 |
| මේරුප්‍රස්තාරයෙහි වර්ණමේරුව | 133 |
| අර්ධසමවෘත්ත ගුරුක්‍රියාව | 134 |
| විෂමවෘත්ත ගුරුක්‍රියාව | 135 |
| ආර්‍යා ගුරුක්‍රියාව | 136 |
| මාත්‍රාවෘත්ත ගුරුක්‍රියාව හා මාත්‍රාමේරුව | ,, |
| සංඛ්‍යාන ප්‍රත්‍යය | 137 – 139 |
| සමවෘත්ත සංඛ්‍යානය | 137 |
| අර්ධසම – විෂමවෘත්ත සංඛ්‍යානය | 138 |
| ආර්‍යා – මාත්‍රාවෘත්ත සංඛ්‍යානය | 139 |
| සම වෘත්තාදීන්ගේ අධ්වයොගය | ,, |
| නිගමනය | 141 |

# වුත්තොදයං.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1. නමත්ථු ජනසන්තාන-තමසන්තානභෙදිනො
ධම්මුජ්ජලන්තරුචිනො-මුනින්දො'දිතරොචිනො.

2. පිඞ්ගලා'චරියා'දීහි-ඡන්දං යමුදිතං පුරා
සුද්ධමාගධිකානං තං-න සාධෙති [1] යථිච්ඡිතං.

3. තතො මාගධභාසාය-මත්තාවණ්ණවිභෙදනං
ලක්ඛලක්ඛණසංයුත්තං-පසන්නත්ථපදක්කමං.

4. ඉදං **වුත්තොදයං** නාම-ලොකියච්ඡන්දනිස්සිතං
ආරභිස්සමහං දානි-තෙසං සුඛවිබුද්ධියා.

5. සබ්බගලා [2] **මනා** දිගලහු-**භයා** මජ්ඣන්තගරූ **ජසා**
මජ්ඣ'න්තලා **රතො**'ත'ඨ-ගණා **ගො** ගරු **ලො** ලහු.

6. භජසා සබ්බගලහු-පඤ්චි'මෙ සණ්ඨිතා ගණා
අරියා'දිම්හි විඤ්ඤෙය්‍යා-ගණො ඉධ චතුක්කලො.

7. සංයොගා'දි ච දීඝො ච-නිග්ගහීත පරො ච යො
ගරු වඞ්කො පදන්තො වා-රස්සො'ඤ්ඤො මත්තිකො ලුජු.

8. පරෙ පාද'දිසංයොගෙ-යො පුබ්බො ගරුවක්ඛරො
ලහු ස ක්වචි විඤ්ඤෙය්‍යො-තදුදාහරණං යථා.-

9. දස්සනරසා'නුභාවෙන-තිබ්බගෙධා ජිනස්ස'යං ජනතා
විම්හයජනනී සඤ්ඤත-ක්‍රියා නු සාසනා'නුරඤ්ජයති.

10. විඤ්ඤෙය්‍යා ලොකතො සඤ්ඤා-සමුද්දෙ'සුරසාදිනං
**පාදෙ** ඤෙය්‍යො චතුත්ථංසො-පදච්ඡෙදො **යති**බ්භවෙ.

11. **සමමද්ධසමං** වුත්තං-**විසමං** චා'පරං තිධා
සමා ලක්ඛණතො පාද-චත්තාරො යස්ස තං සමං.

12. යස්ස'න්තිමෙන දුතියො-තතියෙනා'දිමො සමො
තදද්ධසමමක්ඛාතං-භින්නලක්ඛණ පාදිකං.

13. පාදමෙක'ක්ඛරා'රබ්භ-යාව ඡබ්බීසත'ක්ඛරො
භවෙ පාදෙහි තං ඡන්දං-නානා නාමො'දිතං තතො.

---

1. යතිච්ඡිතං. 2. මතා.

14. **දණ්ඩකා** චණ්ඩවුට්ඨ්‍යා'දි-පාදෙහි ඡහි තීහි තු
**ගාථා**'ති ච පරත්‍ථ'වං-ඡන්දසඤ්ඤූ පකාසිතා.

15. අනන්තරො'දිතං වා'ඤ්ඤං-මෙතං සාමඤ්ඤනාමතො
**ගාථා** මිච්චෙව්ව නිද්දිට්ඨා-මුනින්දවචනෙ පන

16. විසෙසනාමතො කිඤ්චි-ගහෙත්‍වා සබ්බථො'චිතං
දස්සයිස්සාම'හන්ත'ත්‍ථ-නාමානා'විභවිස්සරෙ.

**ඉති වුත්තොදයෙ ඡන්දසි සඤ්ඤාපරිභාසානිද්දෙසො නාම**

## පඨමො පරිච්ඡෙදො.

---

1. ඡට්ඨො'බිලලහු ජො වා-ගන්තා'ඤ්ඤෙ ඡගණා න ජො විසමෙ
අරියාය'න්තඩ්ඩෙ ලො-ඡට්ඨො නෙත ගො ගණා ඡ'ඤ්ඤෙ.

2. පඨම'ද්ධෙ ඡට්ඨො චෙ-සබ්බලහො'ත්‍ථාදි- ලහුති- භවති යති
තප්පරකො'නෙත'පි සචෙ-චරිමෙ- [1] පහවති චතුත්ථො'නෙත.

3. අරියාසාමඤ්ඤං චෙ-පුබ්බා'දිතලක්ඛණං භවෙ යස්සා
ආදිමමථ පාදයුගං-යස්සා තදංසෙහි සා **පථ්‍යා**.

4. යත්‍ථ ගණත්තයමුල්ලඞ්ඝියො-භයත්‍ථා'දිමො භවෙ **විපුලා**

5. ගුරුමජ්ඣගො ජකාරො-චතුත්‍ථකො දුතියකො **චපලා**

6. චපලා'ගතා'බිලඤ්ඤෙව-දලා'දිමං ලක්ඛණං භජති යස්සා
පථ්‍යාලක්ඛණමඤ්ඤං-**මුඛචපලා** නාම සා භවති.

7. පථ්‍යාය ලක්ඛණඤ්ඤෙව-පඨම'ද්ධෙ ලක්ඛණන්තු [2] චපලාය
දුතියෙ දලෙ'ථ යස්සා-පකිත්තිතා සා **ජඝනචපලා**

### [3] අරියාජාතයො.

1. සබ්බං පඨමදලෙ යදි-ලක්ඛණමරියාය වුත්තමුභයෙසු
යස්සා දලෙසු යුත්තං-වුත්තා සා **ගීති** වුත්තයතිලලිතා.

2. අරියායං දුතිය'ද්ධෙ-ගදිතා'ඛිල ලක්ඛණං යං තං
භවති දලෙසුභයෙසු'පි-යදි යස්සා සා **'යමුපගීති**.

3. අරියාය'ද්ධවිතයං-පුබ්බා'දිතලක්ඛණු'පෙතං
විපරියයෙනා 'භිහිතං-යස්සා සම්භවති චෙ'හ **උග්ගීති**.

4. අරියාපුබ්බ'ද්ධං යදි- ගුරුනෙ'කෙනා'ධිකෙන නිධනෙ යුත්තං
යදි පුබ්බ'ද්ධ සමානං- දලමිතරඤ්ඤෙවා'දිතා'ය **මරියාගීති**.

### [4] ගීතිජාතයො.

---

1. පිහවති. 2. චපලා යා. 3. අරියාජාතියො. 4. ගීතිජාතියො

1. විසමෙ ඡ සියුං කලා මුඛෙ-සමෙ'ට්ඨ රලගා තතො'පරි
**වෙතාලියනන්ත** මුච්චතෙ-ලහු ඡක්කං න නිරන්තරං සමෙ.
2. වෙතාලියො'පමං මුඛෙ තං-**ඔපච්ඡන්දසිකං** රයා යදන්ත.
3. **ආපාතලිකා** කථිතා'යං-භගා'න්ත යදි පුබ්බමිව'ඤ්ඤං.
4. යදා'දිතො **දක්ඛිණන්තිකා**-සිතො'ත්ථ පාදෙසා' ඛිලෙසු ජො.
5. **උදීච්චවුත්ති'** හි වුච්චතෙ-ජො චා' දෙ විසමෙසු සණ්ඨිතො.
6. පුබ්බත්ථ සමෙසු චෙ ගජා-**පච්ඡවුත්ති** රුදීතො'ති සණ්ඨිතා.
7. සමා' සමා'න්‍යා' දිතාං සමා-සංයුතා භවති යං **පවත්තකං.**

8. අස්ස යා සමසනා '**පරාන්තිකා.**
9. තදඤ්ඤජා **චාරුහාසිනී.**

**වෙතාලිය ජාතයො.**

---

1. විකවිහතවසුලහු **රචලඩිනී** රිග
2. **මත්තාසමකං** නව මො ල් ගන්තා.
3. ජො න්ලා' එවා'ණ්ණවා **විසිලොකො.**
4. නවයතො **වානවාසිකා** 'ඛ්‍යා.
5. පඤ්චා'ඨනවසු යදි ලො **චිත්‍රා.**
6. ගල්‍යා'ඨහි චෙ සා **උපචිත්‍රා.**
7. යම්හි තල්ලක්ඛණ විංසස්ස යුත්තං
මත්තා සමා'දිපාද'භිහිතං
අතියත වුත්ත පරිමාණ සහිතං
පඨිතං ජනෙසු **පාදාකුලකං**

**[1] මත්තාසම ජාතයො.**

---

චිත්‍රා වණ්ණෙහි මත්තා ගා – චිත්‍රා වණ්ණා ගුරූහි තු
චිත්‍රා [2] ලහූහි ගුරවො – දලෙ පඨ්‍යා'දි නො මතා.

**ඉති වුත්තොදයෙ ඡන්දසි මත්තා වුත්තනිද්දෙසො නාම**
**දුතියො පරිච්ඡෙදො.**

---

1. මත්තා සමකජාතියො. 2. ලහූති.

1. 1. ත්‍යා වෙ ; තනුමජ්ඣා.

6. ගායත්ති.

2. 1. කුමාරලලිතා ජ්සගා.

7. උණ්හි.

3. 1. චිත්‍රපද යදි භා ගා.
4. 2. මො මො ගො ගො විජ්ජුම්මාලා.
5. 3. භා තලගා මානවකං.
6. 4. ග්ලා සමානිකා රජා ච.
7. 5. පමාණිකා ජරා ලගා.

8. [1] අනුට්ඨුභා.

---

**පරිසිට්ඨ වුත්ත සඞ්ගහො.**

1. වුත්තාසං – 2.

1. ගො (සිරි)

2. අච්චුත්තාසං– 4.

1. ගා ථී.

3. මජ්ඣාසං– 8.

1. මො නාරී.
2. ය කෙසා.
3. රො මිගී.

4. පතිට්ඨාසං– 16.

1. මිගා වෙ [illegible].
2. යගා විලා.
3. ඊගා සම්ඛි.
4. සුමති ස්ගා.
5. ජ්ග ලාසිනී.
6. භ්ගා සුබුද්ධී.

5. සුපතිට්ඨාසං– 32.

1. භ්ගා සිඛී පන්ති.
2. ගා රතෝ පිහී.

---

1. අනුෂ්ටුභං.

8. 1. රා නසා යදි හලමුඛී.
9. 2. භුජගසුසුභතා නා මො.

### 9. බ්‍රහතී.

10. 1. මිසා ජ්ගා [1]. සුඛවිරාජි'දං මතං.
11. 2. මිතා යො ගො යදි පණවො ඛ්‍යාතො
12. 3. භ්මා සගයුත්තා රුම්මවතී සා.
13. 4. කෙදයා මත්තා මහසගයුත්තා.
14. 5. නරජගෙහි සා මනොරමා.
15. 6. උපට්ඨිතං තං වෙ තො මරා [2]. ලව
16. 7. [3]. ත්ජා ජො ගුරුනා'ය මුපට්ඨිතා.

### * 10 පඞ්ති.

---

3. භාමිනී ර්ලගා.
4. මජ්ඣ, තලගා.
5. සති ජගා ගො.

### 6. ගායත්ති යා-64.

2. සසි වදනා නයා.
3. මො මො වෙ සාවිත්ති.
4. ම්‍රා යසසා සා නදී.
5. මිසා වුත්තං මුකුලං.
6. සයුගං රමණී.
7. ත්සා වෙ ඛසුමති.

### 7. උණ්හිකා-128.

2. මිසා ගො වෙ මදලෙඛා.
3. මධු යදි නනගා
4. සරගා හංසමාලා

### 8. අනුට්ඨුභායං-256.

6. මිතා ගො හංසරුත මෙතං.
7. නාගරකං හරා ලගා
8. නාරාචිකා තරා ලගා.

---

1. සුඛවිරාජිතං. – – – සුඛවිරාජිතං, 2. – ල.
3. තජා ගජා ගුරානායමුපට්ඨිතා සා.

* මේ ඡන්දසෙහි "වංසකමාලා වෙ නම්සා ගො" යි පෙනෙන පාඨය හලෙමු. 12. 3. වෘත්තයට ලී විවෘතිය බලනු.

17. 1. **ඉන්දා’දිකා** තා **වජිරා** ජගා ගො.
18. 2. **උපා’දිකා** සා’ව ජතා ජගා ගො.
19. 3. අනන්තරො’දීරිත ලක්ඛණා වෙ
පාදා විමිස්සා [1], **උපජාතියො** තා
එවං කිර’ඤ්ඤාසු’පි මිස්සිතාසු
වදන්ති ජාතිස්විදමෙව නාමං.
20. 4. සජ්ජාලගා ගදිතා **සුමුඛී**.
21. 5. **දොධක** මිච්ඡති’ චෙ භභභාගා.
22. 6. වෙද’ස්සෙහි ම්තා තගා ග් **සාලිනී** සා.
23. 7. [2] **වාතුම්මී** සා යති සා ම්භා තගා ගො.
24. 8. භා තතගා ගො’සුරස **සිරී** සා.
25. 9. රො නරා ඉධ **රථොද්ධතා** ලගා.
26. 10. **ස්වාගතෙ**’ති රනභා ගුරුකා වෙ.
27. 11. නතරලහුගුරූහි **භද්දිකා**.

**11.** [3] **තුට්ඨුභා**.

---

**9. බ්‍රහතියා-512.**

3. සා **තරඞ්ගිනී** රජො ජරා.

**10. පන්තියා-1024.**

8. ර්ජා රගා **මයූරසාරිණී**’යං.
9. තිසගා යදි **මෙඝවිතානං.**
10. රො ච සා ගුරුනා **මණ්ඩරාගො.**
11. **තුරිතගති** තු නජනගා.

**11. තුට්ඨුභායං-2048.**

12. ම්භා නො ල්ගා වෙ **භමරවිලසිතං.**
13. නනසගගුරුරචිතා **වුත්තා.**
14. **සෙනිකා** මතා රතො ජරා ලගා.
15. ම්සා ජො ගො ගුරුනා **භවෙ’කාරුපං.**

**12, ජගතියා 4096.**

15. **වංසවුතන්** තිගදන්ති රන්භසා.
16. **පමුදිතවදනා** භවෙ නා රරා.
17. ජසා පුන ජසා **ජලොද්ධතගති.**
18. සිඛුරෙහි ’රිතා **සග්විනී** නාමිකා.

---

1. උප්පජාතියො 2. වාතුම්මී. 3. තුට්ඨුභං.

28. 1. වදන්ති **වංසට්ඨ**මිදං ජතා ජරා.
29. 2. සා **ඉන්දවංසා** ඛලු යත්ථ තා ජරා.
30. 3. ඉධ **තොටක**මම්බුධිසෙහි මිතං.
31. 4. **දුතවිලම්බිත**මාහ නභා භරා.
32. 5. වසුයුගවිරතී නා මයා [1]. **පුටො**'යං
33. 6. නයසහිතා න්‍යා **කුසුමවිචිත්තා**.
34. 7. **භුජඞ්ගප්පයාතං** භවෙ වෙදයෙහි.
35. 8. නභජරෙහි භවති **පියංවද**.
36. 9. වුත්තා සුධීහි **ලලිතා** තභා ජරා.
37. 10. **පමිතක්ඛරා** සජසසෙහු'දිතා.
38. 11. නතභරසහිතා'භිහිතු'**ජ්ජලා**.
39. 12. පඤ්චා' ස්සවජ්ජිතා **වෙස්සදෙවී** මමා යා.
40. 13. වදන්ති හි **තාමරසං** නජජා යො
41. 14. **සාමලා**'ති ඤෙය්‍යා සයසෙහි යො [2], වෙ.

## 12. ජගති.

19. න්‍යා න්‍යා **මණිමාලා** වුත්තා ජහි ඡින්නා.
20. ඤෙය්‍යා සා'යං **ජලධරමාලා** මිභා ස්මා,
21. ඉහ **නවමාලිනී** යදි නජාභ්‍යා.
22. භවති නජා අථ **මාලතී** ජරා.

## 13. අති ජගතිජා- 8,192.

3· නනතතගුරූහා 'සෙසා'පුජිතා **ඛමා**.
4. යමා රා විහ්‍යා නා **ඔඤ්චරිඝාවලී** ගො.
5. සජසා ජගා භවති **මඤ්ජුභාසිනී**.

## 14. සක්කරියං 16 384.

4. මතා නො සො ගා 'ඛඛතිධියති **රසම්බාධා**.
5. **ඉන්දුවදනා** භජසනා මිගුරූ සුතනා.
6. මිසා මිභා ගා යදි පාදෙ සා'**ලොලා**'සස විරාමා.

## 15. අති සක්කරියං-32 768.

5. සජනා නයා සරදසයති **රතිෂරඛා**.
6. මිරා ම්‍යා යො **චන්දලෙඛා** සා'සසංහොගීහි ඡින්නා.

## 16. අෂ්ඨියා 65 536.

2. භ්‍රතජිතගා සරා'ඛක **මුසභගජවිලසිතං**.
3. ජරා ජරා ජගා භවන්ති **විතනහාගජ** මතා.

---

1. පුටොයං. 2. ඡෙ.

42. 1. ම්නා ජ්රා ගො තිදසයති [1] පහාසිනී සා.
43. 2. චතුග්ගහෙහි' භ රුචිරා ජභා සජා ග්.

### 13. අති ජගති.

44. 1. නනරසලහුගා සරෙහි 'පරාජිතා.
45. 2. නනභනලගිති [2] **පහරණකලිකා**
46. 3. වුත්තා **වසන්තතිලකා** තභජා ජගා ගො.

### 14. සක්කරී.

47. 1. ද්විහතහයුගලහුරථ ගිති **සසිකලා.**
48. 2. වසුහයයතිරිධ [3] **මණිගුණ නිකරො.**
49. 3. නනමයයයුතා'යං **මාලිනී** භොගිසීහි.
50. 4. භවති නජා භජා රසහිතා **පභද්දකං.**

### 15. අති සක්කරී.

51. 1. නජභජරා සදා භවති **වාණිනී** ගයුත්තා

### 16 අට්ඨි.

---

### 17. අච්චට්ඨියා. 1, 31, 072.

4. ජසා 'ථ **ධරණී** ජසා යලහුගා විරාමා 'ඨහි.
5. නං වද **වංසපත්තපතිතං** භරනභ නලගා.
6. නජභජජා ලගා හයදිසායති **නද්දමකං.**

### 18. ධුතියං- 2, 62. 144.

2. ර්සා ජජා භර සංයුතා ගජබාණගා **හරනත්තකං.**
3. කපිත්ථමිධ නතා රරා වෙ රරා **සීහවික්කීළිතං.**

### 19. අතිධුතියං- 5, 24, 288.

3. මො ත්නා සො රා ගො සරහයවිරමං **ඵුල්ලදාම**ප්පසිද්ධං.

### 20. කතියා- 10, 48, 576.

2. ඤෙය්‍යා සත්ත'ස්සත්තකා මරභනයයුතා භ්ලා ගො **සුවදනා.**
3. සජ්ජා භරා සලගා යදා ගදිතං තදා **පමද්දනනං.**

### 21. පකතියා- 20, 97, 152.

2. භා භභා ච භරා යදි කිත්තය පුත්තක; **මත්තවිලාසිනිං.**

### 22. ආකතියා- 41, 94, 304.

2. සත්තභසාරයුතා සගුරූ ගදිතා'යමුදාරතරා **මදිරා.**

---

1. පහාසිනී. 2. පහරණකලිකා. 3. මණිගණනිකරො.

52. 1. යමා නොසො භල්ගා රසගර විරාමා **සිඛරිණී**.
53. 2. රසයුගිසිහො නො සො ම්රා ස්ලා ග් යද **හරිණී තද**.
54. 3. **මන්දක්කන්තා** ම්භනතතගා ගො යුගු 'ත්වු'සසෙහි.

### 17. අච්චසී.

55. 1. මො තො නො යො යා **කුසුමිතලතා වෙල්ලිතා** කච්චිසීහි

### 18. ධුති.

56. 1. රසු'ත්ව' සෙසහි ය්මා නසරරගුරු **මෙඝවිප්ඵුජ්ජිතා** සා.
57. .2 අක්ක' සෙසහි යදි ම්සජා සතතගා සද්දූල **වික්කීළිතං**.

### 19. අති ධුති.

58. 1. **වුත්ත** මි දිසන්තු නාමතො රජා රජා රජා ගුරු ලහු ච.

### 20. කති,

59. 1. ම්‍රභ්නා යො යො'ත්‍ර යෙන තිමුනියතියුතා **සද්ධරා** කිත්තිතා'යං

### 21. පකති.

60. 1. භ්‍රා නර්නා රනා'ථ ච ගුරුද්දස 'ක්කවිරමං හි භද්දකමිදං

### 22. ආකති.

## ඉති වුත්තොදයෙ ඡන්දසි සමවුත්ත නිද්දෙසො නාම තතියො පරිච්ඡෙදො.

---

### 23. විකතියා- 83, 88, 608.

1. යම්හ තජා භජා භජභලග් **කමසාලිතං** හරාක්කවිරමං.
2. **මත්තක්කීළා**'ත්‍ර ල්ගා මා තො නචතුහි ච වසුසරද-සයතියුතා.
3. හෙහි ච සතතහි අත්‍ර කතා ගුරුණා ගුරුණා'ථ **මඤ්ජරණති**'යං.

### 24. සඞ්කතියා- 1, 67, 77, 216.

1. ඉන්ද්‍රියලොකා'භිතයති භතතා ස්භා භනයා ච යදිභවති **තන්වී**

### 25. අභිකතියා- 3, 35, 54, 432.

1. **කොඤ්චපද** භ්මා ස්භා චතුරො නා ගු'සුසරවසුමුනියති-භවති සමෙව.

### 26. උක්කතියා- 6, 71, 08, 864.

1. වසවීසා'සසවෙච්ඡෙදෙපෙතං මමතනනයුගරසලගා **භුජඞ්ග-විජම්භිතං**.
2, මො තාතං ඡ ච සගහිනි නවරසරසහයයතියුත **මපවාහං**තං

**ඉති පරිසිට්ඨවුත්තසඞ්ඛෙපො.**

1. විසමෙ යදි සා සලගා සමෙ
භත්තයතො ගුරුකා [1] **උපචිත්තං.**

2. භත්තයතො යදි ගා **දුතමජ්ඣා**
යදි පුතරෙව භවන්ති තජා ජ්‍යා.

3. යදි සත්තිතයං ගුරුයුත්තං
**වෙගවති** යදි භත්තිතයා ගා.

4. තො ජො විසමෙ රතො [2] ගුරූ චෙ
මිසා ජ්ගා **භද්දවිරාජ** මෙතං ගො චෙ.

5. විසමෙ සජා සගුරුයුත්තා
**කෙතුමති** සමෙ භරනගා ගො.

6. [3] **ආඛ්‍යානිකී** තා විසමෙ ජගා ගො
ජතා ජගා ගො තු සමෙ'ථ පාදෙ.

7. ජතා ජගා ගො විසමෙ සමෙ තු
තා ජො ගගා චෙ **විපරීතපුබ්බා**

8. සසජා සලගා විසමෙ සමෙ
තභරා භවති **හරිණප්ලුතා.**

9. යදි නනරලගා නජා ජරා
යදි ච තද'**පරවත්ත**මිච්ඡති.

10. විසමමුපගතා නතා රයා චෙ
නජ්ජරගා සමකෙ ච **පුප්ඵිතග්ගා.**
(වයමිදං වෙතාලියප්පභෙදෙ.)

11. සා **යවාදිකා මති** රජා රජතු.
සමෙ,සමෙ ජරා ජරා ගුරූ භවෙය්‍යුං

**ඉති වුත්තොදයෙ ඡන්දසි අඩ්ඪසමවුත්තනිද්දෙසො නාම**
**චතුත්ථො පරිච්ඡෙදො.**

---

1. න'ඒකෙකරෙසු පාදෙසු- ස්නා'දිම්හා යො'ණ්ණවා **වත්තං.**
2. සමෙසු සින්ධුතො ජෙන- **පථ්‍යාවත්තං** පකිත්තිතං.
3. ඔජෙසු ජෙන සින්ධුතො- තමෙව **විපරීතා'දි**
4. නකාරො චෙ ජලධිතො- **චපලාවත්ත** මිච්චෙතං.
5. සමෙ ලො සත්තමො යස්සා- **විපුලා** පිඞ්ගලස්ස සා.

---

1. උපචිත්තා 2. ගුරුකෙව. 3. ආඛ්‍යානිකා

6. සෙතවිස්සා'භිලෙ'ස්වපි-
7. හෙත'ණ්ණවා **තබ්බිපුලා**-
8. එවමඤ්ඤො රො චතුත්ථා-
9. තො'ණ්ණවා වෙ **තවිපුලා**-
10. තො'ණ්ණවා තථාඤ්ඤා සියා-

**වත්තප්පභෙදො.**

නාදිස්සතෙ'ත්ථ යං ඡන්දං- පයොගෙ දිස්සතෙ යදි
විසමක්ඛරපාදං තං- **ගාථා** සාමඤ්ඤ නාමතො.

**ඉති වුත්තොදයෙ ඡන්දසි විසමවුත්ත නිද්දෙසො නාම**

## පඤ්චමො පරිච්ඡෙදො.

---

1. **පත්ථාරෙ** සබ්බගෙ පාදෙ- පුබ්බගා'ධො ල් පරෙ සමා
පුබ්බෙ ගුරූනෙ'වමිමෙ- කාතබ්බා යාව සබ්බලො.
2. **නට්ඨස්ස** යො භවෙය්‍ය'ඞ්කො- තස්මිං ලො'ද්ධිකතෙ සමෙ
විසමෙ චෙ'කසහිතෙ- භවෙය්‍ය'ද්ධිකතෙ ගුරු.
3. එකා'දි'නුක්කමෙන'ඞ්කෙ- පුබ්බා'ධො දිගුණෙ ලිඛෙ
මිස්සිතෙහි ලහුට්ඨෙහි- සෙකොනු'**ද්දිට්ඨං** භවෙ.
4. වුත්ත'ක්ඛරසමා සඞ්ඛ්‍යා- ලිඛ්‍ය සෙ'කො' පරූපරි
එකෙකාධිකමෙකා'දි- නු'ද්ධාතො **සබ්බගා'දිකං**
5. ගුරුක්‍රිය'ඞ්කසන්දොහෙ- භවෙ **සඞ්ඛ්‍යා** විමිස්සිතෙ
උද්දිට්ඨ'ඞ්කසමාහාරො- සෙ'කො වෙ'මං සමානයෙ.
6. සඞ්ඛ්‍ය'ව විගුණෙ'කූනා- විත්ථාරා'යාමසම්භවො
වුත්තස්ස'ද්ධ'න්තරාතඤ්ච- ගරුලාතඤ්ච අඞ්ගුලං.

**ඉති සඞ්ඝරක්ඛිතත්ථෙරපාදවිරචිතෙ වුත්තොදයෙ ඡන්දසි**
**ඡප්පච්චයවිභාගො නාම**

## ඡට්ඨො පරිච්ඡෙදො.

---

1. සේලාන්තරා'යත්තවාසික්සීලපේර
පාදෙ ගුරූ ගුණගුරූ ජයතං මමෙ'සෝ
යස්සප්පභාවමවලම්බ මයෙ'දිසො'පි
සම්පාදිතො'භිමතසිද්ධිකරො පරත්ථො

2\. පරත්‍ථසම්පාදනතො– පුඤ්ඤෙනා'ධිගමෙනා'ගං
පරත්‍ථසම්පාදනකො– භවෙය්‍යං ජාතිජාතියං

3\. අවලොකිතමත්තෙන– යථා ඡප්පච්චයා මයා
සාධිතා සාධයන්තෙව– මිච්ඡිතා'ත්‍ථමපි පාණිනො

## වුත්තොදයං නිට්ඨිතං.

—සිද්ධිරත්‍ථු.—

---

යෙ'නන්තානන්තරතනාකරමත්‍ථෙන
මිත්‍ථාවලො'ලසිතඤ්ඤාණවරෙන ලද්ධා
සාරා'මතා'තිසුඛිතා සුඛයන්ති ච'ඤ්ඤෙ
තෙ මෙ ජයන්ති ගුරවො ගුරවො ගුණෙහි.

පුඤ්ඤෙන තෙන ජිනපත්ති යදා භවෙය්‍ය
තාවා'හසාරිතනුජො'ව සතීමතීමා
තෙජා නිහෙතුපටිසන්ධි අමොඝරූපී
ලද්ධා ඨිතිබලපසත්‍ථගුණො භවෙය්‍යං

සමගර පොත්වල අවසානයෙහි පැනෙන මේ ගාථා දෙක
වුත්තොදයෙන් බාහිර වූවකි.

## ලඞ්කානුවාද ව්‍යාඛ්‍යා සහිත

# වුත්තෝදය.

1. නමත්ථු ජනසන්තාන- තමසන්තානභෙදිනො
ධම්මුජ්ජලන්තරුචිනො- මුනින්දොදිතරොචිනො

---

“**වුත්තෝදය**” නම් වූ මාගධ ඡන්දශ්ශාස්ත්‍රය රචනා කැටැවි වූ **ශ්‍රී සඞ්ඝරක්ඛිත මහාස්වාමිපාදයෝ** ශාස්ත්‍රාරම්භයෙහි සදාචාරසංරක්ෂණය පිණිස හා නිදුකින් ග්‍රන්ථරචනාව සමාප්ත කරනු පිණිස ඉෂ්ටදෙවතානමස්කාරය කරනුවෝ “නමත්ථු” යනාදි ගය රචනා කළහ.

“මුනින්දොදිතරොචිනො නමත්ථු” යනු මෙහි සම්බන්ධයි. **මුනින්ද × ඔදිතරොචිනො**= මුනීන්ද්‍ර නමැති චන්ද්‍රයාහට **නමො × අත්ථු**= (මාගේ) නමස්කාරය වේවා. කෙබඳු මුනීන්ද්‍රචන්ද්‍රයෙකුට ද යත්?

1. ජනසන්තානතමසන්තානභෙදිනො=**ජනසන්තාන**= ජනසමූහයා කෙරෙහි වූ; **තමසන්තාන**= අඳුරු පරපුර (නොහොත්) මොහාන්ධකාරසමූහය; **භෙදිනො**= බිඳිනසුලු වූ; ධම්මුජ්ජලන්තරුචිනො= **ධම්ම**= සද්ධර්මය වැනි වූ (නොහොත්) සද්ධර්ම නමැති; **උජ්ජලන්ත**= උසස්ව දිලියෙන්නාවූ; **රුචිනො**= කාන්තිඇති; මුනින්දොදිතරොචිනො= **මුනින්ද**= මුනීන්ද්‍ර නමැති; **ඔදිතරොචිනො**= චන්ද්‍රයාහට; (**මම**– මාගේ;) **නමොඅත්ථු**= නමස්කාරය වේවා.

**විවෘති-**

අමෘතස්වරූප වූ චන්ද්‍රයා හා රූපණය කොට මෙත්සුළුණු නමැති අමාවෙන් සිහිල් වූ නිර්වාණාමෘතදායී වූ මුනීන්ද්‍රයන් වහන්සේට නමස්කාරයෙන්ම තත්ප්‍රභව වූ නවලොකොත්තර ශ්‍රී සද්ධර්මරත්නයට ද තත්ප්‍රතිපාදක වූ ආර්‍ය්‍යසඞ්ඝරත්නයට ද නමස්කාරය කරනලද්දේ වෙයි. මෙසේ අභිවාදනාගී වූ රත්නත්‍රයට නමස්කාරය හෙතුකොට ගෙන–

2. පිඞ්ගලා'චරියා'දීහි-ඡන්දං යමුදිතං පුරා
සුද්ධමාගධිකානං තං-න සාධෙති යපිච්ඡිතං-

3. තතො මාගධභාසාය-මත්තාවණ්ණ විභෙදනං
ලක්ඛලක්ඛණ සංයුත්තං-පසත්ථත්ථ පදක්කමං-

---

" **අභිවාදනසීලිස්ස-නිච්චං** වඩ්ඪා'පචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති-ආයුවණ්ණො සුඛං බලං"යි.

වදාළ හෙයින් ප්‍රාරබ්ධග්‍රන්ථයාගේ අවිඝ්නපරිසමාප්තිය සිද්ධ මැයි.

**ජනසන්තාන-** යනාදියෙහි "සන්තාන" ශබ්දයාගේ යෙදී මෙන් ඡන්දශ්ශාස්ත්‍රය තමා අක්ෂරපරම්පරා සඞ්ඛ්‍යාත ලක්ෂණො පෙනබැව් දක්වූහ. කොදුරහට්ටයන් විසිනුදු "සුඛසන්තාන සිද්ධ්‍යර්ථම්"යි සන්තාන ශබ්දය යොදන ලද්දේ ද එහෙයිනි.

"ජනානං සන්තානො "යි ද, "ජනසන්තානස්මිං තමො "යි ද, "ජනසන්තානතමසො සන්තානං"යි ද, "ජනසන්තානතමසන්තානං හිනන්ති සීලෙනාති- ජනසන්තානතමසන්තානහෙදී (තස්ස) යි ද, "උජ්ජලන්තී රුචි "යි ද, "ධම්මො එව උජ්ජලන්තරුචි යස්ස සො ධම්මුජ්ජලන්තරුචි" (තස්ස) යි ද, "මුනීනමින්දො" යි ද, "ඔදාතා රුචියො **යස්ස** සො "යි ද, "මුනින්දො එව ඔදාතරුචි= මුනින්දොදාතරුචි" (තස්ස) යි ද, විග්‍රහයි. "මුනින්දොදාතරුචිනො"යි කියයුත්තෙහි ගාථාශලිෂ්ටත්වය පිණිස "රොචිනො"යි වෘද්ධිවිෂය කරනලදී.

අනතුරුව පිඞ්ගලාදිරචිත ශාස්ත්‍රාන්තරයන් ඇතිකල්හි ද වුත්තොදයරචනාප්‍රයාසයෙහි ප්‍රයොජන හා රචනාවිධි සංඥාදිය දක්වනු පිණිස **පිඞ්ගලා**චරියාදීහි,, යනාදි තෙගය දක්වූහ.

2. **පිඞ්ගලාචරියාදීහි=** පිඞ්ගලමුනිආදි ආචාර්‍යවරයන් විසින්; **පුරා** පූර්වයෙහි; **ඡන්දං=** (වෛදික-ලෞකික වශයෙන් ද්විවිධවූ) යම් ඡන්දශ්ශාස්ත්‍රයක්; **උදිතං=** (දෛවීභාෂාවෙන්) කියන ලදද; **තං=** ඒ ඡන්දශ්ශාස්ත්‍රය; **සුද්ධමාගධිකානං=** හුදුමාගධභාෂාව හදුරන්නවුන්ගේ; **යපිච්ඡිතං=** (ඡන්දොඥනසඞ්ඛ්‍යාත) යථෙප්සිතය; **යථා=** යම්හෙයකින්;) **න සාධෙති-** සිද්ධ නො කෙරේද- (යථිච්ඡිතං,, යන පාඨාන්තරයෙහි **යථා=** යම්හෙයකින්; ඉච්ඡිතං= ඊප්සිතය හෙවත් අභිමතාර්ථය කියා අර්ථ ගන්නේයි.)

3. **තතො=**එහෙයින්; **මත්තාවණ්ණ විභෙදනං=** මාත්‍රා ඡන්ද සය වර්ණච්ඡන්දසය යන භෙද ඇති: **ලක්ඛලක්ඛණ සංයුත්තං=** උදා

4. ඉදං වුත්තොදයං නාම-ලොකියච්ඡන්‍දනිස්සිතං
ආරභිස්සමහන්‍දනි-තෙසං සුඛ විබුද්ධියා.

ගූරණාත්මක සූත්‍රයෙන් යුක්ත වූ; **පසන්නත්ථපදක්කමං**= ප්‍රසන්නවූ (ප්‍රකටවූ) අර්ථවත් පදක්‍රම ඇති- මාගධභාෂාය යනු මතුගය හා සම්බන්ධයි )

4. **ලොකියච්ඡන්‍දනිස්සිතං** ලෞකිකච්ඡන්‍දස ඇසුරුකළාවූ; **ඉදං** මේ; **වුත්තොදයං නාම**= "වුත්තොදය" නම්වූ ඡන්‍දශ්ශාස්ත්‍රය; **තෙසං**= ඒ ශුද්ධ මාගධිකයන්ගේ; **සුඛවිබුද්ධියා**= සුවසේ අවබෝධය පිණිස; **ඉදානි**= දැන්; **අහං**= මම; **මාගධභාසාය**= මාගධභාෂාවෙන්; **ආරභිස්සං**= රචනාකොරෙමි.

**විවෘතයි**-

**පිඞ්ගලාචරියාදියි**- යන්නෙන් සූත්‍රකර්තෘ වූ පිඞ්ගලයන් හා ජයදෙව- සොදුරාදි ඡන්‍දොවේදීකයන් ගත්හ. "තදුචාරයපිවරයන් විසින් රචිත ඡන්‍දශ්ශාස්ත්‍රය ඇති කල්හි නෙපි කුමට මෙම රචනාවෙහි වෙහෙසවන්නාහු ද?" යන අනත'ලීන චොදනායෙහි ලා "ඔවුන්ගේ ශාස්ත්‍රය දෛවිභාෂාමය හෙයින් හුදු මාගධ භාෂාව හදුරන්නවුන්ගේ ඡන්දොඥනය පිණිස මාගේ ප්‍රයාසය වේ" යයි ග්‍රන්ථකරණයෙහි ප්‍රයොජන දක්වූහ.

ඡන්‍දං- "වජ්ජං ඡාදයතීති= ඡන්‍දං" වරද වසානුයි ඡන්‍දස් නම් වේ. "චන්‍දයති හ්ලාදයති- චන්‍දයතෝ'නෙ
"ඡන්‍ද" ශබ්දය. නෙනිවා= ඡන්‍දං" පිණවානුයි හෝ මේ කාරණකොට පිණවනු ලැබෙනුයි ඡන්‍දස් නම් වේ. "ඡන්‍ද" ශබ්දය වෙදාදි නො එක් අර්ථයෙහි වැටෙතුදු මෙහි අක්ෂරසමාවෙශලක්ෂණ වූ ඡන්‍දස ද උපචාරවශයෙන් තත්‍ප්‍රතිපාදකශාස්ත්‍රය ද ප්‍රකාශ කොරෙයි.

**සුඛමාගධිකානං**- සංස්කෘතභාෂාවෙහි නො කළ පරිචයඇති හුදු මාගධභාෂාව හදුරන්නාහු ශුද්ධමාගධිකයෝයි. "මගධෙ භවා= මාගධා" "තමධීතෙ ජානාති වා මාගධිකා" "සුද්ධා ච තෙ මාගධිකා= සුද්ධමාගධිකා" (තෙසං) යනු විග්‍රහයි.

**මත්තාවණ්ණවිභෙදනං**- යන මෙ යින් සවාභිමතඡන්‍දශ්ශාස්ත්‍රය මාත්‍රාවර්ණභෙදයෙන් ද්විවිධබැව් දක්වූහ.

**ඡන්‍දස්හුගේ ත්‍රිවිධත්වය.** තවද-අන්‍යයන් විසින් ගණච්ඡන්‍දස් මාත්‍රාච්ඡන්‍දස් අක්ෂරච්ඡන්‍දස් යයි දක්වූ ත්‍රිභෙදය මෙයින් බැහැර කරනලදී. ඒ එසේමැයි-

" ආදෞ තාවද්ගණච්ඡන්දො-මාත්‍රාඡන්දස්තතඃ පරම්
තෘතීයමක්ෂරච්ඡන්ද-ශ්ඡන්දසෙත්‍රධා තු ලෞකිකම් "

යනාදීන් **හලායුධයෝ** ලෞකිකච්ඡන්දස ගණ-මාත්‍රා-අක්ෂරභෙද්යෙන් ත්‍රිවිධ යයි ද, ආර්‍ය්‍යාදිය ගණච්ඡන්දස යයි ද, වෛතාලීයාදිය මාත්‍රාච්ඡන්දස යයිද, තදන්‍යය අක්ෂරච්ඡන්දස යයිද දැක්වූහ. මෙහි වනාහි ගණයනුදු මාත්‍රාත්මක හෙයින් ආර්‍ය්‍යාදිය හා වෛතාලීයාදිය මාත්‍රාච්ඡන්දස යයිද, තදන්‍යය වර්ණච්ඡන්දස යයිද ගත්හ

**ලක්ෂ්‍ය ලක්ෂණ.**

**ලක්ඛලක්ඛණසංයුත්තං**-යන මෙහි ඡන්දොනිබද්ධපද්‍යාදි උදාහරණයෝ ලක්ෂ්‍ය නම් වෙති, තත්ප්‍රතිපාදක සූත්‍ර ලක්ෂණ නම් වෙත්. " ලක්ඛීයතෙ ලක්ඛිතබ්බං වා= ලක්ඛං " ලක්ඛීයතෙ'නෙනාති= ලක්ඛණං, ලක්ඛඤ්චෙව ලක්ඛණං= ලක්ඛලක්ඛණං, තෙන සංයුත්තං= ලක්ඛලක්ඛණ සංයුත්තං " (තං) යනු විග්‍රහයි.

මේ ශාස්ත්‍රයෙහි වනාහි පිඞ්ගලඡන්දස්සූත්‍රාදියෙහි මෙන් නොව යමෙක් අර්ථාවබෝධය සාරවත ලක්ෂණය හෙවත් සූත්‍රය වේ නම්? එය ම තත්ප්‍රතිපාදකලක්ෂ්‍යය හෙවත් උදාහරණය ද වන්නේය. **ත්‍යා චෙ තනුමජ්ඣා** යනු තනුමධ්‍යා නම් වෘත්තය අවබෝධකර වන සූත්‍රයයි. යම් වෘත්තයක තගණ-යගණයෝ වූවාහු නම් එය තනුමධ්‍යා නම් වෙයි යනු අර්ථයි. එකී ලක්ෂණයට උදාහරණයද එය මැයි.

**ත්‍යා චෙ ත , නු ම ජ්ඣා**
⏑ ⏑ — , — ⏑ ⏑
තගණ යගණ

මෙසේ ගණවින්‍යාසය කළකල්හි "තනුමධ්‍යා" වෘත්තය හැඳින්වීමට දැක්වූ සූත්‍රය ම තගණ-යගණයන්ගෙන් යුක්ත බැවින් ඊට උදාහරණය ද වූබැව් සැලකිය යුතුයි. සෙස්සෙහි ද ලක්ෂ්‍ය ලක්ෂණ සංයුක්තත්වය මෙසේ මැයි.

**පසන්නත්ථපදක්කමං**-මෙයින් ලක්ෂ්‍යාත්මක ලක්ෂණයෙන් යුක්තබැවින් ම ප්‍රසන්න වූ ප්‍රකට වූ අර්ථවත් පදක්‍රම ඇතිබැව් සූචනය කළහ. "පසන්නා පාකටා අත්ථා යස්ස තං" යී ද පසන්නත්ථං ච තං පදං" යී ද "පසන්නත්ථපදානං කමො යස්මිං තං= පසන්නත්ථපදක්කමං" යී ද විග්‍රහයි

5. සබ්බගලා මනා'දිගලහු-භ්‍යා මජ්ඣ'න්තාගරූ ජසා
මජ්ඣන්තලා රතො'න්'ඛ-ගණා ගො ගරූ ලො ලහු.

---

**වුත්තොදයං**-මෙසේ ගුරු-ලඝු පිළිවෙළින් මෙනම් වෘත්තයවේයි යන නියමය ඇත්තේ වෘත්ත නම්. ඡන්දොමඤ්ජරියෙහි—

"පද්‍යං චතුෂ්පදී තච්ච-වෘත්තං ජාතිරිති ද්විධා,
වෘත්තමක්ෂරසඞ්ඛ්‍යාතං-ජාතිර්මාත්‍රාකෘතා භවෙත්" යි

පද්‍යය සිවුපද ඇත්තේ වෙයි, හෙද වෘත්ත-ජාතිවශයෙන් ද්විවිධ වන්නේය, ගුරු-ලඝු සඞ්ඛ්‍යාත අක්ෂරනියමයෙන් කරන ලද්දේ වෘත්ත නම් වේ, මාත්‍රානියමයෙන් කරනලද්දී ජාති නම් වේ යයි ද කියන ලදී. මෙහි වනාහි වෘත්ත-ජාතිවශයෙන් ද්විවිධ වූයේ ම "වුත්ත" ශබ්දයෙන් ගත්තේයයි සැලකිය යුතුයි. "මත්තාවණ්ණ විභෙදනං වුත්තානමුදයො යස්මිංතං වුත්තොදයං"යි අඤ්ඤසංඥයි.

**ලොකියච්ඡන්දනිස්සිතං**-ඡන්දස වනාහි වෛදිකච්ඡන්දසය ලෞකිකච්ඡන්දස යයි ද්විවිධ වේ. එහි මාත්‍රාවර්ණවිභෙදයෙන් යුක්ත වූයේ "ලෞකිකච්ඡන්දස"යි. එය මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි විස්තරකොට දක්වන බැවි මෙයින් ප්‍රතිඥා කළහ. වෛදමන්ත්‍රනිබද්ධ

**වෛදික ඡන්දස.** වූයේ "වෛදිකච්ඡන්දස" නම් වේ. එය-ගායත්‍රි, උෂ්ණිහ්' අනුෂ්ටුභ්, වෘහති, පඞ්ක්ති, ත්‍රිෂ්ටුභ්, ජගති, යන මොවුන්ගේ වශයෙන් විභාගකරන ලද්දේය, නැවත ඒ එකෙකි ඡන්දස-ආර්ෂි, දෛවි, ආසුරී, ප්‍රාජාපත්‍යා, යාජුෂි, සාම්නී, ආර්චී, බ්‍රාහ්මී, යයි අටවැදෑරුම් වේ. මෙකී වෛදිකච්ඡන්දස ශුද්ධමාගධික යන්ගේ ප්‍රයොජනය පිණිස නො පවත්නාහෙයින් මෙයින් ම බැහැර කරනලදී.

මෙහි "වුත්තොදයං නාම" යන්නෙන් සංඥව ද, "සුද්ධමාගධි කානං" යන්නෙන් නිමිත්ත ද, "අහං, ආරභිස්සං'

**සංඥාදි පඤ්චකය.** යන පදයන්ගෙන් කර්තෘ ද, "මත්තාවණ්ණවිභෙදනං ලොකියච්ඡන්දනිස්සිතං" යන පදයන්ගෙන් ප්‍රමාණය ද, "තෙසං සුඛවිබුද්ධියා" යන පදවලින් ප්‍රයොජනය ද කියන ලද්දේ වෙයි.

මෙසේ රත්නත්‍රයාභිවාදනපූර්වකසංඥාදිපඤ්චකය දක්වා දැන් ශාස්ත්‍රයාගේ ව්‍යවහාරසෞකර්‍ය්‍යය සඳහා තදුපයොගී සංඥපරිභාෂාදිය. දක්වන්නාහු "සබ්බගලා" යනාදීන් ගණලක්ෂණොද්දෙශය කෙරෙත්.

**5. සබ්බගලා**= සර්වගුරු-සර්වලඝු ඇත්තාහු; **මනා**=මගණ නගණයෝ වෙති; **ආදිගලහු** ආදිගුරු-ආදිලඝු ඇත්තාහු **භයා**=

භගණ-යගණයෝ වෙති; **මජ්ඣන්තගරූ**= මධ්‍යගුරු-අන්තගුරු ඇත්තාහු; **ජසා**= ජගණ සගණයෝ වෙති; **මජ්ඣන්තලා**= මධ්‍ය ලඝු-අන්තලඝු-ඇත්තාහු; **රතා**- රගණ-තගණයෝ වෙති; **ඉති**= මෙසේ (මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි;) **අට්ඨගණා**= ගණයෝ අටදෙනෙක් වෙත්; **ගරු**= ගුර්ක්ෂරය තෙම; **ගො**= 'ග' නම් වෙයි; **ලහු**= ලඝවක්ෂරයතෙම; **ලො**= 'ල' නම් වේ.

**ගණවිභාගය.**

**වි:-** "ගණ"ශබ්දය සමූහාදි නො එක් අර්ථයන්හි වැටෙතුදු මෙහි ඡන්දශ්ශාස්ත්‍රොක්තඅක්ෂරසඞ්ඛ්‍යාතයෙහි වැටේ. ආදිමධ්‍යාන්ත ගුරුලඝූන්ගෙන් ගණව්‍යවස්ථාව කළහෙයින් ගණයෙක් අකුරු තුනකින් පරිමිතවූයේය'යි හැඟේ. කුමක්හෙයින් ගණයෙක් අකුරු තුනකින් ම යුක්ත වීද යත්? බ්‍රහ්ම-විෂ්ණු-මහෙශ්වර යන මූර්තිත්‍රය හා සත්ත්ව-රජස්-තමස් යන ගුණත්‍රය පරාමර්ශනය කරනු පිණිස ගණයෙක් අකුරුතුණකින් යුක්ත යයි කිසිවෙක් කියති. ලොකයෙහි සෙනාදීන්ගේ ගිණීම සුකරවනු පිණිස හස්තීන් මෙතෙක් සඞ්ඛ්‍යාවක් වූ කල හස්ති ගණය යනාදීන් සමූහ වශයෙන් සංඛ්‍යානය (ගිණීම) කරන්නාක් මෙන් පොරණැදුරන් ඡන්දසුන්ගේ වර්ණ ගිණීම සඳහා සමූහයක් විමට යොග්‍යවූ ඉතා අඩු සඞ්ඛ්‍යාව ගෙන ගණයෙක් අකුරු තුන කින් පරිමිත කොට දක්වන ලදැයි සැලකියයුතු.

කුමක් හෙයින් අඩුවැඩි නොව ගණ අටක් ම වීද යත්? අකුරු තුනක් ගණයෙකැයි කියන ලදී, අකුරු තුනක් ඇති මධ්‍යා ඡන්දස ප්‍රස්තාර කළ කල්හි වෘත්ත අටක් ම ලැබෙන හෙයින් ගණ අටක්ම විය 'මධ්‍යා' ඡන්දසෙහි පිළිවෙළින් ලැබෙන වෘත්ත අට මෙහි ගණ නාමයෙන් ගන්නා ලදහ.

පද්‍යරචනාදියෙහි සාමර්ථ්‍යය ප්‍රාර්ථනා කරන්නවුන් විසින් ගණ ලක්ෂණාදිය වෙසෙසින් අවබොධ කළයුත්තේය.

මො භූමින්තිගුරූ සිරිං දිසති යො වුඩ්ඪිං ජලං වා 'දිලො
රෝ දහං ලහුමජ්ඣගො'ග්ගි පවනො දෙසා'ටනං සො'න්තගො
තො ලා 'න්තො ධනනාසනං තිලපථො ජො'කො රුජං මජ්ඣගො
භො වන්නෙ යසමුජ්ජලං මුඛගුරූ ආයුං තිලො නා'මරො.

| ගණ | ලක්ෂණ | දෙවතා | ඵල | මිත්‍රාදි | ශුභාදි | නිදර්ශන |
|---|---|---|---|---|---|---|
| මගණ | ◡ ◡ ◡ | භූමි | ශ්‍රී | මිත්‍ර | ශුභ | සම්බුඩං |
| යගණ | — ◡ ◡ | ජල | වෘද්ධි | භෘත්‍ය | ශුභ | භජනතා |
| රගණ | ◡ — ◡ | අග්නි | නාශ හෝ දාහ | උදාසීන | අශුභ | සබ්බද |
| සගණ | — — ◡ | වායු | දෙශාටන | ශත්‍රු | අශුභ | සුසුඛං |
| තගණ | ◡ ◡ — | ආකාශ | ශූන්‍ය | ශත්‍රු | අශුභ | විඥත්ති |
| ජගණ | — ◡ — | සූර්‍ය්‍ය | රුජා | උදාසීන | අශුභ | මුනින්ද |
| භගණ | ◡ — — | චන්ද්‍ර | යශස් | භෘත්‍ය | ශුභ | සමමම |
| නගණ | — — — | දෙව | ආයු | මිත්‍ර | ශුභ | දිසතු |

පද්‍ය රචනාවෙහි ලා පද්‍යයාගේ ආරම්භයෙහිද කාව්‍යනායකයාගේ නාමය දෙපස ද ඉෂ්ටගණ යෙදිය යුත්තාහුය, අනිෂ්ට ගණ යෙදීමෙන් කාව්‍යනායකාදීන්ට යෙදෙනසේ අනිෂ්ටඵලද ඉෂ්ට ගණ යෙදීමෙන් ඉෂ්ටඵලද වන්නාහුය, කිසි තැනෙක පද්‍යාරම්භයෙහි අනිෂ්ට ඵල ඇති ගණයෙක් යෙදුන හොත් ඊට සිංහෙන පරිදි දෙවන ගණය ශුබ වුව හොත් මැනවි. මිත්‍රාදි ගණයෙන් මිත්‍රාදි ගණයක් යෙදීමෙන් ලැබෙන ඵලය මතු දක්වන පරදිසි.

| (පූර්වගණ) | මිත්‍රගණය | භෘත්‍යගණය | උදාසීනගණය | ශත්‍රුගණය |
|---|---|---|---|---|
| මිත්‍රගණයෙන් පරව | ධනලාභ | අභිවෘද්ධි | ධනශූන්‍ය | බන්ධු පීඩා |
| භෘත්‍ය ,, | ධෛර්‍ය්‍ය | අධික ගුණ | ධනහානි | ශොක |
| උදාසීන ,, | අල්පදුඃඛ | අල්පසුඛ | මන්දධෛර්‍ය්‍ය | ස්වජන වෛර |
| ශත්‍රු ,, | භ්‍රම | ගෘහිණීනාශ | චිත්තපීඩා | විනාශ . |

මෙහි දක්වූ පරිදි මිත්‍රගණයෙන් මිත්‍රගණය වුවහොත් ධනලාභය මිත්‍රගණයෙන් භෘත්‍යගණය වුවහොත් අභිවෘද්ධිය යනාදි වශයෙන් සැලකිය යුතුයි.

6. භජසා සබ්බගලහු- පඤ්චි මෙ සණ්ඨිතා ගණා
අරියා'දිම්හි විඤ්ඤෙය්‍යා- ගණො ඉධ චතුක්කලො.

---

පද්‍යාරම්භයෙහි හා අභිධාන පාශ්වයෙහි ශුභඵල ඇති අකුරු යෙදීම ද කාව්‍යනායකාදීන්ට ශුභ ඵල ලැබීම පිණිස වේ. ගණ-අක්ෂරාදිය පිළිබඳ ව්‍යවස්ථා වැඩිදුරටත් සිදත ඉවුනිවු අදියර ආදියෙන් බලා දතයුතුයි. තවද- දෙවතාවාචක ශබ්ද- භද්‍රාදිවාචක ශබ්ද යෙදීමෙන් ගණ වශයෙන් හෝ අක්ෂර වශයෙන් විය හැකි දෝෂයෙක් නො වේ යයි ද කියන ලදී.

**අක්ෂර පරිභාෂා**

ගණ-ගුරු-ලඝු සංඥාවන් හා ඡන්දශ්ශාස්ත්‍රයෙහි සර්වව්‍යාපීවූ අක්ෂර පරිභාෂාව ද මෙයින්ම දක්වූහ. ඒ එසේ මැයි.- අෂ්ටගණ වාචක වූ "ම, ය, ර, ස, ත, ජ, භ, න" යන අකුරු අට හා ගුරු- ලඝු වාචක වූ "ග,ල" යන දෙයකුරද මාත්‍රා-වර්ණ භේද වූ ඡන්දස්හි පැතිර පවත්නේය. මෙය දක්වන **කෙදාරයන්** විසින්-

"ම්‍යරසත ජභන ගෛර්ලාං'න්තෛ-රෙභිර්දශභි රක්ෂරෛඃ
සමස්තං වාඞ්මයංව්‍යාප්තං- ත්‍රෛලොක්‍යමිව විෂ්ණුනා"

යනු ප්‍රකාශ කරන ලදී.

එළුසඳස්හි "ලුහුදෙක් ගුරෙක් ගුරු- දෙලුහු අකුරු මෙම තෙක්" යනුවෙන් අකුරු දෙකෙකැයි දක්වන ලද්දේ සියලු එළු සඳස එකාම මාත්‍රාච්ඡන්දසෙහි ඇතුලත්වන හෙයිනි, එහි ගණ ව්‍යවහාරය ඇතද ඡන්දස් මාත්‍රා සඞ්ඛ්‍යාවෙන්ම ප්‍රමාණ කරනු ලැබෙත්, එහෙයින් සර්වව්‍යාපි වූයේ ගුරු-ලඝුවය පමණෙකි.

මෙසේ එක දෙශයකින් ඡන්දශ්ශාස්ත්‍රව්‍යාපීවූ දශාක්ෂරය දක්වා මෙවිට ආයර්‍යාජාත්‍යාදියෙහි යෙදෙන ගණ ව්‍යවස්ථාව කරනු පිණිස "භජසා" යනාදි පරිභාෂා දක්වත්.

6. **භජසා**= (ආදිමධ්‍යාන්ත ගුරු යුක්ත) භගණ- ජගණ- සගණයෝ තුන්දෙනද? **සබ්බගලහු**= සර්වගුරු- සර්වලඝු වූ (මගණ-නගණයෝ දෙදෙනද යන; **ඉමෙ පඤ්ච ගණා**= මේ ගණයෝ පස්දෙන; **අරියාදිම්හි**= ආයර්‍යාදිජාතියෙහි; **සණ්ඨිතා**= සිටියාහුයයි; **විඤ්ඤෙය්‍යා**= දතයුත්තාහුය; **ඉධ**= මේ ආයර්‍යාදියෙහි; **ගණො**= ගණයෙක්; **චතුක්කලො**= කලා (= මාත්‍රා) සතරක් ඇත්තේය.

**වි:-** ආයර්‍යාදියෙහි යෙදෙන්නාහු ගණපසෙකි, මෙහි ගණ යෙක් මාත්‍රා සතරකින් පරිමිත වේ, මාත්‍රා නම්?

**ආයර්‍යාගණ.** අකුරක් උච්චාරණය කරන කාලයයි, එය ඇසිපිය හෙලීමක් හෝ අසුරුසනක් තුල පවතී, ආදිමධ්‍යාන්ත ලඝු ඇති 'ය, ර, ත,' යන ගණ තුනෙහි ගුරු දෙක බැගින් ලැබෙන හෙයින් මාත්‍රා පසක් පිරෙන් නුයි. ඔවුහු මාත්‍රාඡන්දස් පිළිබඳ ගණසඞ්ඛ්‍යාවෙන් බැහැර වූහ. මාත්‍රා සතර බැගින් ඇති ආදිම ධ්‍යාන්තගුරු යුක්ත වූ 'භ, ජ, ස,' යන ගණත්‍රය ද, ගුරු දෙකක් ඇති මගණයක් හා ලඝු සතරක් ඇති නගණයෙක් ද යන ගණ පසක්ම මෙහි යෙදෙත්. යෙද වර්ණඡන්දස් අවස්ථාවෙහි ගණයෙක් අකුරු තුනක් හෙයින් ත්‍ර්‍යක්ෂරච්ඡන්දසෙහි වෘත්ත සමූහය අෂ්ට ගණය වූවාක් මෙන් මේ මාත්‍රා ඡන්දස් අවස්ථාවෙහිද ගණයෙක් මාත්‍රාසතරක් හෙයින් චතුර්මාත්‍රිකච්ඡන්දස්හුගේ ප්‍රස්තාරයෙන් ලැබෙන වෘත්ත සමූහය ම පිළිවෙළින් පඤ්චගණය වන්නේය. ඒ මෙසේයි-.

1. මගණය ⌣ ⌣ සර්ව ගුරු (=විගුරු)
2. සගණය — — ⌣ අන්තගුරු
3. ජගණය — ⌣ — මධ්‍යගුරු
4. භගණය ⌣ — — ආදිගුරු
5. නගණය — — — — සර්ව ලඝු (=චතුර්ලඝු)

"සජභා" යි කියයුත්තෙහි ශ්‍රැති සුඛ පිණිස විලොමයෙන් තබන ලදී.

**අර්යාදිමහි-** මෙහි මාත්‍රාච්ඡන්දස අරියා- ගීති- වෛතාලීය- මාත්‍රාසම යයි ජාති සතරකින් යුක්තවේ, "අර්යාදිමහි" යන තැන්හි ආදි ශබ්දයෙන් ගීති-මාත්‍රා සම යන ජාති දෙක ගන්නා ලදහ. වෛතාලීය ජාතියෙහි රගණාදි පඤ්චමාත්‍රික ගණද යෙදෙන හෙයින් නො ගැනේ. එසේ වුව වෛතාලීය ජාතිය වර්ණච්ඡන්දස්හි ඇතුලත්කළයුතු නොවේද? සැබව- වර්ණවෘත්තයෝ සමානවර්ණ සඞ්ඛ්‍යාවකින්ම ඡන්දස පුරති, (විෂමාක්ෂර ඇති තැන් හිදු මාත්‍රා ගිණීමෙක් නොවේ,) වෛතාලීය ජාතියෙහි මාත්‍රාවන් ගෙන්ම ඡන්දස පුරන හෙයින් මාත්‍රාඡන්දස්හිම ඇතුලත්විය යුත්තේය. ඒ එසේමැයි- සවැනි වූ ගායත්‍රිඡන්දස වර්ණ සයකින් පිරේ, එහෙත් එහි මාත්‍රා සය පටන් මාත්‍රා දොළොසක් තෙක් ඇති වෘත්තයෝ වෙති. මාත්‍රා තුදුසක් ඇති වෛතාලීය පාදයක වර්ණ අට පටන් එකොළොස හෙක් විය හැක. මෙසේ හෙයින් වෛතාලීය ශ්‍රේණි

**7. සංයොගා'දි ච දීඝො ච- නිග්ගහීතපරො ච යො
ගුරු වඞ්කො පදන්තො වා- රස්සො'ඤ්ඤො මත්තිකො ලුජු.**

---

යෙදෙන රගණාදිය ද වර්ණ වශයෙන් නොව මාත්‍රාවශයෙන් ම ගිණියයුතු වෙත්. එළුසඳස්හි යෙදෙන අටගණ ද මාත්‍රා වශයෙන් ගිණිය යුත්තේත් මෙසේම,යි.

**කාලා** ශබ්දයෙන් මෙහි මාත්‍රාවෝ ම කියනු ලැබෙත්.

මෙසේ සැකෙවින් ගණ උද්දෙශ කොට දැන් ගුරු- ලඝු පරිභාෂා දක්වනු පිණිස "සංයොගාදි" යනාදිය කියත්.

7. **යො**= යම් වර්ණයෙක්; **සංයොගාදිච**= සංයොගයහට ආදියෙහි වූයේත් වේද? **දීඝො ච**= (යමෙක්) දීර්ඝ වූයේත් වේද; **නිග්ගහීතපරො ච**= නිග්ගහීතය පර කොට ඇති යමෙකුත් වේද; ( **සො**= ඒ වර්ණය තෙම;) **ගුරු**= ගුරු නම් වෙයි; **වඞ්කො** =(ප්‍රස්තාරයෙහි රේඛා හෙයින්) වක්‍ර වේ. **පදන්තො**= ගාථා පාදාන්තවූ; **රස්සො**= හ්‍රස්වය තෙම; **වා**= ව්‍යවස්ථිත විභාෂා වශයෙන්; (**ගුරු**= ගුරුවේ;) **අඤ්ඤො**= යථොක්ත ලක්ෂණයෙන් අන්‍ය වූ; **මත්තිකො**= මාත්‍රිකාය හෙවත් හ්‍රස්වාක්ෂරය තෙම; **ල්**= ලඝු නම් වෙයි; **උජු**= (ප්‍රස්තාරයෙහි රේඛා හෙයින්) ඍජු වේ.

**වි:- සංයොග** නම්? "අස්ව, හස්ම" යනාදි තැන්හි අතර ස්වර රහිත වූ ව්‍යඤ්ජනයෝයි; ඒ සංයොගයහට පෙර

**ගුරු-ලඝු.**

වූව සිටි හ්‍රස්වය ගුරු සංඥ වෙයි. **දීඝ** නම්? "ආ, ඊ" යනාදි ද්විමාත්‍රිකයෝයි; ඒ දීර්ඝාක්ෂරය ද ගුරුසංඥ වෙයි. **නිග්ගහීත** නම්? "අං, කං" යනාදියෙහි බින්දුවර්ණ යයි; එය මාගධියෙහි හ්‍රස්වස්වරයක් පෙරටු කොටම සිටී, ඒ නිග්ගහීතය පර කොට ඇති හ්‍රස්වය ද ගුරු සංඥ වේ.

**පදන්තොවා-** මෙහි වාශබ්දය ව්‍යවස්ථිත විභාෂායෙහි වේ, එහෙයින් කිසි වෘත්තයක පාදාන්තලඝුව ගුරු වෙයි, කිසිවක ගුරු නො වේ, **සමානිකා** දිවෘත්තයන්ගේ පාදාන්තය නිත්‍යයෙන් ම ලඝු වේ. පාදාන්තය නියතලඝුවක් නො වන දෙවන- සතරවන සමපාදාන්ත ලඝුව ගුරුසංඥවේ, ඉන්ද්‍රවජ්‍රා ප්‍රභෘතිවෘත්තයන්ගේ විෂම පාදාන්තලඝුවද ගුරු වෙයි යනු බොහෝ ආචාර්‍ය්‍යවරයන්ගේ පිළිගැනීමයි. වුත්තොදය විවරණයෙහි ද එසේ ම දක්නා ලැබේ. සාහිත්‍ය දර්පණයෙහි වසන්තතිලකාදීන්ගේ ම විෂමපාදාන්තලඝුහුගේ ගුරුත්වය කියනලදී. එහෙත්-

8. පරෙ පාදා'දිසංයොගෙ- යො පුබ්බො ගරුවක්ඛරො
ලහු සවච් විඤ්ඤෙය්‍යො- තදුදාහරණං යථා-

9 දස්සනරසා'නුභවනෙ- නිබද්ධෙධා ජිනස්ස'යං ජනතා
විමහය ජනනී සඤ්ඤත- ක්‍රියා නු කාන්තා'නුරඤ්ජයති.

---

"බහූහි යො භික්ඛු මනුස්සකෙහි
නිමන්තිතො පඤ්චහි භොජනෙහි
භිත්වා සචෙ පුබ්බ නිමන්ත තස්ස
විසාපපනං පඤ්චසු යස්ස කස්ස"

"තතො කාලිඞ්ගාධිපතිස්ස තස්ස
සො 'ඊතනයාතො පරමප්පතීතො"

යනාදි වශයෙන් පැරණි බොහෝ කාව්‍යයන්හි ඉන්ද්‍රවජ්‍රා- උපෙන්ද්‍ර වජ්‍රා පාද ඇති උපජාතිවෘත්තයන්ගේ ද විෂම පාදාන්තලඝුව ගුරුත්ව‍යෙන් සැලකූ බැව් පෙනේ. මෙහි ලා දකීණ මතය ගරු කිරීම යුතු නොවේ. සම්භාවනීය පැරණි කාව්‍යයෝ **අප්‍රාප්ත ගුරු භාවාගත ලඝුතා** දෙෂයෙන් දූෂට යයි කියයුතු බවට පැමිණෙන හෙයිනි.

යථොක්ත වෘත්තයන් හැර පාදාන්තය ගුරක් වියයුතු අන්‍ය වෘත්තයන්ගේ විෂම පාදාන්තයෙහි ගුරක් ම යෙදිය යුත්තේය. නො එසේ වුව හොත් යථොක්තාදෙෂයෙන් දූෂට වන හෙයිනි.

ආයසීාදීන්ගේ ද පාදාන්තලඝුව ගුරු වන බැව් මෙහිම දක්නා ලැබේ. "බුඩො'පි බුඩභාවං- භාවෙත්වා චෙව සච්ජිකත්වාච" යනාදියද සැලකිය යුතුයි.

සංස්කෘතඡන්දෙග්‍රන්ථයන්හි මේ පිළිබඳ මතාන්තර හා බොහෝ විනිශ්චය ද ඇතත් මෙම ශාස්ත්‍රයට එමතෙක් පමණ හෙයින් ඒ මතාන්තරාදිය මෙහි නො දක්වමු.

සංයොගයහට පූර්ව වූ වර්ණයාගේ අතිප්‍රසඞ්ගනිෂෙධය කරනු පිණිස "පරෙ" යනාදීන් පරිභාෂා දක්වත්.

8. **පාදාදිසංයොගෙ**=ගාථා;පාදයාගේ ආදිසංයොගය; **පරෙ**= පරකල්හි; **පුබ්බො**= (ඒ සංයොගයහට) පූර්ව වූ; **යො ගරුවක්ඛරො**= යම් ගුරුඅක්ෂරයෙක් වේද; **සො**= හෙතෙම **කවචි**= කිසි තැනෙක්හි; **ලහු විඤ්ඤෙය්‍යො**= ලඝු වේ යයි දතයුතුයි. **තදුදාහරණං**= ඊට උදාහරණ; **යථා**= මෙසේයි-

9. **ජිනස්ස**=සර්වඥයන් වහන්සේගේ; **දස්සනරසානුභවනෙ**= දර්ශනරසය විඳීමෙහි; **අයං ජනතා**= මේ ජනසමූහයා **නිබද්

**ගෙධා**= බැඳනාලද ලොභඇත්තිය; (**ති**= ඒ එසේමැය;) **විම්හය ජනනී**= (දුටුවන්) විස්මය උපදවින්නී වූ; **සක්කතක්‍රියා**= විනීත වූ කායිකක්‍රියා තොමෝ; **කං නු**= කවර නම් ජනයකු; **නානු රඤ්ජයති**= නො අලවා ද? (අලවන්නී මැයි.)

**වි:- පාදාදිසංයොගෙ**- මෙහි ගාථාපාදයාගේ ආදිසංයොග යයි අවිශෙෂයෙන් කිව ද එය දෙවන- සතරවන සමපාද යන්ගේ ආදිසංයොගය ම විෂය කොට ඇත්තේය, (සංයොගය හට ආදියෙහි වූ වර්ණය ගුරු වේ යයි පළමු කියනලදී) ගාථා පාදයාගේ ආදියෙහි යෙදෙන සංයුක්තවර්ණයට "ක්‍රම යනු **පරසංඥායි**, සමපාද යාගේ ආදිය විෂය කොට ඇති ඒ ක්‍රමසංඥිතය හේතු කොට ගෙන පූර්වපාදාන්තයෙහි ගුරුසංඥ වූ ලඝුව ලඝුවෙක් ම වේ.

**ක්‍රමසංඥය.**

"දස්සනරසානුභවනෙ" යනාදි නිදසුන පථ්‍යායාර්‍යාවෙකි, එහි= සක්කතක්‍රියා,, යන තැන්හි 'ක්‍රි' යන සංයොගයට පූර්ව වූ 'ත' කාරය ගුරුසංඥ වියයුතුයි, එහෙත් ඒ සංයුක්ත වර්ණය චතුර්ථපාදාදියට පැමිණ ක්‍රමසංඥවිය, ඒ ක්‍රමසංඥිතය පර කොට තෘතීය පාදාන්තයෙහි යෙදුන "ත" කාරය ලඝුවක්ම වේ. මේ ආර්‍යාවගේ ද ප්‍රථම- තෘතීය පාදවය ගණතුනකින් හෙවත් මාත්‍රා දොළොසකින් යුක්ත වියයුතුය, ක්‍රමපූර්වය ගුරක් වුව හොත් තෘතීයපාදය මාත්‍රා තෙළෙසක් වීමෙන් වෘත්තභෙදය වේ එහි ආර්‍යාදියෙහි නො ලැබෙන පඤ්චමාත්‍රික ගණයක් පතිත වීමෙන් දුෂ්ට ද වේ. එය ලඝුවක් වුව හොත් නිදෝෂ වේ. මෙපරිද්දෙන් ක්‍රමසංඥිතයාගේ ප්‍රයෝජනය සැලකිය යුතුයි

**සො පුබ්බො ගරුවක්ඛරො**- යි දැක්වූ ගුර්වක්ෂරය පාදාදිසංයොගය පරකල්හි යයි වෙසෙසා කීහෙයින් ක්‍රමපූර්වවූ හ්‍රස්වය විනා දීර්ඝයාගේ ලඝුත්වය නො වේ.

"වෙදඞ්ග පාරඞ්ගත විප්පචාරා
විපස්ස සද්දෙහි ච නිච්චසොසා"

මෙහි "චි" යන ක්‍රම සංඥිතයෙන් පූර්වවුව ද "රා" යන දීර්ඝය ලඝු නො වේ.

**"ක්වචි"** ශබ්දයෙන් පාදාදිසංයොග (=ක්‍රම) පූර්වයාගේ ලඝුත්වය ප්‍රයොගානුසාරයෙන් වනබැව් කීහ. එහෙයින්-

10. විඤ්ඤෙය්‍යා ලොකතො සඞ්ඛ්‍යා- සමුද්දෙ 'සුරසා' දිනං
පාදෙ ඤෙය්‍යො චතුත්ථංසො- පදච්ඡෙදො යතිබ්භවෙ.

---

"කච්ච්"ශබ්දයෙන් පාදාදිසංයොග (=ක්‍රම) පූර්වයාගේ ලඝුත්වය ප්‍රයොගානුසාරයෙන් වන බැව් කීහ. එහෙයින්-

"යෙනා'නුභූතං අමිතඤ්ච යත්ථ-
ප්පතිට්ඨිතං දුක්ඛමනාදිකාලෙ"

යනාදියෙහි ක්‍රමපූර්ව වුවද ගුරුම වේ. මෙසේ සංයොග පූර්වයාගේ ලඝුත්වයට ක්‍රමසංඥිත පාදාදිසංයොගය පමණක් නො ව තීව්‍රප්‍රයත්නයෙන් උසුරුවීම ද හේතු වේ යයි කියනලදී. එය බොහෝ සෙයින් සංස්කෘතයෙහි වේ, මාගධියෙහි නො දක්නා ලැබේ.

දැන් අවශිෂ්ටසංඥපරිභාෂා පරිග්‍රහණය කරනු වෝ "විඤ්ඤෙය්‍යා" යනාදීන් සඞ්ඛ්‍යාදිපරිභාෂා දක්වත්.

10. සමුද්දෙසුරසාදිනං= **සමුද්ද**= සමුද්‍රය; **උසු**= ශරය; **රස × ආදිනං**= රසය යනාදීන් සම්බන්ධ වූ; **සඞ්ඛ්‍යා**= (සතර–පස–සය–යනාදි සඞ්ඛ්‍යා) සංඥතොමෝ; **ලොකතො**= වෘද්ධලොකයාකෙරෙන් හෝ වෘද්ධව්‍යවහාරයෙන්; **විඤ්ඤෙය්‍යා**= දතයුත්තිය. **චතුත්ථංසො**= (වෘත්තයාගේ) සතරවන භාගය; **පාදෙ ඤෙය්‍යො**= පාදයකැ'යි දතයුත්තේය. **පදච්ඡෙදො**= පදසිඳීම; **යති × භවෙ**=යති නම් වේ.*

**වි**:– විඤ්ඤෙය්‍යා ලොකතො **සඞ්ඛ්‍යා සමුද්දෙසුරසාදිනං**– ශාස්ත්‍ර විෂයෙහි එකක් ම ඇතැයි ලොකයා අතර ප්‍රසිද්ධ වූ වස්තුවාචකශබ්දය එකසඞ්ඛ්‍යා වශයෙන් ද-

**භූතසඞ්ඛ්‍යා.** දෙකක් ම ඇතැයි ප්‍රසිද්ධ වූ වස්තුවාචකශබ්දය ද්විසඞ්ඛ්‍යාවශයෙන් ද යොදනු ලැබේ. එසේම තුන- හතර පහආදි සඞ්ඛ්‍යාවෝ ද ඒ ඒ සඞ්ඛ්‍යා ඇති වස්තුවාචකශබ්දයන්ගෙන් ප්‍රකාශ කරනුලැබෙත්. මෙකී සඞ්ඛ්‍යාක්‍රමය ලෙව්හි **භූතසඞ්ඛ්‍යා** යයි ව්‍යවහාර වේ. තජ්ජඥසුන්ගේ ප්‍රයෝජනය සඳහා ඒ ඒ සඞ්ඛ්‍යා වාචක ශබ්ද ස්වල්පයක් මෙහි දක්වමු.

---

* මෙහි "සඤ්ඤා,, යයි යෙදුනු තැන "සඞ්ඛ්‍යා,, යනු ශුද්ධ පාඨය මෙන් පෙනේ. එහි අර්ථය **සමුද්දෙසුරසාදිනං**= සමුද්‍රය ශරය රසය යනාදීන් සම්බන්ධවූ; **සඞ්ඛ්‍යා**= (සතර–පස–සය යනාදි) සඞ්ඛ්‍යා තොමෝ; යි ගතයුතුයි. අප දුටු සියලු පිටපත්වල ම "සඤ්ඤා,, යනු යෙදී තිබෙන හෙයින් ගත්කරු පිළිගත් පාඨය එය ම යයි ද එහෙයින් එය වෙනස් නො කළයුතුයයි ද ආචාර්‍ය්‍යොපදෙශ හෙයින් තුබූ සේ ම තැබීමු.

| | | | |
|---|---|---|---|
| 1. | භූමි, චන්ද, | යනාදිශබ්දයෝ එකසඞ්ඛ්‍යා වාචකයෝයි. | |
| 2. | නෙත්ත; කණ්ණ, හත්ථ, පාද, මුනි, ,, | ද්විසඞ්ඛ්‍යා | ,, |
| 3. | භුවන අග්ගි, ,, | ත්‍රි සඞ්ඛ්‍යා | ,, |
| 4. | අත්ථ, යුග, වණ්ණ, සාගර, වෙද ,, | චතුස්සඞ්ඛ්‍යා | ,, |
| 5. | ඉන්ද්‍රිය, බාණ, විසය භූත, ,, | පඤ්චසඞ්ඛ්‍යා | ,, |
| 6. | උතු, රස, තක්ක, ගුහක, ,, | ෂට්සඞ්ඛ්‍යා | ,, |
| 7. | ඉසි, අස්ස, සෙල, ලොක, සර, ,, | සප්තසඞ්ඛ්‍යා | ,, |
| 8. | අඞ්ග, නාග, හත්ථි, වසු, ,, | අෂ්ටසඞ්ඛ්‍යා | ,, |
| 9. | ඡිද්ද, ගහ, නිධි, වාර, ,, | නවසඞ්ඛ්‍යා | ,, |
| 10. | දිසා, රාවණ, ,, | දශසඞ්ඛ්‍යා | ,, |
| 11. | රුද්ද, ,, | ඒකාදශසඞ්ඛ්‍යා | ,, |
| 12. | ආදිච්ච, මාස, ,, | ද්වාදශසඞ්ඛ්‍යා | ,, |

බිඳුව කියයුතු තැන්හි ආකාශපර්‍ය්‍යායශබ්දයක් යොදනු ලැබේ.

භූතසඞ්ඛ්‍යා හා - ක-ට-ප-යාදි සඞ්ඛ්‍යාදීන්ගේද ව්‍යවහාර යෙහි දී අවසානයෙහි පටන් අඞ්ක සලකුණු කිරීම ශාස්ත්‍රීය වේ. එහෙයින් දෙදහස්සාරසියඅටසැත්තෑවන බුද්ධවර්ෂය කියයුත්තෙහි "සම්බුද්ධෙ **ගජසෙලවංසනයනෙ** ව්‍යාඛ්‍යා කාතා'යං සුභා" යයි යෙදූ විට "ගජ-සෙල-වංස-නයන" ශබ්දයන්ගෙන් පිළිවෙළින් 8-7-4-2- යන අඞ්ක ලැබේ. මේ අඞ්ක සමූහය භූතසඞ්ඛ්‍යාවෙන් යෙදූහෙයින් විපර්‍ය්‍යාස කොට 2478 යයි ගතයුතුවේ.

**පාදේ‍යාඤ්ඤයො චතුත්ථංසො.** "පජ්ජතෙ ඤායතෙ සමුදායො අනෙනාති= පාදො" යනු නිරුක්ති හෙයින් වර්ණසමුදාය මෙයින් අවබෝධ කරනු ලැබේ නු යි පාද නම්. වෘත්තයක් හුගේ සතරවන අංශය (=සතරින් කොටස) යි. මෙහි පාදශබ්දය ඊට පර්‍ය්‍යාය වූ චරණාදි ශබ්දයන්ට ද උපලක්ෂණයි. අවිශෙෂයෙන් චතුර්ථාංශය පාද යයි කිව ද සමචතුර්ථාංශයාගේ පාදත්වය සමවෘත්තයන්ගේද ඇතැම් අර්ධසම-විෂමවෘත්තයන්ගේ ද ලැබේ. එය ලක්ෂණානුසාරයෙන් දතයුතුයි. මාත්‍රා තිසක්ඇති ආර්‍ය්‍යාපූර්වාර්ධයෙහි ප්‍රථමපාදය මාත්‍රා දොළොසකින්ද ද්විතීය පාදය මාත්‍රා අටළොසකින් ද යුක්ත වේ. සෙස්සෙහි දු මෙසේ යථාලාභ යෙන් පාදව්‍යවහාරය සැලකියයුතුයි.

**පාදය.**

**පදච්ඡෙදො යතිඛ්‍යාතො**- ඒ ඒ වෘත්තයන්හි කනට මිහිරි වන සේ දිවට සුව එලවන පරිදි නියතස්ථානයෙහි පදසිඳීම **යති** නම් වේ. "විච්ඡෙද විරාම විරති ,, යනු ද මීට ම නම්. ශ්‍රී සඞ්ඝරක්ෂිත සඞ්ඝරාජයන්

**යතිවිභාගය.**

විසින් ම "වුත්තෙසු සුවිතෙ ඨානෙ- පදච්ඡෙදෙ භවෙ යති", යනුවෙන් සාමාන්‍යයෙන් යතිලක්‍ෂණය දක්වනලදී. යතිය වෘත්ත ලක්‍ෂණයක් නොවතු දු වෘත්තමධ්‍යයෙහි ලැබෙන හෙයින් ද ශබ්ද ගුණ නො පිරිහෙන පරිදි වෘත්තය රචනාකළයුතු හෙයින් ද සොදාහරණයතිවිභාගය සැකෙවින් මෙහි දක්වනුලැබේ.

"යති සබ්බත්ථ පාදන්තෙ- වුත්තා'ඩෙ ච විසෙසතො
පුබ්බා'පරා'නෙකවණ්ණෙ- පදමජ්ඣෙ'පි කත්ථචි"

යති තොමෝ සාමාන්‍යයෙන් චතුර්‍ථාංශසඞ්ඛ්‍යාත සියලු පාදයන්ගේ අන්තයෙහිද, විශෙෂයෙන් පාදචය සඞ්ඛ්‍යාත වෘත්තයාගේ අර්‍ධයෙහි හෙවත් පාද දෙකක්හුගේ අන්තයෙහි ද වන්නිය, කිසි තැනෙක (යතියට) පූර්‍ව වූද පරවූද නොයෙක් වර්‍ණ ඇති පදයන්ගේ මධ්‍යයෙහි ද යතිය වේ.

(1) **සබ්බත්ථ පාදන්තෙ-** සාමාන්‍යයෙන් සියලු තැන්හි ම පාදාන්තයෙහි යතිය වේ. පාදාන්තයතියට නිදසුන් මෙසේයි-

"තිසිත්තනචිතෙන වජිරාසනසම්ං
තිලොකනාථෙ සතරුමරෙහි
විධියමානෙසු මහාමහෙසු
සමාරසෙනො සමුපාගමාසි"

මෙහි සියලු පාදයන්හි ම අන්තයෙහි විරාමය විය. විරුද්ධොදාහරණ මෙසේයි-

"සකිමපි දස්සනං නාථ- ස්ස කායං අමතාවහං"

අෂ්ටාක්‍ෂරපාද ඇති මේ පථ්‍යාවකත්‍රයෙහි "නාථස්ස" යන පදයාගේ මධ්‍යයෙහි යතිය තැබීමෙන් දූෂ්‍ය විය. යතියෙන් පරව අනෙක වර්‍ණත්වය නැතිහෙයිනි.

(2) **වුත්තාඩෙ ච විසෙසතො-** පාදචයසඞ්ඛ්‍යාතවෘත්තයාගේ අර්‍ධයෙහි විශෙෂයෙන් යතිය වේ යයි කිහෙයින් එහි සන්ධි- සමාසාදියෙන් යුක්ත නො වූ ප්‍රකටවිභක්ති ඇති පදයක් ම යෙදිය යුත්තේය. නිදසුන් මෙසේයි-

"වාමා'මන්දමකරන්ද- බින්දුසන්දොහසුන්දරං
උල්ලොලපදුමාකි'ණ්ණ- විතානං'වා'සි අම්බරං"

මෙහි ද්විතීය පාදන්ත වූ පූර්‍වාර්‍ධයාගේ අවසානයෙහි "සුන්දරං" යන පදය තෘතීය පාදාදිය සමග සන්ධියට ද සමාසයට ද නිමිති ඇතත් විශෙෂ යතිස්ථානය වූ හෙයින් සන්ධි- සමාස නොවීය. සාමාන්‍යයතිස්ථාන වූ දෙවන- තුන්වන පාදයන්ගේ අන්තයෙහි

සමාසවශයෙන් ලොප් ව අප්‍රකට වූ විභක්ති ඇති "මකරන්ද, ආකිණ්ණ" යන පදයන්ගේ අන්තයෙහි යති විය.

ප්‍රකට විභක්ති ඇතිබවට ප්‍රත්‍යුදාහරණ මෙසේයි.

"විජිතමකරකෙතුං ලොකකෙතුං නමඞ්ගී-
රසමමතපදාසිං බ්‍රහ්මදෙවාදිමොලි-
විහිතවරණරෙණුං භානුබන්ධුං ජනානං
දුරිතතුහිනතාපිං සක්‍යසීහං භජවෙහා"

මෙහි ද්විතීයපාදාන්තයෙහි සමාසයෙන් ලොප් වූ විභක්ති ඇති බැවින් දුෂ්ටවිය.

(3) පදච්ඡේදය යතියයි කීහෙයින් පදමධ්‍යයෙහි යති නො වේ ද? යනආශඞ්කායෙහි ලා **පුබ්බාපරානෙකවණ්ණපදමජ්ඣෙපි** යනු දක්වනලදී. පදමධ්‍යයෙහි යති පැමිණි කල යතියට පූර්ව වත් පරවත් යටත්පිරිසෙයින් වර්ණ දෙකක් හෝ තිබියයුතුයි. නොවුවහොත් දුෂ්ට වේ. උදාහරණ-ප්‍රත්‍යුදාහරණ මෙසේයි-

"තං නමෙ සිරසා චාමි- කරවණ්ණං තථාගතං
සකලා'පිදිසා සිඤ්ච- තී'ව සොණ්ණරසෙහි යො.

මෙහි ප්‍රථමපාදාන්තයතිය "චාමිකරවණ්ණං" යන පදයාගේ මධ්‍යයෙහි "චාමි" යී අකුරු දෙකක් ඉක්මවා සිටියේය. පරව ද අකුරු දෙකකින් වැඩි විය, එහෙයින් එය නිර්දොෂයි. තෘතීයපාදාන්තයෙහි "සිඤ්චති" යන පදයාගේ මධ්‍යයෙහි "සිඤ්ච"යි අකුරු දෙකක් ඉක්මවා යතිය සිටි නමුත් එයින් පරව "ති" යී එක අකුරක් වූ හෙයින් දූෂ්ට විය.

**සබ්බත්ථ-** යන්නෙන් පදමධ්‍යයෙහි යතිය සියලු තැන්හි ම නො වන බැව් කීහ. එහෙයින් අනුෂ්ටුභ් ආදි කිසි ඡන්දසක හැර පාදාන්තයතිය පදමධ්‍යයෙහි තැබුව හොත් සදෙස් වේ. "විජිතමකරකෙතුං" යනාදි ගය ම ඊට නිදර්ශනයි. එහි ප්‍රථම පාදාන්තයෙහි හා ද්විතීය පාදාදියෙහි යෙදුන "අඞ්ගී- රසං" යන පදයාගේ මධ්‍යයෙහි යතිය පැමිණ අනෙකවර්ණත්වය තිබුනත් යතිහීනයෙන් දූෂිත විය.

(4) **පදමජ්ඣෙපි-** යන තැන්හි "අපි" ශබ්දයෙන් පාදමධ්‍යයෙහි ලැබෙන සමුද්‍රාදි පදාන්තයතිය සඞ්ග්‍රහ කෙරෙති. **සමුද්‍රාදි පද නම්?** ඒ ඒ වෘත්තයන්ගේ පාදමධ්‍යයෙහි යති තැබීමට නියම කළ ස්ථානයයි. ඒ එසේමැයි- "මන්දක්කන්තා මහනතනතගා ගො සුගුත්තිස්සකෙහි" යනු මන්දාක්‍රාන්තාවෘත්තයෙහි ලක්ෂණයි, එහි යුග

(4) උතු (=6) අස්ස (=7) යන මෙයින් යති වේ යයි කියනලදී. එසේ පාදමධ්‍යයෙහි යති නියමකළ තැන්හි ප්‍රකට විභක්ති ඇති පදයෙහි ද අප්‍රකට (සමාසවශයෙන් ලොප් වූ) විභක්ති ඇති පද යෙහි ද, යතියෙන් පූර්‍ව වූත් පර වූත් නොයෙක් වර්‍ණ ඇති පදමධ්‍ය යෙහි ද යතිය වේ. උදාහරණ-

. . . 4. . . . . . 6. . . . . . . 7.

"තස්මිං සුඛො- දතියවරණා- සතතවිතෙතා භවෙය්‍ය" යන මන්දාක්‍රාන්තාපාදයෙහි අකුරු සතරකින් පරව "සුඛො-දතිය" යන පදයාගේ මැද යතිය විය, එය පූර්‍වාපර අනෙකවර්‍ණත්වය ඇති හෙයින් නිර්දොෂයි ඒ ප්‍රථම යතියෙහි සිට අකුරු සයකින් පරව "වරණ" ශබ්දයාගේ අන්තයෙහි යතිය විය, එය සමාසයෙන් ලොප් වූ විභක්ති ඇති පදයෙහිය. දෙවන යතියෙහි සිට අකුරු සතකින් පරව පාදාන්තයතිය විය. සමුද්‍රාදිපදාන්තයතියද පදමධ්‍ය යෙහි පැමිණීමිට අනෙකවර්‍ණත්වය නොවී නම් දූෂ්‍ය වේ, නිදසුන් මෙසේයි-

"ඛන්ධා නං නි-බ්බුති භගවතො- ඝොසන්ති'ච්චෙව හමත්‍රං'
විජ්ජුම්මාලා-සු ච ගලගලා- යන්තියා වුඩ්ඩියා'හං" යන

මන්දාක්‍රාන්තාපාද දෙක්හි ම ප්‍රථමයතිය පදමධ්‍යයට පැමිණ පූර්‍වාපර අනෙක වර්‍ණත්වය නැතිහෙයින් යතිභිත්තයෙන් දූෂිත විය.

"සරො සන්ධිම්හි පුබ්බන්තො- විය ලොපෙ විභත්තියා
අසන්දෙහා හි සන්දෙහා හත්- යාදෙසාදි පරාදිව"

(5) සමාස වශයෙන් විභක්ති ලොපය ඇති තැන්හි සන්ධියට පැමිණි ස්වරය යතියෙන් පූර්‍වපදයාගේ අන්තය හෙවත් පූර්‍වාව යවය මෙන් වේ. විභක්තිලොපය නැති තැන්හි සන්ධි ස්වරය පරාව යවය හෙවත් යතියෙන් පරපදයාගේ ආදිය මෙන් වේ. නිදසුන් මෙසේයි-

"නමෙතං සිරසා සබ්බො- පමා'තීතං තථාගතං
යස්ස ලොකග්ගතං පත්තා-ස්සොපමා න හි යුජ්ජති"

මෙහි "සබ්බා ච සා උපමා" යී කර්මධාරය සමාස වශයෙන් විභක්තිලොපය කොට "සබ්බොපමා" යී සන්ධිකරනලදී. එහි සන්ධි ස්වරය වූ අසවර්ණා දෙශව පැමිණි "ඔ" කාරය යතියෙන් පෙරටව සිටියේය.

"පත්තස්ස × උපමා" යන විසන්ධියෙහි සවිභක්තික පදයාගේ සන්ධිස්වරය යතියෙන් පරව සිටියේය.

කිසි තැනෙක සවිභක්තික පදයාගේ සන්ධිස්වරය යතියෙන් පූර්ව ද සිටී. උදාහරණ-

"එවං නිමන්තිතො තෙනා- ධිවාසෙත්වා මහාමති"
"විසෙසමධිකං යෙනා-ධ්‍යත්‍ථමෙතං භවෙ යථා"

මෙහි "තෙන" "යෙන" යන තෘතීයාන්තයන් හා සන්ධි වූ ස්වරය පූර්වාවයව විය. මෙබඳු තැන්හි සන්ධිස්වරය පර වී නම් අනෙක වර්ණත්වය නැතිවීමෙන් දූෂ්‍යවේ.

(6) **යාදෙසාදි පරාදිව-** ආදෙශවශයෙන් සන්ධියට පැමිණි යකාරාදිය යතියෙන් පරපදයාගේ ආදිය මෙන් වේ. උදාහරණ මෙසේයි-

"මුනින්දං තං සදා වන්දු- ම්‍යනන්තමති මුත්තමං"

මෙහි "වන්දුමි × අනන්ත" යී ඉකාරයට ආදෙශ වූ යකාරය යතියෙන් පරව ද්විතීය පාදයාගේ ආදියෙහි පතිත විය. මකාරය ද යකාරය හා බැඳුනු හෙයින් පරාවයව විය. මෙබඳු තැන්හි අනෙක වර්ණත්වය අපෙක්ෂා නො කෙරේ. එහෙයින් "පත්ත-ස්ස × උපමා" "වන්දු-මි × අනන්ත" යී අකුරු දෙකක් ඉක්මවා එක් එක් අකුර ඉතිරිව සිටියදී පැමිණි යතිය දුෂ්ට නො වීය. ආදි ශබ්දයෙන් ගත් වකාරාදීන්ට උදාහරණ-

"ජලනිධි මහිරුළ්හ- සෙවසු ආද්‍යය ධාතුං"
"පරත්‍ථමෙව අත්‍ථාන- මිතිපස්සති සො මුනි"

මෙහි ආදෙශවශයෙන් පැමිණි වකාර මකාරයන්ගේ පරාදිත්වය ද පළමු සෙයින් සැලකිය යුතුයි.

"වාදී පුබ්බ පදන්තාව- නිච්චං පුබ්බ පදස්සිතා
පාදයො නිච්ච සම්බන්ධා- පරාදිව පරෙතතු"

(7) නිත්‍යයෙන් පූර්වපදය ඇසුරු කොට සිටින්නාවූ හෙවත් පදාවසානයෙහි යෙදෙන්නාවූ වාදිනිපාතයෝ යතියෙන් පූර්වපදයාගේ අන්තය මෙන් වෙති. ඔවුහු යතියෙන් පර කොට නො යෙදිය යුත්තාහුය. උදාහරණ-

"යස්ස මෙත්තා ච පඤ්ඤා ච- නිස්සීමාතිවිජම්භති"

මෙහි චකාරයෙන් පරව යතිය විය. එහෙයින් නිර්දෝෂයි.

ප්‍රත්‍යුදාහරණ මෙසේයි-

"මහාමෙත්තා මහා පඤ්ඤා- ච යත්‍ථ පර මොදයා"

මෙහි චකාරය යතියෙන් පරව සිටිහෙයින් දූෂිත විය. තවද- වාදි යනු නිහෙයින් නිපාතයන් අතුරෙහි ච,දින්ට වඩා වෙනස් පැවතුම් ඇති තාදීන් පිළිබඳව මෙකී නියමය නොවේ.

11. සමමඩ්ඪසමං වුත්තං- විසමං චා'පරං තිධා
සමා ලක්ඛණතො පාද-චත්තාරො යස්ස තං සමං-

"දිස්වා න තං අච්ඡරියං තිගණ්ඨා- ඉච්චබ්‍රවුං පණ්ඩුනරාධිපංතං
විජ්ජාබලං සෙඛිසුතස්ස එතං-න ධාතුයා දෙව අයං පභාවො"

මෙහි යතියෙන් පරව සිටි "ඉති, න" යන නිපාත දෙක ම දුෂ්ට නොවූහ.

"තිස්සාය පුබ්බලිඛිත- ඤ්චිධ වායමාමි"

මෙහි "ච" යන නිපාතය යතියෙන් පර වුව ද සඞ්ඛ්‍යාවරය භද්ගත හෙයින් නිදෙස් විය.

8. පාදයො- පදයන්ගේ ආදියෙහි ම යෙදෙන්නාවූ පාදි උපසර්ගයෝ යතියෙන් පරව සිටි පදයාගේ ආදිය මෙන් වෙයි. නිදසුන්- "යස්ස" යනාදි ගාථාඞියෙහි "නිස්සීමාති විජම්භති" යන මෙහි නිස්සීමා සී "නි,, යන උපසර්ගය යතියෙන් පරව සිටියේය.

"සම්බුද්ධ මහි වන්දිත්වා- විමුත්තං ජාතිදුක්ඛතො
විභාගං ජාති දුක්ඛස්ස- පවක්ඛාමි සමාසතො"

මෙහි ද "වි, ප" යන උපසර්ග දෙකම යතියෙන් පරව යෙදුනාහුය.

විරුඬොදාහරණ මෙසේයි-

පණමාමි ජිනං තං ප-වරං වරගුණාලයං"

මෙහි "පවරං" යන පදයෙහි "ප" යන උපසර්ගය යතියෙන් මුල යෙදුන හෙයින් සදෙස් විය.

මෙසේ මේ මාගධ ඡන්දශ්ශාස්ත්‍රයට යොග්‍ය වූ යති විභාගය උදාහරණ සහිතව එක දෙශයකින් දක්වන ලද්දේය, මෙහි නොකී ප්‍රභෙද ද සුදුසු පරිද්දෙන් විමසිය යුතුයි

"එවං යථා යථුබෙබහො- කවීනං නොප ජායතෙ
අවුතෙතසු'පි සාතබ්බා- තථා සුතිසුඛා යති"

යම් යම් පරිද්දෙකින් කවීන්ට උවෙගය නූපදනේ ද ඒ ඒ පරිද්දෙන් නො කී තැන්හි ද කනට මිහිරිවූ යතිය කටයුත්තීය.

සංක්‍ෂෙපයෙන් වෘත්තභෙද හා ලක්‍ෂණ දක්වනු පිණිස "සමං" යනාදි දෙගය කියත්.

11. **සමං වුත්තං**= සමවෘත්තය; **අඩ්ඪසමං වුත්තං**= අර්ධසම වෘත්තය; **අපරං**= අන්‍ය වූ; **විසමං ච වුත්තං**= විෂම වෘත්තය දැයි; **තිධා**= (වෘත්තය) තුන්වැදෑරුම් වේ. **යස්ස**= යම් වෘත්තයක්හුගේ;

12. යස්ස'නන්තිමෙන දුතියො- තතියෙනා'දිමො සමො
තදඩ්ඪසමමඤ්ඤන්තු- භින්නලක්ඛණ පාදිකං ,,

13. පාදමේක'ක්ඛරා'රබ්භ-යාව ඡබ්බීසත'ක්ඛරො
භවෙ පාදෙහි තං ඡන්දං-නානා නාමොදිතං තතො-

---

**චත්තාරො පාදා**= පාද සතර; **ලක්ඛණතො**= ලක්ෂණ වශයෙන්; **සමා**= සම වෙත්ද; **තං**= ඒ වෘත්තය; **සමං**= සමවෘත්ත නම් වේ-

12. **යස්ස**=යම් වෘත්තයක්හුගේ; **දුතියො**= දෙවන පාදය තෙම; **අනන්තිමෙන**= අන්ත්‍යයෙහිවූ (සතරවන) පාදය හා; **සමො**=(ලක්ෂණ හෙයින්) සමවේද; **ආදිමො**= ආදියෙහි වූ පාදය තෙම; **තතියෙන**= තුන්වන පාදය හා; **සමො**= සමවේද; **තං**= ඒ වෘත්තය; **අඩ්ඪසමං**= අඞ්ඪසම නම් වේ; **තු**= නැවත; **අඤ්ඤං**= අන්‍ය වූ විෂම වෘත්තය; **භින්නලක්ඛණ පාදිකං**=(එකිනෙකට) වෙනස්වූ ලක්ෂණයෙන් යුත් පාද ඇත්තේ වේ.

**වි:**- පාද සඞ්ඛ්‍යාත පදයෙන් කරන ලද්දේ හෝ ඔවුන්ට හිත වූයේ "පද්‍ය,, නම් වේ. ඒ පද්‍යය වෘත්ත-ජාතිවශයෙන් විවිධ බැව් යට කියන ලදී. එහි නියතමාත්‍රා ඇති ආයඞ්ඩාදිය ජාති නම්. අක්ෂර සඞ්ඛ්‍යාත වූ නියතලඝුගුරු වින්‍යාස ඇති උක්තා-අත්‍යුක්තාදිය වෘත්ත නම්.

පද්‍යයන්ගේ දෙවෙනි සතරවෙනි ආදි යුග්මස්ථානයට පැමිණි ගණපාදාදිය **සම** නම් වේ, **ඔජ** යනු ද මීට ම නමකි. පළමුවන තුන්වන ආදි අයුග්මස්ථානයට පැමිණි ගණ- පාදාදිය **විෂම** නම් වේ, **අනොජ** යනු ද මීට නමකි.

**සමාඞ්ඪසම** යම් වෘත්තයක පාද සතර ම සමාන වූ ගුරු-ලඝු වින්‍යාස සඞ්ඛ්‍යාත ලක්ෂණ ඇත්තේද එබඳු වූ "තනුමධ්‍යාදි" වෘත්තයෝ **සමවෘත්ත** නම් වෙති. යම් වෘත්තයක තුන්වන විෂම පාදය පළමුවන විෂමපාදය හා ද, සතරවන සමපාදය දෙවන සමපාදය හා ද ලක්ෂණයෙන් සමාන වේ නම් එබඳු වූ "ද්‍රැතමධ්‍යා" දි වෘත්තයෝ **අඞ්ඪසම** නම් වෙති. **විෂමවෘත්ත.** යම් වෘත්තයක පාදසතර ම එකිනෙකට අසමාන ලක්ෂණයෙන් යුක්ත වී නම් මේ ඡන්දශශාස්ත්‍රයෙහි ගාථානාමයෙන් දක්වන එබඳු වෘත්තයෝ **විෂම** නම් වෙත්.

දැන් පාදයන්ගේ ස්වරූප දක්වති " පාදං " යනාදීන්-

13. **එකක්ඛරං පාදං ආරබ්භ**= එක් අකුරක් ඇති පාදය පටන්; **යාව** යම්තාක්; **ඡබ්බීසතක්ඛරො**= සවිසි අකුරක් ඇති

14. දණ්ඩකා චණ්ඩවුට්ඨ්‍යා'දි-පාදෙහි ඡගි තීහි තු
ගාථා'ති ච පරත්ථෙ'වං-ඡන්දසඤ්ඤා පකාසිතා.

---

පාදය වේ ද; (**තාව**= ඒතාක්;) **පාදෙහි**= (එතෙකි අකුරෙන් වඩනාලද) පාදයන් කරණකොට ගෙන; **නානානාමොදිතං**= (උක්තාදි වූ) විවිධනාමයන්ගෙන් කියනලද; **තං ඡන්දං භවෙ**= ඒ ඡන්දස් වන්නේ යයි ද; **තතො**:= ඒ සවිසිවන ඡන්දසින් මත්තෙහි-

14. **චණ්ඩවුට්ඨ්‍යාදි**= චණ්ඩවෘෂ්ටිප්‍රපාතාදි වූ; **දණ්ඩකා** = දණ්ඩක වෘත්තයෝ වෙත් යයි ද; **තු**= නැවත; **ඡගි තිහි පාදෙහි**= සපාදයකින් තුන්පාදයකින් යුක්ත වූවා; **ගාථා ඉති ච**= ගාථා නම් වන්නී යයි ද; **එවං**= මෙසේ; **පරත්ථ**= පරශාස්ත්‍රයෙහි; **ඡන්ද, සඤ්ඤා**= ඡන්දස්සංඥ තොමෝ; **පකාසිතා**:= ප්‍රකාශ කරනලද්දීය.

**උක්තාදි ඡන්දස්.**

**වි**:- මතු සමවෘත්තකථනයෙහි දී උක්තාදි පුම්ඡන්දස් පස නො ගන්නාහෙයින් " පාදමේකක්ඛරාරබ්භ " යයි කියනු විරුද්ධ නො වේ ද යත්? නො වේ. ප්‍රස්තාරාදි ෂට්ප්‍රත්‍යයෙහි යෙදෙන හෙයිනි. එහි පිඞ්ගලයන්ගේ ලක්ෂණකථනය ඇසුරුකරනලදී මෙහි ලා කෙදාරයන් ගත් මග ඇසුරුකරන්නාවූ ආචාර්‍ය්‍යපාදයෝ පරසංඥ දක්වන්නාහු එකාක්ෂරච්ඡන්දස පටන් සාමාන්‍යයෙන් සමවෘත්තච්ඡන්දස් ද ගත්හ. එහෙත් ග්‍රන්ථයාගේ ලඝුත්වය සඳහා ඒ උක්තාදි ඡන්දස් මෙතැන්හි සංඥ හෙයින් නොදක්වූහ ආධුනිකයන්ගේ ප්‍රයෝජනය පිණිස ඔවුහු මෙහි සඞ්ග්‍රහ කරනු ලැබෙත්.

1. වුත්තා'ච්චුත්තා තථා මජ්ඣා-පතිට්ඨා'ඤ්ඤා සුපුබ්බිකා
ගායත්‍යුණ්හි'නුට්ඨුභා ච-බ්‍රහතී පන්තියෙව ච

2. තුට්ඨුභා ජගතී චෙව-ඤෙය්‍යා'තිජගතී තථා
සක්කරී චා'තිපුබ්බා සා-අට්ඨී සෙවා'තිපුබ්බිකා:

3. ධුති චා'තිධුතී චෙව-කතී පකති චා'කති
විකති සඞ්කති චා'භි-කති චෙව තථොක්කති

4. ඉති ඡබ්බීසතිච්ඡන්ද-සඤ්ඤා භොගින්දදීපිතා
තතො කිඤ්චි ගහෙත්වාන-භාසිතා මාගධොචිතා

1. උක්තා 2. අත්‍යුක්තා 3. මධ්‍යා 4. ප්‍රතිෂ්ඨා 5. සුප්‍රතිෂ්ඨා 6. ගායත්‍රී 7. උෂ්ණිහ් 8. අනුෂ්ටුභ් 9. බෘහතී 10. පඞ්ක්ති 11. ත්‍රිෂ්ටුභ් 12. ජගතී 13. අතිජගතී 14. ශක්වරී 15. අතිශක්වරී 16. අෂ්ටි 17. අත්‍යෂ්ටි 18 ධෘති 19. අතිධෘති 20. කෘති 21. ප්‍රකෘති 22. ආකෘති 23. විකෘති 24. සංකෘති 25 අභිකෘති 26. උත්කෘති යන මොවුහු සමවෘත්තයන් පිළිබඳ සවිසි ඡන්දස් වෙති. මොවුන

තුරෙන් මාගධිකච්ඡන්දශ්ශාස්ත්‍රයට අතිශයින් ප්‍රයෝජන වූයේ යථා ස්ථානයෙහි මතු පහළ වේ.

ඡන්දස් පිළිබඳ ඒකාක්ෂරාදි නියමය එක් එක් පාදයක්හුගේ වශයෙනි. එහෙයින් ඒකාක්ෂරයයි කියනලද උක්තාච්ඡන්දස පාදයක් පාසා එක් එක් අකුරක් ඇතිහෙයින් චතුරක්ෂරයකින් යුක්ත වේ. එසෙයින් ම අත්‍යුක්තාදි ඡන්දස් ද ක්‍රමයෙන් අකුරු සතර සතර අධික වෙති. එසේ අධික වීමෙන් පාදයක අකුරු සවිස්සක් ඇති උත්කෘතියෙහි පාදසතරට අකුරු එක්සියසතරෙකි.

**දණ්ඩකා චණ්ඩවෘෂ්ට්‍යාදි**- ෂඩ්විංශාක්ෂරච්ඡන්දසින් මත්තෙහි දණ්ඩකයෝ වෙතැයි කීහෙයින් අකුරු සත්විස්සක් ඇති පාදයෙහි පටන් "චණ්ඩවෘෂ්ටිප්‍රපාතා"දි දණ්ඩකයන් ලැබෙනබව සැලකියයුතුයි. පරශාස්ත්‍රයෙහි දක්වන ලද ඒ දණ්ඩකයෝ ද මෙහි සම්ප්‍රකාරයෙන් උචිත නො වන හෙයින් ලක්ෂණවශයෙන් නො දක්වූහ. එහි "චණ්ඩවෘෂ්ටිප්‍රපාත" නම් වූ ප්‍රථම දණ්ඩකය නගණ දෙකකින් හා රගණ සතකින් යුක්ත වේ, එහෙයින් මෙහි අකුරු සත්විස්සකි. අර්ණාදි දණ්ඩකයෝ පිළිවෙළින් එක් එක් රගණයෙන් වැඩි තාහු වෙති. ටීකාකාරයෝ වනාහි චණ්ඩවෘෂ්ටිප්‍රපාතයෙන් මත්තෙහි "අර්ණ අර්ණව පලව ව්‍යාල ජීමූත ලීලාකර උද්දාම සිංහ සමුද්‍ර භුජඞ්ග" යයි දණ්ඩක දසයක් දක්වා ඉන් මත්තෙහි **ප්‍රචිත** නම් වෘත්තයෝ වෙති'යි කීහු. අන්‍යයෝ තදන්‍ය වූ ද දණ්ඩක සංඥා දක්වා සෙස්ස ප්‍රචිත යයි කීහ. ඔවුන්ගේ සංඥා හා ලක්ෂණ මෙසේයි-

**දණ්ඩකවෘත්ත.**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | චණ්ඩවෘෂ්ටිප්‍රපාත | නගණ 2 | රගණ | 7 යි | 15. | කාසාර | නගණ 2 | රගණ | 21 යි. |
| 2. | අර්ණ | නගණ 2 | රගණ | 8 | 16. | විස්තාර | ,, | ,, ,, | 22 |
| 3. | අර්ණව | ,, | ,, ,, | 9 | 17. | සංහාර | ,, | ,, ,, | 23 |
| 4. | ව්‍යාල | ,, | ,, ,, | 10 | 18. | නීහාර | ,, | ,, ,, | 24 |
| 5. | ජීමූත | ,, | ,, ,, | 11 | 19. | මන්දර | ,, | ,, ,, | 25 |
| 6. | ලීලාකර | ,, | ,, ,, | 12 | 20. | කේදාර | ,, | ,, ,, | 26 |
| 7. | උද්දාම | ,, | ,, ,, | 13 | 21. | සාධාර | ,, | ,, ,, | 27 |
| 8. | ශංඛ | ,, | ,, ,, | 14 | 22. | සත්කාර | ,, | ,, ,, | 28 |
| 9. | ආරාම | ,, | ,, ,, | 15 | 23. | සංස්කාර | ,, | ,, ,, | 29 |
| 10. | සංග්‍රාම | ,, | ,, ,, | 16 | 24. | මාකන්ද | ,, | ,, ,, | 30 |
| 11. | සුරාම | ,, | ,, ,, | 17 | 25. | ගොවින්ද | ,, | ,, ,, | 31 |
| 12. | වෛකුණ්ඨ | ,, | ,, ,, | 18 | 26. | සානන්ද | ,, | ,, ,, | 32 |
| 13. | සොත්කණ්ඨ | ,, | ,, ,, | 19 | 27. | සන්දෝහ | ,, | ,, ,, | 33 |
| 14. | සාර | ,, | ,, ,, | 20 | 28. | නන්ද | ,, | ,, ,, | 34 |

මෙසේ එක් එක් රගණය වැඩීමෙන් නොයෙක් නම් ඇති දණ්ඩකයෝ තුන්සිය විසිපහක් (=325) වෙති, අන්තිම වෘත්ත යෙහි නගණ දෙකක් හා රගණ තුන්සිය එක්තිසක් ද වෙති, පාදයෙක් අකුරු නවසිය අනූනවයකින් යුක්ත වේ.

සොඳුරයෝ නගණ දෙකක් හා යගණ සතක් ඇත්තේ **ප්‍රචිත** නම් දණ්ඩකය වේ යයි කීහු. මෙහි ද පෙරසේ ම එක් එක් යගණය වැඩීමෙන් දණ්ඩක නිපදවිය හැකිසි. මේ හැර භින්නලක්‍ෂණ ඇති **සිංහවික්‍රාන්තා**'දි නම් ඇති දණ්ඩකවෘත්තයෝ ද වෙති. ඔවුන්ගේ ලක්‍ෂණාදිය ප්‍රයොජන නො වන හෙයින් නොදක්වමු. සියලු දණ්ඩකයෝ ම සවිස්සකින් අධික වූ අකුරු ඇත්තාහුය, ඌනාක්‍ෂර පාද ඇත්තේ උක්තාදිඡන්දස්හි ඇතුලත් වේ.

**ගාථා.**

පරශාස්ත්‍රයෙහි සපාදයකින් තුන්පාදයකින් යුක්ත වූයේ **ගාථා** නම් වේයයි කිහ. මාත්‍රා–වර්ණවශයෙන් විවිධ වූ ඡන්දස්හි විශෙෂ නාමයෙන් කියන ලද්දවුන් හැර සෙස්ස ගාථා නම් වෙති'යි කිහෙයින් පාදසතරක් ඇත්තාවූ ද අඩු වැඩි අක්‍ෂර සඞ්ඛ්‍යා ඇති පද්‍යය ආර්‍යාදි විශෙෂනාමයකින් නො කියන ලද්දක් වූයේ නම් ගාථා ම වේ. ඊට නිදසුන් සංස්කෘත ජනෙයුග්‍රන්ථයන්ගෙන් ම දතයුත්තේය. එකි ලක්‍ෂණයෙන් පාලියෙහි ලැබෙන කතිපය නිදසුන් කෙනෙක් මෙහි දක්වනු ලැබේ.

"යානි කරොති පුරිසො - තානි අත්තනි පස්සති
කල්‍යාණකාරි කල්‍යාණං– පාපකාරි ච පාපකං
යාදිසං වපතෙ බීජං– තාදිසං හරතෙ ඵලං"

ප්‍රවචනයෙහි සියලු පද්‍යයෝ ම සාමාන්‍යයෙන් ගාථා නමැයි මතු කියන්නේය. එකාක්‍ෂරාදිඡන්දස්වල සතර පාදයන්ගේ වශයෙන් අකුරු සතරින් සතරින් වැඩීම සාමාන්‍ය ලක්‍ෂණ යැසි. මෙසේ චාදශාක්‍ෂර වූ **ජගති** ඡන්දස අකුරු අටසාලිසකින් යුක්ත වේ. මෙහි දැක්වූ පද්‍යයෙහි ද අකුරු අට සාලිසකි. එහෙයින් සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන් ජගති වියහැක. එහෙත් "පාදෙ ඡෙදයො චතුත්ථංසො" යන විශෙෂ ලක්‍ෂණ වශයෙන් එය සිවුපද නො ව සපද වූයෙන් විශෙෂ නාම වශයෙන් ද ගාථාවක් ම විය.

"එතං ච සල්ලං පටිගච්ච පස්සතො
අහං කරොමීති න තස්ස හොති.
පරො කරොතීති න තස්ස හොති"

මේය ත්‍රිපාදගම්භා ගාථා–වෙකි.

15. අනන්තරොදිතං චා'ඤ්ඤ- මෙතං සාමඤ්ඤනාමතො
ගාථා මිච්චෙව නිද්දිට්ඨා- මුනින්ද වචනෙ පන.

16. විසෙසනාමතො කිඤ්චි- ගහෙත්වා සබ්බථො'චිතං
දස්සයිස්සාම'හන්තෙත්ථ- නාමානා'විභවිස්සරෙ.

**ඉති වුත්තොදයෙ ඡන්දසි සඤ්ඤා පරිභාසා නිද්දෙසො නාම පඨමො පරිච්ඡෙදො.**

"යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගනස්ස
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො"

මෙය පාද සතරකින් යුක්ත වුව ද භින්න වූ අක්ෂර සංඛ්‍යා ඇති හෙයින් ගාථාවක්ම වේ. කිසිවෙක් කියන පරිදි උපජාති යෙක් ද නො වන්නේ මය. විෂම වර්ණ හා යති ඇති ජාතීන්ගේ පාදමිශ්‍රණයෙහි උපජාති නො ලැබෙන හෙයිනි. මෙබඳු ගාථා පාලියෙහි ඉතා සුලභ වෙති, පඤ්චපාද ෂට්පාද ඇති ගාථා ද පාලියෙහි දුර්ලභ නො වෙත්.

පාල්‍ය=නුරූප වූ නාමාරොපණය පිණිස දැන් "අනන්තර" යනාදි ගය ප්‍රකාශකෙරෙත්.

15. **අනන්තර × උදිතං ච**= ("පාදමෙකක්ඛරාරබ්භ" යනාදීන්) අනන්තරයෙහි කියනලද වර්ණච්ඡන්දස්ද; **අඤ්ඤං**= අන්‍යවූ (ආර්‍ය්‍යාදි) මාත්‍රාච්ඡන්දස් ද යන; **එතං**= මේ සියල්ල; **මුනින්ද වචනෙ පන**= මුනීන්ද්‍ර වචනයෙහි වනාහි; **සාමඤ්ඤනාමතො**= සාමාන්‍ය නාම හෙයින්; **ගාථා × ඉති × එව**= ගාථා යයි කියා ම; **නිද්දිට්ඨා**= දක්වන ලද්දීය.

**වි:-** සාමාන්‍යයෙන් එකාක්ෂර පාදාදි සමවෘත්ත ඡන්දස් ද දණ්ඩක වෘත්තයෝ ද දක්වන ලද්දාහුය. ආර්‍ය්‍යාදි මාත්‍රාච්ඡන්දස්ද අර්ධසමවෘත්ත හා වක්ත්‍රජාති ද මතු දක්වන්නාහුය. මේ සියල්ල ම මුනීන්ද්‍රවචනාත්මක වූ මාගධියෙහි අවිශෙෂයෙන් **ගාථා** යයි කියාම සාමාන්‍යනාමයෙන් ව්‍යවහාර කරනු ලැබේ.

සියලු වෘත්ත ම ප්‍රවචන පාලියෙහි ගාථා වුව හොත් කිසි යුත්තෙහි වෙනසක් නැද්ද? යන චොදනායෙහි ලා පරිහාර දක්වනුවෝ "විසෙස නාමතො" යනාදිය කීහ.

16. **සබ්බථොචිතං**= සර්වප්‍රකාරයෙන් උචිතවූ; **කිඤ්චි**= කිසි වෘත්තකොතෙක්; **විසෙසනාමතො**= විශෙෂනාමයෙන්; **ගහෙත්වා**=

1. ඡට්ඨෝ'ට්ඨලලහු ජෝ වා- ගරුනා'සේසා ඡගණා න ජෝ විසමේ
   අරියාය'න්ත'ඩ්ඪේ ලො- ඡට්ඨෝ'නේත ගො ගණා ඡ'සේසා.

---

ගෙන; අහං= මම; **එත්ථ**= මේ "වුත්තෝදය" නම් ඡන්දශ්ශාස්ත්‍රයෙහි; **දස්සයිස්සාමි**= දක්වන්නෙමි. **නාමානි**= (දක්වියයුතු ඡන්දස් හා වෘත්තයන්ගේ) නාමයෝ; **ආවිභවිස්සරෙ**= (ඒ ඒ තැන්හි) මතු පහළ වන්නාහුය.

"අහනෙතත්ථ" යන තැන්හි තකාරය ආගමජයි.

**වි:-** කාව්‍යප්‍රයෝගයෙහි බොහෝ සෙයින් දක්නට ලැබෙන එහෙයින්ම සර්වප්‍රකාරයෙන් උචිත වූ ඡන්දස් හා වෘත්ත කිසිවෙක් විශෙෂනාමයෙන් ගෙන මෙහි දක්වනු ලැබෙත්. "සබ්බථොචිතං"යි උචිත වූව ද සියල්ල නො දක්වන බැවි ද අනුචිත වූවත් ඇති බැවි ද දක්වති, එහෙයින් උක්තාදි පූර්ව ඡන්දස් පස ද විකෘත්‍යාදි අවසාන ඡන්දස් සතර ද ඒ ඒ ඡන්දස්හි නො කී වෘත්ත ද පරශාස්ත්‍රයෙන් ගතයුත්තාහුය. විපාත්-පාදචතුරූර්ධ්වා දීහු මෙහි ලා අනුචිතයහ.

---

**වුත්තෝදයෙ ඡන්දසි**= "වුත්තෝදය" නම් මාගධච්ඡන්දශ්ශාස්ත්‍රයෙහි; **සඤ්ඤා පරිභාසා නිද්දෙසො නාම**= සංඥා පරිභාෂාතිදේශ නම් වූ; **පඨමො පරිච්ඡෙදො**= ප්‍රථම පරිච්ඡේදය; **ඉති**= මෙතෙකින් සමාප්තයි.

## ප්‍රථම පරිච්ඡේදයයි.

---

මාත්‍රා- වර්ණවශයෙන් විභෙද වූ ඡන්දසුන් අතුරෙහි ස්වල්ප වූ සියුම් භෙද ඇතිබැවින් "මත්තාවණ්ණ විභෙදනං"යි කළ ප්‍රතිඥාවට ද අනුරූප කොට පළමුව මාත්‍රාවෘත්ත දක්වති.

එහි දු ආර්‍යා-ගීති- වෛතාලීය-මාත්‍රාසම යන ජාතීන් අතුරෙන් සියල්ලන්ට පූර්වක හෙයින් ආර්‍යාජාති දක්වන්නාහු "ඡට්ඨො" යනාදිය කියත්,

1. **අරියාය**= ආර්‍යාවගේ; **ඡට්ඨො**= (පූර්වාර්ධයෙහි) සවෙනි ගණය තෙම; **අට්ඨලලහු**= සර්වලඝුගණය හෝ; **ජො වා**= ජගණය හෝ වෙයි; **ගරුනා**= (අවසානයෙහි) ගුරකින් යුක්තවූ; **අසේසා ගණා**= සෙසු ගණයෝ; **ඡ**= සදෙනෙක් වෙති; **විසමෙ**= (ප්‍රථම-තෘතීය- පඤ්චම- සප්තම- යන) විෂමස්ථානයෙහි; **ජො**= ජගණය; **න**= නො වේ. **අන්තඩ්ඪෙ**= අන්තාර්ධයෙහි හෙවත් අපරාර්ධයෙහි;

2. පඨම'ඩ්ඪෙ ඡට්ඨො ච-සබ්බලහු'ස්සා'දි-ලහුනි-භවති යති
තප්පරකො'න්තෙ'පි සචෙ-චරිමෙ-පඤ්චම චතුත්ථො'න්තෙ

**ඡට්ඨො**= සවෙනිවූයේ **ලහු**= ලඝුවෙකි; **අන්තෙ**= අන්තයෙහි; **ගො**= ගුරෙක් වේ; **අ**-**සෙසා ගණා**= සෙසු ගණයෝ; **ජ**= සදෙනෙක් වෙති.

ආයර්‍යාවගේ උභයාර්ධයෙහි ම යෙදෙන සාමාන්‍ය ලක්‍ෂණ දක්වා දැන් එහි ම විශෙෂයතිස්ථාන ප්‍රකාශ කෙරෙති, "පඨමඩ්ඪෙ" යනාදීන්–

2. **පඨමඩ්ඪෙ**= ආයර්‍යාප්‍රථමාර්ධයෙහි; **ඡට්ඨො**= සවෙනි ගණය; **ච**= ඉදින්; **සබ්බලහු**= සර්වලඝුගණය වී නම්? **එත්ථ**= මේ (සවෙනි) සර්වලඝුගණයෙහි; **ආදිලහුනි**= ආදිලඝුවෙහි; **යති භවති**= යතිය වෙයි; (ආදිලඝුහුගේ අන්තයෙහි යතිය වෙයි යන අර්ථයි.) **සො**= ඒ සවෙනි ගණය තෙම; **ච**= ඉදින්; **තප්පරකො**= ඒ සර්වලඝු ගණය පර කොට ඇත්තේ වී නම්? (සත්වෙනි ගණය ද සර්වලඝු වී නම් යන අර්ථයි.) **අන්තෙ** × **අපි**= සවෙනි ගණයාගේ අන්ත යෙහි ද; යතිය වේ. **චරිමෙ**= අපරාර්ධයෙහි; **චතුත්ථො**= සතරවෙනි ගණය තෙම; **තප්පරකො**= ඒ සර්වලඝුගණය පර කොට ඇත්තේ නම්? (පස්වෙනි ගණය සර්වලඝු වී නම් යන අර්ථයි.) **අන්තෙ**= සතර වෙනි ගණයාගේ අන්තයෙහි; **පභවති**= යතිය ලැබේ.

**විවෘතනි**– ආයුර්‍යාපූර්වාර්ධයෙහි ගණ සතක් හා අන්තයෙහි ගුරක් ද වේ. මාත්‍රා අවස්ථාවෙහි ගණයෙක් සාරා සතරෙකැයි කී හෙයින්. මේ සප්තගණ ගණාර්ධය මාත්‍රා ගණනින් තිසකි, සවෙනි ගණස්ථානයෙහි සර්වලඝුගණය හෝ ජගණය ම වේ.

අපරාර්ධයෙහි සවෙනි ස්ථානය හුදු ලඝුවක් ම වේ, සෙසු ගණ සයක් හා අන්තයෙහි ගුරක් ද වෙයි, මෙහි සවෙනි ස්ථානයෙහි ගණයක් නො ව කෙවල ලඝුවක් ම යෙදෙන හෙයින් මාත්‍රා තුනක් පිරිහී මාත්‍රා සත්විස්සක් වේ.

උභයාර්ධයෙහි ම ගණස්ථානයන් අතුරෙන් විෂම වූ පළමුවන තුන්වන පස්වන සත්වන ස්ථානයන්හි ජගණය නොයෙදේ. සියලු ආයර්‍යාජාතියට ම මෙකී ලක්‍ෂණය සාමාන්‍යයි, මතු ඒ ඒ ආයර්‍යාභෙදයෙහි දක්වන්නේ විශෙෂ ලක්‍ෂණ පමණකි. එහෙයින් "පථ්‍යා"දි ඒ ඒ ආයර්‍යාභෙදයෙහි ලැබෙන විශෙෂලක්‍ෂණ මෙකී සාමාන්‍යලක්‍ෂණයන් සමග ම ගොදා ගතයුතුයි.

මේ ග්‍රන්ථයෙහි "ලක්ඛලක්ඛණසංයුත්තං" යි සූත්‍රය ම උදාහරණය ද වන බැවි කීහෙයින් "ජයො" යනාදීන් දක්වූ ආර්‍ය්‍යාලක්ෂණයට එය ම උදාහරණ වේ. දැන් වින්‍යාසය කොට විමසා බැලිය යුතුයි–

1 2 3 4 5 6 7 8
ජයො බිලලහු ජොවා; ගයුතා සෙසඳ ජ ගගණාන ජොවිස මෙ
⏑ ⏑, – – –, ⏑ ⏑, – – ⏑, ⏑ ⏑, – ⏑ –, ⏑ – –, ⏑ = මාත්‍රා 30

1 2 3 4 5 6 7 8
අරියා යනත ඩේලො; ජයො නෙතගො ග ණාජ සෙසඳ
– ⏑, ⏑ ⏑, ⏑ ⏑, ⏑ ⏑, ⏑ ⏑, –, ⏑ ⏑, ⏑ = මාත්‍රා 27.

මෙහි පූර්වාර්ධයෙහි ෂෂ්ඨස්ථානයෙහි ජගණයක් හා අන්තයෙහි ගුරක් ඇතිබව ද, අපරාර්ධයෙහි ෂෂ්ඨස්ථානයෙහි හුදු ලඝුවක් හා අන්තයෙහි ගුරක් ඇතිබව ද, උභයාර්ධයෙහි ම 1–3–5–7 යන විෂමස්ථානවල ජගණය නො යෙදුනබව ද පෙනේ. මෙසේ පළමු දක්වූ ලක්ෂණ මෙහි ඇතිහෙයින් මෙය ම ඊට නිදසුන් වූබව සැල කියයුතුයි. මෙහි ලා අමුතු නිදසුන් දැක්වීම ප්‍රයොජන නො වේ, මෙය ම ප්‍රමාණහෙයිනි. (මත්තෙහි දූ සියලු තැන්හි ඒ ඒ ලක්‍ෂ්‍ය ලක්ෂණ මෙසේ ම විමසා බැලියයුතුයි.)

තවද මෙකී ලක්ෂණානුසාරයෙන් ආර්‍ය්‍යා උභයාර්ධයෙහි ම ප්‍රථම ගණස්ථානයෙහි ජගණය හැර ඉතිරි ගණ සතරින් යම් කිසි ගණයක් යෙදිය හැක. තුන්වන–පස්වන–සත්වන ස්ථානවල ද මෙසේ මැයි. එකී ස්ථාන යෙදෙන ගණයන්ගේ වශයෙන් භෙද සතරින් සතරින් යුක්ත වෙති, දෙවන–සතරවන ස්ථානවල මාත්‍රා ගණ පසින් කැමති ගණයක් යෙදිය හැක. එහෙයින් ඒ දෙතැන භෙද පසකින් පසකින් යුක්ත වෙයි, පූර්වාර්ධයෙහි සවන ගණස්ථානයෙහි ජගණය හෝ සර්වලඝුගණය ම යෙදෙන හෙයින් භෙද දෙකකි, අපරාර්ධයෙහි සවැන්න හුදු ලඝුවක් හෙයින් භෙද නැති, අන්තයෙහි ගුරක් ම යෙදෙන හෙයින් එහි ද භෙද නො ලැබේ. උභයාර්ධයෙහි ම ඒ ඒ ස්ථානවල යෙදෙන භෙද මෙසේයි–

පූර්වාර්ධය– 1–4, 2-5, 3–4, 4–5, 5-4, 6–2, 7-4, 8–ගුරු.
අපරාර්ධය– 1–4, 2-5, 3–4, 4–5, 5–4, 6–ලඝු, 7-4, 8–ගුරු.

මෙහි සියලු තැන්හිම මුලින් ස්ථානාඞ්කය ද අගින් ඒ ඒ තැන යෙදිය හැකි ගණ සඞ්ඛ්‍යාව ද දක්වනලදී.

මෙසේ එක් එක් ස්ථානයෙහි ලැබෙන භේදසංඛ්‍යා එකිනෙක ගුණකිරීමෙන් ආර්‍යාජාතියෙහි වෘත්තසංඛ්‍යාව 8,19,20,000 කි. සංඛ්‍යාව සෙවීමේ දී පළමු කොට ප්‍රථමගණස්ථානයෙහි භේද සතර ද්විතීයස්ථානභේද පසෙන් ගුණ කළයුතුයි. එයින් ලත් ඵලය තෘතීයස්ථානභේදවලින් ගුණ කළ යුතුයි. මෙසේ අර්ධදෙක්හිම අවසානය දක්වා ගුණ කොට වෙන වෙන ම. අර්ධදෙකේ සංඛ්‍යා ගුණ කළයුතුයි. භේද නැති තැන ගුණ කළයුතු නො වේ. $(4 \times 5 = 20 \times 4 = 80 \times 5 = 400 \times 4 = 1600 \times 2 = 3200 \times 4 = 12800)$ පූර්වාර්ධභේද දොළොස්දහස්අටසියයකි. අපරාර්ධයාගේ සවෙනි ස්ථානයෙහි භේද නො ලැබේ. එහි-$(4 \times 5 = 20 \times 4 = 80 \times 5 = 400 \times 4 = 1600 \times 4 = 6400)$ භේද සදහස්සාරසියයකි, අර්ධදෙකේ භේද ගුණ කිරීමෙන් $(12800 \times 6400 = 81920000)$ සියලු ආර්‍යාවන්ගේ සංඛ්‍යාව අටකෝටි දහනවලක්‍ෂ විසිදහසකි.

**ආර්‍යාසංඛ්‍යා.**

> "ජගණවිහීනා විසමෙ-චතුරො පඤ්ච සමකොසවපි ච ජගෙ
> වෙ යෙව භවන්ති ගණා-තථාන්තගො පඨමදලසංඛ්‍යා
> දුතියෙපි තථෙව දලෙ-ඡට්ඨො පන භවති-ලහුති එකස්මිං
> අරියොභයදලභෙදා-ගුණිතා සංඛ්‍යාවිනිද්දිට්ඨා."

පඨමංඝ යනාදීන් ආර්‍යාවෙහි විශේෂයතිස්ථාන දක්වනලදී. ඔවුන්ගේ පාදාන්තයතිය පෙර සේ මැයි. ආර්‍යා පූර්වාර්ධයෙහි සවෙනි ගණය සර්වලඝු ද විය හැක. එසේ වූවහොත් ඒ සර්වලඝුගණයාගේ ආදිලඝුවෙන් පරව යතිය වේ, සත්වෙනි ස්ථානය ද සර්වලඝුගණයට බාධාවක් නැතිහෙයින් එසේ වුව හොත් ඒ සත්වෙනි ගණයෙන් පූර්වයෙහි (=සවෙනි ගණයාගේ අන්තයෙහි) ද යතිය වේ. "පඨමධෙ" යනාදි ආර්‍යාව ම ඊට නිදර්ශනයි. එහි වින්‍යාසය මෙසේයි-

**ආර්‍යායතිස්ථාන.**

```
           1     2     3     4    5       6     7   8
පූර්වාර්ධය --◡ ◡◡ ◡◡; ◡-- ◡◡ -;---; ---- ◡·මාත්‍රා30
            1     2     3     4     5   6   7   8
අපරාර්ධය ◡-- ◡◡ --◡; --◡; ---- — ◡◡ ◡· මාත්‍රා27
```

වින්‍යාසයෙහි ";" මේ ලකුණ යතිස්ථාන හැඟවීම පිණිස යොදන ලද්දේය. එහි සවෙනි ගණය "දිලහුති" යනුයි, එය සර්වලඝු හෙයින් ආදිලඝුව වූ "දි" යන්නෙන් පරව යතිය විය, සත්වැන්න ද "භවතිය" කියා සර්වලඝු විය, එහෙයින් ඊට මුලින් ගෙවත් සවෙනි ගණයාගේ අන්තලඝුව වූ "ති" යන්නෙන් පරව ද

යතිය විය. යම් ආර්‍යාවක සත්වනගණය සවිලඝු නො වී නම් පසුව කී සවෙනි ගණයාගේ අන්තයෙහි යතිය නො ලැබේ.

“කාරුණ්ණසීතලහදයං–පඤ්ඤාපජ්ජොත–විගතමොහතමං” යන මෙහි සත්වන ගණය සවිලඝු නො වූ හෙයින් සවෙනි ගණයාගේ ආදිලඝුවෙහි පමණකක් යතිය වූබැව් සැලකිය යුතුයි.

අපරාර්ධයෙහි ද පස්වෙනි ගණය සවිලඝු වී නම් එයින් පූර්වයෙහි සතරවෙනි ගණයෙන් පරව යතිය වේ. “ තපපරයො ” යනාදි අපරාර්ධයෙහි “පහවති” යනු පස්වෙනි ගණයයි, එය සවිලඝු වූ හෙයින් ඊට මුලින් සිටි “චරිමෙ” යන සතරවෙනි ගණයෙන් පරව යතිය විය.

බොහෝ පොත්වල පෙනෙන “පිහවති” යන විරාගත දූෂිත පාඨය හා ව්‍යාඛ්‍යානය ද බැහැර කෙළෙමු. කිසිවෙක් මෙහි “ අපි ” ශබ්දයක් ගෙන පස්වෙනි ගණයාගේ ආදිලඝුවෙහි හා අන්තයෙහි ද යති නියම කෙරෙති, “චරමෙ’ත්ථ පඤ්චමකො–තසමා–දිහ හවති ෂෂ්ඨො ලඃ” යි **කේදාරයෝ** චතුර්ථගණයාගේ අන්තයෙහි ම යතිය දැක්වූහ. එහි “දිහහව” යන පඤ්චමගණයාගේ ආදිලඝුවෙහි හෝ අන්තයෙහි යති නො ලැබෙනබව ප්‍රකට ව පෙනේ. **සඞ්ඝරක්ඛිතපාදයෝ** අස්ථානයෙහි අපි ශබ්දයක් යොදා සවකිය ශාස්ත්‍රය කිලිටි නො කළාහුය’යි ද, පූර්වාර්ධෂෂ්ඨ ගණයෙහි මෙන් අපරාර්ධපඤ්චමගණයෙහි ද යති වේ යයි සැලකූ අවිචාරබුද්ධියකුවිසින් පසු කාලෙක මෙය කිලිටිකරනලද්දැ’යි ද සැලකිය යුතුයි. මෙහි “අපි” ශබ්දයක් ම ඇතැ’යි සැලකූ විවරණකරු ද “අපිසද්දො අට්ඨානප්පයුත්තො” “නයිදමෙව සුත්තං ලක්ඛණ මුදාහරණඤ්ච” යී කියමින් තමාගේ නිදහස පමණක් ම අපේක්ෂා කෙළේය. මෙහි ලා “පහවති” යනු ශුද්ධ පාඨය’යි ද මේ ලක්ෂණෝදාහරණයෙහි දෙසක් නැතැ’යි ද සැලකිය යුතුයි

සියලු ආර්‍යාවන්ගේම උභයාර්ධයෙහි ලැබෙන සාමාන්‍යලක්ෂණ හා විශෙෂයතිනියමය ද මෙසේ මැයි- මතුදක්වනුලබන්නේ ඒ ඒ ආර්‍යාවන්ගේ විශෙෂලක්ෂණ පමණකි. මුලින් දැක්වූ ආර්‍යා දෙක ම පථ්‍යාලක්ෂණයෙන් යුක්ත වෙති. එහි පළමුවැන්න ආර්‍යා ප්‍රස්තාරයෙහි 19, 297, වෙනි ස්ථානයෙහි ද, දෙවැන්න 1,66,77,042 වෙනි ස්ථානයෙහි ද ලැබේ. ආර්‍යා ප්‍රස්තාරාදිය මතු ෂට්ප්‍රත්‍යය විභාගයෙහි පහළවන්නේය.

3 අරියාසාමඤ්ඤමෙව-පුබ්බාදිතලක්ඛණං භවෙ යස්සා
ආදිමමථ පාදයුගං-යස්සා ත්‍යංසෙහි සා පථ්‍යා

4. යත්‍ථ, ගණත්තයමුල්ලඞ්ඝියො- භයත්‍ථා'දිමො,භවෙවිපුලා.
5. ගුරුමජ්ඣගො,ජකාරො- චතුත්ථකො,දුතියකො,චපලා.

---

දැන් ‘ පථ්‍යා” ලක්ෂණ දක්වති “අරියා” යනාදින්--

3. **යස්සා**= යම් ආර්යාවක්ගේ; **එව**= ඉදින්; **පුබ්බාදිත ලක්ඛණං**= (“ජඩො'බිලලහු” යනාදීන්) පළමු කියන ලද ලක්ෂණය; **භවෙ**= වන්නේද; (එය) **අරියාසාමඤ්ඤං**= ආර්යාසාමාන්‍යලක්ෂණ යයි; **අථ**= නැවත; (විශෙෂලක්ෂණ කියනුලැබේ.) **යස්සා**= යම් ආර්යාවකගේ; **ආදිමං**= (උභයාර්ධයෙහි) ආදි වූ; **පාදයුගං**= පාද යුගමය; **ත්‍යංසෙහි**= ගණ තුනකින් පරවෙේද; **සා**= ඕ ආර්යා තොමෝ; **පථ්‍යා**= පථ්‍යා නම් වන්නීය.

**වි**:- “ජඩො'බිලලහු” යනාදීන් පළමු දක්වන ලද්දේ සියලු ආර්යාවන්ගේ ම සාධාරණ ලක්ෂණය'යි. එකී සාමාන්‍යලක්ෂණ ඇති යම් ආර්යාවක උභයාර්ධයෙහි ම පූර්වපාද දෙක ගණ තුනකින් අවසන් වේ නම්? හෙවත් චතුර්මාත්‍රිකගණ තුනකින් පරව පාදන්තයතිය වේ නම්? එය **පථ්‍යාර්යා** නම් වේ. සෙසු ලක්ෂණ හා යතිනියමයත් පළමු දැක්වූ අයුරු මැයි. “අරියා” යනාදියෙහි වින්‍යාසය මෙසේයි-

1 2 3 4 5 6 7 ගු
(1) – – ◡ ◡ ◡ ◡ ◡ ; ◡ ◡ – – ◡ – ◡ – ◡ ◡ ◡ මාත්‍රා30
1 2 3 4 5 ල 7 ගු
(2) ◡ – – – – ◡ – – ◡ ; ◡ ◡ ◡ ◡ – ◡ ◡ ◡ = මාත්‍රා27

මෙහි “අරියාසාමඤ්ඤමෙව” කියා ද “ආදිමමථ පාදයුගං” කියාද අර්ධදෙක්හි ම මූල පාදදෙක ගණ තුනකින් තුනකින් අවසන්ව තිබෙනබව ද, පළමු දැක්වූ සාමාන්‍යලක්ෂණ යෙදීතිබෙන බව ද සැලකියයුතුයි. “අරියා” යනාදිගය ප්‍රස්තාරයෙහි 3 33 202 වෙනි ආර්යාවයි.

4. **යත්‍ථ**= යම් ආර්යාවක; **උභයත්‍ථ**= උභයාර්ධයෙහි **ගණත්තයං**= ගණ තුනක්; **උල්ලඞ්ඝිය**= ඉක්මවා; **ආදිමො**= ප්‍රථමපාදය; **භවෙ**= වන්නේද; (මෝ ආර්යාතොමෝ) **විපුලා**= “විපුලා” නම්.

**වි**:- පළමුදැක්වූ සාමාන්‍යලක්ෂණඇති යම් ආර්යාවක ගණ තුනක් ඉක්මවා සතරවෙනි ගණයාගේ මධ්‍යයෙහි ප්‍රථම-තෘතීය පාදන්තයතිය වේ නම්? ඒ ආර්යාව **විපුලා**= යයි කියනුලැබේ. “යත්‍ථ යනාදි ආර්යාර්ධයෙහි ලඝු-ගුරුවින්‍යාසය මෙසේයි-

1 2 3 4 5 6 7 ගු

◡ – – ◡ – – ◡ ◡ – ◡ ;– ◡ ◡ – ◡ – ◡ – – ◡ =මාත්‍රා30

මෙහි "ඝියොභ" යනු සතරවෙනි ගණයයි, "යත්‍ථ ගණතතය මූලලඞ්ඝියො,, යී ඒ සතරවෙනි ගණයාගේ මධ්‍යයට පැමිණ ප්‍රථමපාදය අවසන් විය. මෙති¦දක්වන ලද්දේපූර්‍වාඪිය පමණකි, අපරාඪියද මේ විශෙෂලක්‍ෂණය යොදා සම්පූර්ණ කළයුතුයි.

**විපුලා** මේ විපුලායම්ාව "මුඛවිපුලා, ජඝනවිපුලා, උභයවිපුලා" **භෙද.** යයි ත්‍රිවිධවෙයි. පූර්‍වාඪියෙහි පමණක් සතරවන ගණයාගේ මැද පාදසන්‍ධියනිය වේ නම් එය **මුඛවිපුලා** නම්, අපරාඪියෙහි පමණක් එකි ලක්‍ෂණය සිටිසාල **ජඝනවිපුලා** නම්, අඩි දෙකෙහි ම සිටියේ නම් **උභයපුලා** වෙයි, "මහාවිපුලා" නම් හෝ වේ, "චපලා" ලක්‍ෂණ දක්වන අපරාඪිය සමග එක්කොට ගත් කල මෙය **මුඛවිපුලාවට** උදාහරණ වේ. ජඝනවිපුලා මහාවිපුලා දෙකෙහි උදාහරණ සෙවියයුතුයි.

5. ("යත්‍ථ,, යනු ද "උභයත්‍ථ" යනු ද වැටේ-) **යත්‍ථ**= යම් ආයම්ාවෙක්හි; . **උභයත්‍ථ**= උභයාඪියෙහි; **චතුත්‍ථකො**= සතර වැනි වූ ද; **දුතියකො** දෙවැනි වූ ද; **ජකාරො**= ජගණය තෙම; **ගුරුමජ්ඣගො**= (පූර්‍වාපරවූ) ගුරු දෙකක්හුගේ මැදට පැමිණියේ වේ ද; (ඕතොමෝ) **චපලා**= චපලා නමු.

**වි:-** මේ චපලාවෙහි දෙවන ගණය හා සතරවෙනි ගණය ද නිත්‍යයෙන් ම ජගණ දෙකක් වී ඒ ගණදෙකට පෙරටුව හා පරව ද ගුරු අකුරු ම යෙදීම විශෙෂලක්‍ෂණයයි. මෙහි "ඛගොජ" යන දෙවෙනි ගණය "මජ්– කා,, යන ගුරු දෙදෙනාගේ ද, "චතුත්‍ථ" යන සතරවන ගණය "රො– කො" යන ගුරු දෙදෙකාගේ ද මැද පිහිටියෝය. වින්‍යාසය මෙසේයි.

1 - 2 2 - 1 3 - 1 4 - 1 5 - 2 6 - 1 7 - 4 ගු.

– – ◡ – ◡ – ◡ ◡ ; – ◡ – ◡ – – – – ◡ – – ◡ මාත්‍රා 27.

මෙහි සෙසු ගණයන්ගේ විශෙෂ නියමයක් නැති නමුදු දෙවන සතරවන ගණ ගුරු මැදට පැමිණෙන කල්හි ප්‍රථම ගණස්ථානයෙහි සර්‍වගුරු අන්‍තගුරු ගණදෙකින් එකක් ම යෙදේ, (දෙවෙනි සතරවෙනි ස්ථාන නිත්‍යජගණයි,) තෘතීය

6. චපලා'ගතා'ඛිලසේචෙ– දලා'දිමං ලක්ඛණං භජති යස්සා
පච්ඡාලක්ඛණමඤ්ඤං– මුඛචපලා නාම සා භවති.

---

ස්ථානයෙහි නිත්‍යයෙන් සර්වගුරුගණය ම වෙසි' පඤ්චමස්ථාන යෙහි සර්වගුරු ආදිගුරු ගණදෙකින් එකක් ම යෙදේ, එසේ නො වූව හොත් චපලාලක්ෂණය නො ලැබෙනහෙයිනි, ෂෂ්ඨ- සප්තමස්ථාන පෙර සේ මැයි.

**චපලාසඞ්ඛ්‍යා.** එකිඑකි ගණස්ථානයෙහි ලැබෙන හෙද ගුණ කිරිමෙන්(2 × 1=2 × 1=2 × 1=2 × 2=4 × 2=8 × 4=32) පූර්වාර්ධයෙහි හෙද දෙතිසක්ද, අපරාර්ධයෙහි(2 × 1=2 × 1=2 × 1=2 × 2) 4 × 1=4 × 4=16 හෙද සොළොසක් ද වේ, උභයාර්ධයෙහි ම හෙද පන්සියදෙළොසක් (512) ලැබේ. මේ මහාචපලායාර්යාවෙහි සි. (මේ චපලාවද පළමු දැක්වූ විපුලාව සෙයින් මුඛචපලා ජඝනචපලා උභය චපලා හෙවත් මහාචපලා යයි ත්‍රිභෙද වේ.) මෙකී චපලා සඞ්ඛ්‍යාවද පූර්වෝක්ත ආර්යාසඞ්ඛ්‍යාවෙහි ම ඇතුළත් වේ. මෙය **විපුලා** ලක්ෂණ දැක්වූ පූර්වාර්ධය සමග ගත්විට **ජඝනචපලාවට** නිදසුන් වේ. මහා චපලාවට නිදසුන් සෙවිය යුතුයි.

6. **යස්සා**= යම් ආර්යාවකගේ; **ආදිමං දලං**= පළමුවන අර්ධය; **චපලා'ගතං**= චපලාවෙහි ආවාවූ; **අඛිලං ලක්ඛණං**= සියලු ලක්ෂණය; **චෙ**= ඉදින්; **භජති** සෙවුනේ ද; **අඤ්ඤං**= අන්‍යවූ අපරාර්ධය; **පච්ඡාලක්ඛණං**= පථ්‍යාවෙහි ආ ලක්ෂණය සෙවුනේ ද; **සා**= ඕ ආර්යාතොමෝ; **මුඛචපලා නාම භවති**= මුඛචපලා නම් වන්නීය.

**විවෘතති–**

යම් ආර්යාගාථාවක පූර්වාර්ධයෙහි චපලාවට කී ලක්ෂණත් අපරාර්ධයෙහි පථ්‍යාවට කී ලක්ෂණත් යෙදේ නම් ඕතොමෝ "මුඛචපලාර්යා,, .යි මෙහි 'චපලා,, යනාදි ආර්යාවගේ පූර්වාර්ධයෙහි "ලා–ලං," යන ගුරුදෙක මැද **"ගතාඛි"** යන දෙවෙනි ජගණය ද "චෙ–මං" යන ගුරුදෙක මැද **"දලාදි"** යන සිවුවෙනි ජගණය ද යෙදුනේය, අපරාර්ධයෙහි "පච්ඡාලක්ඛණමඤ්ඤං,, යී ගණතුනකින් පාදය අවසන් වීය. එහෙයින් මෝ **මුඛචපලාවකි.**

**මුඛචපලාසඞ්ඛ්‍යා.** මෙහි ද මහාචපලාවෙහි මෙන් පූර්වාර්ධහෙද දෙතිසක් (32) ද, පථ්‍යාවෙහි මෙන් අපරාර්ධ හෙද සදහස්සාරසියයක් (6400)ද ලැබේ. මෙද පූර්වෝක්ත ආර්යා සඞ්ඛ්‍යාවෙහි ම ඇතුලත් වේ.

7. පථ්‍යාය ලක්ඛණසෙව-පඨම'ඩෙ ලක්ඛණන්තු චපලාය
දුතියෙ දලෙ'ථ යස්සා-පකිත්තිතා සා ජඝනචපලා.

**අභිප්පායො.**

---

7. **යස්සා**= යම් ආර්‍ය්‍යාවකගේ; **පඨමඩෙ**= ප්‍රථමාර්ධයෙහි; **එව**= ඉදින්; **පථ්‍යාය ලක්ඛණං**= පථ්‍යාවගේ ලක්ෂණය වේ ද; **අථ**= නැවත; **දුතියෙ දලෙ**= ද්විතියාර්ධයෙහි; **චපලාය**= චපලාවගේ; **ලක්ඛණං තු**= ලක්ෂණය වේ ද; **සා**= ඕ ආර්‍ය්‍යාතොමෝ; **ජඝනචපලා**= ජඝනචපලා යයි; **පකිත්තිතා**= කියනලද්දීය.

**වි:-** මේ ජඝනචපලාවෙහි පළමුවන අර්ධය පථ්‍යාලක්ෂණයෙන් යුක්තාවෙයි, දෙවන අර්ධයෙහි "යෙ-යස්" යන ගුරු මැද **දලෙථ** යන ජගණය ද, "සා-තා" යන ගුරු මැද **පකිත්ති** යන ජගණය ද ද්විතීය චතුර්ථස්ථානයන්හි පතිත විය.

**ජඝනචපලාසඞ්ඛ්‍යා.** මෙහි ද ගණවිකල්ප ගුණ කිරීමෙන් පථ්‍යාවෙහි මෙන් පූර්වාර්ධයෙහි භෙද දෙලොස් දහස් අටසියයක් (12800) ද, අපරාර්ධයෙහි චපලාවෙහි මෙන් සොළසක් (16) ද වෙයි. සියල්ල ගුණකිරීමෙන් උභයාර්ධයෙහි ම දෙලක්ෂසාරදහස්අටසියයක් (2,04,800) ලැබේ.

**ආර්‍ය්‍යාභෙද.** ආර්‍ය්‍යාජාතිය භෙදවශයෙන් **පථ්‍යා එකෙකි.** විපුලාව මහාවිපුලා මුඛවිපුලා ජඝනවිපුලා යයි **භෙද තුනකි.** මහාචපලා මුඛචපලා ජඝනචපලා යන භෙද තුන පථ්‍යා-විපුලාභෙද සතරින් ගුණකළ විට **චපලාභෙද දෙළොසකි.** මේ දෙළොස හා විපුලාතුන හා ශුද්ධපථ්‍යාව දැයි **ආර්‍ය්‍යාභෙද සොළොසකි.**

"එකා'ව භවති පථ්‍යා-තිස්සො විපුලා තතො චතස්සො තා
චපලා තතයෙන ගුණිතා-ඉත්‍යපි සොළස භවන්ත්‍යරියා"

ඔවුහු නාම වශයෙන් මෙසේයි-

1. පථ්‍යා.
2. මහාවිපුලා.
3. මුඛවිපුලා.
4. ජඝනවිපුලා
5. පථ්‍යාමහාචපලා.
6. පථ්‍යාමුඛචපලා.
7. පථ්‍යාජඝනචපලා.
8. මහාවිපුලාමහාචපලා.
9. මහාවිපුලාමුඛචපලා.
10. මහාවිපුලාජඝනචපලා.
11. මුඛවිපුලාමහාචපලා.
12. මුඛවිපුලාමුඛචපලා.
13. මුඛවිපුලාජඝනචපලා.
14. ජඝනවිපුලාමහාචපලා.
15. ජඝනවිපුලාමුඛචපලා.
16. ජඝනවිපුලාජඝනචපලා.

**මෙකී භෙද සියල්ල ම පළමු දක්වූ ආර්‍ය්‍යාසඞ්ඛ්‍යාවෙහි ඇතුළත් වේ. එයින් වෘත්ත පන්සියදෙළසක මහාචපලා ලක්ෂණ ද**

1\. සබ්බං පඨමදලෙ යදි-ලක්ඛණමරියාය වුත්තමුභයෙසු
යස්සා දලෙසු යුත්තං-වුත්තා සා ගීති වුත්තයතිලලිතා

---

දෙලක්ෂසාරදහස්අටසියයක මුඛචපලා ලක්‍ෂණ ද, එපමණෙක්හි ම ජඝනචපලාලක්‍ෂණ ද යෙදේ. සෙස්ස පථ්‍යා හෝ විපුලා විය හැක.

**ආර්‍ය්‍යාජාතිය.**

---

1\. **යදි**= ඉදින්; **අරියාය**= ආර්‍ය්‍යාවගේ; **පඨමදලෙ**= ප්‍රථමාර්ධ සෙහි; **වුත්තං**= කියනලද; **සබ්බං ලක්ඛණං**= සියලු ලක්‍ෂණය; **යස්සා**= යම් ආර්‍ය්‍යාජාතියකගේ; **උභයෙසු දලෙසු**= උභයාර්ධයෙහි; **යුත්තං**= යෙදුනේ වේ ද; (**තදා**= එකල්හි;) **වුත්තයතිලලිතා**= (පෙර ආර්‍ය්‍යාවෙහි) කියනලද යතින් හොබනාවූ; **සා**= ඕ ආර්‍ය්‍යා තොමෝ; **ගීති වුත්තා**:= ගීති යයි කියනලදී.

**වි**:= ආර්‍ය්‍යාපූර්වාර්ධයෙහි යෙදෙන ලක්‍ෂණ උභයාර්ධයෙහි ම යුක්ත වූවා **"ගීති"** නම් වන්නීය. "සබ්බං" යනාදියෙහි වින්‍යාසය හා ගීතිගණස්ථානභෙද ද මෙසේයි.

1-4 2-5 3-4 4-5 5-4 6-2 7-4 ගු

⏑ ⏑ – – – – ⏑ – –; ⏑ – – – – ⏑ – ⏑ – – – ⏑ ⏑=මාත්‍රා30.

1-4 2-5 3-4 4 5 5-4 6-2 7-4 ගු

⏑ ⏑ – ⏑ – ⏑ ⏑; ⏑ ⏑ ⏑ ⏑ – ⏑ – – – – – ⏑=මාත්‍රා30.

මෙහි අර්ධ දෙක ම ආර්‍ය්‍යාපූර්වාර්ධය වැනි හෙයින් අර්ධ දෙක්හි ම මාත්‍රා තිස තිස වේ, අපරාර්ධයෙහි ද ෂෂ්ඨස්ථානය හුදු ලඝුවක් නො ව ජගණය හෝ නගණය ම වේ. "වුත්තයතිලලිතා"යි කී හෙයින් ආර්‍ය්‍යාපූර්වාර්ධයට දක්වූ යතිලක්‍ෂණ උභයාර්ධයෙහි ම යෙදේ. මේ'ගීති'ය පථ්‍යාය ත්‍රිවිධ විපුලාය චාදශ චපලාය යන ෂෝඩශආර්‍ය්‍යාවන් හා සංකලනයෙන් සොළොස්වැදෑරුම් වේ. "පථ්‍යාගීති, මහාවිපුලාගීති, මුඛවිපුලාගීති, ජඝනවිපුලාගීති, පථ්‍යාමහාචපලාගීති" යනාදීන්ගේ වශයෙනි. මේ ගීතියෙහි අර්ධදෙක ම ආර්‍ය්‍යාපූර්වාර්ධයට සමාන බැවින් ඊට සමානවූ භෙදසංඛ්‍යාවක් ද වේ. ආර්‍ය්‍යාපූර්වාර්ධයෙහි භෙද දොළොස්දහස්අටසියයකි. (12800) මෙහි ද පූර්වාර්ධභෙද එපමණ වෙ, අපරාර්ධයෙහිත් එපමණ ම වේ. අර්ධ දෙක්හි ම භෙද ගුණකිරීමෙන් සොළොස්කෙළ අටතිස්ලක්‍ෂ සතළිස්දහසකැයි (16,38,40,000) සැලකිය යුතුයි. චපලාගීති ආදීන්ගේ භෙද ද මේ සංඛ්‍යාවෙහි ම ඇතුලත් වේ.

**ගීතිභෙද හා සංඛ්‍යා.**

2. අරියායං දුතිය'ඩෙ- ගදිතා'ඛිල ලක්ඛණං යංතං
හවති දලෙසු'භයෙසු'පි- යදි යස්සා සා'යමුපගීති.

3. අරියා'යඩවිතයං- පුබ්බො'දිතලක්ඛණු'පෙතං
විපරියයෙනා'භිහිතං- යස්සා සම්භවති චෙ'හ සො'ගගීති.

---

2. **අරියායං**= ආයර්‍යාවෙහි; **දුතියඩෙ**= දෙවන අඩියෙහි, **ගදිතං**= කියනලද; **යං අඛිලලක්ඛණං**= යම් සියලු ලක්ෂණයක් ඇද්ද; **තං**= එය; **යස්සා**= යම් ආයර්‍යාවකගේ; **උභයෙසු දලෙසු අපි**= උභයාර්ධයෙහි ම; **යදි භවති**= ඉදින් වේ නම්; **සා අයං**= ඒ මේ ආයර්‍යාතොමෝ; **උපගීති** "උපගීති" යයි කියන ලදී.

**වි:-** ආයර්‍යාඅපරාර්ධයට කී ලක්ෂණ උභයාර්ධයෙහි ම සිටියේ නම් ඒ තොමෝ **"උපගීති"** නම් මෙහි අර්ධ දෙක්හිම ෂෂ්ඨස්ථානය හුදු ලඝුවකින් යුක්ත ව මාත්‍රා සත්විස්ස (27) බැවින් ලැබේ. වින්‍යාසය සුකරයි, ගණස්ථානවිකල්ප දෙඅඩෙහි ම යට දැක්වූ ආයර්‍යාඅපරාර්ධයෙහි මෙන් සැලකිය යුතුයි.

මේ "උපගීති"ය ද පළමු ගීතිය සෙයින්ම පථ්‍යාදි ආයර්‍යා සොළසින් ගුණිතව "පථ්‍යොපගීති, මහාවිපුලොපගීති, මුඛවිපුලොපගීති"යනාදි හෙදසොළසක් වේ ආයර්‍යා අපරාර්ධයෙහි සෙයින් මෙහි උභයාර්ධයෙහි ම වෘත්තසඞ්ඛ්‍යා සදහස්සාරසියය (6400) බැගින් ලැබේ. එකිනෙක ගුණිතව සියල්ල සාරකොටි නවලක්ෂ සැටදහසකි. (4, 09, 60, 000) සියලු භෙද මේ සඞ්ඛ්‍යාවෙහි ම ඇතුලත් වේ.

**උපගීතිභෙද හා සඞ්ඛ්‍යා.**

3. **අරියාය**= ආයර්‍යාවගේ; **පුබ්බොදිත ලක්ඛණුපෙතං**= පෙර කියනලද ලක්ෂණයෙන් යුක්තවූ; **අඩවිතයං**= අර්ධදෙක **චෙ**= ඉදින්; **යස්සා**= යම් අයර්‍යාවකගේ; **විපරියයෙන අභිහිතං**= විපර්‍යාසයෙන් කියන ලද්දේ; **සම්භවති**= ලැබේ ද; **සා**= ඒ ආයර්‍යා තොමෝ; **ඉහ**= මේ ගීතිජාතියෙහි **උග්ගීති**= "උද්ගීති" යයි කියනලදී.

**වි:-** යට දැක්වූ ආයර්‍යාලක්ෂණ විපර්‍යාස කොට හෙවත් පූර්වාර්ධයට කී ලක්ෂණ අපරාර්ධයෙහි ද අපරාර්ධයට කී ලක්ෂණ පූර්වාර්ධයෙහි ද ලා රචනා කරනලද්දී **"උග්ගීති"** යයි කියනු ලැබේ.

**උද්ගීතිභෙද හා සඞ්ඛ්‍යා.** මෙය ද පළමු සෙයින් ම පථ්‍යාදි ආයර්‍යා සොළොසින් ගුණිත ව පථ්‍යොද්ගීති විපුලොද්ගීති" ආදී හෙද සොළොසක් වේ. මෙහි අර්ධ විපර්‍යාස වුවත් ගණවිකල්පවශයෙන් ප්‍රස්තාරයෙහි ලැබෙන වෘත්තසඞ්ඛ්‍යාව ආයර්‍යාවෙහි මෙන් 8, 19, 20,000 කි.

4. අරියාපුබ්බ'ඩ්ඪං යදි-ගුරුනෙ'කෙනා'ධිකෙන නිධනෙ යුත්තං
යදි පුබ්බඩ්ඪසමානං- දලමිතරඤ්ච තදු'දිතා'යමරියාගීති

---

4. **යදි**=ඉදින්; **අරියාපුබ්බඩ්ඪං**=ආර්යාවගේ පූර්වාර්ධය; **නිධනෙ**= කෙළවර; **අධිකෙන**= අධිකවූ; **එකෙන ගුරුනා**= එක් ගුරකින්; **යුත්තං**= යුක්තවේ ද; **යදි**= ඉදින්; **ඉතරං ච දලං**= අපරාර්ධයත්; **පුබ්බඩ්ඪසමානං**= පූර්වාර්ධය හා සමාන වේද; (**තදා**= එකල්හි;) **අයං**= මේ ආර්යාතොමෝ; **අරියාගීති උදිතා**= "ආර්යාගීති" යයි කියන ලදී.

**වි:-** යට කී ලක්ෂණ ඇති ආර්යාපූර්වාර්ධයාගේ අන්තයෙහි තවත් ගුරක් එකතු කිරීමෙන් ගණ අටක් කොට අපරාර්ධයත් ඒ ලක්ෂණයෙන් ම රචනාකළ කල්හි **ආර්යාගීති** නම්. මෙහි අර්ධයක් පාසා මාත්‍රා දෙතිස බැගින් ලැබේ. වින්‍යාසය සුකරයි. උභයාර්ධයෙහි ම ගණස්ථානවිකල්ප පළමු ගීතියට සමානයි. මෙහි ගණ අටක් වුවත් නිත්‍යගුරකින් පරිමිතවූ ආර්යාපූර්වාර්ධයාගේ අෂ්ටම ස්ථානයට අමුතු ගුරක් එක් වීමෙන් හටගත් සර්වගුරුගණය ද එහි නියත හෙයින් භේදයෙක් නො ලැබේ.

**ආර්යාගීතිභේද හා සඞ්ඛ්‍යා.**

මේ **ආර්යාගීතිය** ද පෙර සෙයින් ම ආර්යාවන් හා සංකලනයෙන් ‘පථ්‍යාර්යාගීති" ම හා විපුලාර්යාගීති, මුඛවිපුලාර්යාගීති, ජඝනවිපුලාර්යාගීති, පථ්‍යාමහාචපලාර්යාගීති" යනාදීන් සොළොස්භේදවේ. ආර්යාපූර්වාර්ධයෙහි මෙන් මෙහිද ගණස්ථානවිකල්පයන්ගේ වශයෙන් පූර්වාර්ධභේද සඞ්ඛ්‍යා දොළොස් දහස් අටසියයකි. (12800) අපරාර්ධයෙහි ද එපමණවේ. අර්ධ දෙක්හි ම භේද එකිනෙක ගුණකිරීමෙන් සියල්ල සොළොස්කොටි අටතිස් ලක්ෂ සතලිස් දහසකි. (16,38,40,000) මේ ප්‍රස්තාරයෙහි වෘත්ත සඞ්ඛ්‍යාවයි. පළමු දැක්වූ භේද සොළස ම මේ සඞ්ඛ්‍යාවෙහි ලැබේ.

ආර්යාඅපරාර්ධයාගේ අන්තයෙහි අධිකගුරක් හෙලා මාත්‍රා විසිනවයකින් යුක්ත කොට කිසිවෙක් ආර්යාගීතිඅපරාර්ධය සලකතත් මෙහි එසේ නො යෙදෙනබව උදාහරණාත්මකලක්ෂණයෙන් ම පැහැදිලි වේ.

මෙසේ මේ චතුර්විධ ගීතිය ම එකක් එකක් භේද සොළස බැගින් සූසැටක් (64) භේද ලැබේ. එය ශුද්ධආර්යා සොළසත් සමග ගත් විට **ආර්යාභේද සියල්ල අසූවකි.** (80)

1. විසමෙ ඡ සියුං කලා මුඛෙ–සමෙ තා’ඨ රලගා තතො’පරි
වෙතාලීයමන්තමුච්චතෙ–ලහුඡක්කං න නිරන්තරං සමෙ

---

මේ ගීති සතර හැර අන්‍යවූත් ගීති එකොළොසක් දක්වති, ඔවුන්ගේ නම් හා ලක්‍ෂණ මෙසේයි.

1. **සංගීති**– ආර්‍ය්‍යාවගේ ම උභයාර්ධයෙහි කොළවර අධිකගුරකින් යුක්ත වේ.
2. **සුගීති**– ආර්‍ය්‍යාපූර්වාර්ධයෙහි පමණක් අධිකගුරකින් යුක්ත වේ.
3. **ප්‍රගීති**– ආර්‍ය්‍යාඅපරාර්ධයෙහි පමණක් අධිකගුරකින් යුක්ත වේ.
4. **අනුගීති**– සුගීතියෙහි අර්ධදෙක විපර්‍ය්‍යාසයෙන් යොදන ලද්දී වේ.
5. **මඤ්ජුගීති**– ප්‍රගීතියෙහි අර්ධදෙක විපර්‍ය්‍යාසයෙන් යොදන ලද්දී වේ.
6. **විගීති**– උපගීති උභයාර්ධයෙහි ම අධිකගුරකින් යුක්ත වේ.
7. **චාරුගීති**– උද්ගීති උභයාර්ධයෙහි ම අධිකගුරකින් යුක්ත වේ.
8. **වල්ගුගීති**– ආර්‍ය්‍යාඅපරාර්ධයාගේ අන්තයෙහි හීනවූ එක් ගුරකින් යුක්ත වේ.
9. **ලලිතා**– ආර්‍ය්‍යාපූර්වාර්ධයාගේ අන්තයෙහි හීනවූ ගුරකින් යුක්ත
10. **ප්‍රමදා**– උපගීති පූර්වාර්ධයෙහි පමණක් අධිකගුරකින් යුක්ත වේ.
11. **චන්ද්‍රිකා**– උපගීති අපරාර්ධයෙහි පමණක් අධිකගුරකින් යුක්ත වේ.

මොහු එකොළොස ද වෙන් වෙන් වශයෙන් ආර්‍ය්‍යා සොළොසින් ගුණිත ව හෙද එක්සියසැත්තෑවක් (176) වේ. මුලින් දක්වූ ගීති 64 ද ආර්‍ය්‍යා 16 දැයි සියල්ල එක්ව අර්‍ය්‍යාභෙද (176 + 64 + 16= 256) දෙසියසපනසක් වේ.

## ගීතිජාතියි.

---

මාත්‍රාවන්ගෙන් ම ඡන්දස පිරේතුයි මාත්‍රාඡන්දස්හි ඇතුලත් වන හෙයින් ගීතිජාතියට අනතුරු කොට වෛතාලීයජාතිය ආරම්භ කරන්නාහු “විසමෙ” යනාදිය දක්වත්.

1. (යස්මිං= යම් මාත්‍රාවෘත්තයෙක්හි;) **විසමෙ**= විසමවූ (ප්‍රථම–තෘතීය) පාදයෙහි: **මුඛෙ**= ආදියෙහි; **ඡ කලා**= මාත්‍රාවෝ සදෙනෙක්; **සියුං**= වෙත් ද; **සමෙ තු**= සමවූ (ද්විතීය–චතුර්ථ) පාදයෙහි වනාහි; **අඨ**= (ආදියෙහි) මාත්‍රාවෝ අටදෙනෙක් වෙත් ද; **තතො**

**උපරි**= එයින් මත්තෙහි; **රලගා**= රගණ-ලඝු-ගුරු යන මොහු වෙත් ද; **සමෙ**= සමපාදයෙහි; **නිරන්තරං**= නිරතුරුව හෙවත් ගුරකින් අතුරු නැති ව; **ලහුඡක්කං**= ලඝු සයක්; **නා**= නොවන්නේ ද; **තං**= ඒ වෘත්තය; **වෙතාලියං උච්චතෙ**= "වෛතාලීය" නමැයි කියනු ලැබේ.

**වි:-** මෙයින් **වෛතාලීයලක්ෂණ** කියනලදි. මෙහි "කලා" ශබ්දයෙන් මාත්‍රා කියනු ලැබෙත්. වෛතාලීය විෂමපාදයන්ගේ ආදියෙහි මාත්‍රා සයක් ද, සමපාදයන්ගේ ආදියෙහි මාත්‍රා අටක් ද එයින් පරව පාද සතරෙහි ම රගණයක් හා ලඝුවක් හා ගුරක් ද වෙති, සමපාදයන්ගේ ආදියෙහි අතරතුර ගුරුඅකුරක් නො යෙදී ලඝු සයක් පිළිවෙළින් නො සිටී. මෙය වෛතාලීය ජාතියෙහි සාමාන්‍යලක්ෂණය ද වෙයි.

සංස්කෘතඡන්දස්හි වෛතාලීයවෘත්තයන් පිළිබඳ "සමමාත්‍රා පරමාත්‍රා ඇසුරු නොකරන්නේය" යන ව්‍යවස්ථාව මාගධිකඡන්දසෙහි නොයෙදෙන බැව් පෙනේ. මෙය සංස්කෘතයට වඩා මෙහි ඇති විශෙෂයක් සේ සැලකියයුතුයි.

මාත්‍රා 6. රගණ ලඝු ගුරු මාත්‍රා 8. රගණ ලඝු ගුරු
(1)විසමෙඡසි යුංකලා මු බෙ (2)සමෙතාඪරල ගාතහො ප රි
– – ◡ – –, ◡ – ◡ , – , ◡ , – ◡ ◡ – – –, ◡ – ◡ ; –, ◡ .

මාත්‍රා 6. රගණ ලඝු ගුරු මාත්‍රා 8. රගණ ලඝු ගුරු
(3)වෙතාලී යනාමු ච්ච තෙ (4)ලහුඡක්කංනනි රනතරං ස මෙ
◡ ◡ ◡, ◡ – ◡, – , ◡, – – ◡ ◡ – –, ◡ – ◡, – , ◡

මෙහි සමපාදයන්හි පිළිවෙළින් ලඝුසයක් යෙදී නැත. දෙවන පාදයෙහි දෙවන සතරවන සමමාත්‍රාදෙක පරමාත්‍රා ඇසුරුකොට ගුරු වූ බැව් පෙනේ. වෛතාලීයවිෂමපාද මාත්‍රා තුදුසකින් ද සමපාද මාත්‍රා සොළොසකින් ද යුක්ත වේ.

**වෛතාලීයභෙද-** මෙහි විෂමපාදයාගේ ආදියෙහි වූ මාත්‍රා සයෙහි සමමාත්‍රා පරමාත්‍රා ඇසුරුකොට ද සිටිය හැකිබව හෙයින් භෙද තෙළෙසක් ලැබේ. මෙය ෂණ්මාත්‍රිකච්ඡන්දස ප්‍රස්තාරකිරීමෙන් ලැබෙන වෘත්තසඞ්ඛ්‍යාවට සමාන වේ. විෂමපාදයාගේ ආදියෙහි යෙදෙන මාත්‍රා අටෙහි භෙද එක්විසකි. අෂ්ටමාත්‍රිකච්ඡන්දස ප්‍රස්තාර කළ විට ලැබෙන වෘත්තසූතිසෙන් ආදිගුරු-අන්තගුරු-සර්වලඝුවෘත්ත තුන හළ කල්හි මේ සඞ්ඛ්‍යාව

2. වෙතාලීයො'පමං මුඛෙ තං– ඔපච්ඡන්දසිකං රයා යදන්තෙ.
3. ආපාතලිකා කථිතා 'යං – භගගා'න්තෙ යදි පුබ්බමිව'ඤ්ඤං.

---

ලැබේ. එකි වෘත්ත තුනෙහි පිළිවෙළින් ලඝු සයක් ලැබෙන හෙයිනි. අන්තයෙහි නිත්‍යයෙන් රගණ-ලඝු-ගුරු යෙයින් එහි භේදයක් නැති, පාද දෙකෙහි භේද එකිනෙක ගුණකළ විට (13 × 31=403.) අඩියක භේද සාරසියතුනකි. අඩි දෙක්හි ම භේද (403 × 403=1,62,409) එක්ලක්‍ෂ දෙසැටදහස් සාරසියනවයකි. සංස්කෘතයෙහි වෛතාලීයවෘත්තයාගේ මෙපමණ භේද නොලැබේ. එහි සමමාත්‍රා පරමාත්‍රා ඇසුරු නොකිරීම ව්‍යවස්ථා හෙයිනි.

2. (**යස්ස**= යම් මාත්‍රාවෘත්තයක්හුගේ) **යදි**= ඉදින්; **මුඛෙ**= ආදියෙහි; **වෙතාලියොපමං**= වෛතාලියය හා සමාන ද; **අන්තෙ**= කෙළවර; **රයා**= රගණ-යගණයෝ වෙත් ද; (**තදා**= එකල්හි;) **තං**= ඒ වෘත්තය; **ඔපච්ඡන්දසිකං**= "ඖපච්ඡන්දසික,, නම් වේ.

**වි:**– විෂම-සමපාදයන්ගේ ආදියෙහි වෛතාලියවෘත්තයට සමාන ව මාත්‍රා සයක් හා අටක් යුක්ත කොට අන්තයෙහි රගණ-යගණ යෙදූ කල්හි **"ඖපච්ඡන්දසික,,** වෘත්තය වේ. මෙහි දක්වනලද්දේ එක් අඩියකි. අනිත් අඩිය ද මේ ලක්‍ෂණ යෙන් ම පුරවා ගතයුතුයි. වින්‍යාසය ද පළමු සෙයින් කළ යුතුයි. මෙහි විෂමපාදයෙහි මාත්‍රා සොළොසක් හා සමපාදයෙහි අටළොසක්ද ලැබේ. පළමු **දක්වූ** "වෛතාලිය,,යාගේ පාදසතර කෙළවර අධිකගුරක් එක්කළ විට ද මෙකී ලක්‍ෂණ ම ලැබේ. මෙහි විකල්පසඞ්ඛ්‍යා ද වෛතාලීයයට සමානවේ.

3. **යදි**= ඉදින්; (**යස්සා**= යම් මාත්‍රාජාතියකගේ කෙළවර;) **භගගා**= භගණයක් හා ගුරු දෙකක් වෙත් ද; **අඤ්ඤං**= සෙසු ලක්‍ෂණය; **පුබ්බං ඉව**= පෙර වෛතාලීයයෙහිමෙන් වේ ද; (**තදා**= එකල්හි;) **අයං**= මෝ මාත්‍රාජාති තොමෝ; **ආපාතලිකා**= "ආපාතලිකා නමැයි; **කථිතා**= කියනලදී.

**වි:**– මේ "ආපාතලිකා,,වෙහි විෂම-සමපාදයන්හි මාත්‍රා සයෙන් හා අටෙන් පරව භගණය හා ගුරු දෙකක් ද වෙති; දක්වනලද්දේ එක් අඩියෙකි. ඉතිරි අඩිය ද මේ ලක්‍ෂණයෙන් ම ගත් විට ගාථාව පිරේ; මෙහි විෂම සමපාද මාත්‍රා තුදුසකින් හා සොළොසකින් යුක්ත වේ. උභයාඩියෙහි ම භේද වෛතාලියයෙහි මෙන් එක්ලක්‍ෂ දෙසැටදහස් සාරසියනවය (1,62,409)කි.

4. යද'දිතො දක්ඛිණන්තිකා–සිතෙ'ත්‍ථ පාදෙසා'ඛිලෙසු ජො.

---

4. **යදි**= ඉදින්; (**යස්සා**= යම් මාත්‍රාජාතියකගේ;) **අඛිලෙසු පාදෙසු**= සියලු පාදයන්හි; **ආදිතො**= ආදියෙහි; **ජො**= ජගණ යෙක්; **සිතො**= සිටියේ වී නම්; **එත්‍ථ**= මෙහි; (**සා**= ඕ මාත්‍රා ජාතිතොමෝ;) **දක්ඛිණන්තිකා**= “දක්ඛිණන්තිකා,, යයි කියනලදී.

**වි:**– පාද සතරෙහි ම ආදියෙහි ජගණයක් යෙදී සෙසු ලක්‍ෂණ සාමාන්‍යවෛතාලීයයෙහි මෙන් සිටි කල **“දක්‍ෂිණාන්තිකා,,** නම් වේ. මෙහි ද දක්වනලද්දේ අඩියෙකි. “යදාදි,, කියා ද “සිතෙත්‍ථ,, කියා ද ආදියෙහි ජගණ යෙදී තිබේ. ඒ ජගණයෙහි වූ මාත්‍රා සතරත් සමග විෂම සමපාදයන්හි මාත්‍රා සයක් හා අටක් හැර එයින් පරව රගණ–ලඝු–ගුරු ද යෙදී තිබේ. මේ ලක්‍ෂණයෙන් ම අපරාඩියත් ගත් විට ගාථාව පිරේ.

වෛතාලීයපාදයන්ගේ ආදියෙහි ජගණ යෙදූන බැවින් මෝ තොමෝ “වෛතාලීයදක්‍ෂිණාන්තිකා,, නමුදු වේ. මෙසේ ම, “ඖපච්ඡන්දසික–ආපාතලිකා,, ලක්‍ෂණ ඇති පාදයන්ගේ ද ආදියෙහි ජගණ යෙදූන කල “ඖපච්ඡන්දසික දක්‍ෂිණාන්තිකා ආපාතලිකාදක්‍ෂිණාන්තිකා,, යයිද කියනු ලැබේ. එහෙයින් දක්‍ෂිණාන්තිකා තොමෝ ත්‍රිවිධ වන්නීය. පාදයක් පාසා ලැබෙන මාත්‍රාසඞ්ඛ්‍යාව යථොක්ත ත්‍රිවිධවෘත්තයන්ට ම සමාන වේ.

මෙහි ආදියෙහි ජගණය නිත්‍යහෙයින් විෂමපාදයන්හි විකල්පදෙකෙකි. සමපාදයන්හි විකල්ප පසකි. එය මෙහි දක්වන වින්‍යාසය බලා දතයුතුයි.

| විෂමපාද විකල්ප=2 | සමපාද විකල්ප=5 |
|---|---|
| –◡–, ◡ | –◡–, ◡◡ |
| –◡–, –– | –◡–, ––◡ |
| | –◡–, –◡– |
| | –◡–, ◡–– |
| | –◡–, –––– |

අවසානයෙහි යෙදෙන ලක්‍ෂණ හැර විෂම–සමපාදයන්ගේ මාත්‍රා සයෙහි හා අටෙහිත් මේ වින්‍යාසයට අනුව ගුරුලඝු යෙදේ, පාදදෙක්හි ම විකල්ප ගුණ වූ විට (2 × 5=10) දසයකි. මේ අඩියක විකල්පයෝයි. අඩිදෙක්හි ම (10 × 10=100) සියයෙකි. මේ විකල්පසඞ්ඛ්‍යාව ද පළමු දැක්වූ වෛතාලීයවිකල්පයන්හි ම ඇතු

5. උදීච්චවුත්ති ති වුච්චතෙ– ජො චා’දෙ විසමෙසු සණ්ඨිතො.
6. පුබ්බත්‍ථ සමෙසු චෙ ගජා–පච්චවුත්ති රුදිතො’ති සණ්ඨිතා.

---

ලත් වේ. “දක්ෂිණාන්තිකා” විකල්ප ද සංස්කෘතයෙහි මීටවඩා අඩු විය හැක, සාමාන්‍ය ලක්ෂණයෙහි සම මාත්‍රා පරමාත්‍රා ඇසුරු නො කරන හෙයිනි.

5. **චෙ**= ඉදින්; **විසමෙසු**= විෂමවූ (පළමුවන තුන්වන) පාදයන්හි **ආදෙ**= ආදියෙහි; **ජො** ජගණය; **සණ්ඨිතො**= සිටියේ වී නම්; (**තදා**= එකල්හි;) **උදීච්චවුත්ති ඉති**= “උදීච්‍යවෘත්ති; යයි; **වුච්චතෙ**= කියනුලැබේ.

**වි**:– “චෙ × ආදෙ,, යී පදච්ඡේදයි. විෂම පාදයන්හි පමණක් ආදියෙහි ජගණය සිටියේ නම් **උදීච්‍යවෘත්ති** යයි; කියනුලැබේ. මේ “උදීච්‍යවෘත්ති,, ය ද “දක්ෂිණාන්තිකාව,, මෙන් වෛතාලීයාදි තුනෙහි ම යෙදෙන හෙයින් “වෛතාලීයඋදීච්‍යවෘත්ති,, ආදිවශයෙන් ත්‍රිභෙද වේ. පාදයක් පාසා ලැබෙන මාත්‍රාසඞ්ඛ්‍යාව ද ඒ ඒ වෘත්තයන්ට සමාන වේ.

මෙහි විෂමපාදයන්හි “දක්ෂිණාන්තිකා,, වෙහි මෙන් විකල්ප දෙකක් ද සමපාදයන්හි “වෛතාලීයයෙහි,, මෙන් විකල්ප තිස් එකක් ද ලැබේ. අර්ධයක විකල්ප (2 × 31=62) දෙසැටකි. අනිත් අර්ධයෙහිත් එසේ මැයි. අර්ධදෙක්හි ම විකල්ප (62 × 62 × =3844) තුන්දහස් අටසියසුසාලිසකි. මොවුහු ද වෛතාලීයවිකල්පසඞ්ඛ්‍යා වෙන් උද්ධරණය කළ යුත්තාහුය.

6. **චෙ**= ඉදින්; **සමෙසු**= (දෙවන–සතරවන) සමපාදයන්හි; **පුබ්බත්‍ථ**= පූර්වයෙහි; **ගජා** ගුරක් හා ජගණය ද යන මොහු; **සණ්ඨිතා**= සිටියාහු වී නම් (**තදා**= එකල්හි;) **පච්චවුත්ති ඉති**= “ප්‍රාච්‍යවෘත්ති,, යයි; **උදිතා**= කියනලදී.

**වි**:– “රුදිතා යන තැන්හි “ර,, කාර සන්ධිජයි. සමපාදයන්හි ආදියෙහි ගුරක්හා ජගණය වීම “ප්‍රාච්‍යවෘත්ති,, යෙහි විශෙෂ ලක්ෂණයයි. මෙහි “පච්චවුත්ති,, යී ගුරක් හා ජගණය දක්නා ලැබේ. සෙසු ලක්ෂණ වෛතාලීයයෙහි මෙනි, මේ ලක්ෂණයෙන් ඉතිරි අර්ධයත් ගත් විට ගාථාව පිරේ. මේ ප්‍රාච්‍යවෘත්ති ද පෙර සෙයින් ම ත්‍රිවිධ වේ, පාදයක් පාසා ලැබෙන මාත්‍රා සඞ්ඛ්‍යාව ද පෙර මෙනි.

**7, සමා'සමා'ත්‍රා'දිනං සමා–සංයුතා භවති තං පවත්තකං.**

"වෘත්තරත්නාකරයෙහි **ප්‍රවෘත්තක** **ප්‍රතෝ'ථ පකෑවමඃ** යි සම පාදයන්ගේ පස්වන මාත්‍රාව මුලින් සිටි සතරවන මාත්‍රාව හා එක්ව ගුරක් වන බව කියනලදි; සෙසු තැන්හි. සමමාත්‍රා පර මාත්‍රා ඇසුරු නො කරන හෙයින් එහි තුන්වන සවන මාත්‍රා දෙක ද ලඝුදෙකක් ම වේ. දූන් එහි ජගණයක් වූ බව ප්‍රක ටය, පළමුවන දෙවන මාත්‍රා දෙක පිළිබඳ නියමයක් නො දක් වූ හෙයින් එ ය ගුරකින් හෝ ලඝු දෙකකින් හැබීමට ඉඩතිබේ, මෙහි වනාහි **"ගජා,,** යී වෙසෙසා කී හෙයින් ප්‍රථම– විතීය මාත්‍රාවය ගුරු අකුරකින් ම තැබියයුත්තේය. එහෙයින් මෙයද සංසකෘත ඡන්දසට වඩා මෙහි ඇති විශෙෂයක්සේ සැලකිය යුතුයි.

මෙහි විෂමපාදයෙහි වෛතාලීයයෙහි මෙන් විකල්ප නො ලෙසකි. සමපාදයෙහි සත්වන අටවන මාත්‍රාවන්හි ලැබෙන විකල්පදෙක පමණකි, අඩියක විකල්ප (13 × 2=26) සවිස්සෙකි, අඩිදෙක්හි ම විකල්ප (26 × 26=676) හයියහැත්තෑසයෙකි. මො වුහු ද පළමු වෛතාලීය සඞ්ඛ්‍යාවෙහි ම ඇතුලත් වෙත්.

7. **අත්‍ර=** මේ මාත්‍රාජාතියෙහි; **ආදිනං=** ආදිවූ උදීච්‍යවෘත්ති ප්‍රාච්‍යවෘත්ති දෙදෙනාගේ; **සමා × අසමා**=සම වූද විෂමවූ ද පාද යෝ; **සමා=** (ලක්ෂණහෙයින්) සමවූවාහු; **සංයුතා=** (විපය්‍යාස යෙන්) යෙදුනාහු වෙත්ද, **තං=** (එකල්හි) ඒ වෘත්තය; **පවත්තකං භවති=** "ප්‍රවෘත්තක" නම් වේ.

**වි:–** මෙහි "ආදිනං" යන්නෙන් නිර්දිෂ්ටවූ "උදීච්චවුත්ති–පාචීන වුත්ති"යන දෙකට අනුලෝමයෙන් "අසමා–සමා"යි කිවයුත්තෙහි "අසමා ච සමා ච" යන වාක්‍යයෙහි අල්පස්වරශබ්දයාගේ පූර්ව නිපාතය කොට විලෝමක්‍රමවශයෙන් "සමා'සමා"යි තබනලදී. "උදීච්‍යවෘත්ති" විෂමපාදය හා "ප්‍රාච්‍යවෘත්ති සමපාදයෙන් රචනා කරනලද්දේ **"ප්‍රවෘත්තක"** නමි. මෙහි ප්‍රථමපාදයෙහි "සමාස"යි ආදියෙහි ජගණය ද විතීයපාදයෙහි "සං,යුතාභ"යි ආදියෙහි ගුරක් හා ජගණය ද යෙදී තිබේ. සාමාන්‍යලක්ෂණ වෛතාලීයයට සමානයි මේ ලක්ෂණයෙන්ම අතිත් අඩියත් ගත්විට ගාථාව පිරේ.

**මෙය ද පළමු සෙයින් ත්‍රිවිධ වේ, විෂමපාදයෙහි "උදීච්‍ය වෘත්ති" යෙහි මෙන් විකල්ප දෙකක් ද සමපාදයෙහි "ප්‍රාච්‍යවෘත්ති" යෙහි මෙන් විකල්ප දෙකක් ද වේ.** අඩියක විකල්ප (2 × 2 = 4) **සතරක්. උභයාඞ්ගියෙහි ම (4 × 4 = 16) සොළොසකි. මෙය ද පළමු දක්වූ වෛතාලීයවිකල්පසඞ්ඛ්‍යාවෙහි ම ඇතුලත් වේ.**

8. අස්ස යා සමකතා'පරාන්තිකා.
9. තදඤ්ඤජා චාරුහාසිනී.

**වෙතාලීය ජාතයො.**

---

8. **යා**= යම් මාත්‍රාජාතියක්; **අස්ස**= මේ ප්‍රවෘත්තකයාගේ; **ස ම ක තා**= සමපාදයෙන් රචනාකරනලද්දී ද; (ඕහොමෝ) **අපරාන්තිකා**= "අපරාන්තිකා" නමු.

**වි:**- "ප්‍රවෘත්තකයාගේ" සමපාදලක්ෂණයෙන් පාදසතරම රචනාකරනලද්දී **"අපරාන්තිකා"** යි. ප්‍රවෘත්තකසමපාද නම්? ප්‍රාච්‍යවෘත්තිසමපාද මැයි. පාදයක් පාසා මාත්‍රා සොළස බැවින් යෙදේ. මෝහොමෝ ද පළමු සෙයින් ත්‍රිවිධ වන්නිය. මෙහි පාදයක විකල්ප දෙකකි. අර්ධයක $(2 \times 2 = 4)$ සතරකි. සියල්ල $(4 \times 4 = 16)$ සොළසකි. මොවුහු වෛතාලියාදීන්ගේ විකල්ප සඞ්ඛ්‍යාවෙන් බාහිර වෙත්.

9. **තදඤ්ඤජා**= එයින් අන්‍යවූ (ප්‍රවෘත්තකයාගේ) විෂමපාදයෙන් ජාතවූවා; **චාරුහාසිනී**= "චාරුහාසිනී" නමු.

**වි:**- "ප්‍රවෘත්තකයාගේ" විෂමපාදයෙන් පාදසතර ම බඳනා ලද්දී. **"චාරුහාසිනී"** නම්, මේ විෂමපාද නම්? "උදීච්‍යවෘත්ති" විෂමපාද මැයි, "දක්ෂිණාන්තිකා" විෂමපාදයත් මේ මැයි. මෙහි පාදයක මාත්‍රා තුදුසකි. මෝ ද පළමු සෙයින් ත්‍රිභෙද වේ. පාද යක විකල්ප දෙකකි. වෘත්තයෙහි සියලු විකල්ප $(2 \times 2 = 4 \times 4 = 16)$ සොළොසක් වෙති, මේ සොළොස ද වෛතාලියාදීන්ගේ සඞ්ඛ්‍යා වෙන් බාහ්‍යවෙත්.

සංස්කෘත ඡන්දෝග්‍රන්ථයන්හි මෙහි නො දක්වනලද අන්‍යවූත් වෛතාලිය භෙදයෝ දක්නා ලැබෙති, ඔවුහු මේ මාගධිකඡන්දශ් ශාස්ත්‍රයට ද අවිරුඬ බැවින් ලක්ෂණ මාත්‍රයෙන් මෙහි දක්වනු ලැබෙත්.

1. වෛතාලීය සමපාදයෙන් රචනාකරනලද්දී **"අන්‍ය-දක්ෂිණාන්තිකා"** නම්.
2. වෛතාලීය විසමපාදයෙන් රචනාකරනලද්දී **"උත්තරාන්තිකා"** නම්.
3. ආපාතලිකා–ප්‍රාච්‍යවෘත්තීන්ගේ විසමපාදයෙන් රචනාකරන ලද්දී **"අඩා'පාතලිකා"** නම්.

වෛතාලීය වෘත්තයාගේ පාදයක් පාසා අන්තයෙහි අධික ගුරක් යෙදීමෙන් **ඖපච්ඡන්දසික** ලක්ෂණය ලැබෙනබැවි පළමු

1. සිඛිවිහතවසුලහු රචලධිති ඊහ.
2. මත්තාසමකං නවමො ල් ග'න්තෙ.

---

දක්වනලදී, එපරිද්දෙන් ම "ආපාතලිකා"දී සප්තවෘත්තයන්ගේ පාදයක් පාසා අන්තයෙහි අධික ගුරක් යෙදීමෙන් ආපාතලිකාදි සංඥ පෙරටු කොට ඇති ඖපච්ඡන්දසික සතක් ලැබේ. "ආපාතලිකෞපච්ඡන්දසික" "දක්ෂිණාන්තිකෞපච්ඡන්දසික" යනාදි වශයෙනි. මෙසේ සියලු ම වෛතාලිය භෙදයෝ එක්තිසක් පමණ වේ.

ඒ මෙසේයි-

| | |
|---|---|
| "වෛතාලිය-ඖපච්ඡන්දසික-ආපාතලිකා යන ප්‍රමුඛවෘත්ත | 3 යි |
| "දක්ෂිණාන්තිකාදි වෘත්තසය එකක් එකක් ත්‍රිභෙද වීමෙන් | 18 |
| "අන්‍යදක්ෂිණාන්තිකාදිභෙද | 3 |
| "ආපාතලිකෞපච්ඡන්දසිකාදිභෙද | 7 |
| සියල්ල | 31 |

## වෛතාලීයජාතියි.

ප්‍රාප්තාවසරයෙහි **මාත්‍රාසම** ජාති දක්වන්නාහු "සිඛිවිහත,, යනාදිය ආරම්භ කරත්.

1. සිඛිවිහතවසුලහු= **සිඛි**= දෙකින්; **විහත**= ගණනලද; **වසුලහු**= අට ලඝුවක් ඇත්තේ; (ලඝු සොළසක් යයි කියනලද වෙයි.) **ඉහ**= මේ "මාත්‍රාසම,, ජාතියෙහි; **අචලධිති**=" අචලධෘති නමි.

මෙහි රකාර ආගමජයි.

**වි:-** මාත්‍රාසමජාතියෙහි එක් පාදයක ලඝු ම සොළසක් යොදා ඉතිරි පාද තුනත් එසේ ම රචනා කරන ලද්දී **අචලධෘති** නම් වෘත්තයයි.

ෂොඩශමාත්‍රිකච්ඡන්දසෙහි අවසානයෙහි යෙදෙන 1597 වන වෘත්තය වූ මෙය "අෂ්ටි, නම් වර්ණච්ඡන්දසෙහි 65 536 වන අවසානවෘත්තය මෙන්ද සිටී, එයද ලඝු සොළසකින් පරිමිත හෙයිනි. පිඞ්ගලයන් **ශිඛාසාගර** නාමයෙන් **ද**ක්වන ලද්දේත් මේ වෘත්තය'යි. මාගධීකාච්ඡන්දස් කරුවෝ කෙදාරභට්ටාදීන් විසින් ගත් සංඥ අනුගමනය කරමින් "අචලධිති,, යයි කීහ. සියලු තැන්හි ලඝුම යෙදෙන හෙයින් මෙහි විකල්ප නො ලැබේ.

"ලහු,, ශබ්දය මාත්‍රාර්ථයෙහි ලා ගෙන "සිඛිවිහතවසුලහු., යන පදය මත්තෙහි ද සම්බන්ධ කරනු ලැබේ. එහෙයින් මාත්‍රාසමකාදියෙහි ද පාදයක මාත්‍රා සොළසක් ම ඇතැයි ද ඔවුහු ෂොඩශමාත්‍රිකච්ඡන්දස්හි ම ඇතුලත් වෙතැ'යි ද සැලකිය යුතුයි.

2. (**යදි**= ඉදින්; ෂොඩශමාත්‍රික පාදයෙහි) **නවමො**= නව වැනි වූයේ; **ල්**= ලඝුවෙක් වේද; **අන්තෙ**= කෙළවර; **ග්**= ගුරෙක් වේද; (**කදා**= එකල්හි ඒ වෘත්තය;) **මත්තාසමකං**= "මාත්‍රාසමක" නම් වේ.

**වි**:= නවවැනි මාත්‍රාව ලඝුවක් වී අන්තයෙහි ගුරක් ඇතිකල්හි **මාත්‍රාසමක** වෘත්තය වේ, සෙසු තැන්හි විශ්ලොකාදීන්ට ඉෂ්ට නො වන සේ ගුරු–ලඝු මිශ්‍රව ද යෙදේ. "මත්තාසමකං" යනාදිය ම ඊට නිදර්ශනයි, ඉතිරි පාදතුනත් මේ ලක්ෂණයෙන් ගත්විට ගාථාව පිරේ.

වෛතාලීය ජාතියෙහි මෙන් මාත්‍රාසමජාතියෙහි ද "සමමාත්‍රා පරමාත්‍රා ඇසුරු නො කිරීම" සංස්කෘත ඡන්දශ්ශාස්ත්‍රඥයන්ගේ පිළිගැනීමයි. එහෙත් මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි වෛතාලීය ජාතියෙහි ලා තද්ව්‍යවස්ථාව නො යෙදෙනබැව් පළමු කියනලදි. එසේ ම මේ මාත්‍රා සමජාතියෙහි ද සමමාත්‍රා පරමාත්‍රාව සමග එක්ව ගුරක් වුව ද නිර්දෝෂ වේ. එසේ ගත්විට මාත්‍රාසමකාදීන්ගේ විකල්ප පිළිබඳ සංස්කෘතයට වඩා විශෙෂතා ද ඇතිවිය හැකියි. එපරිද්දෙන් ම මෙහි ඔවුන්ගේ විකල්පව්‍යවස්ථාව කරනු ලැබේ.

මාත්‍රාසමකාදීන්ගේ පාදයක ලැබෙන මාත්‍රා සොළස ගණවශයෙන් භාග (=කොටස්) සතරකි, ඔවුනතුරෙන්–

(1.) ප්‍රථමගණස්ථානයෙහි සර්වගුරුආදි ගණපසින් අභිමත ගණයක් යෙදීමට බාධාවක් නැත. සමමාත්‍රා පරමාත්‍රාව ඇසුරු කිරීමෙන් දොසක් නො වන හෙයිනි.

(2.) ද්විතීයගණස්ථානයෙහි සර්වගුරු – අන්තගුරු – ආදි ගුරු ගණ තුනෙන් එකක් ම යෙදේ. මධ්‍යගුරු හෝ සර්වලඝුගණයක් නො යෙදිය යුතුයි. "චිත්‍රා" පාදයක් වියහැකි හෙයිනි. (මෙහි මධ්‍යගුරු – සර්වලඝු නො යෙදිය යුත්තේ "විශ්ලොකයට ඉෂ්ටබැවිනැයි කිසිවෙක් කියති. එය නො ගත යුතුයි විය හැක්කේ විශ්ලොක නොව චිත්‍රා මැයි, තෘතීයගණස්ථාන විමසනු.)

(3.) තෘතීය ගණස්ථානයෙහි අන්ත්‍ය ගුරුගණය පමණක් ම යෙදේ නවවැන්න ලඝුවක් වියයුතු හෙයින් සර්වගුරු – ආදිගුරු ගණ නො යෙදෙති, මධ්‍යගුරු – සර්වලඝුගණයෝ "වානවාසිකා" ලක්ෂණ හෙයින් නො යෙදෙත්.

(4.) චතුර්ථස්ථානයෙහි සර්වගුරු – අන්තගුරුගණ දෙක පමණක් යෙදෙත් අන්තයෙහි ගුරක් වියයුතු හෙයින් අන්‍යගණයෙක් නො යෙදේ.

### 3. ජෝ නලා'ථවා'ණ්ණවා විසිලොකො.

ගණස්ථාන විකල්පනයෙහි දී ස්වලක්ෂණයට බාධා නො වන සේ පෙනෙතත් ඒ ඒ ගණස්ථානවල අන්‍යවෘත්තයකට ඉෂ්ට වූ ගණයක් නො යෙදිය යුතුයි. එසේ ඇතිකල්හි මතු දක්වන පාදාකුලකය හෝ අන්‍යවෘත්තයක් විය හැකි හෙයිනි.

“මත්තාසමකං” යනාදියෙහි වින්‍යාසය හා ගණස්ථාන විකල්ප මෙසේයි.

| 1 - 5 | 2 - 3 | 3 - 1 | 4 - 2 |
|---|---|---|---|
| මත්තා , | සමකං , | නව මෝ , | ල්ගනෙත |
| ⏑ ⏑ | – – ⏑ | – – ⏑ | ⏑ ⏑ |

මෙහි නවවැනි මාත්‍රාව ලඝුවකි, අන්තයෙහි ගුරකි, කිසි තැනෙකත් අන්‍යවෘත්තයකට ඉෂ්ට පරිදි ගණ යෙදී නැත. ගණස්ථාන විකල්ප එකිනෙක ගුණ කිරීමෙන් පාදයක ($5 \times 3 = 15 \times 1 = 15 \times 2 = 30$) විකල්ප තිසකි. අඩියක ($30 \times 30 = 900$) නවසියයකි. අඩ දෙක්හි ම ($900 \times 900 = 810000$) අටලක්ෂ දසදහසකි. මේ සඞ්ඛ්‍යාව පාද සතරෙහි ගණවිකල්ප සඞ්කලනයෙන් ම ලැබේ.

“ගනෙත” යනු මත්තෙහි වැටේ. එහෙයින් “විශ්ලෝකා” දියෙහි ද අන්තයෙහි ගුරක් ම වේ.

3. **අණ්ණවා**= අර්ණවයකින් හෙවත් මාත්‍රා සතරකින් පරව; **ජො**= ජගණය වේද; **අථවා**= නොහොත්; **නලා**= නගණ-ලඝු යන මොහු වෙත් ද; (එකල්හි ඒ වෘත්තය) **විසිලොකො**= “විශ්ලෝක” නම් වේ.

**වි:-** මාත්‍රා සතරකින් පර ව මධ්‍යගුරු = ජගණය හෝ සර්වලඝුගණය යෙදීමෙන් **විශ්ලෝකා** නම් වෘත්තය වේ. මෙහි ද අන්තයෙහි ගුරක් ඇති මාත්‍රා සොළසක් වේ. සූත්‍රය ජගණපක්ෂයෙහි උදාහරණයි. එහි “ජෝනලා” යි මාත්‍රා සතරකි, ඉන් පර ව “ථවාණ්ණ” යි ජගණය යෙදී තිබේ. නගණ – ලඝු යයි කියන ලද්දේ සර්වලඝුගණය මැයි, ඒ සර්වලඝුපක්ෂයෙහි නිදසුන් මෙසේයි.

“චරණම්බුජජුසිතා හගවා තෙ-සිකතා මපි විහවං නහි දජ්ජා” මෙහි පාද දෙක්හි ම මාත්‍රා සතරින් පර සර්වලඝුගණය යෙදී තිබේ.

(1.) විශ්ලෝකයෙහි ද ප්‍රථම ගණස්ථානයෙහි සර්වගුරු ආදි ගණ පසින් අභිමත වූවක් යෙදිය හැකි හෙයින් විකල්ප පසකි.

(2.) ද්විතීය ස්ථානයෙහි නිත්‍යයෙන් ජගණය හෝ සර්වලඝු ගණය වියයුතු බැවින් විකල්ප දෙකකි.

4. තචයතො වානවාසිකා'ඛ්‍යා.

(3.) තෘතීය ස්ථානයෙහි සර්වගුරු – ආදි ගුරුගණ දෙක පමණක් යෙදේ. "චිත්‍රා" පාදයක් විය හැකි හෙයින් අන්‍යගණයක් නො යෙදිය යුතුයි.

(4.) චතුර්ථ ස්ථානයෙහි මාත්‍රාසමකයෙහි මෙන් සර්වගුරු – අන්ත්‍යගුරුගණ දෙක පමණකි.

එක් එක් ගණස්ථානයක විකල්ප පෙර සේ ම ගුණ කිරීමෙන් විශ්ලොකපාදයක විකල්ප (5 × 2 = 10 × 2 = 20 × 2 = 40) සතලිසකි. පාදසතරෙහි ම (40 × 40 = 1600 × 1600 = 2560000) පස්විසිලක්ෂ සැටදහසකි.

"ජො නලාථවා" යනු මතු සූත්‍රයෙහි වැටේ.

4. **නවිසගකො**– ඒ අෂ්ට දෙකකින් හෙවත් මාත්‍රා අටකින් පර ව; (**ජො**= ජගණය වේ ද; **අථවා**= නොහොත්; **නලා**= නගණ –ලඝු යන මොහු වෙත් ද; එකල්හි ඕ මාත්‍රාසමජාති තොමෝ) **වානවාසිකාඛ්‍යා**= "වානවාසිකා" නම් වන්නිය.

**වි:**= මාත්‍රා අටකින් පර ව ජගණය හෝ සර්වලඝුගණය වීමෙන් **වානවාසිකා** වෘත්තය ලැබේ. සූත්‍රය ජගණය යෙදුන පක්ෂයට උදාහරණයි, එහි "තචයතො වා" යි මාත්‍රා අටකි. එයින් පර ව "නවාසි" යි ජගණය යෙදී තිබේ. න–ලඝුපක්ෂයෙහි නිදසුන් මෙසේයි–

"බ්‍රහමසුරාසුරනරමනුජා කිං – පාදනබංසුං සිරසි වහනෙත"

මේ පාදදෙක්හි ම මාත්‍රා අටකින් පර ව සර්වලඝුගණය යෙදී තිබේ.

(1) මෙහි ද ප්‍රථමගණස්ථානයෙහි විකල්ප පෙර සේ මැයි.

(2) ද්විතීයස්ථානයෙහි මාත්‍රාසමකයෙහි මෙන් සර්වගුරු–අන්ත ගුරු–ආදිගුරුගණ තුන පමණක් යෙදේ. "චිත්‍රා" පාදයක් විය හැකි හෙයින් ඉතිරි ගණ නො යෙදිය යුතුයි.

(3) තෘතීයස්ථානයෙහි මධ්‍යගුරු = සර්වලඝුගණ දෙක නියම යෙන් ම වේ.

(4) චතුර්ථස්ථානය ද මාත්‍රාසමකයට සමානයි.

මෙසේ ඒ ඒ තැන්හි යෙදෙන ගණයන්ගේ වශයෙන් පාදයක විකල්ප (5 × 3 = 15 × 2 = 30 × 2 = 60) සැටකි. පාදසතරෙහි විකල්ප (1,29,60,000) එක්කෝටි විසිනවලක්ෂ සැටදහසකි.

5. පඤ්චම'ඨනවසු යදි ලො චිත්‍රා.
6. ගලෘා'ඨහි වෙ සා චුපචිත්‍රා.

---

මේ "වානවාසිකා" වෙහි ද නවවෙනි මාත්‍රාව ලඝුවක් ම වන හෙයින් "මාත්‍රාසමක" ලක්ෂණ ඇත්තේ නො වේ ද යත්? සැබව- මෙහි නවවැන්න ලඝු වූයේ තෘතීයගණස්ථානයෙහි ජගණය හෝ සර්වලඝුගණය යෙදී මෙනි. මාත්‍රාසමකයෙහි තෘතියස්ථානයෙහි අන්ත්‍යගුරුගණය ම යෙදීමෙන් නවවැන්න ලඝුවක් වේ. මෙසේ මේ වෘත්තයන් දෙදෙනාගේ විශෙෂය සැලකිය යුතුයි. (61 වෙනි පිටේ කොෂ්ටය ද බලනු.)

5. **යදි**= ඉදින්; **පඤ්චමඨනවසු**= පඤ්චම අෂ්ටම නවම ස්ථාන යන්හි; **ලො**= ලඝුවෙක් වී නම්? (එකල්හි ඒ වෘත්තය) **චිත්‍රා**= "චිත්‍රා" නම් වේ.

**වි:**— කෙළවර ගුරක් ඇති ෂොඩශමාත්‍රිකා පාදයෙහි පස්වෙනි අටවෙනි නවවෙනි මාත්‍රා ලඝුවකින් තැබූ කල්හි "චිත්‍රා" නම් වෘත්තය වේ. "පඤ්චම" යනාදි සූත්‍රයෙහි "ඨ – සු – ය" යන මොහු පිළිවෙළින් පඤ්චම අෂ්ඨම නවම මාත්‍රාවෝයි.

(1) මෙහි ද– ප්‍රථම (4) චතුර් ගණස්ථාන විකල්ප මාත්‍රාසමක යෙහි මෙනි.

(2) විතියස්ථානයෙහි ජගණය හෝ සර්වලඝුගණය ම යෙදිය යුතුයි. පස්වෙනි අටවෙනි මාත්‍රා ලඝු වියයුතු හෙයිනි.

(3) තෘතීයස්ථානයෙහි අන්ත්‍යගුරු – මධ්‍යගුරු – සර්වලඝුගණ තුනෙන් එකක් ම යෙදිය යුතුයි. නවවැන්න ලඝුවක් වියයුතු හෙයිනි.

මේ "චිත්‍රා" වෙහි ද නවවැන්න ලඝුවක් හෙයින් "මාත්‍රාසමක" ලක්ෂණ ද විතීයස්ථානයෙහි ජගණය හෝ සර්වලඝුගණය යෙදෙන හෙයින් "විශෙලොකලක්ෂණ ද ඇතැයි කියහැකියි. එහෙත් ඒ ඒ තැන්හි යෙදෙන ගණයන්ගේ වශයෙන් ඔවුන්ගේ විශෙෂය සැල කිය යුතුයි.

6. **වෙ**= ඉදින්; (**යස්සා**= යම් මාත්‍රාසමජාතියකාගේ;) **අඨහි**= මාත්‍රා අටකින් පරව; **ගලෘා**= ගුරු – ලඝු - යගණ යන මොහු වෙත් ද; **සා**= ඕ තොමෝ; **උපචිත්‍රා**= "උපචිත්‍රා" නමු.

**වි:**— මාත්‍රා අටකින් පර ව ගුරු – ලඝු හා යගණය යෙදීමෙන් **උපචිත්‍රා** වෘත්තය වේ යයි කියනලදී. මෙහි ද "ගලෘාඨහි වෙ" යී මාත්‍රා අටකි. එයින් පරව "සා චුපචිත්‍රා" යී ගුරු – ලඝු හා යගණය යෙදී තිබේ.

සොදුරහටවයෝ "උපචිත්‍රා නවමෙ පරයුතොත" යි මාත්‍රා අට කින් පර ව ගුරක් යිටීම පමණක් උපචිත්‍රාලක්ෂණය කොට දක්වූහ එහෙත් ශ්‍රී සඞ්ඝරක්ෂිත මහාස්වාමිහු "අෂ්ටමෙෂ්‍යා ගො ල්‍යාවුපචිත්‍රා" යන ජයදෙවවචනය ම්මෙහි දී ඇසුරු කළබැව් පෙනේ. "අඞ්ඝියුගා ද්හශෙවදු ප්චිත්‍රා" යන පඤ්චිකාවචනයෙන් ද මෙකී ලක්ෂණය ලැබේ ගුරු - ලඝු - යගණ සිටිකල්හි භගණය ලැබෙන හෙයිනි.

(1) මෙහි ප්‍රථම (2) ද්විතීයස්ථානවිකල්ප මාත්‍රාසමකයෙහි මෙනි. (3) තෘතීයස්ථානයෙහි ආදි ගුරුගණය ද; (4) චතුර්ථ ස්ථානයෙහි සර්ව්ගුරුගණය ද පමණක් යෙදේ. අටකින් පර ව ගුරු - ලඝු යගණ යෙදියයුතු හෙයිනි. මෙහි ලැබෙන ස්ථානභෙද ගුණිවීමෙන් පාදයක විකල්ප (15) පසළොසකි. පාදසතරෙහි විකල්ප (50'625) පනස්දහස් හයියවිසිපහකි.

මාත්‍රාසමකාදිවෘත්ත පසෙහි ඒ ඒ ස්ථානයෙහි යෙදෙන ගණ විකල්පාදිය පහත දක්වන කොෂ්ඨයෙන් දතයුතුයි. එහි මාත්‍රා චිහ්ණයාගේ යට "." මේ ලකුණෙන් දක්වන්නේ ඒ ඒ වෘත්තයට විශෙෂයෙන් ලක්ෂණ වන ස්ථානයයි.

| 1. ගණ ස්ථානය | 2. ස්ථානය | 3. ස්ථානය | 4. ස්ථානය | වෘත්තය | පාදයක විකල්ප | පාදසතරෙහි විකල්ප |
|---|---|---|---|---|---|---|
| ⏑⏑<br>– – ⏑<br>– ⏑ –<br>⏑ – –<br>– – – – | ⏑⏑<br>– – ⏑<br>⏑ – – | – – ⏑<br>· | ⏑⏑<br>– ⏑ ⏑ | මාත්‍රා සමක | 30 | 8 10 000 |
| වෛතාලීයාදී සතරෙහි ප්‍රථම ස්ථාන විකල්ප මාත්‍රා සමකයෙහි මෙනි. | – ⏑ –<br>· ·<br>– – – –<br>· · | ⏑⏑<br>⏑ – – | ⏑⏑<br>– – ⏑ | වෛතාලීය | 40 | 25 60 000 |
| | ⏑⏑<br>– – ⏑<br>⏑ – – | – ⏑ –<br>· ·<br>– – – –<br>· · | ⏑⏑<br>– – ⏑ | වානවාසිකා | 60 | 1 29 60 000 |
| | – ⏑ –<br>· ·<br>– – – –<br>· · | – – ⏑<br>·<br>– ⏑ –<br>·<br>– – – – | ⏑⏑<br>– – ⏑ | චිත්‍රා | 60 | 1 29 60 000 |
| | ⏑⏑<br>– – ⏑<br>⏑ – – | ⏑ – –<br>· · | ⏑⏑<br>· · | උපචිත්‍රා | 15 | 50 625 |

7. යමත්ථිත ලක්ඛණ විසෙස යුත්තං
මත්තාසමා'දිපාද'භිහිතං
අනියතවුත්ත පරිමාණ සහිතං
පථිතං ජනෙසු පාදකුලකං
**මත්තාසමජාතියො.**

---

7. **යං**= යම් වෘත්තයක්; **අත්ථි**= ඉකුත්වූ; **ලක්ඛණවිසෙස යුත්තං**= ලක්ෂණ විශෙෂයෙන් යුක්ත වූ; **මත්තාසමාදි**= මාත්‍රාසම කාදි වෘත්තයන්ගේ; **පාදභිහිතං**= පාදයන්ගෙන් රචනා කරන ලදද; **අනියතවුත්තපරිමාණසහිතං**– අනියම වූ වෘත්තපරිමාණ යෙන් හෙවත් අනියම වූ (මාත්‍රාසමකාදි) වෘත්තයෙන් හා ෂොඩශ මාත්‍රා සඞ්ඛ්‍යාත පරිමාණයෙන් යුක්ත වූ ( **තං**= ඒ වෘත්තය; ) **ජනෙසු**= ජනදස් වෛදික ජනයා කෙරෙහි; **පාදකුලකං**= "පාද කුලක" නමැයි; **පථිතං**= ප්‍රසිද්ධයි.

**වි:-** යටදැක්වූ මාත්‍රාසමකාදි වෘත්තයන් පස්දෙනා අතුරෙන් යම් කිසි වෘත්ත දෙකකින් හෝ තුනකින් හෝ සතරකින් මිශ්‍ර කොට පාද සතර රචනා කරන ලද්දේ අන්වර්ථ සංඥ හෙයින් **පාද කුලක** නම් වේ.

පාදකුලකය වනාහි යට දැක්වූ මාත්‍රාසමකාදීන්ගේ පාද මිශ්‍ර වීමෙන්ම ලැබෙන බව සැලකිය යුතුයි. ඒ ඒ වෘත්තයාගේ ප්‍රකට ව පෙණෙන විශෙෂ ලක්ෂණය ගෙන ලක්ෂණ මිශ්‍රකොට බඳනා ලද්දේ "පාදකුලක" යයි කියත් හොත් ශුද්ධ වූ "වානවාසිකා චිත්‍රා" දෙකටද පාදකුලක යයි කිය යුතුවේ. මේ වෘත්ත දෙක්හි "මාත්‍රාසමක, විශ්ලොක" ලක්ෂණ ඇතිසේ පෙනෙන හෙයිනි. මෙකී වෘත්තයන්ගේ විශෙෂය යට දක්වන ලදී. තවද– මෙහි පූර්ව වෘත්තයන්ගේ ලක්ෂණය අපරවෘත්තයකට බාධා නො වන පරිද්දෙන් ම පිහිටුවා ගතයුතුයි ඊට නිදර්ශනයක් නම්? "නවවෙනි මාත්‍රාව ලඝුවක් වීම මාත්‍රාසමක ලක්ෂණය'යි" තෘතීය ගණස්ථානයෙහි අන්තගුරු– මධ්‍යගුරු– සර්ව ලඝු ගණ තුනෙන් කවරක් යෙදුවත් ඒ ලක්ෂණය ලැබේ. එසේ ම මාත්‍රා අටකින් පරව ජගණය හෝ සර්වලඝු ගණය යෙදීම "වාන වාසිකා" ලක්ෂණය'යි, හෙද තෘතීයස්ථාන යෙහි ම වේ. දැන් වාන වාසිකා ලක්ෂණයෙහි මාත්‍රාසමකලක්ෂණයත් මිශ්‍රවූ බැව් පෙනේ. මේ වෘත්තයන් දෙදෙනාගේ ලක්ෂණ මිශ්‍ර නො වී එකිනෙක් වෙනස් වීම පිණිස වානවාසිකාවට ඉෂට වූ මධ්‍යගුරු–සර්වලඝුගණ

**පාදකුලක විනිශ්චය.**

විනා චතුත්‍ථෙ මත්තා ගා- විනා වණ්ණා ගරූහි තු
විනා ලහූහි ගරවො- දලෙ පථ්‍යා'දිනො මතා.

**ඉති වුත්තොදයෙ ඡන්දසි මත්තා වුත්ත නිද්දෙසො නාම දුතියො පරිච්ඡෙදො.**

---

දෙක මාත්‍රාසමකතෘතීය ස්ථානයෙහි නො යොදා අන්ත්‍යගුරුගණය පමණක් යෙදීමෙන් නවවැන්න ලඝුවක් කළයුතුයි. සෙසු වෘත්ත ගැනත් මෙසේ මැයි.

“යමතීත” යනාදි ගයෙහි ලක්ෂණ මිශ්‍ර වී ඇතැයි කිසිවෙක් කියති. එහි ද පාදයන්ගේ මිශ්‍රත්වය ම ඇතිබව සැලකිය යුතුයි. එහි ගුරු-ලඝු වින්‍යාසය මෙසේයි.

| | 1. | 2. | 3. | 4. | |
|---|---|---|---|---|---|
| 1. | – – ◡ | – ◡ – | – – ◡ | – – ◡ | = චිත්‍රා. |
| 2. | ◡ ◡ | – ◡ – | ◡ ◡ | – – ◡ | = විශ්ලෝකා. |
| 3. | – – – – | ◡ – – | – ◡ – | – – ◡ | = වානවාසිකා |
| 4. | – – ◡ | – ◡ – | ◡ ◡ | – – ◡ | = විශ්ලෝකා. |

මෙහි ප්‍රථම පාදය **චිත්‍රා** යැ, පඤ්චම- අෂ්ටම- නවම මාත්‍රා ලඝු වූ හෙයිනි. මාත්‍රා සතරකින් පරව ජගණය ඇති හෙයින් විශ්ලෝකා නො වේ ද? නො වේ තෘතීයස්ථානයෙහි අන්ත්‍යගුරු ගණය යෙදුන හෙයිනි. මාත්‍රාසමකාද නො වේ, මාත්‍රාසමක ද්විතීයස්ථානයෙහි ජගණය නො ලැබේ. ද්විතීයපාදය **විශ්ලෝකා** යැ, මාත්‍රා සතරකින් පර ව ( ද්විතීයස්ථානයෙහි ) ජගණය යෙදුන හෙයිනි. තෘතිය පාදය **වානවාසිකා** යි, මාත්‍රා අටකින් පර ව ජගණය වූ හෙයිනි. මෙහි නවවැන්න ලඝු වුව ද මාත්‍රාසමකලක්ෂණය නො පුරයි, තෘතීය ගණස්ථානයෙහි මාත්‍රාසමකයට විෂය නො වූ ජගණය යෙදුන හෙයිනි. චතුර්ථපාදය ද **විශ්ලෝකා** යැ.

පාදාකුලකයාගේ සිද්ධියෙහි දී මාත්‍රාසමකාදි වෘත්තපස දස ආකාරයකින් මිශ්‍රවේ. ඒ මෙසේයි. (මෙහි මාත්‍රාසමකාදි වෘත්ත පස පිළිවෙළින් 1, 2, 3, 4, 5 යන අඞ්කවලින් දක්වනු ලැබෙත්.)

1- 2, 1- 3, 1- 4 1- 5, 2- 3, 2- 4, 2- 5, 3- 4, 3- 5, 4 – 5

යන ක්‍රමයෙනි. මෙහි වෘත්ත දෙකක් මිශ්‍ර වන කල්හි පාද සතර තුදුස් (=14) ආකාරයකින් මිශ්‍ර වේ. (එය මතු දක්වන ඉන්ද්‍රමාලාවෙහි පාද මිශ්‍රවන අයුරු බලා අවබෝධ කළ යුතුයි.) මෙසේ එක් එක් මිශ්‍රණයක භේද තුදුස බැගින් ලැබෙන හෙයින් වෘත්ත දෙකක් දෙකක් මිශ්‍ර වීමෙන් පාදාකුලක භේද 140 කි.

| | 1. පාදය | 2. පාදය | 3. පාදය | 4. පාදය |
|---|---|---|---|---|
| 1 | මා: | මා: | වි: | වා: |
| 2 | වා: | මා: | මා: | වි: |
| 3 | වි: | වා: | මා: | මා: |
| 4 | මා: | වි: | වා: | මා: |
| 5 | මා: | මා: | වා: | වි: |
| 6 | වි: | මා; | මා: | වා: |
| 7 | වා: | වි: | මා: | මා: |
| 8 | මා: | වා: | වි: | මා: |
| 9 | මා: | වි: | මා: | වා: |
| 10 | වා: | මා: | වි: | මා: |
| 11 | මා: | වා: | මා: | වි; |
| 12 | වි: | මා: | වා: | මා: |

පාදතුනක් මිශ්‍ර වීමේ දී එක් වෘත්තයක් සමග අනිත් වෘත්ත සතර සැඅාකාරයකින් මිශ්‍ර වේ, ඒ මෙසේයි- 1-2-3, 1-2-4, 1-2-5, 1-3-4, 1-3-5, 1-4-5,

මේ මාත්‍රා සමකය සමග ඉතිරි වෘත්ත මිශ්‍රවන අයුරුයි. මෙ සේ විශ්ලොකාදිය සමග ද සය සය පරිද්දෙකින් මිශ්‍රවන හෙයින් වෘත්ත පස තිස්ආකාරයකින් මිශ්‍ර වෙති, වෘත්ත තුනක් මිශ්‍ර වන කල්හි පාදසතර මිශ්‍රකළ හැක්කේ දෙළොස් (=12) ආකාරයකිනි, මෙසේ පාද තුනක් මිශ්‍ර වී මෙන් පාදකුලක භෙද 360 කි. මාත්‍රා සමක ප්‍රථම මිශ්‍රණය මේ කොෂ්ට යෙහි පෙනේ, සෙස්ස මේ ක්‍රම යෙන්සූදුසු සේ යොදා ගත යුතුයි.

පාද සතරක් මිශ්‍ර වීමේ දී එක් වෘත්තයක් සමග සිව් පරිද්දෙකින් මිශ්‍ර වේ. ඒ මෙසේයි-

| | 1. පාදය | 2. පාදය | 3. පාදය | 4. පාදය |
|---|---|---|---|---|
| 1 | මා: | වි: | වා: | වි: |
| 2 | මා: | වි: | වි: | වා: |
| 3 | මා: | වා: | වි: | වි: |
| 4 | මා: | වා: | වි: | වි: |
| 5 | මා; | වි: | වා: | වි; |
| 6 | මා: | වි: | වි: | වා; |

1-2-3-4, 1-2-3-5, 1-2-4-5, 1-3-4-5,

මේ මාත්‍රා සමකය සමග මිශ්‍රවන අයුරුයි. සෙස්සෙහි දු මෙසේ ම හෙයින් වෘත්ත පස විසි ආකාර යකින් මිශ්‍ර වෙති, චතුෂ්කසංක ලනයෙහි පාද සතර මිශ්‍ර කළ හැක්කේ සය (=6) ආකාරයකිනි, මෙසේ පාද සතරක් මිශ්‍ර වී මෙන් ලැබෙන පාදකුලක භෙද 120 කි. ප්‍රථම මිශ්‍රණයෙහි භෙද සය මෙහි පෙනේ. මෙපරිද්දෙන් ඒ ඒ වෘත්තයන්ගේ පාද මිශ්‍ර වීමෙන් පාදකුලක භෙද 520 කි. එකෙකි භෙදය මාත්‍රා සමකාදීන්ගේ විකල්පයන්හි ලා ගිණීමෙන් පාදකුලක විකල්ප අනන්ත වෙත්. මෙහි දක්වන ලද්දේ පාදකුලකයන් පිළිබඳ උපාය මාත්‍රයකි. ග්‍රන්ථබාහුල්‍යයට හා ආධුනිකයන්ගේ ඛෙදයටත් හෙතුවන හෙයින් ප්‍රපඤ්ච නොකරමු.

**මාත්‍රාසමජාතියි.**

මෙසේ මාගධානුරූප වූ මාත්‍රා වෘත්ත ප්‍රකාශ කොට දූන් සියලු වෘත්තයන් පිළිබඳ ගුරු– වර්ණාදීන්ගේ ප්‍රමාණය නිශ්චය කිරීමෙහි උපාය දක්වනුවෝ "විනා" යනාදිය කියත්.

**පථ්‍යාදිනො**= පථ්‍යාදි වෘත්තයාගේ; **මත්තා**= මාත්‍රාවෝ; **වණ්ණෙහි විනා**= අක්‍ෂරයන් හැර (සිටියාහු;) **ගා**= ගුරු වෙති. **තු**= තැවත; **ගුරූහි විනා**= ගුරුන් හැර (සිටියාවූ මාත්‍රාවෝ;) **වණ්ණා**= අක්‍ෂරයෝ වෙති. **ලහූහි විනා**= ලඝූන් හැර (සිටියාවූ මාත්‍රා;) **දලෙ**= අඩ කළ කල්හි; **ගුරවොමතා**= ගුරු වෙත් යයි දත්නාලද්දහුය.

**වි:**– මෙහි "වණ්ණ" ශබ්දයෙන් ස්වරයෝ ම ගැනෙති, ව්‍යඤ්ජන අනියත හෙයින් නො ගැනෙත්.

(1) පථ්‍යායහීාදි යම් කිසි වෘත්තයක හෝ අර්ධයක හෝ පාද යක අකුරු සඞ්ඛ්‍යාව ගෙන එහි මාත්‍රා ගණිතින් අඩු කළ විට අනන්තරය එහි ගුරු සඞ්ඛ්‍යාව වේ. (2) මාත්‍රාසඞ්ඛ්‍යාවෙන් ගුරු සඞ්ඛ්‍යාව අඩුකළ කල්හි ඉතිරිය වර්ණ සඞ්ඛ්‍යාවයි. (3) එහි ලඝු සඞ්ඛ්‍යාව ගෙන මාත්‍රා ගණිතින් අඩු කොට අඩ කළ (දෙකින් බෙදූ) කල්හි ද එහි ගුරු සඞ්ඛ්‍යාව ලැබේ.

(1) අකුරු සතලිසක් ඇති පථ්‍යාගාථාවක ගුරු කොතෙක් දූ?යි ඇසූ විට එහි මාත්‍රා සඞ්ඛ්‍යාවෙන් දූක්වූ අකුරු ගණන (40) අඩුකරනු. (ඒ ඒ ආයහීාවට නියමිත මාත්‍රාසඞ්ඛ්‍යා යට දක්වන ලදී. පථ්‍යාපූර්වාර්ධයෙහි මාත්‍රා 30 ක් ද අපරාර්ධයෙහි 27 ක් දූයි සියල්ල 57 කි.) එවිට එහි ගුරු සඞ්ඛ්‍යාව 17 ක් බව පෙනේ. ප්‍රථම පරිච්ඡේදයෙහි "දස්සන රසානුභවනෙ" යනාදි පථ්‍යායහීාව බලනු.

| | | |
|---|---|---|
| පථ්‍යාවෙහි මාත්‍රා | = | 57 |
| (දූක්වූ) වර්ණ | = | 40 |
| අඩු කළ කල්හි ගුරු | = | 17 |

වර්ණ ගිණීමේ දී ගුරු අකුර එකක් වශයෙන් ද මාත්‍රා ගිණීමෙ දී දෙකක් වශයෙන් ද ගිණීම හෙතුකොට ගෙන වෘත්තයක මාත්‍රා හා වර්ණසඞ්ඛ්‍යාව අතර මේ ගුරු සඞ්ඛ්‍යාව ලැබෙන බැව් සැලකිය යුතුයි.

(2) ගුරු 17 ක් ඇති පථ්‍යාවෙහි වර්ණ කොතෙක් දූ? යි විචාළ හොත් මාත්‍රා ගණිතින් ගුරු සඞ්ඛ්‍යාව අඩුකරනු–

| | | |
|---|---|---|
| පථ්‍යාවෙහි මාත්‍රා | = | 57 |
| (දූක්වූ) ගුරු | = | 17 |
| අඩු කළ කල්හි වර්ණ | – | 40 |

(3) ලඝු 23 ක් ඇති පථ්‍යාවෙහි ගුරු කොතෙක් ද? යන ප්‍රශ්නයෙහි මාත්‍රා ගණනින් ලඝු සඞ්ඛ්‍යාව අඩු කොට දෙකින් බෙදනු.

| | | |
|---|---|---|
| පථ්‍යාවෙහි මාත්‍රා | - | 57 |
| (දක්වූ) ලඝු | = | 23 |
| | 2 | 34÷2 |
| (දෙකින් බෙදූ විට) ගුරු | = | 17 |

මතු දක්වන වර්ණවෘත්තයන් පිළිබඳව ද මේ ක්‍රමය මෙසේ මැයි.

---

**"වුත්තොදය" නම් මාගධ ඡන්දශ්ශාස්ත්‍රයෙහි**
**මාත්‍රාවෘත්තනිර්දේශ නම් වූ**
**තිවිස පරිච්ඡෙදය මෙතෙකින් සමාප්තයි.**

---

මාත්‍රාච්ඡන්දස සිවුපරිච්ඡේදෙකින් විභාග කොට "මත්තාවණ්ණ විභෙදනං" යි කළ ප්‍රතිඥාවට අනුරූප වන සේ වර්ණච්ඡන්දස ආරම්භ කරනුවෝ- සූත්‍රකාර **පිඞ්ගලයන්** උක්තාදි ඡන්දස් පස වෘත්තලක්‍ෂණ කථනයෙහි ලා නො ගත් හෙයින් ද, කවිප්‍රයෝග යෙහි බහුල වශයෙන් නො දක්නා හෙයින් ද, **"ගායත්ති ඡන්ද සො මුඛං"** යි තථාගතයන් වදාළබැවි සිත තබා ගායත්‍රියෙහි පටන් වෘත්තලක්‍ෂණ දක්වනු පිණිස "ත්‍යා චෙ" යනාදිය කීහු.

අපගේ මේ ව්‍යාඛ්‍යායෙහි ආධුනිකයන්ගේ ප්‍රයෝජනය සලකා වුත්තොදයෙහි අනුක්ත ඡන්දස් ද, එසේ ම මෙහි නො දක්වූ ඊකා - වෘත්තරත්නාකරාදියෙහි පෙනෙන ප්‍රසිද්ධ වූ ඇතැම් වෘත්ත කොතෙක් ද දක්වන්නෙමු. එහි දු සුදුසු තැන්හි කිසිවෙක් ලක්‍ෂ්‍ය - ලක්‍ෂණ චාරයෙන් ද කිසිවෙක් ලක්‍ෂණ මාත්‍රයෙන් ද දක්වනු ලැබෙත්.

---

### 1. උක්තාච්ඡන්දසෙහි වෘත්ත- 2,

1. **"ශ්‍රී" වෘත්තය-** පාදසතරෙහි ම ගුරු සතරෙක් වී නම් "ශ්‍රී" වෘත්තය වේ.

**වි:-** උක්තාච්ඡන්දස එකාක්‍ෂර හෙයින් වෘත්ත 2 කි. වර්ණ යන් විසින් ම ඡන්දස පූරන වර්ණවෘත්තයන්ගේ එක් අකුරක ගුරු - ලඝු වශයෙන් භෙද දෙකක් ලැබෙන හෙයිනි. පාදයක

අකුරු දෙකක් ඇති අත්‍යුක්තාවෙහි වෘත්ත සතරකි. හෙද ප්‍රථමාක්‍ෂරයෙහි හෙද දෙක විතීයාක්‍ෂරයෙහි හෙද දෙකින් ගුණ කළ විට අක්‍ෂරවයෙහි ලැබෙන හෙද සඞ්ඛ්‍යාව මැයි. ඒ ඒ ඡන්දස්වල අක්‍ෂරයන්ගේ හෙද වශයෙන් ලැබෙන වෘත්තසඞ්ඛ්‍යාව ව්‍යාඛ්‍යාරම්භයෙහි ඡන්දස සමග දක්වනු ලැබේ.

පාදයක ගුරක් බැවින් ගුරු සතරක් ඇති පාද සතරක් වී නම් ශ්‍රීවෘත්ත නමැයි කියනලදී. "කාං, භූ, තෙ, ධි" යන මෙය ඒ සඳහා ටීකාවෙහි දක්වූ නිදසුනයි හෙද පාදසතරක් ඇති ගාථාවෙකි.

## 2. අත්‍යුක්තාඡන්දසෙහි වෘත්ත- 4.

1. "ගා මි" පාදයක ගුරු දෙදෙනෙක් වී නම් එය "සත්‍රී" නම් වෘත්තයයි.

වි:- "ගාමි" යනු සත්‍රීවෘත්තයාගේ එක් පාදයකි. ඉතිරි පාද තුනත් මෙසේ ම ගත් විට ගාථාව පිරේ. හෙද ලක්‍ෂ්‍ය - ලක්‍ෂණ වාරයෙන් ම දක්වූ හෙයින් අමුතු නිදසුනෙන් ප්‍රපඤ්ච නො කරමු, අර්ථින් විසින් "වුත්තොදයටීකා" ආදිය බලා උදාහරණ ගතයුතුයි මත්තෙහිදු මෙසේයි.

## 3, මධ්‍යාඡන්දසෙහි වෘත්ත- 8.

1. **මො නාරී**- පාදයක් පාසා මගණය වී නම් "නාරී" වෘත්තය වේ.

2. **ය ඝොසා**- පාදයක් පාසා යගණය වී නම් ඒ වෘත්තය "ඝොසා" නම්.

3. **රො මිගී**- පාදයක් පාසා රගණය ඇත්තේ "මෘගී" නම් වෘත්තයයි.

**වි:-** මේ වෘත්ත තුනට "මො නාරී" යනාදිය ම පිළිවෙළින් උදාහරණයි. දෙවැන්නෙහි "ය" යනු ලුප්තවිභක්තික පදයකි. මේ ඡන්දසෙහි **කුමාරී** නමින් පාදසතරෙහි ම සගණයෙන් වෘත්තයක් ටීකාවෙහි පෙනේ.

## 4. ප්‍රතිෂ්ඨාවෙහි වෘත්ත- 16.

1. **මිනා මෙව කාස්සා**- ඉදින් පාදයක් පාසා මිගණියෙක් ගුරෙක යන මොහු වී නම් ඒ වෘත්තය "කාන්‍යා" නාමු.

2. **යගා විලා**– යගණ – ගුරු යන මොහු වෙත් නම් "ව්‍රීඩා" වෘත්තයයි.

3. **ර්ගා සම්ඞි**– රගණ – ගුරු යන මොහු වෙත් නම් ඒ වෘත්තය "සමෘද්ධි" නම්.

**වි:**– මේ වෘත්තය ටීකාවෙහි "රගා පුෂ්ඵ" යයි "පුණ්‍යා" යන නමින් දක්වනලදී.

4. **සුමති ස් ගා**– සගණ – ගුරු යන මොහු වෙත් නම් "සුමති" වෘත්තයයි.

5. **ජ්ග ලාසිනි**– ජගණ – ගුරු යන මොහු වෙත් නම් "ලාසිනී" වෘත්තයයි.

**වි:**– මෙහි "ජ්ග" යනු ලුප්තවිභක්තිකායි.

6. **භ්ගා සුමුඛී**– භගණ – ගුරු වූහු නම් "සුමුඛී" වෘත්තයයි.

**වි:**= මේ වෘත්ත ටීකාවෙහි නො පෙනෙත්. එහෙත් අන්‍ය වූ "කුසුමා" නම් වෘත්තයක් පෙනේ. "**තගා කුසුමා**" යනු ඒ සඳහා ටීකාපාඨයි. එහි තගණ – ගුරු යන මොහු පාදයක ලක්‍ෂණයි. ඡන්දෝමඤ්ජරීයෙහි "සතී" යයි දක්වන ලද්දේත් එය මැයි.

---

**5. සුප්‍රතිෂ්ඨාවෙහි= 32.**

1. **භ්ගා ගිති පංක්ති**– භගණය හා ගුරෙක් ද නැවත ගුරෙක් (= භගණය හා ගුරුදෙකක්) දැයි මෙසේ සිටි වෘත්තය "පංක්ති" නම්.

2. **ගා රතො පීති**– රගණයෙන් පරව ගුරු දෙදෙනෙක් වෙත් නම් ඒ වෘත්තය "ප්‍රීති" නම් වේ.

3. **භාමිනී ර්ලගා**– පාදයක් සාසා රගණ – ලඝු – ගුරු යන මොහු වෙත් නම් "භාමිනී" වෘත්තය වේ.

4. **මඤ්ජු තලගා**– තගණ – ලඝු – ගුරුහු වෙත් නම් "මඤ්ජු" වෘත්තයයි.

5. **සති ජගා ගො**= ජගණ – ගුරුදෙකක් වෙත් නම් "සතී" වෘත්තය වේ.

**වි:**= ඡන්දෝමඤ්ජරීයෙහි "සතී" යනු අන්‍යවෘත්තයකි.

---

1. 1. ත්‍යා චෙ තනුමජ්ඣා·

6. ගායත්‍රි.

2. 1. කුමාරලලිතා ජ්ස්ගා.

7. උෂ්ණි.

---

## 6. ගායත්‍රියෙහි– 64.

1. 1. වෙ– ඉදින්' **ත්‍යා**= තගණ – යගණයෝ වෙත් නම්; **තනුමජ්ඣා**= (එකල්හි ඒ වෘත්තය) "තනුමධ්‍යා" නම් වේ.

**වි:–** පාදසතරෙහි ම තගණ – යගණය බැවින් ඇති වෘත්තය "තනුමධ්‍යා" නමි. ආචාර්‍ය්‍යපාදයන් විසින් ගායත්‍රියෙහි පටන් වෘත්තලක්‍ෂණ දක්වන ලද්දේය. මෙතැන් සිට ග්‍රන්‍ථාගත මෘත්ත යන් පදවි හා විවෘත්ති දක්වමින් ද අප විසින් සූත්‍රිත වූ අධික වෘත්තයන් ඒ ඒ ඡන්දස් හි ම යටින් දක්වමින් ද ලියනුලැබේ.

### ගායත්‍රියෙහි පරිශිෂ්ට වෘත්ත–

2. **සසිවදනා න්‍යා:–** නගණ – යගණයෝ වෙත් නම් ඒ වෘත්තය "ශශිවදනා" නම් වේ.

**වි:–** මේ වෘත්තය ටීකාවෙහි "මුකුලිතා" යන නමින් දක්වන ලදී. "න්‍යා මුකුලිතා" යනු ටීකාපාඨයි.

3. **මො මො චෙ සාවිත්ති–** මගණයෝ දෙදෙනෙක් වෙත්, නම් "සාවිත්‍රි" වෘත්තය වේ.

**වි:–** කිසිවෙක් මිට "විද්‍යුල්ලෙඛා" යයි ද කියත්.

4. **ම්‍රා සසා සා නදි–** යම් වෘත්තයකට මගණ = රගණයෝ වෙත් නම් ඔහොමෝ "නදී" නමු.

5. **මිසා වුත්තං මුකුලං–** මගණ – සගණයෝ වෙත් නම් ඒ වෘත්තය "මුකුල" නම් වේ.

6. **සයුගං රමණී–** සගණ යුවලක් වී නම් "රමණී" වෘත්තය වේ.

7. **ත්සා චෙ වසුමති–** තගණ – සගණයෝ වෙත් නම් "වසුමතී" වෘත්තය වේ.

මේ ඡන්දසට අයත් සුචිමුඛී – සිඛණ්ඩිනී යයි වෘත්ත දෙකක් ද ටීකාවෙහි පෙනේ "සමා සුචිමුඛී" "යමා සිඛණ්ඩිනී" යනු ටීකා පාඨයි.

**ගායත්ති= ගායත්‍රි ඡන්දසයි.** (**සෙස්ස ද මෙසේයි.**)

3. 1. චිත්තපද යදි භා ගා.
4. 2. මෝ මෝ ගො ගො විජ්ජුම්මාලා.
5. 3. භා තලගා මා නවකං.
6. 4. ගලා සමානිකා රජා ච.
7. 5. පමාණිකා ජරා ලගා.

8. අනුෂ්ටුභා.

---

### 7. උෂ්ණික්ඡන්දසෙහි- 128.

2. 1. **ජ්සගා=** ජගණ – සගණ – ගුරු යන මොහු වෙත් නම්: **කුමාරලලිතා** ඒ වෘත්තය "කුමාරලලිතා" නම් වේ.

**වි:=** මෙහි අකුරු තුනකින් හා සතරකින් පරව යති වේයයි කියනලදී.

### උෂ්ණික්හි පරිශිෂ්ට වෘත්ත.

2. **මිසා නො චෙ මදලෙඛා=** මගණ – සගණ – ගුරු යන මොහු වෙත් නම් "මදලෙඛා" නම් වෘත්තය වේ.

3. **මධු යදි නනගා–** නගණ දෙකක් හා ගුරෙක් වී නම් "මධු" වෘත්තය වේ.

**වි:=** මිට "නනගි මධුමතී" යයි ගඞගාදසයෝ "මධුමතී" යන නාමය කළහ. පඤ්චිකාවෙහි මධුමතී යයි දක්වනලද්දේ නගණ–භගණ–ගුරු යන මෙයින් ලක්‍ෂිත වූ වෘත්තයෙකි.

4. **සරගා හංසමාලා=** සගණ – රගණ – ගුරුහු වෙත් නම් "හංසමාලා" නමු.

ටීකාවෙහි "ආරොහණං භභගා, උඩතා රසගා" යි තවත් වෘත්ත දෙකක් මෙ ඡන්දසෙහි පෙනෙත්. එහි අරුත් නො ගැඹුරුයි.

**උෂ්ණික්ඡන්දසයි.**

---

### 8. අනුෂ්ටුප් ඡන්දසෙහි වෘත්ත= 256.

3. 1. **යදි=** ඉදින්; **භා=** භගණයෝ දෙදෙනෙක් වෙත් ද, **ගා=** ගුරු දෙකක් වෙත් ද; **චිත්තපද=** (එකල්හි ඒ වෘත්තය)= "චිත්‍රපද" නම් වේ.

**වි:=** මෙහි පාදන්තයෙහි යතිය වේ. (මත්තෙහි පාදමධ්‍යයෙහි විශෙෂයතිස්ථාන පමණක් දක්වන්නෙමු. යතිය නො දක්වන වෘත්තයන්ගේ පාදන්ත යතිය ම ලැබෙනබැව් සැලකිය යුතුයි.)

4\. 2. **මෝ**= මගණයෙක් ද; **මෝ**= (නැවත) මගණයෙක් ද; **ගෝ**= ගුරෙක් ද; **ගෝ**= (නැවත) ගුරෙක් ද වී නම්; **විජ්ජුම්මාලා**= ඒ වෘත්තය "විද්‍යුන්මාලා" නමි.

**වි**:= මෙහි අකුරු සතරින් සතරින් යති වේ.

5\. 3. **භා**= භගණයකින් පරව; **තලගා**= තගණ - ලඝු - ගුරුහු වෙත් නම්; **මානවකං**= ඒ වෘත්තය "මානවක" නම් වේ.

**වි**:= මෙහි ද සතරින් සතරින් යතිය වේ. මීට "මානවක ක්‍රීඩතක" යනු පිඬගලසංඥයි.

6\. 4. **ග්ලා**= (ආදියෙහි) ගුරු - ලඝුහු වෙත් ද; **රජා ච**= (අන්තයෙහි) රගණ - ජගණ දෙක ද වෙත් නම්, **සමානිකා**= ඒ වෘත්තය "සමානිකා" නමි.

**වි**:= වෘත්තරත්නාකරයෙහි ගුරු - ලඝු අන්තයෙහි දක්වන ලදි. "ග්ලිනි සමානි" යනුවෙන් පිඬගලයෝ ගුරෙක ල්ඝුවෙක යන ක්‍රමයේන් අෂ්ටාක්ෂර පාදය රචනා කරන ලද්දි "සමානි" නමැයි කිහු. මේ ත්‍රිවිධියෙහි ම සමාන ලක්ෂණ ලැබෙන හෙයින් මෙහි විරොධයෙක් නො වේ.

7\. 5. **ජරා**= ජගණ- රගණයෝ වෙත් ද; **ලගා**= (අන්තයෙහි) ලඝු-ගුරුහු වෙත් ද; **පමාණිකා**= ඒ වෘත්තය "ප්‍රමාණිකා" නමි.

**වි**:- "ල්ගිනි ප්‍රමාණි" යන පිඬගල සූත්‍රයෙන් ලඝුවෙක ගුරෙක යන ක්‍රමයෙන් අෂ්ටාක්ෂර පාදය බඳනා ලද්දේ "ප්‍රමාණි" නමැයි කියන ලදි. මෙහි ද ලක්ෂණ සම වන හෙයින් විරොධ යෙක් නො වේ.

පිඬගලයන් විසින් "සමානි, ප්‍රමාණි" යන නම්වලින් මේ වෘත්ත දෙක දක්වා "විතානමන්‍යත්" සී සමානි- ප්‍රමාණි දෙකින් අන්‍යවූ අෂ්ටාක්ෂරපාද ඇත්තේ "විතාන"නම් වේ යයි කියනලදි. මේ පිඬගලොක්තිය පරිදි විතාන නමින් වෘත්ත බොහෝ ගණනක් තිපදවිය හැකි බැව් පෙනේ. මේ ඡන්දශ්ශාත්‍රයෙහි එය හළ නමුත් වෘත්තරත්නාකරයෙන් බලා උගත යුතුයි

## අනුෂටුභ්හි පරිශිෂටවෘත්ත.

6\. **මිනා ගා හංසරුතමෙතං**- මගණ - නගණ හා ගුරු දෙකක් වෙත් නම මේ වෘත්තය "හංසරුත" නමි.

**වි**:= "හංසරුතා ද්‍රුහද්‍රුගා" යයි ටීකාවෙහි දක් වූ භගණ දෙකක් හා ගුරු දෙකක් ඇති වෘත්තය ලක්ෂණයෙන් මෙන් ම සංඥ වෙන් ද මෙයින් භින්න වූවකැයි සැලකිය යුතුයි.

8. 1, රා නසා යදි හලමුඛී.
9. 2. භුජගසුසුභතා නා මො.

9. බ්‍රහති.

10. 1. ම්සා ජ්ගා සුඛවිරාජිදං මතං.

---

7 නාගරකං භරා ලගා– භගණ - රගණයෝ ද ලඝු - ගුරුහු ද වෙත් නම් ඒ වෘත්තය "නාගරක" නම්.

8. නාරාචිකා තරාලගා– තගණ - රගණයෝ ද ලඝු - ගුරු හු ද වෙත් නම් ඒ වෘත්තය "නාරාචිකා" නමු.

මේ ඡන්දසෙහි ම "රගණ දෙකක් හා ගුරු දෙකක්" ඇති "පද්මිණී" නම් වෘත්තයක් ද ටීකාවෙහි පෙනේ.

---

9. බෘහතිඡන්දසෙහි වෘත්ත= 512.

8 • 1. යදි= ඉදින්; රා= රගණයෙන් පරව; නසා= නගණ– සගණයෝ වෙත් ද; හලමුඛී= (එකල්හි ඒ වෘත්තය) "හලමුඛී" නමු.

වි:= මෙහි අකුරු තුනකින් හා සයකින් පරව යති වේ.

9. 2. නා = නගණයෝ දෙදෙනෙක් වෙත් ද; මො = (නැවත) මගණයෙක් වේ ද; භුජගසුසුභතා= ඒ වෘත්තය "භුජග ශිශුභෘතා" නමු.

වි:= මෙහි සතකින් හා දෙකකින් යති වේ.

පරිශිෂ්ට වෘත්ත–

3. සා තරඞ්ගිනි රනො ජරා– රගණයෙන් පරව ජගණ - රගණයෝ වෙත් නම් ඕහොමෝ ' තරඞ්ගිනී" වෘත්තයයි.

වි:= තරඞ්ගවතී යනු ද මේ වෘත්තය මැයි. මේ ඡන්දසෙහිම 'මණිමධ්‍යා" නම් වෘත්තයක් ටීකාවෙහි පෙනේ. "භමසා මණිමජ්ඣා" යනු ටීකාවචනයි.

---

10. පඞ්ක්තිච්ඡන්දසෙහි= 1024.

10. 1. ම්සා= මගණ - සගණයෝ වෙත් ද; ජ්ගා= (නැවත ජගණ - ගුරු යන මොහු වෙත් ද; ඉදං= මේ වෘත්තය; සුඛවිරාජං= "ශුඛවිරාජ්" යයි; මතං= දන්නාලදී .

වි:- මේ වෘත්තය පොත්වල "සුඛවිරාඞිතං" යි ද "සුඛවිරාජිතං" යි ද පෙනේ. එහෙත් "විරාජ්" යන සංසකෘත ප්‍රකෘතිය මාගධයෙහි "විරාජ" යයි වියයුතු හෙයින් ඒ දෙක ම ප්‍රතික්‍ෂෙප කොළෙමු. "සුඛවිරාජ" යනු මෙහි මාගධ සංඥයි. "භද්‍රවිරාජ්" යනු ද මෙසේ මැයි.

11. 2. මිනා යො ගො යදි පණවො ඛ්‍යාතො.
12. 3 භ්මා සගයුත්තා රුම්මවතී සා.
13. 4. ඡෙදය්‍යා මත්තා මභසගයුත්තා,
14. 5. නරජගෙහි සා මනොරමා.
15. 6. උඬ්භාසකං තං වෙ තො මරා ලව.

---

11. 2. **යදි**= ඉදින්; **මිනා**= මගණ – නගණයෝ වෙත් ද; **යො**=(නැවත) යගණයෙක් වේ ද; **ගො**=(අන්තයෙහි) ගුරෙක් වේ ද; **පණවො ඛ්‍යාතො**= (එකල්හි ඒ වෘත්තය) "පණව" යයි ප්‍රසිඬයි.

**වි**:= අකුරු පසකින් පසකින් යතිය වේ.

12. 3. (**යස්සා**= යම් වෘත්තයකාගේ; **සගයුත්තා**= (අන්ත යෙහි) සගණය හා ගුරකින් යුක්තවූ; **භ්මා**= භගණ – මගණයෝ වෙත් ද; **සා**= ඕතොමෝ; **රුම්මවතී**= "රුක්මවතී" නමු.

**වි**:– මෙහි ද පසකින් පසකින් යතිය වේ. "චම්පකමාලා වෙ භමසා ගෙ" යී පොත්වල ඇතුලත්ව තිබෙන සූත්‍රයෙහි ද මේ ලක්‍ෂණ ම පෙනෙන හෙයින් "චම්පකමාලා" යනු රුක්මවතියට ම අපර නාමයකැයි කියයුතුයි. "රූපවතී" යනු ද මීට ම නමකි.

13. 4. **මභසගයුත්තා**= මගණ – භගණ – සගණ – ගුරු යන මෙයින් යුක්තවූවා; **මත්තා**= "මත්තා" නමැයි; **ඡෙදය්‍යා**– දත යුත්තීය.

**වි**:= සතරකින් හා සයකින් යතියයි. "මභසගා විලසිතා" සී ටීකාවෙහි මීට "විලසිතා" යයි කියනලදී. අන් තැනෙක මේ නාමය නො දක්නාලැබේ. එහි ම උදාහරණ කළ–

"ඡන්නාකාරං යදි තු වරඞගං—නෙත්තා සාමා කමලදලාභා
වත්තං පීතං කරවරණා වා =**මත්තා** ලක්‍ඛී විලසති තසමිං"

යන ගාථාවෙහි ද **වෛදෙහස්වාමිහු** මත්තා යන නාමය ම ගත් බැව් පෙනේ. "විලසිතා" යනු ද මීට ම අපර නාමයකැයි කිම යොග්‍යයි.

14. 5. **නරජගෙහි**= නගණ = රගණ – ජගණ – ගුරු යන මොවුන් කරණ කොට ගෙන; (**යා**= යම් වෘත්තයක් වේ ද;) **සා**= ඕතොමෝ; **මනොරමා**= "මනොරමා" නමු.

15. 6. **වෙ**= ඉදින්; **තො**= තගණය ද; **මරා**= (නැවත) මගණ – රගණයෝ ද; **ලව**= (අන්තයෙහි) ලඝුවෙක් ද වී නම්; **තං**= ඒ වෘත්තය; **උඬ්භාසකං**= "උද්භාසක" නම් වේ.

16. 7. ත්ජා ජෙ ගුරුනා'යමුපඨිතා.

**10. පඞ්ති.**

---

**වි:=** මෙහි ද පසකින් පසකින් යතිය වේ. "ලව" යනු අනත යෙහි ලඝුවක් ම ඉෂ්ටබැවින් "ව" කාරය පදපූරණ වශයෙන් ගත් තැනි. මේ වෘත්තය වෘත්තරත්නාකරාදියෙහි නො පැනේ.

16. 7. **ත්ජා=** තගණ – ජගණයෝ වෙත් ද; **ජො=** (නැවත) **ජ** ගණයෙක් වේ ද; **ගුරූනා=** (අන්තයෙහි) ගුරකින් යුක්ත වූ; **අයං=** මේතොමේ; **උපඨිතා=** "උපස්ථිතා" නමි.

**වි:=** අකුරු දෙකකින් හා අටකින් යති වේ. මෙය "ත්ජා ජ්ගා ගුරූනා යමුපඨිතා සා" යයි අන්තයෙහි අධික ගුරක් හෙලා ත්‍රිෂ්ටුභ් ඡන්දසට ඇතුලත් කොට තිබේ. එය වෘත්තරත්නාකර පඤ්චිකාව හා එහි ම සිංහල ව්‍යාඛ්‍යාදිය අනුව සාමෙන් පසුකාලෙක කරනලද විපර්‍ය්‍යාසයකැයි හඟිමු. වුත්තොදය ටීකාවෙහි "ත්ජා ජ්ගා උපඨිතා" යී පඞ්ක්තිඡන්දසෙහි ඇතුලත් කොට එසේ ම උදාහරණ ද කරනලදී.

"ජුම්හා විමලා පටිභාති සා— චූලලා විටපී වකුලාදයො

සත්ථා කරුණාය වසඬ්ගතො— මාරස්ස ච'ගා සුරධිතරෙ" යී. මෙය "උපස්ථිතා ත්ජෞ ජ්ගෞ" යන පිඞ්ගල සූත්‍රයට ද අනුරූප වෙයි. එහෙයින් පඞ්ක්තිඡන්දසට ම ඇතුලත් කෙළෙමු.

**පඞ්ක්තියෙහි පරිශිෂ්ට වෘත්ත.**

8. **ර්ජා රගා මයූරසාරිණී'යං=** රගණ – ජගණ – රගණ – ගුරු යන මොහු වෙත් නම් මෝහොමෝ "මයූරසාරිණී" නමි.

9. **තිසගා යදි මෙසවිතානං=** සගණ තුනක් හා ගුරෙක් වී නම් ඒ වෘත්තය "මෙඝවිතාන" නම් වේ.

10. **රො ච සා ගුරූනා මණිරාගො=** අන්තයෙහි ගුරක් සහිත වූ රගණයක් ද සගණයෝ දෙදෙනෙක් ද වෙත් නම් ඒ වෘත්තය "මණිරාග" නම් වේ.

11. **තුරිතගති තු නජනගා=** නගණ – ජගණ – නගණ – ගුරු යන මොහු වෙත් නම් ඒ වෘත්තය "තුරිතගති" නම් වේ.

මේ ඡන්දසෙහි "මනරගා එකරූපා" යී ලක්ෂණ දක්වූ වෘත්තයක් ද ටීකාවෙහි පෙනේ.

---

17. 1. ඉන්ද'දිකා තා වජිරා ජගා ගො.
18. 2. උපා'දිකා සාව ජතා ජගා ගො.
19. 3. අනන්තරො'දීරිතලක්ඛණා වෙ
පාදා විමිස්සා උපජාතයො තා
එවං කිර'ඤ්ඤාසු'පි මිස්සිතාසු
වදන්ති ජාතිස්විදමෙව නාමං

---

## 11. ත්‍රිෂ්ටුභ්ශි වෘත්ත — 2048.

17. 1. **තා**= තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජගා**= (නැවත) ජගණ - ගුරු යන මොහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; ඒ වෘත්තය **ඉන්දාදිකා**= "ඉන්ද" ශබ්දය ආදි කොට ඇති; **වජිරා**= "වජිරා" නමුදු හෙවත් "ඉන්ද්‍රවජ්‍රා" නම් වේ.

18. 2. **ජතා**= ජගණ - තගණයෝ වෙත් ද; **ජගා**= (නැවත) ජගණ = ගුරුහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; ඒ වෘත්තය **උපාදිකා**= "උප" ශබ්දය ආදි කොට ඇති; **සා × එව**= ඕතොමෝ මැයි හෙවත් "උපෙන්ද්‍ර වජ්‍රා" නම් වේ.

19. 3. **වෙ**= ඉදින්; **අනන්තරොදීරිත**= අනතුරු කොට කියන ලද; **ලක්ඛණා**= ඉන්ද්‍රවජ්‍රා - උපෙන්ද්‍ර වජ්‍රා දෙදෙනාගේ ලක්‍ෂණ ඇති; **පාදා**= පාදයෝ; **විමිස්සා**= විවිධාකාරයෙන් මිශ්‍ර වූවාහු වෙත් ද; **තා**= ඔවුහු **උපජාතයො**= "උපජාති" නම් වෙති; **එවං කිර**= මෙපරිද්දෙන්ම; **අඤ්ඤාසු ජාතිසු**= අන්‍ය ඡන්දෝජාතීන්; **මිස්සිතාසු අපි**= මිශ්‍ර කළ කල්හිදු; **ඉදමෙව නාමං**= මේ නාමය ම **වදන්ති**= කියත්.

**වි:-** පූර්වෝක්ත ඉන්ද්‍රවජ්‍රා- උපෙන්ද්‍රවජ්‍රාදෙදෙනාගේ පාදමිශ්‍ර කොට රචනා කරන ලද්දේ "උපජාති" නම් වේ.

**ඉන්ද්‍රමාලාව හා උපජාති.** ඉන්ද්‍රවජ්‍රාපාද පිණිස "ඉ" කාරය ද, උපෙන්ද්‍ර වජ්‍රාපාද පිණිස "උ" කාරය ද ගෙන පාද සතර තබා චතුරක්‍ෂරච්ඡන්දස මෙන් ප්‍රස්තාරකළකල්හි ඉන්ද්‍රවජ්‍රාපාදයක් සමග උපෙන්ද්‍රවජ්‍රාපාද තුනක් ද, උපෙන්ද්‍රවජ්‍රාපාදයක් සමග ඉන්ද්‍රවජ්‍රාපාද තුනක් දැයි පාදයක් සමග පාද තුනක් මිශ්‍රවීමෙන් භෙද අටක් ද, එසේ ම අර්ධයක් සමග අර්ධයක් මිශ්‍රවීමෙන් භෙද සයක් ද, ශුද්ධ ඉන්ද්‍රවජ්‍රා - උපෙන්ද්‍රවජ්‍රා දෙක දැයි භෙද සොළොසක් ලැබේ. මේ ප්‍රස්තාරයට "ඉන්ද්‍රමාලා" යයි කියති. කියනලද මැයි:—

"පාදේකා පාදත්තයතො ච අඩ්ඪ- අථ"ඬ්ඪයොගෙන ජලෙව භෙදා
ඉන්දන්ති මාලා'බිල පුබ්බමිස්සා- පමාණතොසොළසභෙදභින්නා"යි.

ප්‍රස්තාරයෙහි ඉන්ද්‍රවජ්‍රාපාද මුලට තබාගතයුතුයි. "ඉන්ද්‍රමාලා", ප්‍රස්තාරය මෙසේයි-

| 1. පාදය | 2. පාදය | 3. පාදය | 4. පාදය | නාම. | |
|---|---|---|---|---|---|
| ඉ | ඉ | ඉ | ඉ | | ඉන්ද්‍රවජ්‍රා |
| උ | ඉ | ඉ | ඉ | 1 | කිත්ති |
| ඉ | උ | ඉ | ඉ | 2 | වාණී |
| උ | උ | ඉ | ඉ | 3 | මාලා |
| ඉ | ඉ | උ | ඉ | 4 | ශාලා |
| උ | ඉ | උ | ඉ | 5 | හංසී |
| ඉ | උ | උ | ඉ | 6 | මායා |
| උ | උ | උ | ඉ | 7 | ජායා |
| ඉ | ඉ | ඉ | උ | 8 | බාලා |
| උ | ඉ | ඉ | උ | 9 | ආර්ද්‍රා |
| ඉ | උ | ඉ | උ | 10 | භද්‍රා |
| උ | උ | ඉ | උ | 11 | ප්‍රේමා |
| ඉ | ඉ | උ | උ | 12 | රාමා |
| උ | ඉ | උ | උ | 13 | ඍද්ධි |
| ඉ | උ | උ | උ | 14 | බුද්ධි. |
| උ | උ | උ | උ | | උපේන්ද්‍රවජ්‍රා |

මේ ඉන්ද්‍රමාලාවෙහි ආද්‍යන්ත වෘත්තදෙක ශුද්ධඉන්ද්‍රවජ්‍රා–උපේන්ද්‍ර වජ්‍රා හෙයින් හැර මධ්‍යයෙහි සිටි භෙද තුදුස "උපජාති" නම් වෙති. ඒ උපජාතීන් අතුරෙහි ප්‍රථමපාදය උපේන්ද්‍රවජ්‍රාලක්ෂණ ද ඉතිරි පාද තුන ඉන්ද්‍රවජ්‍රාලක්ෂණද ඇති පළමු වන උපජාතිය "කීර්ති" නම් වේ. සෙස්ස ද මෙ නයින් සලකනු. "අනන්තර" යනාදි ගය "ආර්ද්‍රා" නම් උප ජාතියයි.

සඞ්ග්‍රහ ගාථා ද වෙත්.

":කිත්ති වාණී තථා මාලා-
සාලා හංසී තථෙව ච
මායා ජායා තථා බාලා-
අද්දා භද්දා තතො පරං,
පෙමා රාමා තථා ඉද්ධි-
බුද්ධි චෙවොපජාතිසු
වුත්තානෙතානි නාමානි-
විඤ්ඤෙය්‍යානි යථාක්කමං"

මෙහි "හංසී, භද්‍රා" යන නම් ඇති පස්වම - දශම උපජාති දෙක අර්ධසම වන හෙයින් මතු දක්වන අර්ධ සමවෘත්තයන්හි ද ඇතුලත් වේ.

මෙසේ ශාලිනී – වාතොර්මී දෙදෙනාගේ පාද මිශ්‍රවීමෙන් ද, ඉන්ද්‍රවංශා – වංශස්ථ පාද මිශ්‍රවීමෙන් ද, වෙනත් කතිපය වෘත්ත කෙනෙකුන්ගේ පාද මිශ්‍රවීමෙන් ද උපජාති තුදුසබැගින් ලැබෙත්. මේ උපජාතීන්ගේ සිද්ධිය සඳහා සමානාක්ෂර සඞ්ඛ්‍යා සමානයති ඇති පාදයන්ගේ මිශ්‍රවීම ම කැමතිවිය යුතුයි. සූත්‍රයෙහි "එවං කිර" යන්නෙන් විෂමාක්ෂර පාදයන්ගේ උපජාතිත්වය ප්‍රතිෂිද්ධයි, පූර්ණ සත්තායෙහි;—

.20. 4. නජජලගා ගදිතා සුමුඛී.

21. 5. දොධකමිච්ඡනි වෙ භභභා ගා.

22. 6. වෙද'සෙසහි මිතා තගා ග් සාලිනී සා.

---

"කුම්භූපමං කායමිමං විදිත්වා- නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යොධෙථමාරං පඤ්ඤායුධෙන-ජිතඤ්චරක්ඛෙ අනිවෙස නොසියා"

යන විෂමාක්‍ෂර පාද ඇති ධම්මපද ගාථාව නිදසුන් කරමින් නො මග ගියබැව් පෙනේ. එසේ ගතහොත් පාලියෙහි අධිකවශයෙන් ලැබෙන විෂමාක්‍ෂර පාද ඇති ගාථා උපජාති යයි කියයුතු බවට පැමිණේත්. "කුම්භූපමං" යනාදිය ගාථාවක් මැයි.

සියලු උපජාතීහුම අඞ්සම - විෂමවෘත්ත සවරූප වෙති. එහෙයි සමවෘත්ත පාදයන්ගෙන් කරනලද බැවින් සමවෘත්ත යන්හි ලා දක්වන ලදහ.

**උපජාතායො**- යනු මාගධික ශබ්ද ලක්‍ෂණයන් අනුගමනය නො කළ සේ පෙනෙතත් සංස්කෘතානුසාරයෙන් සිඩවූ බාහුලක විධියෙකි. "සබ්යා" යනාදි මෙබඳු අන්‍යබාහුලක ප්‍රයොග දක්නා ලැබෙන හෙයින් මෙහි සාධුත්වය ද වේ.

ලෞකික මහාජනයා කෙරෙහි ප්‍රසිඩ හෙයින් ආචාර්‍යපාද යෝ ඇතැම් ශබ්දාවිධි සංස්කෘතනය ගෙන මෙහි ඇතුලත් කළ බව සැලකිය යුතුයි.

20. 4. **නජජලගා** = නගණ - ජගණ - ජගණ - ලඝු - ගුරු යන මොහු වෙත් නම්; **සුමුඛී**- ඒ වෘත්තය "සුමුඛි" නමැයි; **ගදිතා** කියනලදී.

**වි**:= පසකින් හා සයකින් යති වේ. කිසිවෙක් මෙය "සජජලගා" යී ආදියෙහි සගණය යුක්ත කොට ගදරත්.

21. 5. **වෙ**= ඉදින්; **භභභා**= භගණයෝ තිදෙනෙක් වෙත් ද; **ගා**= (නැවත) ගුරු දෙකක් වෙත් ද; (එකල්හි ඒ වෘත්තය) **දොධකං ඉච්ඡති**= "දොධක" යයි කැමති වේ.

22. 6. **මිතා**= මගණ - තගණයෝ වෙත් ද; **තගා**= තගණ - ගුරු යන මොහු වෙත් ද; **ග්**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; **වෙද × අසෙසහි**= සතරකින් හා සතකින් යති වේ ද; **සා**= ඕ තොමෝ; **සාලිනී**= "ශාලිනී" නමු.

23. 7. වාතුම්මි සා යති සා මිභා තගා ගො.

24. 8. භා තතගා ගො'සුරස සිරී සා.

25. 9. රො නරා ඉධ රථො ධතා ලගා.

26. 10. ස්වාගතෙ'ති රනභා ගුරූකා වෙ.

27. 11. නනරලහුගුරූහි භද්දිකා.

## 11. තුට්ඨුභා.

---

23. 7. **මිභා**= මගණ - භගණයෝ වෙත් ද; **තගා**= තගණ - ගුරූහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; **සා යති**= ඕ (ශාලිනියෙහි කී) යති වී නම්; **සා**= ඕ තොමෝ; **වාතුම්මි**= "වාතොම්මි" නමු.

**වි**:= මෙහි ද ශාලිනියෙහි මෙන් සතරින් සතින් යති වේ. "වාතුම්මි" යනු අපපාඨයෙකි.

24. 8. **භා**- භගණයෙන් පරව; **තතගා**= තගණ - තගණ - ගුරූ යන මොහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; **ඉසුරස**- පසකින් හා සයකින් යති ඇති; **සා**= ඕතොමෝ; **සිරී**= "ශ්‍රී" නම් වේ.

**වි**:- වුත්තෝදය සන්නවල "සුරසසිරි" නමැයි වැරදීමකින් ලියනලද්දකි. ටීකාවෙහි "ලක්ඛී" යයි දක්වූයේත් මෙය මැයි. ඡන්දොමඤ්ජරියෙහි මීට "අනුකූලා" යයි කියනලදි. 'ස්‍යාදනුකූලා භතනගගාශ්චෙත්" යනු එහි සූත්‍රයි. කෙදාරභට්ටයන් මෙය "ශ්‍රී" යයි එක් වරක් ගෙන "මෞක්තිකමාලා" යයි අභිධානලක්ෂණයෙන් නැවතත් කියනලද්දේ කුමක් හෙයින් ද? පිඞ්ගලයන් විසින් "කුඩ්මලදන්තී භ්‍රේෂ් න්ගෞ ගිතිප්‍රියරසාඃ" යි කුඩ්මලදන්තී ගාථාව යයි කියනලදී.

25. 9. **රො**= රගණය වේ ද; **නරා**= නගණ - රගණයෝ වෙත් ද; **ලගා**= (අන්තයෙහි) ලඝු - ගුරූහු වෙත් ද; (ඒ වෘත්තය) **ඉධ**= මෙහි; **රථොධතා**= "රථොද්ධතා" නමු.

26. 10. **රනභා**= රගණ - නගණ = භගණයෝ වෙත් ද; **ගුරූකා වෙ**- ගුරූහු දෙදෙනෙක් වෙත් ද; **ඉති**= මෙසේ සිටි වෘත්තය; **ස්වාගතා**= "ස්වාගතා" නම් වේ.

27. 11. **නනරලහුගුරූහි**= නගණ - නගණ - රගණ- ලඝු - ගුරූ යන මොවුන් කරණ කොට ගෙන; **භද්දිකා**= "භද්‍රිකා" නම් වෘත්තය වේ.

28. 1. වදන්ති වංසඨම්දං ජතා ජරා.

---

වි:= වුත්තොදයටීකා විවරණාදියෙහි "භද්‍රිකා" යයි දක්නට ලැබෙන මේ වෘත්තය වෘත්තරත්නාකරාදියෙහි "සුභද්‍රිකා" යයි දක්වා තිබේ. මීට "වඤ්ජිකා" යයි ද කියත්.

---

### ත්‍රිෂ්ටුභ්හි පරිශිෂ්ට වෘත්ත.

12. **ම්භා නො ල්ගා චෙ භමරවිලසිතං**– මගණ – භගණ – නගණ – ලඝු - ගුරුහු වෙත් නම් "භ්‍රමරවිලසිත" වෘත්තය වේ.

**වි**:= සතරින් හා සතින් යති වේ. මීට "භ්‍රමරවිලසිතා" යයි ද කියති.

13. **නනසගගුරුරචිතා වුත්තා**= න – න – සගණ හා ගුරු දෙකකින් රචනා කරනලද්දී "වෘත්තා" නම් වේ.

**වි**:= පිඞ්ගලයන් විසින් "වෘත්තා නෞ ස්ගෞ ග්" යි "වෘත්තා" යන නාමයෙන් දැක්වූ මේ වෘත්තයට ටීකා ආදියෙහි වෘත්තා යයි කියනලදී. "පෘථ්වී" යනු ද මීට ම නමකි.

14. **සෙනිකා මතා රජො ජරා ලගා**= රගණයෙන් පරව ජගණ – රගණ – ලඝු – ගුරුහු වෙත් නම් ඒ වෘත්තය "ශ්‍යෙනිකා" යයි දන්නාලදී.

**වි**:= මීට ටීකාවෙහි දැක්වූ සෙසී යන්න ලිපියෙන් වූ වරදකි. පිඞ්ගලයන් විසින් "ශ්‍යෙනි ර්ජෞ ර්ලෞ ග්" යී සූත්‍රිතයි. "ශ්‍යෙනිකා" යනු කෙදාරයන් ගත් අයුරුයි.

15. **ම්සා ජෙ ගො ගුරුනා භවෙ'කරූපං**= අන්තයෙහි ගුරකින් යුක්ත මගණ – සගණ – ජගණ – ගුරුහු වෙත් නම් "එකරූප" නම්.

මේ ඡන්දසෙහි "ජසයලගා සඞ්ගතා", "ජසතගගා උපඨිතා" යයි වෘත්ත දෙකක් ටීකාවෙහි දක්වා තිබේ. මෙහි උපඨිතා යයි දක්වනලද්ද කිසිවෙක් "උපඨිත" යයි දක්වති.

---

### 12. ජගතිඡන්දසෙහි වෘත්ත — 4096.

28. 1. (**යතථ**= යම් වෘත්තයෙක්හි;) **ජතා**= ජගණ – තගණයෝ වෙත් ද; **ජරා**= ජගණ – රගණයෝ වෙත් ද; **ඉදං**= මේ වෘත්තය; **වංසඨං වදන්ති**= "වංශස්ථ" යයි කියත්.

**වි**:= "වංශස්ථවිල, වංශස්තනිත" යයි ද මීට ම කියත්.

29. 2. සා ඉන්‍ද්‍රවංසා බලු යත්‍ථ තා ජරා.
30. 3. ඉධ තොටකමම්බුධිසෙහි මිතං.
31. 4. දුතවිලම්බිතමාහ නභා භරා.
32. 5. වසුයුගවිරතී නා ම්‍යා පුටො'යං.
33. 6. නයසහිතා න්‍යා කුසුමවිචිත්‍රා
34. 7. භුජඞ්ගප්පයාතං භවෙ වෙදයෙහි.
35. 8. නභජරෙහි භවති පපියං වදා.

---

22. 2. **යත්‍ථ**= යම් වෘත්තයෙක්හි; **තා**= තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජරා**= (නැවත) ජගණ - රගණයෝ වෙත් ද; **සා බලු**= ඕ වනාහි; **ඉන්‍ද්‍රවංසා**= "ඉන්‍ද්‍රවංශා" නමු.

30. 3. **ඉධ**= මෙහි; **අම්බුධිසෙහි**= සගණ සතරකින්; **මිතං**= ප්‍රමාණ කරනලද වෘත්තය; **තොටකං**= "තොටක" නම්.

31. 4. **නභා**= නගණ - භගණයෝ වෙත් ද; **භරා**- භගණ - රගණයෝ වෙත් ද; **දුතවිලම්බිතං**= ඒ වෘත්තය "දෘතවිලම්බිත" නමැයි; **ආහ**= කියයි.

32. 5. **නා**= නගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ම්‍යා**= මගණ - යගණයෝ වෙත් ද; **වසුයුගවිරති**= අටකින් හා සතරකින් යති වේ ද; **අයං**= මේ වෘත්තය; **පුටො**= "පුට" නම් වේ.

**වි**:= "පුඨ" යන නාමය ලිපියෙන් වූ ප්‍රමාදයකි. ටීකාවෙහි "නනමයා පුටොහා" යයි මීට ම "පුටොහා" යයි කියනලදී.

35. 6. **නයසහිතා**= නගණ - යගණ සහිත වූ; **න්‍යා**= නගණ - යගණයෝ වෙත් ද; **කුසුමවිචිත්‍රා**= ඒ වෘත්තය "කුසුම විචිත්‍රා" නමු.

**වි**:= මීට ටීකාවෙහි සයකින් සයකින් යති නියමකරනලදී. අන්තයෙහි වේ යයි කිසිවෙක් කියත්.

34. 7. **වෙදයෙහි**= සතර යගණයකින්; **භුජඞ්ගප්පයාතං භවෙ**= "භුජඞ්ගප්‍රයාත" නම් වන්නේය.

**වි**;- වාදශාක්‍ෂරවජ්‍රඥස ප්‍රස්තාරකරන්නාවූ **පිඞ්ගලනාගයෝ** යගණ චතුෂ්කසප්තයට පැමිණ "භුජඞ්ගප්‍රයාතං යඃ" යි කියමින් සමුද්‍රයෙහි නිමග්න ව ගුරුළාගෙන් මිදුනාහු යයි ද, එහෙයින් මේ වෘත්තය "භුජඞ්ගප්‍රයාත" නම් වී යයි ද කියත්.

35. 8. **නභජරෙහි**= නගණ - භගණ - ජගණ - රගණයන් කාරණකොට ගෙන; **පියංවද භවති**= "ප්‍රියංවදා" වෘත්තය වේ.

36. 9. වුත්තා සුධීහි ලලිතා තභා ජරා.
37. 10. පමිතක්ඛරා සජ සසෙහු'දිතා.
38. 11. නනභරසහිතා'භිහිතුජ්ජලා.
39. 12. පඤ්චා'ස්සච්ඡින්නා වෙස්සදෙවී මමා යා.
40. 13. වදන්ති හි තාම රසං නජජා යො.
41 14. කමලා'ති ඤෙය්‍යා සයසෙහි යො වෙ.

## 12. ජගති.

---

36. 9. **තභා**= තගණ- භගණයෝ වෙත්ද; **ජරා**= ජගණ-රගණයෝ වෙත් ද; **සුධීහි**= පණ්ඩිතයන් විසින්; **ලලිතා වුත්තා**= ඒ වෘත්තය; "ලලිතා" යයි කියන ලදී.

37; 10. **සජසසෙහි**= සගණ- ජගණ- සගණ- සගණයන් කරණකොට ගෙන; **පමිතක්ඛරා**= "ප්‍රමිතාක්ෂරා" වෘත්තයයි; **උදිතා**= කියන ලදී.

38. 11. **නනභරසහිතා**= නගණ- නගණ- භගණ- රගණ යන් සහිත වූවා; **උජ්ජලා අභිහිතා**= "උජ්වලා" වෘත්ත යයි කියන ලදී.

39. 12. **මමා**= මගණයෝ දෙදෙනෙක් වෙත් ද; **යා**= (නැවත) යගණයෝ දෙදෙනෙක් වෙත් ද; **පඤ්ච**= පසකින් හා; **අස්ස**= සතකින්; **ඡින්නා**= යති හෙයින් සිඳින ලද්දී ද; **වෙස්ස දෙවී**= ඕ තොමෝ "වෛශ්‍යදෙවී" නමු.

40. 13. **නජජා**= නගණ-ජගණ-ජගණයෝ වෙත් ද; **යො**= (අන්තයෙහි) යගණයෙක් වේ ද; **තාමරසං**= ඒ වෘත්තය "තාම රස" නමැයි; **වදන්ති හි**= කියා මැයි.

**වි:-** "මීට අභිනවතාමරස, ලලිතපද" යන නම් ද කියත්.

41. 14. **වෙ**= ඉදින්; **සයසෙහි**= සගණ-යගණ- සගණයන් කෙරෙන් පරව; **යො**= යගණය වීනම්; **කමලා × ඉති**= "කමලා" යයි; **ඤෙය්‍යා**= දතයුත්තීය.

**වි:-** අකුරු සයකින් සයකින් යතියයි. මේ වෘත්තය බොහෝ තැන්හි දක්නට නො ලැබේ.

---

### සමග්ග පරිශිෂ්ට වෘත්ත.

15. **චන්දවුත්ති නිගදන්ති රනභසා**- ර-න-භ- සගණයෝ වෙත් නම් ඒ වෘත්තය "චන්ද්‍රවෘත්ති" යයි කියත්.

**වි:-** සතරින් අටින් යතියයි. මීට"චන්ද්‍රවර්ත්මන්"යයිද කියති. "රනභසා චන්දවුත්ති" යනු ටීකායි මෙහි ද ඒ නාමය ම යෙදීමු.

16. **පමුදිත වදනා භවෙනාරරා**– නගණයෝ දෙදෙනෙක් හා රගණයෝ දෙදෙනෙක් වෙත් නම් "ප්‍රමුදිත වදනා" වෘත්තයයි.

**වි:**– "නරවයෙහි පමුදිත වදනා සතතහි විරාමො භවති" යනු මේ සඳහා ටීකොක්තියි. වෘත්ත රත්නාකරයෙහි– "ප්‍රමුදිත වදනා" භවෙන්නෞ රරෞ" යන සූත්‍රයෙන් මෙය දක්වා "ස්වර ශරවිරතිර් නනෞ රෞ ප්‍රභා" යයි එම ගණ ලක්ෂණ ම ගෙන අකුරු සතකින් හා පසකින් යති ඇති "ප්‍රභා" නම් වෘත්තයක් ද දක්වන ලද්දේය. ඡන්දෝමඤ්ජරියෙහි මීට "මන්දාකිනී" යයි කියන ලදී. පිඞ්ගලයන් විසින් "චඤ්චලාක්ෂිකා නෞ රෞ" යී "චඤ්චලාක්ෂිකා" යයි නම් කොට ඔවුන් විසින් ම "ගෞරී නෞ රෞ" යී "ගෞරී" නම් ගාථාවයයි කියන ලද්දේත් මේ වෘත්තය මැයි.

17. **ජසා පුන ජසා ජලොද්ධතගති**– ජගණ-සගණයෝ ද නැවත ජගණ- සගණයෝ ද වෙත් නම් ඒ වෘත්තය "ජලොද්ධතගති" නම් වේ.

**වි:**– සයකින් සයකින් යති වේ.

18. **සිඬුරෙහිරිතා සග්විනී නාමිකා**– රගණ සතරකින් "ස්‍රග්විනී" නම් වෘත්තය කියන ලදී

**වි:**– "සග්විනී" යනු මාගධොචිත නො වේ ද? යත්– මෙය සංඥා මාත්‍රය දක්වීම පිණිස ගත්හෙයින් අනුචිත නො වේ. "චතුරෙහි සග්විනීතා" යනු ටීකා වචනයි. එහෙත් "සුබ්බිනීතා" ආදි වශයෙන් විකෘති කොට ගැනීම නො යෙදේ.

19. **තයා තයා මණිමාලා වුත්තා ජහි ඡිනනා**– තගණ- යගණ තගණ- යගණයෝ වෙත්නම් " මණිමාලා " වෘත්තයයි, සයකින් සයකින් යති ඇත්තිය.

20. **වෙදස් සා'යං ජලධරමාලා ම්භා ස්මා**– ම-භ-ස- මගණයෝ වෙත් නම් "ජලධරමාලා" වෘත්තය වේ.

**වි:**– සතරකින් අටකින් යති වේ. ටීකාවෙහි "මහසමා සොදුවිනීසා" සී මීට සොදුවිනී යයි කියන ලදී. පිඞ්ගලයෝ "ජලධරමාලා මෙභෞ සෙමෞ සමුද්‍ර වසවඃ" යී ජලධරමාලා නම් ගාථාව යයි කීහ. කෙදාරයෝ ද මේ සංඥාව ම ගත්හ. එහෙයින් මෙහි ද එය යෙදීමු.

21. **ඉහ නවමාලිනී යදි නජා භ්‍යා**– න-ජ-භ- යගන වෙත් නම් "නවමාලිනී" වෘත්තය වේ.

22. **භවති නජා අථ මාලතී ජරා**– න-ජ-ජ- රගණ වෙත් නම් "මාලතී" වෘත්තය වේ.

42. 1. ම්නා ජ්රා ගො තිදසයතිප්පහාසිනී සා.
43. 2. චතුග්ගහෙහි'හ රුචිරා ජභා සජා ගී.

**13. අතිජගති.**

---

වි:- පසකින් සතකින් යති වේ. පිඞගලයන් විසින් "වර තනු ගාථා" යයි කියන ලද්දේ මේ ලක්‍ෂණ ම ඇති වෘත්තයකි. එහි සයකින් සයකින් යති වේ යයි කියන ලදී.

---

**13. අති ජගති ඡන්‍දසෙහි වෘත්ත- 8 192.**

42. 1. **ම්නා**= මගණ-නගණයෝ වෙත් ද; **ජ්රා**= ජගණ-රගණයෝ වෙත් ද; **ගො**= අන්‍තයෙහි ගුරෙක් වේ ද; **තිදසයති**= තුනකින් හා දසයකින් යති ඇති; **සා**= ඕ තොමෝ; **පහාසිනී**= "ප්‍රහර්ෂිණී" නමු.

**වි**:- ඇතැම් පොත්වල පහාසිනී යයි පෙනේ. "ප්‍රහර්ෂිණී" යන සංස්කෘත වචනය මාගධියෙහි "පහාසිනී" කියා වේ.

43. 2. **ජභා**= ජගණ-භගණයෝ වෙත් ද; **සජාගී**= සගණ-ජගණ- ගුරුහු වෙත් ද; **චතුග්ගහෙහි**= සතරකින් හා නවයකින් යති වේ ද; ඒ වෘත්තය- **ඉහ**= මෙහි; **රුචිරා**= රුචිරා නම් වේ.

**වි**:- මීට ටීකාවෙහි "පසංසිනී" යයි කියන ලදී. කිසි තැනෙක "අති රුචිරා" යයි ද පෙනේ. එහෙත් පිඞගල සංඥව "රුචිරා" යනුයි.

**අති ජගතියෙහි පරිශිෂ්ට වෘත්ත.**

3. **නනනනගුරුකා 'සෙසා'තු ජිනනා ධම්**- න-න-න-නගණ හා ගුරක් ඇත්ති 'ක්‍ෂමා" වෘත්තයයි. සතකින් සයකින් යති වේ

**වි**:- කිසිවෙක් මීට "චණ්ඩිකා" යයි ද කියති. පිඞගලයන් "කුටිල ගති" නම් ගාථාව යයි කියන ලද්දේත් මෙය මැයි.

4. **යමාරා විඛ්‍යාතා චණ්ඩරිඛාවලී ගො**- ය-ම-ර- රගණ හා ගුරක් ඇත්ති "චණ්ඩරිකාවලී" නාම් වෘත්තයයි.

**වි**:- මෙහි සයකින් සතකින් යති වේ.

5. **සජසා ජගා භවති මඤ්ජුභාසිනී**- ස-ජ-ස- ජගණ හා ගුරක් ඇත්තී "මඤ්ජුභාෂිනී" නම් වේ.

**වි**:- පසකින් හා අටකින් යතිවේ. ටීකාවෙහි මීට "විජය නන්දිනී" යයි කියන ලදී. කිසිවෙක් මෙයින් අන්‍ය වෘත්තයක්

44. 1. නනරස ලහුගා සරෙහි'පරාජිතා.
45. 2. නනභන ලගිති පපහරණ කලිතා.
46. 3. වුත්තා වසන්තතිලකා තභජා ජගා ගො.

14. සක්කරි-

---

මඤ්ජුභාසිනී යයි ද මීට "සුනන්දිනී" යයි ද කියති. පිඞ්ගලයන් දැක්වූ "කනකප්‍රභා" නම් ගාථාව ද මෙම ලක්‍ෂණයි.

මේ ඡන්දසෙහි "මතයසගා මත්තමයූරං" "මභනයගා භද්‍රකා" යයි ලක්‍ෂණ දැක්වූ වෘත්ත දෙක ද ටීකාවෙහි පෙනේ. "චන්ද්‍රිකා" වෘත්තය වෘත්තරත්නාකරයෙහි "නනතරගුරුභිඃ චන්ද්‍රිකා'ශ්ව ෂඩ්භිඃ" යයි දක්වන ලදී.

---

14. ශක්වරී ඡන්දසෙහි- 16 384.

44. 1. **නනරසලහුගා**= නගණ-නගණ-රගණ-සගණ-ලඝු-ගුරු යන මොහු වෙත්ද; **සරෙහි**= සතකින් සතකින් යති වේ ද; **අපරාජිතා**= ඒ වෘත්තය "අපරාජිතා" නම් වේ.

වි:- "සරාච සරා ච= සරා, තෙහි"යි එකශෙෂචන්ද්ව සමාසයි.

45. 2. **නනභනලගා**= නගණ-නගණ-භගණ-නගණ- ලඝු ගුරු යන මොහු වෙත් නම්; **ඉති**= මෙසේ සිටි වෘත්තය; **පහරණකලිතා**= "ප්‍රහරණ කලිතා" නම් වේ.

**වි:-** "පහරණකලිකා" යී පොත්වල පෙනෙන නමුත් "ප්‍රහරණකලිතා" යන පිඞ්ගල සංඥව ම අභිඥෘතයි.

46. 3. **තභජා**= තගණ-භගණ- ජගණයෝ වෙත් ද; **ජගා**= (නැවත) ජගණ-ගුරුහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; **වසන්තතිලකා**= ඒ වෘත්තය "වසන්තතිලකා" යයි **වුත්තා**= කියන ලදී.

**වි:-** මෙහි අටකින් හා සයකින් යතිවේ. අන්තයෙහි වේ යයි ද කියති. මීට ම කාශ්‍යපයන් "සිංහොන්නතා" යයි ද සෙසන් වයන් "උද්ධර්ෂිණී" යයි ද කිබව ඡන්දස්කාතීෘකපිඞ්ගලයෝ පැවසූහ.

**පරිශිෂ්ට වෘත්ත.**

**4. මිතා තො සො ගා'සම්බාධා- ම-ත-න-සගණ හා ගුරු දෙකක් වෙත් නම් "අසම්බාධා" වෘත්තයයි, පස කින් හා නවයකින් යති වේ.**

**වි:-** මෙහි රකාරය ආගමජයි

47. 1. මිහනහයලහුරථ ගිති සසිකලා.
48. 2. වසුහයයතිරිධ මණි'ගුණනිකරෙ.
49. 3. ននමයයයුතා'යං මාලිනී භොගිසිහි.

---

5. **ඉන්දුවදනා භජසනා මිගුරූ යුතනා**– අන්තයෙහි ගුරු දෙකක් ඇති භගණ–ජගණ–සගණ–නගණයෝ වෙත් නම් "ඉන්දු වදනා" වෘත්තයයි.

**වි**:– මෙය ටීකාවෙහි "භජසනගගා විලාසිනි" යයි දක්නා ලැබේ. පිඞ්ගලයන් "වරසුන්දරි, ගාථා" යයි කියන ලද්දේත් මේ වෘත්තයයි.

6. **ම්ණා ම්භා ගා ඡදි පාදෙ සා'ලොලා'සසවිරාමා**– පාද යෙක්හි ම–ස–ම– භගණ හා ගුරු දෙකක් වෙත් නම් ඕහොමෝ "අලොලා" නම් වෘත්තයයි, සතකින් සතකින් යති ඇත්තීය.

මේ හැර "රසනභගගා මත්තාසා" "රජරජලගා භමරපනනි සා" යයි ලක්‍ෂණ දක්වූ වෘත්ත ද ටීකාවෙහි පෙනෙත්.

---

## 15. අතිශක්වරී ඡන්දසෙහි — 32,768.

47. 1. **මිහනා**= දෙකින් ගුණ කරනලද; **හයලහු**= සත්ලඝු වෙක් (= ලඝු හුදුසක්) ඇත්ති වේ.ද; **අථ**= නැවත; **ග්**=(සොළවර) ගුරෙක් වේ ද; **ඉති**= මෙසේ සිටි වෘත්තය; **සසිකලා**= "ශශිකලා" නමු.

**වි**:– ටීකාවෙහි "චතුනසා චන්‍ද්‍රවත්තා" යි මීට 'චන්ද්‍රාවතී' යයි කියනලදී. පිඞ්ගල සූත්‍රය ද "චන්ද්‍රාවතී නෞ නෞ ස්" යි පෙනේ.

48. 2. **ඉධ**= මෙහි; **වසුහයයති**= අටකින් හා සතකින් යති ඇති; (ශශිකලාව ම) **මණිගුණනිකරො**= "මණිගුණනිකර" නම් වේ.

**වි**:– මෙය කිසිපොතක "මණිගණනිකර" යයි පෙනේ; කිසි වෙක් මණිගණකිරණ යයි ද කියති. මෙහි පිඞ්ගලසංඥව ම යෙදීමු.

ටීකාවෙහි "සා'ව ඡහිමාලා" යි ශශිකලාව ම සයකින් නවය කින් යති වී නම් "මාලා" නම් වෘත්තයක් වේ යයි කියනලදී. එය පිඞ්ගලොක්තියට ද එකඟ වෙයි. එහෙත් සොඳුරයෝ ඒ වෘත්තය "ස්‍රග්" නමැයි ගත්හ.

49. 3. **නනමයයයුතා**= නගණ – නගණ – මගණ – යගණ යගණ යන මොවුන්ගෙන් යුක්තවූ; **අයං**= මෝහොමෝ; **මාලිනී**= "මාලිනී" නම් වේ. **භොගිසිහි**= අටකින් හා සතකින් යති වේ.

50. 4. භවති නජ භජ රසහිතා පහද්දකං.

**15. අතිසඤ්ඤාරි.**

51. 1. නජභජර සදා භවති වාණිනී ගයුත්තා.

**16. අෂ්ඨි.**

52. 1. යමා නො සො භල්ගා රසගරවිරමා සිඛරිණී.

---

50. 4: **නජා**= නගණ – ජගණයෝ ද; **භජා**= භගණ – ජගණයෝ ද; **රසහිතා**= (අන්තයෙහි) රගණයෙන් යුක්තයෝ වෙත්ද; **පහද්දකං භවති**= ඒ වෘත්තය "ප්‍රභද්‍රක" නම් වේ.

**වි:–** සතකින් අටකින් යති වේ. "නජභජරසු කෙසර" යනු මෙය ටීකාවෙහි දක්වූ පරිද්දයි.

**මෙහි සම්බන්ධ වෘත්ත.**

5. **සජනා නයා සරදසසතිරතිරෙඛා**– ස – ජ – න – න – යගණයෝ වෙත් නම් පසකින් දසයකින් යති ඇති ඕ තොමෝ "අතිරෙඛා" නමු.

**වි:–** මීට "**එලා**" යයි ද කියත්.

6. **මරා ම්‍යා යො චන්දලෙඛා සා'සස හොශිහි ජිනනා**–

ම – ර – ම – ය – යගණයෝ වෙත් නම් ඕතොමෝ "චන්‍ද්‍ර ලෙඛා" නමු. සතකින් හා අටකින් යතිහෙයින් සිදිනලද්දීය.

**වි:–** මීට ටීකාවෙහි "කලා" යයි කියනලදී. වෘත්තරත්නා කරාදියෙහි පෙනෙන සංඥව ම මෙහි යෙදීමු.

ටීකාවෙහි "සුග්විණී" නම් වෘත්තයක් මේ ඡන්දසට ද ඇතුලත් වේ.

---

**16. අෂ්ටිච්ඡන්දසෙහි — 65,536.**

51. 1· **ගයුත්තා**= (අන්තයෙහි) ගුරකින් යුක්ත වූ; **නජභජරා**= නගණ – ජගණ – භගණ – ජගණ – රගණයෝ වෙත් නම්; **සදා**= හැමකල්හි; **වාණිනී භවති** = "වාණිනී" වෘත්තය වේ.

**වි:=** ටීකාවෙහි "නජභජරගා චන්දිකා" යි මීට "චන්දිකා" යයි කියා තිබේ. එහි ම වෘත්තරත්නාකරපඤ්චිකාවෙහි "වාණිනී" යයි දක්වූ වෘත්තය "නජභජතගා චන්දලෙඛා" යී පෙනේ. ඊට ඡන්දොමඤ්ජරියෙහි කියනලද්දේ "ගරුඩරුත" යන නාම යයි ඒම සිය යුතුයි.

52. 1. **යමා**= යගණ මගණයෝය; **නො**= නගණය; **සො**= සගණය; **භල්ගා**= භගණ – ලඝු – ගුරුය යන මොහු වෙත් ද; **රස හරවිරාමා**= සයකින් හා එකොළොසකින් යති ඇත්තී ද; **සිඛ රිණී**= ඕතොමෝ "ශිඛරිණී" නමු.

53\. 2. රසයුගිසිතො නො සො ම්රා, ස්ලා ග් යදා හරිණී තදා.

54\. 3. මන්දක්කන්තා ම්භනතතගා ගො යුගුත්වස්සකෙහි

**17. අච්චසී.**

---

### මෙහි පරිශිෂ්ට වෘත්ත.

2- **භ්‍රනතිනගා සරා'ඛකමුසභගජවිලසිතං**- භගණය රගණය නගණ තුනෙක ගුරෙක යන මොහු වෙත් නම් "ඍෂභගජවිලසිත" වෘත්තයයි. සතකින් පරව (පාදමධ්‍ය) යතිය වේ.

වි:= ටීකාවෙහි ම පෙනෙන "උසභගතිවිලසිතා" යන නාමය ගලෙමු.

3\. **ජරා ජරා ජගා භවන්ති චිත්‍රභාගජා මතා**- ජ - ර - ජ - ර - ජගණයන් හා ගුරෙක් වෙත් නම් "චිත්‍රභාගජා" වෘත්ත යයි දන්නාලදී

වි:- නවයෙන් සතින් යති වේ. මීට ම "චිත්‍රභාගා" යයි ද "පඤ්චචාමර" යයි ද කියත්.

ටීකාවෙහි "රවතුනගා ලලනා සා" යි මේ ඡන්දසෙහි ම වෘත්තයක් වේ.

---

## 17. අත්‍යෂ්ටිච්ඡන්දසෙහි — 1,31.072.

53\. 2. **යදා**= යම් කාලෙක්හි; **නො**= නගණය ද; **සො**= සගණය ද; **ම්රා**= මගණ - රගණයෝ ද; **ස්ලා**= සගණ - ලඝුහු ද; **ග්**= ගුරෙක් ද වී නම්; **රසයුග × හයිනො**= සයකින්, සතරකින් හා සතකින් යති වේ ද; **තදා**= එකල්හි; **හරිණී**= "හරිණී" වෘත්තය වේ

54\. 3. **මභනතතගා**= මගණ - භගණ - නගණ - තගණ - තගණ - ගුරුහු වෙත් ද; **ගො**= (සොළවර) ගුරෙක් වේ ද; **යුග × උතු × අස්සකෙහි**= සතරකින් සයකින් හා සතකින් යති වේ ද; **මන්දක්කන්තා**= ඒ වෘත්තය "මන්දක්‍රාන්තා" නමු.

### මෙහි පරිශිෂ්ට වෘත්ත.

4\. **ජසා'ථ ධරණී ජසා යලහුගා විරාමා'ඨහි**- ජ - ස - ජ - ස - යගණ හා ලඝු - ගුරුහු වෙත් නම් "ධරණී" වෘත්ත යයි, අකුරු අටකින් (පාදමධ්‍ය) යතිය වේ.

වි:- මීට "පෘථ්වී" යයි ද නමකි.

5\. **භං වද වංසපත්තපතිතං භරනභනලගා**- භ - ර - න - භ - නගණ හා ලඝු - ගුරු වෙත් නම් ඒ වෘත්තය "වංශපත්‍රපතිත" යයි කියව.

55. 1. මො තො නො යො යා කුසුමිතලතාවෙල්ලිතා'ක්ඛුත්වසීහි
18. ධුති.

---

වි:- මෙහි දශයකින් හා සතකින් යති වේ.

6. **නජභජජා ලගා භයදිසායති නද්දටකං**= න - ජ - භ - ජ - ජගණයෝ ද ලඝු - ගුරුහු ද වෙත් නම් "නර්දටක" වෘත්ත යයි සතකින් හා දශයකින් යති වේ.

වි:- මීට ටීකාවෙහි "කොකිලක" යයි කියනලදී. පිඞ්ගල යන් විසින් "අවිතථගාථා' යයි කියනලද්දේත් මෙය යි. පාදන්ත යෙහි යතිය වීම පමණක් එහි වෙනසයි.

---

## 18. ධෘතිච්ඡන්දසෙහි වෘත්ත — 2,62,144.

55. 1. **මො**= මගණය ද; **තො**= තගණය ද; **නො**= නගණය ද; **යො**= යගණය ද; **යා**= (නැවත) යගණයෝ දෙදෙනෙක් ද වෙත් නම්; **අක්ඛ × උතු × ඉසීහි**= පසකින් සයකින් හා සතකින් යති වී නම්; **කුසුමිතලතාවෙල්ලිතා**= (ඕතොමෝ) "කුසුමිතලතා වෙල්ලිතා" නමු.

### මෙහි පරිශිෂ්ට වෘත්ත.

2. **ඊසා ජජා භරසංයුතා ගජබාණගා භරනත්තකං**- අන්ත යෙහි භගණ - රගණයන්ගෙන් යුක්ත වූ ර - ස - ජ - ජගණයෝ වෙත් ද, අට හා පසට පැමිණි යති වේ ද, ඒ වෘත්තය "භරනතීක' නම්.

වි:- "විබුධප්‍රියා ර්සෞ ජෞ භ්‍රෞ වසුදිශඃ" යි පිඞ්ගලයන් විසින් "විබුධප්‍රියාගාථා" යයි කියනලද්දේ මේ වෘත්ත යයි. එහි අටින් දසයෙන් යති වීම වෙනසයි.

3. **සාපිනම්බ නනා රරා ච රරා සීහවික්කීළිතං**- න - න - ර - ර - ර - රගණයෝ වෙත් නම් මෙහි ඒ වෘත්තය "සිංහවික්‍රීඩිත" නම්,

වි:- මෙහි දසයකින් හා අටකින් යති තැබිය යුතුයි. "නාරාචකං නෞ රෞ රෞ" යනුවෙන් පිඞ්ගලයන් "නාරාචකගාථා" යයි කියනලද්දේත් මේ වෘත්ත යයි. මීට ම "නාරාච" යයි ද කියති.

"සතජනභසා කමලා" යි මේ ඡන්දසෙහි තවත් වෘත්තයක් ටීකාවෙහි පෙනේ.

---

56. 1. රසු'තූ'සෙහි ය්මා නසරරගුරූ මෙඝවිප්ඵුජ්ජිතා සා.

57. 2. අඞ්ක'ස්සෙහි යදි මිසජා සතතගා සද්දූලවික්කීළිතං

**19. අතිධුති.**

58- 1 වුත්තමිදිසන්තු නාමතො රජා රජා රජා ගුරූ ලහූ ච.

**2. කති.**

---

## 19. අතිධෘතිච්ඡන්දසෙහි — 5,24.288.

56. 1. **ය්මා**= යගණ - මගණයෝ වෙත් ද; **නසරරගුරූ**= නගණ - සගණ - රගණ - රගණ - ගුරුහු වෙත් ද; **රස × උතු × අස්සෙහි**= සයකින් සයකින් හා සතකින් යති වේ ද; **සා**= ඕතොමෝ; **මෙඝවිප්ඵුජ්ජිතා**= "මෙඝවිස්ඵූර්ජිතා" නමු.

**වි:-** පිඞ්ගලයන් "විසමිතාගාථා" යයි කියනලද්දේ මේ වෘත්ත යයි. "විසමිතා ය්මෞ න්සෞ රෞ ග් රසත්‍රිස්වරාඃ" යනු ඔහුගේ සූත්‍රයි.

57. 2. **යදි**= ඉදින්; **මිසජා**= මගණ - සගණ - ජගණයෝ වෙත් ද; **සතතගා**= සගණ - තගණ - තගණ - ගුරුහු වෙත් ද; **අඞ්ක × අස්සෙහි**= දොළසකින් හා සතකින් යති වේ ද; **සද්දූලවික්කීළිතං**= (එකල්හි ඒ වෘත්තය) "ශාර්දූලවික්‍රීඩිත" නම් වේ.

**මෙහි පරිශිෂ්ට වෘත්ත.**

3. **මො තනා සො රා ගො සරහය විරමං චූලලදමපප සිඩං**— ම - ත - ත - ස - ර - රගණයෝ ද අන්තයෙහි ගුරෙක් ද වෙත් නම් ඒ වෘත්තය "චූලලදමත්" යයි ප්‍රසිඩයි, පස සත හා සත යතිස්ථාන වෙති.

ටීකාවෙහි "මසජසතතගා වායුවෙගා" යනුවෙන් තවත් වෘත්ත යක් දක්නා ලැබේ.

---

## 20. කෘතිච්ඡන්දසෙහි — 10,48,576.

58. 1. **රජා**= රගණ - ජගණයෝ ද; **රජා**= (නැවත) රගණ - ජගණයෝ ද; **රජා**=(නැවතත්) රගණ - ජගණයෝ ද; **ගුරූ**= ගුරෙක් ද; **ලහු ච**= ලඝුවෙක් ද යන මොහු වෙත් නම්; **ඊදිසං තු**= මෙබඳු වූ වෘත්තය වනාහි; **නාමතො**= නාම හෙයින්; **වුත්තං**= "වෘත්ත" නමි.

**වි:=** "ගලිති වෘත්තම්" යනු මේ සඳහා පිඞ්ගලසූත්‍රයි. ගුරෙක ලඝුවෙක යන ක්‍රමයෙන් ඡන්දස පුරනලද්දේ වෘත්ත නමි. මෙහි දක්වූ රගණ - ජගණාදි ක්‍රමයෙන් ද මේ ලක්‍ෂණය ම ලැබේ.

59. 1. ම්‍රභ්නා යො යො'ත්‍ර යෙන තිමුනියතියුතා සඹරා කිත්තිතා'යං.

**21. පකති.**

60. 1. භ්‍රා නරනාරනා'ථ ච ගුරුදසඃ'ක්කවිරමං හි භද්දකම්දං.

**22. ආකති.**

**ඉති වුත්තොදයෙ ඡන්දසි සමවුත්තනිද්දෙසො නාම තතියො පරිච්ඡෙදො.**

---

**මෙහි පරිශිෂ්ට වෘත්ත.**

2 **ඥෙයා සත්ත'ස්සත්ථකා මරභනයයුතා ග්ලා ගො සුවදනා**– ම – ර – භ – න – ය – භගණයෝ ද ලඝු – ගුරුහු ද වෙත් නම් සතකින් සතකින් හා සයකින් යතිඇති වෘත්තය "සුවදනා" නමැයි දතයුත්තීය.

3. **සජ්ජා භරා සලගා යදා ගදිතං තදා පමදානනං**– යම් කලෙක ස – ජ – ජ – භ – ර – සගණ – ලඝු – ගුරුහු වෙත් ද, එකල්හි ඒ වෘත්තය "ප්‍රමදානන" යයි කියනලදී.

**වි:-** මීට ඡන්දොමඤ්ජරියෙහි "ගීතිකා' යයි කියනලදී.

---

**21. ප්‍රකෘතිච්ඡන්දසෙහි — 20,97,152.**

59. 1 **ම්රභ්නා**= මගණ – රගණ – භගණ – නගණයෝ වෙත් ද; **යො**= යගණය වේ ද; **යො**= (නැවත) යගණය වේ ද; **යෙන**= (අන්තයෙහි ද) යගණයෙන් යුක්ත වූ; **තිමුනියතියුතා**= තුනසත හෙවත් සතකින් සතකින් හා සතකින් යති යුක්ත වූ **අයං**= මේතොමෝ; **අත්‍ර**= මෙහි; **සඹරා**= "ශ්‍රග්ධරා" යයි; **කිත්තිතා**= කියනලදී:

**මෙහි පරිශිෂ්ට වෘත්ත.**

2. **භා තභභා ච භරා යදි කිත්තය පුත්තක! මත්තවිලාසිනිං**– පිළිවෙළින් භගණ සයක් හා අන්තයෙහි රගණය ද වී නම් ඒ වෘත්තය "මත්තවිලාසිනී" යයි කියව.

ටීකාවෙහි "නජභයසජරෙහි සාලොපමා" යි "සාලොපමා,, නම් වෘත්තයක් ද දක්වා තිබේ:

---

**22, ආකෘතිච්ඡන්දසෙහි — 41,94,304,**

60. 1. **භ්රා**= භගණ – රගණයෝ වෙත් ද; **නරනා**= නගණ – රගණ – නගණයෝ වෙත් ද; **රනා**= රගණ – නගණයෝ වෙත් ද; **අථ**= නැවත; **ගුරු ච**= ගුරෙකුත් වේ ද; **දස × අක්කා**

විරමං= දසයකින් හා දෙළොසකින් විරාම ඇති; ඉදං හි= මේ වෘත්තය වනාහි; භද්දකං= "භද්‍රක" නම්.

**මෙහි පරිශිෂ්ට වෘත්ත.**

2. **සත්තභකාරයුතා සගුරූ ගදිතා'ය මුදුරතරා මදිරා**– කොළවර ගුරක් සහිත වූ භගණ සතක් ඇති මෝතොමෝ අතිශයින් උදාර වූ "මදිරා" නම් වෘත්ත යයි කියනලදී.

මේ ඡන්දසෙහි ටීකාකාරයන් දක්වන ලද්දේ "භතිරනගා මාධුරිකා" යි භ - ර - න - ර - න - ර - නගණ - ගුරු යන මෙයින් යුක්ත වූ "මාධුරිකා" නම් වෘත්තයක් පමණකි.

---

## 23. විකෘතිච්ඡන්දසෙහි = 83,88,608.

1. **යම්හ නජා භජා භජභලග් තමස්සලලිතං හර'ක්ක විරමං**– මෙහි යම් වෘත්තයක් න - ජ - භ - ජ - භ - ජ - භගණ හා ලඝු ගුරු වේ ද; එකොළොසකින් හා දෙළොසකින් වූ යති ඇත්තේ ද ඒ වෘත්තය "අශ්වලලිත" නම්.

**වි:**– ඡන්දොමඤ්ජරියෙහි "අද්‍රිතනයා" යි කියන ලද්දේ මේ වෘත්තයයි.

2. **මත්තාකීළා'නෙන ල්ගා මා තො නවතුහි ච වසුසර දසයතියුතා**– යම් වෘත්තයෙක්හි මගණ දෙකක් ද තගණය ද නගණ සතරක් ද අන්තයෙහි ලඝු - ගුරුහු ද වෙත් නම් අටකින් පසළොසකින් යතිඇති ඒ වෘත්තය "මත්තාක්‍රීඩා" නම් වේ

**වි:**– මෙහි "වසුසරදස,, යනු වෘත්තරත්නාකර සූත්‍රය හා සම කොට යෙදීමු. ඊට "අටකින් පසකින් හා දසයකින්,, යයි අරුත් කිව හැකියි. ටීකාවෙහි ද "අඨහි පඤ්චහි ච විරාමං" යි එසේ ම යතිස්ථාන දක්වා තිබේ. එහෙත් – " වසුපඤ්චදශකො " යන පිඞ්ගලවචනය යතිස්ථාන තුනක් වීම වළකයි. එහෙයින් අටකින් හා පසළොසකින් යයි කීම යොග්‍යයි.

3. **භෙහි ච සත්තහි අන්ත ගතා ගුරුණා ගුරුණා'ථ මයූර ගති'යං**– මෙ ඡන්දසෙහි භගණ සතකින් ද අන්තයෙහි ගුරු දෙකකින් ද කරනලද මේ වෘත්තය "මයූරගති" නම් වේ.

**වි:**– මෙහි ශ්‍රැතිසුඛ පරිදි යතිය කළ යුතුයි.

## 24. සඞ්කෘතිච්ඡන්දසෙහි — 1,67,77,216.

1. **ඉන්ද්‍රියලොකා'ශිතයති භතනා ස්නා භනයා ච සදි භවති තන්වී**– භ - ත - න - ස - භ - භ - න - යගණයෝ වෙත් ද; පසකින් හා සතකින් කරනලද පාදමධ්‍යයතී වේ ද ඒ වෘත්තය "තන්වී" නම් වේ.

1. විසමෙ යදි සා සලගා සමෙ
භත්තයතො ගුරූකා උපචිත්තං.

ටීකාවෙහි ,, විනජරා මෙඝමාලා ,, යි නගණ දෙකකින් හා රගණ සයකින් ලක්‍ෂිත වූ වෘත්තයක් ද පෙනේ.

---

**25. අතිකෘතිච්ඡන්දසෙහි — 3,35,54,432.**

1. **කොඤ්චපදා භ්මා ස්භා චතුරෙ නා ගු'ස්සුසරවසුමුනි යති භවති සඡව**– භ – ම – ස – භගණයන් හා නගණ සතරක් වෙත් ද; අන්තයෙහි ගුරක් වේ ද පසකින් පසකින් අටකින් හා සතකින් යති වේ ද එකල්හි ඒ වෘත්තය " කොඤ්චපදා ,, නම් වන්නීය.

---

**26. උත්කෘතිච්ඡන්දසෙහි — 6,71,08,864.**

1. **වසවිසා'සසවෙජදෙපෙනං මමතනනනයුගරසලගා භුජ ඞ්ගවිජම්භිතං**– ම – ම – ත – න – න – න – ර – සගණ – ලඝු – ගුරුහු වෙත් ද අටකින් එකොළොසකින් හා සතකින් කරනලද යතිඇති වෘත්තය "භුජඞ්ගවිජෘම්භිත" නම් වේ.

2. **මො නානං ජ ච සගගිති නවරස යුගසරයතියුතමප වාහං තං**– මගණය ද නගණ සයක් ද සගණය හා ගුරු දෙකක් ද යන මොහු වෙත් ද නවයකින් සයකින් සයකින් හා පසකින් යති යුක්ත වූ ඒ වෘත්තය "අපවාහ,, නම් වේ.

---

**"වුත්තොදය" නම් මාගධිකඡන්දශ්ශාස්ත්‍රයෙහි සමවෘත්තනිද්දේශ නම් වූ තෘතිය පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.**

---

එකදෙශයකින් සමවෘත්ත දක්වා දැන් අඩ්සමවෘත්තයන් දක්වන්තාහු "විසමෙ,, යනාදිය කියත්.

1. **විසමෙ**= විෂම පාදයෙහි; **යදි**= ඉදින්; **සා**– සගණයෝ (දෙදෙනෙක්) වෙත් ද; **සලගා**= (නැවත) සගණ – ලඝු – ගුරුහු වෙත් ද; **සමෙ**= සමපාදයෙහි; **භත්තයතො**= භගණ තුනකින් පරව; **ගුරූකා**= ගුරුහු දෙදෙනෙක් වෙත් ද; **උපචිත්තං**= ඒ වෘත්තය "උපචිත්‍ර,, නමි.

**වි:**– දක්වන ලද්දේ පූර්වාර්ධයෙහි ලක්‍ෂණයි. අර්ධ සමයෙහින් අපරාර්ධය ද මෙසේ මැයි. එහෙයින් විෂම වූ තුන්වන පාදයෙහි

2. ගන්තගතො යදි ගා දුතමජ්ඣා
යදි පුනෙරව භවන්ත් නජා ජ්‍යා.

3. යදි සන්තිතයං ගුරුයුත්තං
වෙගවතී යදි භන්තිතයා ගා.

4. තො ජො විසමෙ රතො ගුරු චෙ
ම්සා ජ්ගා භද්දවිරාජමෙත්ථ ගො චෙ.

---

පළමුවන පාදය මෙන් සගණ තුනක් හා ලඝු - ගුරු ද සම වූ සතර වන පාදයෙහි දෙවන පාදය මෙන් භගණ තුනක් හා ගුරු දෙකක් ද යුක්ත කළ යුතුයි. කිසිවෙක් මීට ,,උපචිත්‍රක,, යයි ද කියත්.

ලක්ෂ්‍යලක්ෂණ සංයුක්ත හෙයින් **"විසමෙ"** යනාදිය ම එයින් දක් වූ ලක්ෂණයට නිදශිතයි. අපරාර්ධය ද මෙසේ ම ගත් විට ගාථාව පිරේ. ගුරු - ලඝු වින්‍යාසය සුගම යි. මත්තෙහි ද මෙසේ යි.

2. **යදි**= ඉදින්; **භන්තගතො**= (විෂමපාදයෙහි) භගණ තුනකින් පරව; **ගා**= ගුරුහු දෙදෙනෙක් වෙත් ද; **යදි**= ඉදින්; **පුන** × **එව**= නැවතත් (සමපාදයෙහි) **නජා**= නගණ - ජගණයෝ ද; **ජ්‍යා**= ජගණ - යගණයෝ ද; **භවන්ති**= වෙත් ද; (එකල්හි ඒ වෘත්තය) **දුතමජ්ඣා**= "දෘතමධ්‍යා" නමු.

**වි:-** මේ ලක්ෂණයෙන් අර්ධදෙක ම රචනා කරන ලද්දේ **"දෘතමධ්‍යා"** වෘත්ත යයි. වෛතාලීය ජාතියෙහි ත්‍රිවිධ අපරාන්තිකාවන් අතුරෙන් **ආපාතලිකා'පරාන්තිකා** ලක්ෂණ ද, මාත්‍රා සමජාතියෙහි **උපචිත්‍රා** ලක්ෂණ ද මෙහි දක්නා ලැබේ.

3. **යදි**= ඉදින්; (විෂමපාදයෙහි) **ගුරුයුත්තං**= (අන්තයෙහි) ගුරකින් යුක්ත වූ; **සන්තිතයං**= සගණ තුනක් වෙත් ද; **යදි**= ඉදින්; (සමපාදයෙහි) **භන්තිතයා**= භගණ තුනකින් පරව; **ගා**= ගුරුහු දෙදෙනෙක් වෙත් ද; **වෙගවතී**= (එකල්හි) "වෙගවතී" වෘත්තය වේ.

**වි:-** මෙහි විෂමපාද සගණ තුනකින් හා ගුරකින් ද සමපාද භගණ තුනකින් හා ගුරු දෙකකින් ද යුක්ත වේ. මෙහි ද **ආපාතලිකා** ලක්ෂණ ම දක්නා ලැබේ.

4. **විසමෙ**= විෂම පාදයෙහි; **චෙ**= ඉදින්; **තො**= තගණය වේ ද; **ජො**= ජගණය වේ ද; **රතො**= (නැවත) රගණයෙන් පරව; **ගුරු**= ගුරෙක් වේ ද; **එත්ථ**= මේ සමපාදයෙහි; **චෙ**= ඉදින්; **ම්සා**= මගණ - සගණයෝ වෙත් ද; **ජ්ගා**= ජගණ - ගුරුහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේ ද; **භද්දවිරාජං**= (එකල්හි ඒ වෘත්තය) "භද්‍රවිරාජ්" නම්.

5. විසමෙ සජා සගුරුයුත්තා
කෙතුමතී සමෙ භරනගා ගො.

6. ආඛ්‍යානිකී තා විසමෙ ජගා ගො
ජතා ජගා ගො තු සමෙ,ථ පාදෙ.

7. ජතා ජගා ගො විසමෙ සමෙ තු
තා ජෝ ගගා චෙ විපරීතපුබ්බා.

---

**වි:-** විෂමපාද තගණ - ජගණ - රගණ - ගුරකින් ද, සම පාද මගණ - සගණ - ජගණ - ගුරු දෙකකින් ද යුක්ත වූයේ "භද්දවිරාජ,, (= භද්‍රවිරාජ්) නම් වෘත්ත යයි මෙහි **ඛෟපචඡන්දසික ලක්‍ෂණ පෙනේ.**

"ගුරු" යි ජන්දස පිණිස දීඝිය.

5. **විසමෙ**= විෂම පාදයෙහි; **සගුරුයුත්තා**= සගණ - ගුර කින් යුක්ත වූ; **සජා**= සගණ - ජගණයෝ වෙත් ද; **සමෙ**= සම පාදයෙහි; **භරනගා**= භගණ - රගණ - නගණ - ගුරු යන මොහු වෙත් ද; **ගො**= (අන්තයෙහි) ගුරෙක් වේද; **කෙතුමතී**= ඒ වෘත්තය "කෙතුමතී" නමි.

**වි:-** මෙහි විෂමපාද සගණ - ජගණ - සගණ - ගුරකින් ද, සමපාද භගණ - රගණ - නගණ - ගුරු දෙකකින් ද යුක්තවෙත්.

6. **විසමෙ**= විෂම පාදයෙහි; **තා**= තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජගා**= ජගණ - ගුරුහු වෙත් ද; **ගො**= (නැවත) ගුරෙක් වේ ද; **අථ**= නැවත; **සමෙ පාදෙ තු**= සමපාදයෙහි වනාහි; **ජතා**= ජගණ - තගණයෝ වෙත් ද; **ජගා**= ජගණ - ගුරුහු වෙත් ද; **ගො**= (නැවත) ගුරෙක් වේ ද; **ආඛ්‍යානිකී**= ඒ වෘත්තය "ආඛ්‍යානි කී,, නමි.

**වි:-** මෙහි විෂම - සමපාද 'ඉන්ද්‍රවජ්‍රා - උපෙන්ද්‍රවජ්‍රා,, පාද මැයි. එහෙයින් යට දක්වූ ඉන්ද්‍රමාලාවෙහි මෙය "භද්‍රා" යන නාමයෙන් කියනලදී. එතකුදු වුවත් විශෙෂ නාමයෙන් දක්වනු පිණිස මෙහි නැවත ගන්නාලදී.

"ආඛ්‍යානිකා, ආඛ්‍යාතිකා,, යනු පාඨාන්තරයි.

"ආඛ්‍යානිකී,, යනු වැටේ.

7. **විසමෙ**= විෂම පාදයෙහි; **ජතා**= ජගණ - තගණයෝ **වෙත් ද; ජගා**= ජගණ - ගුරුහු වෙත් ද; **ගො**= (නැවත) ගුරෙක් **වේ ද; තු**= නැවත; **සමෙ**= සමපාදයෙහි; **චෙ**= ඉදින්; **තා**= තගණ **යෝ දෙදෙනෙක් වෙත් ද; ජෝ**= ජගණයෙක් වේ ද; **ගගා**= (අන්ත

8. සසතො සලගා විසමෙ සමෙ
නහහරා භවති හරිණපලුතා.

9. යදි නතරලගා තජා ජරා
යදි ච තද'පරවත්තමිච්ජති.

10. විසම මුපගතා නනා රයා වෙ
නජජරගා සමකෙ ච පුප්ඵිතග්ගා.
(වියමිදං වෙතාලීයප්පභෙදෙ.)

යෙහි) ගුරුහු දෙදෙනෙක් වෙත් ද; (එකල්හි ඒ වෘත්තය) **විපරීත පුබ්බා**= "විපරීත,, යනු පූර්ව කොට ඇති; **ආඛ්‍යානිකී**= "ආඛ්‍යානිකී" නමු ගෙවත් "විපරීතාඛ්‍යානිකී,, නම් වේ.

**වි:-** මෙහි විෂම – සමපාද උපෙන්‍ද්‍රවජ්‍රා – ඉන්ද්‍රවජ්‍රා පාදයි, ඉන්ද්‍රමාලාවෙහි "හංසී" නාමයෙන් දක්වන ලද්දේ මෙයයි.

8. **විසමෙ**= විෂම පාදයෙහි; **සසතො**= සගණ – සගණයන් කෙරෙන්; **සලගා**= සගණ – ලඝු – ගුරුහු වෙත් ද; **සමෙ**= සම පාදයෙහි; **නභභරා**= නගණ – භගණ – භගණ – රගණයෝ වෙත් ද; **හරිණපලුතා භවති**= ඒ වෘත්තය "හරිණප්ලුතා" නම් වේ.

**වි:-** මෙහි විෂමපාද සගණ තුනකින් හා ලඝු – ගුරු දෙක කින් ද, සමපාද නගණය භගණ දෙකක් හා රගණයකින් ද යුක්ත වෙත්.

9. **යදි**= ඉදින් (විෂමපාදයෙහි;) **නනරලගා**= නගණ – නග ණ - රගණ – ලඝු – ගුරුහු වෙත් ද; **යදි**= ඉදින් (සමපාදයෙහි;) **නජා**= නගණ – ජගණයෝ වෙත් ද; **ජරා**= ජගණ – රගණයෝ වෙත් ද; **තද**= එකල්හි; (ඒ වෘත්තය) **අපරවත්තං**= "අපරවක්ත්‍ර" නමැයි; **ඉච්ජති**= කැමති වේ.

**වි:-** මෙහි විෂමපාද නගණ දෙකක් හා රගණ – ලඝු – ගුරු යන මොවුන්ගෙන් ද; සමපාද නගණය ජගණ දෙකක් හා රගණය කින් ද යුක්ත වෙත්. මෙය "වෛතාලීය,, භෙදයකි.

"යදි ච,, හි "ච,, කාරය පාද පූරණයෙහි වේ. සත්නවල පෙ නෙන "පරවක්ත්‍ර,, යන නාමය නො යෙදේ.

10. **වෙ**= ඉදින්; **නනා**= නගණයෝ දෙදෙනෙක් ද; **රයා**= රගණ – යගණයෝ ද; **විසමං**= විෂම පාදයට; **උපගතා**= පැමිණි යාහු වෙත් ද; **සමකෙ ච**= සමපාදයෙහි ද; **නජජරගා**= නගණ – ජගණ – ජගණ – රගණ – ගුරු යන මොහු වෙත් ද; **පුප්ඵිතග්ගා**= ඒ වෘත්තය "පුෂ්පිතාග්‍රා,, නමු.

11. සා යවාදිකා මතී රජා රජා තු
සමෙ'සමෙ ජරා ජරා ගුරූ භවෙය්‍යුං.

**ඉති වුත්තෝදයෙ ඡන්දසි අඩ්ඪසමවුත්තනිද්දෙසො නාම චතුත්ථො පරිච්ඡෙදො.**

---

**වි:-** මෙහි විෂම පාදයන්හි නගණ දෙකක් හා රගණ යගණයෝ ද, සමපාදයන්හි නගණය ජගණ දෙකක් හා රගණ - ගුරු යන මොහු ද වෙත් . මෙය "ඖපච්ඡන්දසික" භෙදයකි.

(**ඉදං වයං**= මේ (අපරවක්ත්‍ර - පුෂ්පිතාග්‍රා යන) වෘත්ත දෙක; **වෙතාලියප්පභෙදා**= වෛතාලීයජාති ප්‍රභෙදයි.)

මෙහි යට දක්වූ "අපරවක්ත්‍ර, පුෂ්පිතාග්‍රා" යන වෘත්තදෙක වෛතාලීය ඖපච්ඡන්දසික ලක්ෂණ ඇතුදු ජාතිවශයෙන් ගෙන "වෙතාලියප්පභෙදා" යි කීහ. "අපරාන්තිකා" දි ලක්ෂණ ඇති අඩ්ඪසමවෘත්ත ඇතිකල්හි මෙපමණක් වෙසෙසා දක්වන ලද්දේ "වදන්ත්‍යපරවක්ත්‍රාඛ්‍යං" යනාදි ශ්ලෝකය හෙයිනැයි හැගේ.

11. **අසමෙ**= විෂම පාදයෙහි; **රජා**= රගණ - ජගණයෝ වෙත්ද; **රජා**= (නැවත) රගණ - ජගණයෝ වෙත් ද; **තු**= නැවත; **සමෙ**= සමපාදයෙහි; **ජරා**= ජගණ - රගණයෝ ද; **ජරා**= (නැවත) ජගණ - රගණයෝ ද; **ගුරූ**= ගුරෙක් ද යන මොහු; **භවෙය්‍යුං**= වන්නාහු ද; **සා**= ඕතොමෝ; **යවාදිකා**= "යව" ශබ්දය ආදිකොට ඇති; **මතී**= "මතී" හෙවත් "යවමතී" නමි.

**වි:-** විෂමපාද රගණ - ජගණ - රගණ - ජගණයන්ගෙන් ද; සමපාද ජගණ - රගණ - ජගණ - රගණ - ගුරු යන මෙයින් ද, යුක්ත වූවා "යවමතී" නම් වෘත්ත යයි.

වෘත්තරත්නාකරයෙහි "ලලිතා" නම් අඩ්ඪසමවෘත්තයක් ද කිසි තැනෙක එය ම "සුන්දරී" යන නමින් ද ග්‍රන්ථාන්තරයෙහි තදන්‍ය අඩ්ඪසමවෘත්ත ද දක්නා ලැබෙත්.

**"වුත්තෝදය" නම් මාගධික ඡන්දශාස්ත්‍රයෙහි අඩ්ඪසමවෘත්තනිර්දේශ නම් වූ චතුර්ථපරිච්ඡේදව්‍යාඛ්‍යාව මෙතෙකින් සමාප්තයි.**

1. න'ට්ඨ'ක්ඛරෙසු පාදෙසු- ස්නා'දිම්හා යො'ණ්ණවා වත්තං.

---

අඞ්සමවෘත්තයන් දක්වා විෂමවෘත්ත දක්විය යුත්තෙහි "වක්ත්‍රච්ඡන්දස" නිර්දේශ කරන්නාහු "නට්ඨක්ඛරෙසු" යනාදිය කියත්.

1. **අට්ඨ'ක්ඛරෙසු පාදෙසු**= අෂ්ටාක්ෂර පාදයෙහි; **ආදිම්හා**= ආදියෙහි අක්ෂරයා කෙරෙන් පරව; **ස්නා**= සගණ - නගණයෝ; **න**= නො වෙත් ද; **අණ්ණවා**= අකුරු සතරකින් පරව; **යො**= යගණයෙක් වේ ද; **වත්තං**= ඒ වෘත්තය "වක්ත්‍ර" නමි.

**වි:**= මෙයින් වක්ත්‍රවෘත්තයන්ගේ සාමාන්‍ය ලක්ෂණ කියන ලදී. මෙහි පාදයෙක්හි අකුරු අටකි, එය ලක්ෂණ වශයෙන් කොටස් සතරකින් යුක්ත වේ. එයින් ප්‍රථමස්ථානය එක ම වර්ණයකි, එය ලඝුවක් හෝ ගුරක් විය හැක. ද්විතිය ස්ථානයෙහි සගණ - නගණ දෙක හැර සෙසු ගණ සයෙන් .එකක් රුචිලෙස යෙදිය හැක. තෘතිය ස්ථානයෙහි කෙවල වූ යගණය පමණක් යෙදේ. චතුර්ථස්ථානය ද ගුරක් හෝ ලඝුවක් විය හැකියි.

"නට්ඨක්ඛරෙසු" යනාදිය ම එයින් දක්වූ ලක්ෂණයට නිදර්ශනයි එහි ආදි වර්ණයෙන් පරව සගණය හෝ නගණය යෙදී නැත, අකුරු සතරකින් පරව සගණය යෙදී තිබේ, දක්වන ලද්දේ අර්ධයක් හෙයින් ඉතිරි අර්ධය ද මේ ලක්ෂණයෙන් ගත්විට ගාථාව පිරේ එහි වින්‍යාසය හා ස්ථාන භේද ද මෙසේයි.

(1) ⏑ , ⏑ – ⏑ , – ⏑ ⏑ , –
1 - 2 , 2 - 6 , 3 - 1 , 4 - 2

(2) ⏑ , ⏑ ⏑ ⏑ , – ⏑ ⏑ , ⏑
1 - 2 , 2 - 6 , 3 - 1 , 4 - 2

මේ දක්වූ ස්ථාන භේදයන්ගේ වශයෙන් පාදයක (2 × 6=12 × 2=24) විකල්ප සූවිස්සකි, අර්ධයක (24 × 24=576) විකල්ප පන්සිය සසැත්තෑවකි, උභයාර්ධයෙහි (576 × 576=3,31,776) තුන්ලක්ෂ තිස්එක්දහස් සත්සිය සසැත්තෑවකි.

කිසි ආචාර්‍ය්‍ය කෙනෙක් මේ වක්ත්‍රජාතිය මාත්‍රාච්ඡන්දස්හි ලා දක්වති. එහෙත් මෙහි වර්ණ වෘත්තයන් පිළිබඳ ගණ යෙදෙන හෙයින් ද, පාද වර්ණසඞ්ඛ්‍යාවෙන් ගිණිය යුතු හෙයින් ද ආචාර්‍ය්‍ය පාදයෝ මොවුන් වර්ණච්ඡන්දස්හි ඇතුලත් කිරීමෙහි යුක්තතරත්වය සැලකූහ. අෂ්ටාක්ෂරපාද වුව අනුෂ්ටුප් ඡන්දස්හි කුමක් හෙයින්

2. සමෙසු සිඛුනො ජෙන– පථ්‍යාවත්තං පකිත්තිතං.
3. ඔජෙසු ජෙන සිඛුනො– තමෙව විපරීතා'දි.
4. නකාරෙ චෙ ජලධිතො– චපලාවත්තමිච්චෙතං.

---

ඇතුලත් නො වෙත් ද යත්? සමවෘත්තයන් මෙන් මේ වක්ත්‍රජාති යෙහි සකල ස්ථානයෙහි නියත ගුරු – ලඝු නො ලැබෙන හෙයින් අනුෂ්ටුප්ති ලා නො ගැණේ. එහෙයින් ම මේ මාගධවිජ්ජසෙහි වක්ත්‍රවෘත්ත විෂමවෘත්තයන් මෙන් ගත්බව සැලකිය යුතුයි.

2. **සමෙසු**= සමපාදයන්හි; **සිඛුනො**= අකුරු සතරකින් පරව සිටි; **ජෙන**= ජගණය කරණ කොට ගෙන; **පථ්‍යාවත්තං**= "පථ්‍යාවක්ත්‍ර" යයි; **පකිත්තිතං**= කියනලදී.

**වි:–** මේ පථ්‍යාවක්ත්‍රයෙහි සම (= 2 – 4) පාදයන්හි අකුරු සතරකින් පරව ජගණය යෙදීම පමණක් වක්ත්‍රයට වඩා විශෙෂ යයි. එහෙයින් පාදසතරෙහි ම ආදි වර්ණයෙන් පරව සගණ – නගණ නො යෙදේ. විෂම (= 1 – 3) පාදයන්හි සතරකින් පරව යගණය ම යෙදේ. ස්ථාන විකල්පාදිය වක්ත්‍රයට කී ලෙසින් සැල කිය යුතුයි.

3. **ඔජෙසු**= විෂම පාදයන්හි; **සිඛුනො**= අකුරු සතරකින් පරව සිටි; **ජෙන**= ජ ග ණ ය කරණ කොට ගෙන **තමෙව**= ඒ "පථ්‍යාවක්ත්‍රය" ම; **විපරීතාදි**= "විපරීත" යනු ආදි කොට ඇත්තේ වේ; හෙවත් "විපරීතපථ්‍යාවක්ත්‍ර" නම් වේ.

**වි:–** මේ වෘත්තයෙහි විෂම (= 1 – 3) පාදයන්හි අකුරු සත් රකින් පරව ජගණය යෙදීමෙන් වක්ත්‍රයට වඩා වෙනස් වේ. සෙසුලක්ෂණ හා විකල්පාදිය වක්ත්‍රයෙහි මෙන් ම සැලකිය යුතුයි. පථ්‍යාවක්ත්‍රයෙහි සමපාදයට පැමිණි විශෙෂ ලක්ෂණය මෙහි විෂම පාදයට පැමිණි හෙයින් "විපරීතපථ්‍යාවක්ත්‍ර" නම් විය.

"ඔජෙසු" යනු වැටේ.

4. (**ඔජෙසු**= විෂම පාදයන්හි;) **ජලධිතො**= අකුරු සතර කින් පරව; **චෙ**= ඉදින්; **නකාරෙ**= නගණය වේ ද; **ඉති**= මෙසේ සිටිකල්හි; **එතං**= මේ වෘත්තය; **චපලාවත්තං**= "චපලාවක්ත්‍ර" නම්.

**වි:–** මෙහි විෂම පාදයන්හි පමණක් අකුරු සතරකින් පරව නගණය යෙදීම ම වක්ත්‍රයට වඩා වෙනසයි. සෙසු ලක්ෂණාදිය වක්ත්‍රයෙහි කී පරිද්දෙනි.

5. සමෙ ලො සත්තමො යස්සා– විපුලා පිඞ්ගලස්ස සා.
6 සෙතවස්සා'ඛිලෙසවපි–
7. භෙන'ණ්ණවා තබ්බිපුලා–

5. **යස්සා**= යම් වක්ත්‍ර ජාතියෙක්හි; **සමෙ**= සමපාදයෙහි; **සත්තමො**= සත්වෙනි වර්ණය තෙම; **ලො**= ලඝුවෙක් වේ ද; **පිඞ්ගලස්ස**= පිඞ්ගල මුනිහුගේ මතයෙහි; **සා**= ඕ තොමෝ; **විපුලා**= "විපුලා" නමු.

**වි**:= සම පාදයන්හි සත්වන අකුර නියත ලඝුවක් වීම මෙහි විශෙෂ ලක්‍ෂණ යයි. පථ්‍යාවක්ත්‍රයෙහි ද අකුරු සතරකින් පරව ජගණය ම යෙදෙන හෙයින් සත්වැන්න ලඝුවක් වේ. එහෙත් මෙහි ජගණ – තගණ – භගණ – නගණ – යන ගණ සතරින් එකක් යෙදුන විට සත්වැන්න ලඝුවක් වේ. මෙසේ මොවුන් දෙදෙනාගේ විශෙෂය සැලකිය යුතුයි, දුන් ජගණ පක්‍ෂයෙහි පථ්‍යාවක්ත්‍රය හා මිශ්‍රවනබව පෙනේ, එහෙයින් ජගණ පක්‍ෂය හළයුතුද? නැත, "සමෙ" යනාදි ලක්‍ෂණාත්මක ලක්‍ෂ්‍යයෙහි ම සතරින් පරව ජගණය යෙදී තිබෙන හෙයිනි. මෙහි ලා සංඥ වෙන් පමණක් විශෙෂය සැලකිය යුතුයි.

මෙහි ද විෂම පාදයෙහි වක්ත්‍රයෙහි මෙන් විකල්ප සූවිස්ස (24) කි. සමපාදයෙහි සත්වැන්න ලඝුහෙයින් තෘතියස්ථානයෙහි ජ – ත – භ – න යන ගණ සතරින් රුචි වූවක් යෙදිය හැකියි, මෙසේ එහි විකල්ප සතරක් වන හෙයින් සමපාද විකල්ප සයානූව (96) කි, අර්ධයෙක්හි විකල්ප 2304 කි, සියල්ල 53,08,416 කි.

කිසිවෙක් මීට "යුගමවිපුලා" යයි ද කියත්.

"ලො, සත්තමො, විපුලා" යනු වැටේ.

6. **සෙතවස්ස**= සෙතව මුනිහුගේ මතයෙහි; **අඛිලෙසු** × **අපි**= සියලු පාදයන්හි ම; (**සත්තමො**= සත්වන වර්ණයතෙම; **ලො** ලඝුවෙක් වී නම්; **විපුලා**= "විපුලා" යයි දන්නාලදී.)

**වි**:= සෙතවයෝ විපුලාවෙයි පාද සතරෙහි ම සත්වැන්න ලඝුවෙක් වේ යයි කියති, ඔහුගේ මතය පරිදි පාදසතරෙහි ම තෘතීය ස්ථාන විකල්ප සතරකි, ප්‍රථම – ද්විතිය – චතුර්ථ ස්ථාන යන්හි වක්ත්‍රයට සමානයි, මෙසේ පාදයක ලැබෙන විකල්ප 96 කි, මුළුල්ල 18,49,34,656 කි.

"අඛිලෙසවපි" යනු වැටේ.

7. (**අඛිලෙසු අපි**= සියලු පාදයන්හි ම;) **අණ්ණවා**= සතර කින් පරව සිටි; **භෙන**= භගණය සාරණ කොට ගෙන; **තබ්බිපුලා**= ඒ භකාරයෙන් පර වූ; විපුලා නමි. ("භවිපුලා" යයි සේයි,)

8. එවමඤ්ඤෙ රො චතුත්ථා-
9. නො'ණ්ණවා චෙ නවිපුලා-
10. තො'ණ්ණවා තථා'ඤ්ඤෙ සියා-

**වත්තපභෙදො.**

---

**වි:=** "තතො භකාරතො පරා විපුලා තබ්බිපුලා" යනු විග්‍රහයි, මේ භවිපුලාවෙහි පාද සතරෙහි ම අකුරු සතරකින් පරව භගණය යෙදීමෙන් වක්ත්‍රයට වඩා වෙනස් වේ. සෙසු ලක්‍ෂණ හා විකල්ප ද වක්ත්‍රයට කී අයුරු මැයි.

හලායුධයෝ විෂම පාදයන්හි ම භගණාදිය වේ යයි කීහ. එහෙත් සඞ්ඝරක්‍ෂිතපාදයන් එය ගරු නො කළ බැව් පෙනේ. ටීකාකාරයෝ ද "සබ්බත්‍ර''යි සතර පාදයෙහි ම භගණාදිය කැමති වූහ.

8. **එවං**= මෙසේ; (මේ භවිපුලාවෙහි මෙන්) **චතුත්ථා**= සතර වෙනි අක්‍ෂරයෙන් පරව; **රො**= රගණය වී නම්; **අඤ්ඤෙ**= අන්‍ය වූ "රවිපුලා" නමු.

**වි:-** මෙහි අන්‍යොන්‍ය විශෙෂය හා විකල්ප සඞ්ඛ්‍යාදිය යට දක්වූ පරිද්දෙන් සැලකිය යුතුයි.

9. **චෙ**= ඉදින්; **අණ්ණවා**= අකුරු සතරකින් පරව; **නො**= නගණය වේ ද; (එකල්හි ඒ වෘත්තය) **නවිපුලා**= "නවිපුලා" නමු.

10. **තථා**= එපරිද්දෙන්; **අණ්ණවා**= සතරකින් පරව; **තො**= තගණය වී නම්; **අඤ්ඤෙ සියා**= අන්‍ය වූ 'තවිපුලා" වන්නීය.

**වි:=** මෙසේ ම යම් වෘත්තයක සතරකින් පරව මගණය වී නම් "මවිපුලා" යයි ද, යගණය වී නම්; "යවිපුලා" යයි ද කියනු ලැබේ. මේ වක්ත්‍රජාතියෙහි ලැබෙන විපුලාභෙද අනන්ත වේ. ඔවුන්ගේ සතරවැන්න ගුරෙක් වෙයි යන කෙවිනමතය ද මෙහි නො ගිණුහ.

කවිප්‍රයොගයෙහි බොහෝ සෙයින් දක්නට ලැබෙන මෙහි දක්වූ වක්ත්‍රලක්‍ෂණයෙන් වෙනස් වූ ලක්‍ෂණ ඇති වක්ත්‍රවිශෙෂ ද දක්නා ලැබෙත්, ඡන්දොමඤ්ජරියෙහි-

"පඤ්චමං ලඝු සර්වත්‍ර- සප්තමං ද්විචතුර්ථයොඃ
ගුරු ෂෂ්ඨඤ්ච පාදානාං- ශෙෂෙෂ්වනියමො මතඃ.
ප්‍රයොගෙ ප්‍රායිකං ප්‍රාහුඃ- කෙප්‍යෙතද්වක්ත්‍රලක්‍ෂණම්
ලොකෙ'නුෂ්ටුබිති ඛ්‍යාතං- තස්‍යා'ෂ්ටා'ක්‍ෂරතා කෘතා" යි

න දිස්සතෙ'ත්ථ යං ඡන්දං- පයොගෙ දිස්සතෙ යදි
විසමක්ඛරපාදං තං- ගාථා සාමඤ්ඤනාමතො.

**ඉති වුත්තොදයෙ ඡන්දසි විසමවුත්තනිද්දෙසො නාම පඤ්චමො පරිච්ඡෙදො.**

---

ලොකයෙහි "අනුෂ්ටුප්" යයි ප්‍රසිඬ වූ අෂ්ටාක්ෂර පාද ඇති මේ වක්ත්‍රයාගේ පාදසතරෙහි ම පස්වැන්න ලඝුවක් වෙයි, දෙවෙනි සතර වෙනි පාදයන්හි සත්වැන්න ද ලඝු වෙයි, සියලු තැන්හි ම සවැන්න ගුරු වෙයි, සෙසු තැන්හි අනියමයෙන් සිටි. මේ "ඇතැම් ආචාර්‍ය්‍ය මතයකි. කිසි ප්‍රයොගයෙක්හි විෂම පාද යන් පිළිබඳව මෙකී ලක්‍ෂණ නියමය ශ්‍රුතිකටු නො වන පරිදි පිරිහී තිබෙනබැව් ද පෙනේ. මෙසේ වක්ත්‍රවෘත්තයන් පිළිබඳව පවත්නා අනන්ත වූ භෙදයෝ ප්‍රයොගානුසාරයෙන් ම දත යුත්තාහුය.

**වත්තප්පභෙදො** – වක්ත්‍රප්‍රභෙදයි.

---

දැන් මෙහි නො දක්වූ වෘත්තජාතීනුදු සඞ්ග්‍රහ කරන්නාහු "න දිස්සතෙ" යනාදිය කියත්.

**ඒසත්**= මේ "වුත්තොදය" නම් මාගධ ඡන්දශාස්ත්‍රයෙහි; **යං ඡන්දං**= යම් ඡන්දසෙක්; **න දිස්සතෙ**= නො දක්නා ලැබේ ද; **යදි**= ඉදින්; **පයොගෙ**= කවිප්‍රයොගයෙහි හෝ පිටකත්‍රයෙහි; **දිස්සතෙ**= දක්නා ලැබේ ද; **විසමක්ඛරපාදං**= විෂම වූ අක්‍ෂර හා පාද ඇති; **තං**= ඒ ඡන්දස; **සාමඤ්ඤනාමතො**= සාමාන්‍ය නාමයෙන්; **ගාථා**= "ගාථා" නම් වේ.

**වි**:= මෙහි "ඡන්ද" ශබ්දයෙන් වෘත්තජාති කියනු ලැබේ. අක්ඛරානි ච පාදානි ච= අක්ඛරපාදානි, විසමානි අක්ඛරපාදානි යස්ස තං= විසමක්ඛරපාදං යනු විග්‍රහයි.

ප්‍රවචනාත්මක වූ මාගධ භාෂාවෙහි සියලු ඡන්දොජාතීහු ම සාමාන්‍ය නාම හෙයින් ගාථා යයි පලමු කියනලදී. මාගධානුරූප වූ යට දක්වූ ප්‍රසිඬ වෘත්තජාතීන් පරශාස්ත්‍රානුසාරයෙන් විශෙෂනාමාරොපණය කොට දක්වා මෙහි නො දක් වූ "පාදචතුරූඬම්" දි වෘත්තජාතීන්ට "ගාථා" යන සාමාන්‍ය නාමය ම යෙදිය යුතුබැව් මෙයින් දක්වූහ. ප්‍රථම පරිච්ඡෙදයෙහි චතුර්ගගාථා විවෘත්තිය ද බැලිය යුතුයි.

1. පත්ථාරෙ සබ්බගෙ පාදෙ- පුබ්බගා'ධො ල් පරෙ සමා
පුබ්බෙ ගුරුත්‍යෙවමිමෙ- කාතබ්බා යාව සබ්බලො.

---

**"විසමක්ඛරපාදං"** යන තැන්හි ගුරු - ලඝු නියමය නැති බැවින් විෂමාක්ෂර බව ද; ඒකාක්ෂර - ව්‍යක්ෂරාදි අක්ෂර නියමය නැති බැවින් විෂමපාද බවද වේ. විෂමාක්ෂර - විෂමපාද ඇති ඡන්දස් ගාථා වේ යයි කී හෙයින් යට උපජාති අවස්ථාවෙහි දක්වූ "කුම්භූපමං" යනාදි ගය වැනි විෂම පාද ඇති ගාථා උපජාති නො වන බැවි ද එබඳු තැන්හි ද උපජාති ලැබෙයි යන කිසිවෙකු ගේ මතය මෙයින් ඛණ්ඩනය කළබැව් ද සැලකිය යුතුයි.

**"වුත්තොදය" නම් වූ මාගධික ඡන්දශ්ශාස්ත්‍රයෙහි**
**විෂමවෘත්තනිර්දේශ නම් වූ**
**පඤ්චම පරිච්ඡේදය සමාප්තයි.**

---

සම - අර්ධසම - විෂම වෘත්තයන්ගේ වශයෙන් වර්ණච්ඡන්දස විභාග කොට දූන් ඒ ඒ ඡන්දසුන් පිළිබඳ මෙහි දක්වූ වෘත්තයන් ගේ ද අනුක්ත වුව ද කාව්‍යප්‍රයෝගයෙහි පෙනෙන විවිධ වෘත්තයන් ගේ ද උත්පත්තික්‍රමාදිය දක්වීම පිණිස ෂට්ප්‍රත්‍යය ආරම්භ කරන් නාහු "පත්ථාරෙ" යනාදීන් පළමු කොට ප්‍රස්තාර ප්‍රත්‍යය ප්‍රකාශ කරත්.

1. **පත්ථාරෙ**= ප්‍රස්තාරයෙහි; හෙවත් ප්‍රස්තාරය කළ යුතු කල්හි; **සබ්බගෙ පාදෙ**= සර්වගුරු පාදයෙහි; **පුබ්බගා**= පූර්වයෙහි වූ ගුරුහු කෙරෙන්; **අධො**= යට; **ල්**= ලඝුවෙක් වෙයි; **පරෙ**= අන්‍ය යෝ; **සමා**= (උඩ වෘත්තයට) සමවූවාහු වෙති; **පුබ්බෙ**= පූර්වයෙහි; **ගුරූ**= (ඌනස්ථානයෙහි) ගුරෙක් වෙයි; **ඉති**= මෙසේ කටයුත් තේය. **එවං**- මෙසේ= උක්තප්‍රකාරයෙන්; **ඉමෙ**= මේ ත්‍රිවිධවිධීහු; **යාව**= යම්තාක්; **සබ්බලො**= සර්වලඝුපාදය වේ ද; (**තාව**= ඒතාක්;) **කාතබ්බා**= කටයුත්තාහුය.

**වි:**= ඡන්දසක් ප්‍රස්තාර කරන කල්හි එහි සර්වගුරුපාදය පළමු කොට තබා ගතයුත්තේය. ඊට පසු ඒ සර්වගුරු පාදයාගේ ආදි යෙහි ම වූ ගුරට යටින් ලඝුවක් ඇඳීමය, සෙස්ස උඩ පෙලට සම කොට ඇඳීමය, (යම් පෙලක මුලින් හිස් වූ තැනක් වී නම් ඒ) හිස් වූ තැන ගුරකින් පිරවීමය, යන තුන්ආකාරය සර්වලඝු වෘත්තය ලැබෙන තෙක් කටයුත්තේය යන අර්ථයි.

2. නට්ඨස්ස යො භවෙය්‍ය'ඞ්කො– තස්මිං ලො'ඞ්කිතෙ සමෙ
විසමෙ ත්වෙකසහිතෙ– භවෙය්‍ය'ඞ්කිතෙ ගුරු.

3. එකා'දි'නුක්කමෙන'ඞ්කා– පුබ්බා'ධො දිගුණෙ ලිඛෙ
මිස්සිතෙහි ලහුට්ඨෙහි– සෙකෙහු'ද්දිට්ඨකං භවෙ.

---

මෙසේ සාමාන්‍යයෙන් ප්‍රස්තාර ප්‍රත්‍යය දක්වා "නෂ්ටප්‍රත්‍යය" දක්වන්නාහු "නට්ඨස්ස" යනාදිය කියත්.

2. **නට්ඨස්ස**= නෂ්ටවෘත්තයාගේ; **යො අඞ්කො**= යම් අඞ්කයෙක්; **භවෙය්‍ය**= වන්නේද; **අඞ්කිතෙ**= අඞ්කලාවූ; (=දෙකින් බෙදූ යයි සේයි) **තස්මිං**= ඒ (නෂ්ටවෘත්තයාගේ) අඞ්කය; **සමෙ**= සම වූ කල්හි; **ලො**= ලඝුවෙක් වන්නේය. **විසමෙ තු**= විෂම වූ කල්හි වනාහි; **එකසහිතෙ**= එකක් සහිත වූ ඒ අඞ්කය; **අඞ්කිතෙ**= අඞ්කල කල්හි; **ගුරු භවෙය්‍ය**= ගුරෙක් වන්නේය.

**වි:=** ගුරු - ලඝු නො පෙනීගිය වෘත්තයක පළමු වන දෙවන ආදි යම් සඞ්ඛ්‍යාවෙක් වේ නම් එය දෙකින් බෙදූ විට සම වුව හොත් හෙවත් ශෙෂයෙක් නො පෙනේ නම් දෙකින් බෙදූ එහි ලඝුවෙක් ද, විෂම හෙයින් දෙකින් නො බෙදිය හැකි නම් එකක් එක් කොට දෙකින් බෙදූ එහි ගුරෙක් ද ලියන්නේය, යන අර්ථයි. ඡන්දස්හුගේ අක්ෂර සඞ්ඛ්‍යාව පිරෙනතුරු මෙසේ කිරීමෙන් නෂ්ට වෘත්තයාගේ ගුරු - ලඝු පෙනේ.

නෂ්ටප්‍රත්‍යයට අනතුරු කොට "උද්දිෂ්ටප්‍රත්‍යය" දක්වන්නාහු 'එකාදි" යනාදිය කියත්.

3. **පුබ්බා**= (උදෙසනලද වෘත්තයාගේ) පූර්වාක්ෂරයෙහි පටන්; **අධො**= (අක්ෂරයන්ගේ) යට භාගයෙහි; **එකාදි × අනුක්කමෙන**= එක (දෙක) ආදි පිළිවෙළින්; **දිගුණෙ**= දියුණු වූ හෙවත් දෙකින් ගුණ වූ; **අඞ්කා**= අඞ්කයන්; **ලිඛෙ**= ලියන්නේය; **ලහුට්ඨෙහි**= ලඝුන් යට සිටියාවූ; **සෙකෙහි**= එකක් සහිත වූ; **මිස්සිතෙහි**= මිශ්‍රකරන ලද හෙවත් එකතු කරනලද අඞ්කයන් කරණ කොට ගෙන; **උද්දිට්ඨකං භවෙ**= උද්දිෂ්ට වෘත්තය වන්නේය.

**වි:-** දක්වූ වෘත්තයාගේ ගුරු - ලඝු යට එක - දෙක - සතර ආදි ක්‍රමයෙන් දෙකින් ගුණ වූ අඞ්ක ලියා ලඝුන් යට සිටි අඞ්ක අන්‍ය වූ එකක් සමඟ එකතුකළ විට (කීවෙනි වෘත්තය දැ? යි) උද්දිෂ්ටවෘත්තයාගේ අඞ්කය ලැබේ.

4. වුත්ත'ක්ඛරසමා සඞ්ඛ්‍යා– ලිඛ්‍ය සෙකොපරූපරි
එකෙකාහිනමෙකා'දි– නු'ඩ්ඩාතෙ සබ්බගා'දිකං.

5. ගුරුක්‍රියා'ඞ්කසන්දොහෙ– භවෙ සඞ්ඛ්‍යා විමිස්සිතෙ
උද්දිට්ඨා'ඞ්කසමාහාරො- සේ'කො වෙ'මං සමානයෙ.

6. සඞ්ඛ්‍යෙව විගුණේ'කූනා– විත්ථාරා'යාමසම්භවො
වුත්තස්ස'ඞ්ගනාරුනඞ්ඩව– ගරුලානඞ්ඩව අඞ්ගුලං.

**ඉති සඞ්ඝරක්ඛිතථෙරපාද විරචිතෙ**
**වුත්තොදයෙ ඡන්දසි ඡප්පච්චයවිභාගො නාම**
**ඡට්ඨො පරිච්ඡෙදො.**

---

මෙසේ සංක්‍ෂෙපයෙන් උද්දිෂ්ට ප්‍රත්‍යය දක්වා "එකාව්‍යාදි ගුරු ක්‍රියාව" දක්වන්නාහු "වුත්තක්ඛර" යනාදිය කියත්.

4. **වුත්තක්ඛරසමා**= ඡන්දස්හුගේ අක්‍ෂරයන් හා සම වූ; **සඞ්ඛ්‍යා**= සඞ්ඛ්‍යාවන්; **සෙකා**= එකක් සහිත වූවන් කොට; **උපරූපරි**= මතු මතුයෙහි; **ලිඛ්‍ය**= ලියා; **එකෙකාහිනං**= (අන්තයෙහි) එක එක හීන කොට; **එකාදිනං**= එක දෙක ආදීන්ගේ; **උඩ්ඩානෙ**= උඩ්ඩානය (=එකතු) කළ කල්හි; **සබ්බගාදිකං**= සර්වගුරුපාදාදිය වේ.

**වි:–** ඡන්දසෙහි නියම අකුරු ගණිතින් එකක් වැඩි කොට අඞ්කයන් උඩ යට වශයෙන් ලියා කෙළවර අඞ්කය හැර එක දෙක ආදි අඞ්කයන් තබා ගත් කල්හි සර්වගුරු – එකක්ගුරු – දෙකක් ගුරු ආදි වෘත්ත සඞ්ඛ්‍යාව වන්නේය.

ඉතා සැකෙවින් "ගුරුක්‍රියාව" ද දක්වා "සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය" දක්වන්නට "ගුරුක්‍රියා" යනාදිය ප්‍රකාශ කෙරෙත්.

5. **ගුරුක්‍රියා**= එකාව්‍යාදි ගුරුක්‍රියාවගේ; **අඞ්කසන්දොහෙ**= අඞ්ක සමූහය; **විමිස්සිතෙ**= මිශ්‍රකළ කල්හි හෙවත් එක්කළ කල්හි; **සඞ්ඛ්‍යා භවෙ**= (ඡන්දසෙහි වෘත්ත) සඞ්ඛ්‍යාව වන්නේය. **වා**= නොහොත්; **සෙකො**= එකක් සහිත වූ; **උද්දිට්ඨ × අඞ්කසමාහාරො**= උද්දිෂ්ටයෙහි අඞ්කයන්ගේ එක්කිරීම; **ඉමං**= මේ (වෘත්තයන්ගේ) සඞ්ඛ්‍යාතය; **සමානයෙ**= එලවන්නේය.

**වි:=** ගුරුක්‍රියාවෙහි සර්වගුරු = එකගුරු– ව්ගුරු ආදි වෘත්ත සමූහය එකතු කළ කල්හි හෝ උද්දිෂ්ටයෙහි වෘත්තයාගේ අකුරු යට ලියූ අඞ්ක එකක් සමග එකතු කළ විට හෝ ඡන්දස්හුගේ වෘත්ත සඞ්ඛ්‍යාව වන්නේය.

දූන් "අධ්වයොගය" ද දක්වනු පිණිස "සඞ්ඛ්‍යෙව" යනාදිය කියත්.

6. **ද්විගුණා**= දෙකින් ගුණ වූ; **එකූනා**= එකක් ඌන වූ; **සඞ්ඛ්‍යා × එව**= (අක්ෂරයන්ගේ ද වෘත්තයන්ගේ ද) සඞ්ඛ්‍යාතොමෝ මැ; **වුත්තස්ස**= ඡන්දස්හුගේ; **විත්ථාරායාමසම්භවො**= විස්තාරයෙන් ද ආයාමයෙන් ද හටගත්තාවූ; **අද්ධා**= මාර්ගය වෙයි. **අන්තරානං ච**= (ගුරු - ලඝූන්ගේ හා වෘත්තයන්ගේ) අන්තරයන්ට ද; **ගරුලහූනං ච**= ගුරු - ලඝූන්ට ද; **අඞ්ගුලං**= (ප්‍රමාණය) අඟුලෙක් වේ,

**වි:-** ඡන්දස්ස අකුරු සඞ්ඛ්‍යාවත් වෘත්ත සඞ්ඛ්‍යාවත් වෙන වෙන ම දෙකින් ගුණ කොට එකක් අඩු කළ කල්හි ඒ ඡන්දස ප්‍රස්තාර කිරීමට උවමනා බිම්හි පුළුල හා දිග වෙයි, ගුරු ලඝු රේඛාවන්ට ද ඔවුන්ගේ අතර හා වෘත්ත දෙකක් අතර ද ප්‍රමාණය අඟුලෙකි.

---

මෙසේ ආචාර්යපාදයෝ ග්‍රන්ථලාඝවය සලකා ඉතා සැකෙවින් ෂට්ප්‍රත්‍යයන්ගේ විභාගය දක්වූහ. හෙ ද සමවෘත්තයන් පිළිබඳව මැයි, එයිනුදු ශාස්ත්‍රාන්තගවෙෂී වූ ආධුනිකයන්ගේ අභිමතාර්ථ සංසිද්ධිය නො වන හෙයින් මෙතැන්සිට ආචාර්යානුශාසනා නො ඉක්මැ "**සමවෘත්ත - අර්ධසමවෘත්ත - විෂමවෘත්ත - ආර්යා - මාත්‍රා**" යන මොවුන්ගේ වශයෙන් ෂට්ප්‍රත්‍යය විභාගය ඉතා සරල කොට දක්වනු ලැබේ. එය ඡන්දස්සාගරාවතීර්ණ වූ ආධුනිකයන්ට ස්වර්ණනෞකාවක් වේවා.

---

## ෂට්ප්‍රත්‍යයවිභාගය.

"**පතීයන්ති සඞ්ඛ්‍යාදිකාමෙතෙහීති පච්චයා**" යන නිරුක්ති වශයෙන් "මොවුන් කාරණ කොට ගෙන ඡන්දස්හුගේ වෘත්ත සඞ්ඛ්‍යාදිය දත්තාලැබේ නු'යි ප්‍රත්‍යයෝ නම් වෙති" ප්‍රස්තාරාදීහුයි. තවද "**පතීයන්ති එතෙහි අප්පතීතිතා විසෙසා සත්ථකාරාතිමත ඤාණාතිසයො'ති පච්චයා**" යී යුබැවින් "මොවුන් කරණ

කොට ගෙන ශාස්ත්‍රයෙහි ලක්‍ෂණ වශයෙන් නො පිහිටුවන ලද විශෙෂයෝ ද ඡන්‍දස් ශාස්ත්‍රකාර පිඞගලාදීන්ගේ ප්‍රඥාමහිමය ද වෙසෙසින් දන්නා ලැබෙත් නු'සි ප්‍රත්‍යය නම් වෙති. ප්‍රස්තාරාදිහු මැයි. මොවුහු "ප්‍රස්තාර, නෂ්ටනය, උද්දිෂ්ටවිධි, ගුරුක්‍රියා, සඞ්ඛ්‍යානා, අධ්වයොග" යයි සදෙනෙක් වෙත්.

**ෂට්ප්‍රත්‍යය හැඳින්වීම.** 1. ඡන්‍දසක වෘත්ත පැතිරවීමට ද ඇතිතාක් වෘත්ත යන්ගේ ගුරු - ලඝු වින්‍යාසය දැනගැනීමට ද උපකාර වන ප්‍රත්‍යය **"ප්‍රස්තාර"** නම් වේ.

2. ගුරු - ලඝු තො පෙනී ගිය වෘත්තයාගේ ගුරු - ලඝු වින්‍යාසය දැන ගැනීමට උපකාරවන ප්‍රත්‍යය **"නෂ්ටනය"** නම් වේ.

3. ගුරු - ලඝු වින්‍යාසය පෙනෙන යම් කිසි වෘත්තයක් ප්‍රස්තාරයෙහි කතමස්ථානයකින් උපදී ද? යි සොයා ගැනීමට උපකාර වන ප්‍රත්‍යය **"උද්දිෂ්ටවිධි"** නම් වේ.

4. ඒ ඒ ඡන්‍දසෙහි එකගුරුවෘත්ත විගුරුවෘත්ත ත්‍රිගුරුවෘත්ත ආදිය මෙතෙකැ'යි නිශ්චය කිරීමට උපකාරවන ප්‍රත්‍යය **"ගුරුක්‍රියා"** නම් වේ.

5. ඡන්‍දසක වෘත්ත සඞ්ඛ්‍යාව පහසුවෙන් දැන ගැනීමට උපකාරවන ප්‍රත්‍යය **"සඞ්ඛ්‍යාන"** නම් වේ.

6. ඡන්‍දසක් ප්‍රස්තාර කිරීමට උවමනා භූමිප්‍රදෙශයාගේ ප්‍රමාණය සොයා ගැනීමට උපකාරවන ප්‍රත්‍යය **"අධ්වයොග"** නම් වේ.

---

## 1. ප්‍රස්තාර ප්‍රත්‍යය.

1. **සමවෘත්ත ප්‍රස්තාරය.** සමවෘත්ත ප්‍රස්තාරය කෙසේ කටයුතු ද? යනු ගාථාවිවෘත්තියෙහි සාමාන්‍යයෙන් දක්වනලදී. මෙහිදී දතයුතු කරුණු කීපයකි. පළමු කොට ප්‍රස්තාර කළයුතු ඡන්‍දසෙහි සර්වගුරු වෘත්තය තබා ගතයුතු වෙයි. අනතුරුව 1. ආදියෙහි ගුරට යටින් ලඝුවක් ඇඳීම, 2. සෙස්ස මතු වෘත්තය හා සම කොට ලිවීම, 3. ඌනස්ථානය ගුරකින් පිරවීම, මේ ක්‍රම තුන නො වරදවා සර්වලඝු වෘත්තය ලැබෙන තෙක් ප්‍රස්තාර කටයුතුයි. "මධ්‍යා" නම් ත්‍ර්‍යක්‍ෂරච්ඡන්‍දස ප්‍රස්තාර කළයුතු කල්හි–

⏑ ⏑ ⏑ 1.
— ⏑ ⏑ 2.
(… — ⏑ 3)
⏑ — ⏑ 3.
— — ⏑ 4.
(… … — 5)
⏑ ⏑ — 5.
— ⏑ — 6.
(… — — 7)
⏑ — — 7.
— — — 8.

(ශුඩ ප්‍රස්තාරය.)

මේ එහි පළමු කොට තැබිය යුතු සර්වගුරු වෘත්ත යයි. මේ දෙවන වෘත්තය ගුරු යට ලුහු කොට සෙස්ස උඩ වෘත්තයට සම කොට ලියූ තැනයි. මෙහි උනුතැන් පිරවීමක් නැත. දැන් දෙවන වෘත්තයේ දෙවන ගුර යට ලඝුව ලියා සෙස්ස සම කළ යුතුයි. එවිට {— ⏑ ⏑ 2 / — ⏑ 3} ආදියෙහි ලඝුව යට ඌනස්ථානය පෙනේ. එය ගුරින් පිරූ කල තුන්වන වෘත්තය විය. දැන් ප්‍රස්තාරයෙහි යෙදෙන විධිතුන ම කරනලදි. එහෙත් සර්වලඝු වෘත්තය නො ලැබුන හෙයින් නැවතත් ඒ ත්‍රිවිධියෙන් ප්‍රස්තාර කළ යුතුයි. ගුරු යට ලුහු හා සෙස්ස සම කළ විට සතරවන වෘත්තය විය. පස්වන වෘත්තය සඳහා ගුරු යට ලුහු කළ විට සම කළ යුත්තක් නැති බව ද ඌනස්ථාන දෙකක් බව ද පෙනේ. (උනුතැන් සියල්ල ම ගුරුවලින් පිරවිය යුතුයි. එහෙත් සියලු ම ගුරු යට ලුහු නො කළ යුතුයි.)

⏑ ⏑ ⏑ 1.
— ⏑ ⏑ 2.
⏑ — ⏑ 3.
— — ⏑ 4.
⏑ ⏑ — 5.
— ⏑ — 6.
⏑ — — 7.
— — — 8.

ගුරු යට ලුහු ද, උනුතැන් පිරීම ද කිරීමෙන් පස්වන වෘත්තය විය. නැවතත් ගුරු යට ලුහු හා ශෙෂය සම කිරීමෙන් සවන වෘත්තය ලැබුනේය.

ගුරු යට ලුහු ද, සම කිරීම ද, උනුතැන් පිරීම ද, යන ත්‍රිවිධිය ම කළ විට සත්වන වෘත්තය විය.

ගුරු යට ලුහු හා සම කිරීමෙන් අටවන වෘත්තය ලැබුනේය. එය සර්වලඝු හෙයින් ප්‍රස්තාරය එයින් නවතී. එහි ගුරු යට ලඝු කළ යුත්තක් නැති හෙයිනි.

⏑ ⏑ ⏑ ⏑ 1
— ⏑ ⏑ ⏑ 2
⏑ — ⏑ ⏑ 3
— — ⏑ ⏑ 4
⏑ ⏑ — ⏑ 5
— ⏑ — ⏑ 6
⏑ — — ⏑ 7

"ප්‍රතිෂ්ඨා" නම් වූ චතුරක්ෂරච්ඡන්දසෙහි ප්‍රස්තාරය ද මෙහි දක්වනු ලැබේ. දක් වූ ක්‍රමානුසාරයෙන් ම එකාක්ෂරච්ඡන්දසෙහි පටන් ෂඩ්විංශාක්ෂරච්ඡන්දස දක්වා සමවෘත්තයන්ගේ ප්‍රස්තාරය කළ යුතුයි.

— — — ⏑ 8
⏑ ⏑ ⏑ — 9
— ⏑ ⏑ —10
⏑ — ⏑ —11
— — ⏑ —12
⏑ ⏑ — —13
— ⏑ — —14
⏑ — — —15
— — — —16

එළුසඳස්හි–

"ගුරු යට ලුහු කැරු– පෙරසේ ම සෙස් අඳනේ
ගුරින් පුරා උනුහැන්– සව්ලුහුවිරිත් උපයා"යි

දක්වන ලද්දේත් මේ සමවෘත්ත ප්‍රස්තාරය මැයි. ප්‍රස්තාර සූත්‍ර වශයෙන් මෙය භාවිතා කිරීම සුකර සේ ද පෙනේ.

2. **අර්ධ සමවෘත්ත ප්‍රස්තාරය.** අර්ධ සමවෘත්තයන්ගේ ප්‍රස්තාරයෙහි දී වෘත්තයාගේ අර්ධයක් ම පාදයක් වශයෙන් සැලකිය යුතුයි. (සමවෘත්ත ප්‍රස්තාරයෙහි මුලට තබා ගත් සර්වගුරු වෘත්තය ඒ වෘත්තයාගේ එක් පාදයකි.) මෙහි සර්වගුරු වෘත්තයෙන් පාද දෙකක් තබා ගැනීම සමවෘත්තයට වඩා වෙනසයි.

එකාක්ෂරච්ඡන්දසෙහි අර්ධසම ප්‍රස්තාරය කළයුතු නම්? එහි සර්වගුරු වෘත්තයාගේ අර්ධයක් "⏑ , ⏑" මෙසේ තබා ගෙන සම වෘත්ත ද්‍ව්‍යක්ෂරච්ඡන්දස මෙන් ප්‍රස්තාර කළ යුතුයි. එසේ ම ද්‍ව්‍යක්ෂර අර්ධසම ප්‍රස්තාරය කරන විට සමවෘත්ත චතුරක්ෂරච්ඡන්දස මෙන් ද ත්‍ර්‍යක්ෂර අර්ධසම ප්‍රස්තාරය සමවෘත්ත ෂඩක්ෂරච්ඡන්දස මෙන් ද කළ යුතුයි, සෙස්සෙහි දු මෙසේ මැයි.

ද්‍ව්‍යක්ෂරච්ඡන්දසෙහි අර්ධසම ප්‍රස්තාරය කළ යුතු වී නම්; "⏑ ⏑, ⏑ ⏑" මෙසේ සර්වගුරු වෘත්තය තබාගත පළමු දැක්වූ සමවෘත්ත චතුරක්ෂරච්ඡන්දස මෙන් ප්‍රස්තාර කළයුතුයි. මෙහි දී අර්ධයක් ම පාදයක් වශයෙන් ගත්හෙයින් වෘත්තසඞ්ඛ්‍යාව වැඩි වෙයි. ද්‍ව්‍යක්ෂරච්ඡන්දසෙහි සමප්‍රස්තාරයෙහි වෘත්ත සතර (4) කි, අර්ධසම ප්‍රස්තාරයෙහි වෘත්ත සොළොස (16) කි. යම් ඡන්දසක අර්ධසමප්‍රස්තාරය කළ විට ඒ ඡන්දසෙහි සමවෘත්ත ද ඒ ප්‍රස්තාරය තුළ ම ලැබේ. එහෙයින් වෘත්ත 16 ක් ඇති ද්‍ව්‍යක්ෂර අර්ධසම ප්‍රස්තාරයෙහි ශුද්ධසම වෘත්ත සතරකි. එය හළ විට ශුද්ධ අර්ධසමවෘත්ත දොළොස (12) කි. එහි 1. වෙනි වෘත්තය වූ "⏑ ⏑ , ⏑ ⏑" යන්න අර්ධයකි. ඉතිරි අර්ධයත් එසේ ම සිටින හෙයින් එය සමවෘත්ත ප්‍රස්තාරයෙහි ද 1 වෙනි වෘත්තයයි. 6. වෙනි වෘත්තය වූ "— ⏑ , — ⏑" යන්න සම ප්‍රස්තාරයෙහි 2. වෙනි වෘත්තයයි, 11. වෙනි වෘත්තය වූ "⏑ — , ⏑ —" යන්න සම ප්‍රස්තාරයෙහි 3. වෙනි වෘත්ත යයි. 16. වෙනි වෘත්තය වූ "— — , — —" යන්න සමවෘත්ත ප්‍රස්තාරයෙහි 4 වෙනි වෘත්තයයි. සෙසු ඡන්දස්වල ද මෙසේ මැයි. මෙහි ලා ශිෂ්‍යයන්ගේ අසන්දේහාවබෝධය පිණිස කාරුණු ස්වල්පයක් දක්වනු ලැබේ.

“උක්තං”දී යම් කිසි ඡන්දසක සමවෘත්ත සඞ්ඛ්‍යාව ගෙන (මතු “සඞ්ඛ්‍යාන” ප්‍රත්‍යය බලනු.) ඒ සඞ්ඛ්‍යාවෙන් ම වැඩිකළ විට ඒ ඡන්දසෙහි අඩ්ඪසම ප්‍රස්තාරයෙන් ලැබෙන වෘත්ත සඞ්ඛ්‍යාව වේ. (ව්‍යක්ෂරච්ඡන්දසෙහි සමවෘත්ත 4 කි. එය එම සඞ්ඛ්‍යාවෙන් ගුණ කළ විට (4 × 4=16) අඩ්ඪසම ප්‍රස්තාරයෙහි වෘත්තසඞ්ඛ්‍යාව ලැබේ.) එයින් සමවෘත්ත අඩුකළ විට ශුද්ධ වූ අඩ්ඪසමවෘත්ත සඞ්ඛ්‍යාව වේ. **අඩ්ඪසමප්‍රස්තාරය තුළ කතමස්ථානයක සමවෘත්ත ලැබේ ද?** යි සෙවිය යුතු විට ඒ ඡන්දසෙහි සමවෘත්ත ගණන එකක් එකතු කොට ගෙන මුලින් ලැබෙන සමවෘත්තයාගේ අඞ්කයට එකතු කරනු. එවිට දෙවෙනි සමවෘත්තය සිටි අඞ්කය ලැබේ. ඒ අඞ්කයට නැවතත් එකක් සහිත වූ සමවෘත්ත ගණන එකතු කරනු. එවිට තුන්වන සමවෘත්තය සිටි අඞ්කය ලැබේ. මෙසේ ඒ ඒ සමවෘත්තය සිටි අඞ්කයට එකක් සහිත සමවෘත්ත සඞ්ඛ්‍යාව එකතු කිරීමෙන් එහි ඇතිතාක් සමවෘත්තයන් උද්ධරණය කළ හැකි වේ. මේ නිදසුනකි-

ව්‍යක්ෂරච්ඡන්දසෙහි අඩ්ඪසමප්‍රස්තාරය තුළ සමවෘත්ත සෙවිය යුතු නම්? ඒ ඡන්දසෙහි සමවෘත්ත ගණන (=4) ට එකක් එකතු කළ විට 5 ක් වේ. (මේ එකක් සහිත සමවෘත්ත සඞ්ඛ්‍යාවයි.) ප්‍රස්තාරයෙහි මුලින් තබාගත් “⏑ ⏑ , ⏑ ⏑” යන ප්‍රථමාඞ්කයට පැමිණි සර්වගුරු වෘත්තය පළමුවන සමවෘත්තය ද වේ. දෙවන සමවෘත්තය සෙවීමට එකක් සහිත සමවෘත්ත සඞ්ඛ්‍යාව වූ පස (=5) එකාඞ්කයට එකතු කරනු. එවිට (1 + 5=6) සයක් වේ. ඒ දෙවෙනි සමවෘත්තය සිටි අඞ්කයයි. (මුලින් දැක්වූ ප්‍රස්තාරය බලනු.) ඊට නැවතත් පස එක්කරනු. එවිට (6 + 5=11) එකොළසක් වේ. ඒ තුන්වන සමවෘත්තය සිටි අඞ්ක යයි. ඒ එකොළසට ද නැවත පස එක්කරනු. එවිට (11 + 5=16) සොළොසක් වේ. ඒ සතරවන සමවෘත්තයේ අඞ්කයයි. මෙසේ අඩ්ඪසම ප්‍රස්තාරයෙහි වෘත්ත දහසයෙන් සමවෘත්ත සතර වෙන්කර ගත හැකිවූ බව ප්‍රකට ව පෙනේ. මීට තව නිදසුනක් මෙසේයි.

1 ත්‍ර්‍යක්ෂරච්ඡන්දසෙහි සමවෘත්ත ප්‍රස්තාරයෙහි වෘත්ත කොතෙක්ද?

2. „ „ අඩ්ඪසමප්‍රස්තාරයෙහි වෘත්ත කොතෙක් ද?

3. ප්‍රස්තාරයෙහි කතමස්ථානවලින් සමවෘත්ත ලැබෙත් ද?

4. එහි ශුද්ධඅඩ්ඪසමවෘත්ත කොතෙක් ද? යන මෙහි ලා-

… ත්‍ර්‍යක්ෂරච්ඡන්දසෙහි සම වෘත්ත 8 කි. (මෙය සඞ්ඛ්‍යාන යෙන් ලැබුනේය.)

2. අර්ධසමවෘත්ත 64 කි. සමවෘත්ත සඞ්ඛ්‍යාව වූ "8" එම ගණනින් වැඩි කළ විට (8 × 8=64) මේ සඞ්ඛ්‍යාව ලැබුනේය.

3. ප්‍රස්තාරයෙහි මුලින් සිටි සර්වගුරු වෘත්තය ප්‍රථම සම වෘත්තයයි.

| | | |
|---|---|---|
| ප්‍රථම සමවෘත්තය. | | 1 + 9 = 10. |
| | | 9 |
| ද්විතීය | ,, | 10 + 9 = 19. |
| | | 9 |
| තෘතීය | ,, | 19 + 9 = 28. |
| | | 9 |
| චතුර්ථ | ,, | 28 + 9 = 37. |
| | | 9 |
| පඤ්චම | ,, | 37 + 9 = 46. |
| | | 9 |
| ෂෂ්ඨ | ,, | 46 + 9 = 55. |
| | | 9 |
| සප්තම | ,, | 55 + 9 = 64. |
| | | 9 |
| අෂ්ටම | ,, | 64 |

එහෙයින් ඒ පළමුවැන්නෙහි පටන් සමවෘත්ත "8" එකක් සම ග එකතු කිරීමෙන් පිළිවෙළින් 1. 10. 19. 28. 37. 46. 55. 64. යන සඞ්ඛ්‍යා ස්ථානයන්හි ලැබෙන්නාහු සම වෘත්තයෝයි.

4. සමවෘත්ත "8" ප්‍රස්තාරයෙහි වෘත්තසඞ්ඛ්‍යාවෙන් "64" අඩුකළ විට ශුද්ධ අර්ධ සමවෘත්ත 56 කි.

සෙසු ඡන්දස්වල ද මේ ක්‍රම යෙන් ප්‍රස්තාරයෙහි ලැබෙන ශුද්ධ සම වෘත්ත සොයා හළ යුතුයි. එවිට ශුද්ධ වූ අර්ධ සම ප්‍රස්තාරය ලැබේ. එහෙත් වෘත්ත සඞ්ඛ්‍යා ගිණීමේ දී හරිනලද සමවෘත්ත යන් සමග ම ගිණිය යුතුයි. නැතහොත් නෂ්ටොද්දිෂ්ටයන් සෙවීම නො හැකි හෙයිනි.

අර්ධසම ප්‍රස්තාරයෙන් සමවෘත්තයන් උද්ධරණය කිරීම පිණිස තවත් ක්‍රමයක් දක්වනු ලැබේ.

ඒ ඒ ඡන්දසට අයිති අර්ධසමවෘත්ත සඞ්ඛ්‍යාවෙහි සමවෘත්ත සඞ්ඛ්‍යාවට එකක් එකතු කොට සොයා ගතයුතු සමවෘත්තයෙ සඞ්ඛ්‍යාවට එකක් අඩුවූ ගණනින් වැඩි කළ යුතුය, වැඩි කිරීමෙන් ලැබුන සඞ්ඛ්‍යාවට එකක් එකතු කළ විට සමවෘත්තය සොයා ගත හැක් වේ.

අකුරු දෙකක් ඇති ඡන්දසෙහි තුන්වන සමවෘත්තය අර්ධසම ප්‍රස්තාරයේ කතමස්ථානයෙහි තිබේ ද? යන ප්‍රශ්නයෙහි–

ද්‍ව්‍යක්ෂරච්ඡන්දසෙහි සමවෘත්ත 4 කි. ඊට එකක් එකතු කළ විට 5 ක් වේ. සෙවිය යුත්තේ 3 වෙනි සමවෘත්තය ලැබෙන ස්ථාන යයි. ඒ සඞ්ඛ්‍යාව (3) ට එකක් අඩු වූ ගණන දෙකයි, මෙය එකක් සහිත සමවෘත්ත ගණනින් වැඩි කොට එකක් එකතු කළ කල්හි එකොළොසක් වේ. (5 × 2=10 + 1=11) මෙය ද්‍ව්‍යක්ෂරච්ඡන්දසෙහි අර්ධසම ප්‍රස්තාරය තුල එම ඡන්දසෙහි තුන්වන සමවෘත්තය ලැබෙන ස්ථානයයි. සෙස්ස ද මේ නයින් ම සැලකිය යුතුයි.

3. **විෂමවෘත්ත ප්‍රස්තාරය.** විෂමවෘත්ත ප්‍රස්තාරයෙහි දී වෘත්තයාගේ පාද සතර ම එක් පාදයක් මෙන් ගෙන සර්වගුරු වෘත්තය මුලට තබා පළමු සමවෘත්ත ප්‍රස්තාරයට කී පරිද්දෙන් ම ප්‍රස්තාර කටයුතුයි.

ඒකාක්ෂරච්ඡන්දසෙහි විෂමවෘත්ත ප්‍රස්තාරය කළ යුතු නම්? එහි සර්වගුරු වෘත්තයෙහි පාදසතර ම "◡, ◡, ◡; ◡" මෙසේ තබා ගෙන සමවෘත්ත චතුරක්ෂරච්ඡන්දස හෝ අර්ධසම ද්ව්‍යක්ෂරච්ඡන්දස මෙන් ප්‍රස්තාර කළයුතුයි. සෙසු ඡන්දස් ගැන ද මෙසේ මැයි.

ද්ව්‍යක්ෂරච්ඡන්දසෙහි විෂමවෘත්ත ප්‍රස්තාරය කළයුතු වී නම්? "◡◡, ◡◡, ◡◡, ◡◡" මෙසේ සර්වගුරු වෘත්තයෙහි පාද සතර ම මුලට තබා සමවෘත්ත අෂ්ටාක්ෂරච්ඡන්දස මෙන් ප්‍රස්තාර කළයුතුයි. මේ ක්‍රමයෙන් ප්‍රස්තාර කළ කල්හි ද්ව්‍යක්ෂරවිෂමප්‍රස්තාරයට වෘත්ත "256"ක් ලැබේ. ප්‍රස්තාර කොට බැලිය යුතුයි. ද්ව්‍යක්ෂර සමවෘත්ත ප්‍රස්තාරයෙහි වෘත්ත "4" ක් හා අර්ධසම ප්‍රස්තාරයෙහි වෘත්ත "16" ක් ලැබෙන බව ද, එයින් ශුද්ධ අර්ධසමවෘත්ත "12" ක් බව ද පළමු කියනලදී. ඒ සමවෘත්ත සතර ද අර්ධසමවෘත්ත දොළොස ද යන වෘත්ත සොළොස විෂම ප්‍රස්තාරයෙහි ලැබුනු වෘත්ත දෙසියසපනසින් අස් කළ කල්හි (256–16=240) ශුද්ධ විෂමවෘත්ත දෙසියසතළිසකි. අනිත් ඡන්දස්වල ද විෂමවෘත්ත ප්‍රස්තාරය කළ කල්හි ඒ ප්‍රස්තාරය තුළ තිබෙන සම - අර්ධසමවෘත්ත අස් කොට ප්‍රස්තාරය ශුද්ධ කරගත යුතුයි, එහෙත් වෘත්තසඞ්ඛ්‍යා ගිණීමෙහි දී අස් කළ වෘත්ත ද ගතයුතුයි. නෂ්ටෝද්දිෂ්ටයන් සෙවීම පිණිසයි.

විෂමවෘත්ත ප්‍රස්තාරය තුළ **කතමස්ථානවල සම – අර්ධසම වෘත්ත ලැබෙත් ද?** යන ප්‍රශ්නයෙහි ලා– ඡන්දසක ලැබෙන සම වෘත්ත සඞ්ඛ්‍යාව ඒ ගණනින් ම වැඩිකළ විට ඒ ඡන්දසෙහි අර්ධසම වෘත්ත සඞ්ඛ්‍යාව ලැබෙන බව කියනලදී. එසේ ම අර්ධසම වෘත්ත සඞ්ඛ්‍යාව ඒ සඞ්ඛ්‍යාවෙන් ම වැඩිකළ විට එහි විෂමවෘත්ත සඞ්ඛ්‍යාව ලැබේ (ද්ව්‍යක්ෂරච්ඡන්දසෙහි සමවෘත්ත 4 × 4=16 අර්ධ සමවෘත්ත 16 × 16=256, විෂම වෘත්තයි.) හැම ප්‍රස්තාරයක ම ප්‍රථම වෘත්තය සර්වගුරු හෙයින් එය සමවෘත්තයක් වේ. කී පරිද්දෙන් අභිමත වූ ඡන්දසට අයිති අර්ධසමවෘත්ත සොයා ඊට එකක් එකතු කොට එය ප්‍රථමාඞ්කයට එකතු කරනු, එවිට අර්ධසම ප්‍රස්තාරයෙහි දෙවෙනි වෘත්තය ලැබේ. මෙසේ අර්ධසමවෘත්ත අවස්ථාවෙහි කී නයින් එකක් සහිත අර්ධසමවෘත්ත සඞ්ඛ්‍යාව මුල පටන් එකතු කළ කල්හි විෂම ප්‍රස්තාරය තුළ තිබෙන සම– අර්ධසම වෘත්තයන් උද්ධරණය කළ හැකි වේ.

ද්ව්‍යක්ෂර විෂමප්‍රස්තාරයෙහි සම- අඩිසමවෘත්ත සෙවිය යුතු කල්හි- එහි අඩිසමවෘත්ත සංඛ්‍යාව වූ 16 ට එකක් එකතු කොට (16 + 1=17) එය ප්‍රථමාංකයට එක් කළ විට 18 කි. එය අඩිසම ප්‍රස්තාරයෙහි දෙවන වෘත්තයයි. මෙය වෘත්ත වින්‍යාසය සමග පිළිවෙළින් දක්වනු ලැබේ.

1. ◡◡, ◡◡, ◡◡, ◡◡, (1) මෙය **ප්‍රථම සමවෘත්ත යාගේ ඡංද සකාරයයි.**

1 + 17= 18. —◡, ◡◡, —◡, ◡◡, (2) මෙය ප්‍රථම අඩි සමවෘත්තයාගේ උභයාඩියයි.

18 + 17= 35. ◡—, ◡◡, ◡—, ◡◡, (3) දෙවන අඩිසම වෘත්තය.

35 + 17= 52. ——, ◡◡, ——, ◡◡, (4) තුන්වන අඩි සමවෘත්තය.

52 + 17= 69. ◡◡, —◡, ◡◡, —◡, (5) සතරවන අඩි සමවෘත්තය.

69 + 17— 86. —◡, —◡, —◡, —◡, (6) මෙය **දෙවන සමවෘත්තයයි.**

86 + 17=103. ◡—, —◡, ◡—, —◡, (7) පස්වන අඩි සමවෘත්තය.

103 + 17=120. ——, —◡, ——, —◡; (8) සවන අඩි සමවෘත්තය.

120 + 17=137. ◡◡, ◡—, ◡◡, ◡—, (9) සත්වන අඩි සමවෘත්තය.

137 + 17=154. —◡, ◡—, —◡, ◡—, (10) අටවැනි අඩි සමවෘත්තය.

154 + 17=171. ◡—, ◡—, ◡—, ◡—, (11) මෙය **තුන් වන සමවෘත්තයයි.**

171 + 17=188. ——, ◡—, ——, ◡—, (12) නවවැනි අඩි සමවෘත්තය.

188 + 17=205. ◡◡, ——, ◡◡, ——, (13) දසවන අඩි සමවෘත්තය.

205 + 17=222. —◡, ——, —◡, ——, (14) එකොළොස් වන අඩිසමවෘත්තය.

222 + 17=239. ◡—, ——, ◡—, ——, (15) දොළොස්වන අඩිසමවෘත්තය.

239 + 17=256. ——, ——, ——, ——, (16) මෙය **සිවුවන සමවෘත්තයයි.**

මෙසේ කවර ඡන්දසක වුවත් එකක් සහිත අර්ධසමවෘත්ත සංඛ්‍යාව ප්‍රථමාඞ්කයේ පටන් එකතු කළ විට විෂමවෘත්ත ප්‍රස්තාරයෙන් සම- අර්ධසමවෘත්ත උද්ධරණය කළ හැකි වෙත්.

එහෙත් සමවෘත්තය පමණක් සොයා ගතයුතු වී නම්? අර්ධසම ප්‍රස්තාරයෙහි පසුව කී ක්‍රමය ඇසුරු කළ යුතු වේ.

පාදයකට අකුරු දෙකක් ඇති "අත්‍යුක්තා" ඡන්දසෙහි විෂම ප්‍රස්තාරය තුල තුන්වන සමවෘත්තය කතමස්ථානයෙහි තිබේ ද? යන ප්‍රශ්නයෙහි-

අර්ධසම ප්‍රස්තාරයාගේ එකාදශස්ථානයෙහි තුන්වන සමවෘත්තය ලැබේ. එයින් එකක් අඩු කළ විට (11—1=10) දසයකි. එකක් සහිත අර්ධසමවෘත්ත සඞ්ඛ්‍යාව එයින් ගුණ කළ විට (17 × 10=170) එකසියසැත්තෑවකි. ඊට නැවත එකක් එක් කළ විට "171" වැන්න තුන්වන සමවෘත්තය බැව් පෙනේ.

---

**4. ආර්‍ය්‍යා ප්‍රස්තාරය.** ආර්‍ය්‍යාජාතීන්ගේ ප්‍රස්තාරයෙහි ද උභයාර්ධය ම එක් පාදයක් මෙන් සලකා පළමු කොට සර්වගුරු වෘත්තය තබා ගත යුතුයි. පළමු දැක්වූ වර්ණච්ඡන්දස් පිළිබඳ ප්‍රස්තාරවල දී "ගුරු යට ලුහු" කරන ලද්දේ වර්ණයක් පාසා ගුරු - ලඝුන්ගේ වශයෙන් භෙද දෙක දෙක ලැබෙන හෙයිනි ආර්‍ය්‍යාවන්ගේ චතුර්ලඝූපෙත ගණයක් පාසා භෙද ලැබෙනබැව් යට කියන ලදී. එහෙයින් මෙහි දී ඒ ඒ ගණස්ථානයෙහි ලැබෙන ගණවිකල්ප පිළිවෙළින් යොදමින් ප්‍රස්තාරකළ යුත්තේය.

ආර්‍ය්‍යාප්‍රස්තාරයෙහි මුලට යෙදියයුතු වෘත්තය මෙසේයි.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | |
|---|---|---|---|---|---|---|---|---|
| ⏑⏑, | ⏑⏑, | ⏑⏑, | ⏑⏑, | ⏑⏑, | —⏑—, | ⏑⏑, | ⏑ | (පූර්වාර්ධය) |

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | |
|---|---|---|---|---|---|---|---|---|
| ⏑⏑, | ⏑⏑, | ⏑⏑, | ⏑⏑; | ⏑⏑, | —, | ⏑⏑, | ⏑ | (අපරාර්ධය) |

මෙහි පූර්වාර්ධ ෂෂ්ඨස්ථානයෙහි සර්වගුරු ගණය නො යෙදෙන හෙයින් එහි යෙදෙන භෙද දෙකින් ප්‍රථම භෙදය වූ මධ්‍යගුරු ගණය ද, අපරාර්ධ ෂෂ්ඨස්ථානය නිත්‍යලඝුවක් හෙයින් එය ද යෙදූ බැව් සැලකිය යුතුයි. මෙසේ සිටි ප්‍රථමවෘත්තයේ පටන් ඒ ඒ ස්ථානවල ගණවිකල්ප යොදමින් ප්‍රස්තාර කරන අයුරු මදක් දුර දක්වනු ලැබේ.

| | 1 | 2 | |
|---|---|---|---|
| (1) | ⏑⏑ | ⏑⏑ | අඩිදෙක්හි ම සෙසු සථාන ද සුදුසු සේ යොදනු සෙස්ස පෙරසේ මැයි. |
| 2 | – – ⏑ | ⏑⏑ | |
| 3 | ⏑ – – | ⏑⏑ | ,, ,, |
| 4 | – – – – | ⏑⏑ | ,, ,, |
| 5 | ⏑⏑ – | – ⏑ | ,, ,, |
| 6 | ⏑⏑ – | – ⏑ | ,, ,, |
| 7 | ⏑⏑ ⏑ | – – | ,, ,, |
| 8 | ⏑⏑ – – | – – | ,, ,, |

මෙහි දෙවන පෙළේ ප්‍රථම ගණස්ථානය යට දෙවැනි වූ සගණය යොදා සෙස්ස සම කරනලදී. තුන්වන පෙළේ විෂම වූ ප්‍රථම ස්ථානයෙහි ජගණය නො යෙදෙන හෙයින් සතරවන ගණය වූ භගණය ද, සතරවන පෙළේ පඤ්චමගණය වූ නගණය ද යොදා සෙස්ස සම කරනලදී. පස්වන පෙළේ පටන් දෙවෙනි ගණස්ථානය යට පිළිවෙළින් අන්තගුරු මධ්‍යගුරු ආදිගුරු සර්වලඝු ගණ යොදා සෙස්ස සම කොට ඌන වූ ප්‍රථම ගණස්ථානය යට සර්වගුරු ගණය යොදනලදී.

මේ ක්‍රමයෙන් ප්‍රස්තාර කළ විට ආර්‍ය්‍යාවිකල්ප 8,19,20,000 ක් ලැබේ. පථ්‍යා - විපුලා - චපලා වශයෙන් භෙද වූ ආර්‍ය්‍යා සොළොස ම මේ ප්‍රස්තාරය තුළ ලැබේ. අවසානයෙහි ලැබෙන සර්වගුරු වෘත්තයෙහි පවා අන්ත්‍යගුරු නිත්‍ය හෙයින් උභයාර්ධයාගේ ම අවසානයෙහි ලඝුවක් නො ලැබේ.

ගීතිජාතීන්ගේ ප්‍රස්තාරක්‍රමය ද මෙසේ මැයි. ඒ ඒ ගීතීන්ගේ වශයෙන් වෘත්තසංඛ්‍යා අඩුවැඩිවීම පමණක් වෙනසයි.

---

5\. **මාත්‍රා ප්‍රස්තාරය.** මාත්‍රා ප්‍රස්තාරයෙහි ද සර්වගුරු වෘත්තය මූලට තබා වර්ණ ප්‍රස්තාරයෙහි සෙයින් (1) ගුරු යට ලුහු කිරීම, (2) සෙස්ස සම කිරීම, (3) උනුතැන් ගුරින් පිරීම, යන ත්‍රිවිධියෙන් ප්‍රස්තාර කළ යුතුයි. මාත්‍රා අවස්ථාව හෙයින් උනුතැන් පිරීමේදී මාත්‍රා සම කිරීම පමණක් මෙහි වෙනසයි.

එය එළුසඳස්හි-

"මත්පිරිහුනු විරිතැ- දූතෙතැන් මතෝනැ අතින්
මත්වැඩිවිරිත් දුට- එහි මැ එ මැ මත සමනාවූ" යි.

ප්‍රස්තාරයෙහි උනුතැන් පිරූ කල ඡන්දසෙහි මාත්‍රාගණන නො පිරේ නම්? අමුතුවෙන් මාත්‍රාවක් ලියා සම්පූර්ණ කිරීම ද මාත්‍රා අධික වී නම්? අඩු කිරීම ද මෙයින් උගන්වනලදී.

චතුර්මාත්‍රිකච්ඡන්දස ප්‍රස්තාර කරන විට මාත්‍රා සතරක් ඇති විගුරු වෘත්තය මූලට තබා මෙසේ ප්‍රස්තාර කළ යුතුයි.

◡ ◡ 1.
(— ◡ 2)
— — ◡ 2.
(◡ ◡ — 3)
— ◡ — 3.
◡ — — 4.
(— — — 5)
— — — — 5.

(ශුද්ධ ප්‍රස්තාරය)
◡ ◡ 1.
— — ◡ 2.
— ◡ — 3.
◡ — — 4.
— — — — 5.

පළමුවැන්න මාත්‍රා සතරක් ඇති විගුරු වෘත්ත යයි. දෙවන වෘත්තය සඳහා "ගුරු යට ලුහු කර" සෙස්ස සමකළ විට — ◡ මෙසේ සිටී, මෙහි මාත්‍රා තුනක් හෙයින් එකක් පිරිහී ගියබව පෙනේ, ඊට අතින් මාත්‍රාවක් හෙලා — — ◡ මෙසේ ගත් විට දෙවෙනි වෘත්තය ලැබේ. තුන්වන වෘත්තය සඳහා "ගුරු යට ලුහු සාර උනුතැන් ගුරින් පිරූ විට ◡ ◡ — මෙසේ සිටී. "මත්වැඩි විරිත" යයි කිවේ මෙබඳු තැනයි, මාත්‍රා පහක් හෙයිනි. මූල ගුර ලඝුවක් කිරීමෙන් වැඩිවූ මාත්‍රාව අස්කළ විට — ◡ — මෙසේ තුන්වන වෘත්තය ලැබේ. සතරවැන්නෙහි "ගුරුයට ලුහු" ආදි ත්‍රිවිධිය කළ විට ◡ — — මෙසේ සතරවන වෘත්තය ලැබේ. මෙහි මාත්‍රා සතරක් ම ඇති හෙයින් අඩු - වැඩි කිරීමක් නො මැනියි. පස්වැන්නෙහි ගුරු යට ලුහු හා සෙස්ස සම කළ විට — — — මෙසේ සිටී, මෙහි මාත්‍රාවක් අඩු වූ හෙයින් වැඩිපුර මාත්‍රාවක් ලියූ කල්හි පස්වන වෘත්තය — — — — මෙසේ ලැබේ. එය සම්ලඝු හෙයින් ප්‍රස්තාරය මෙසින් නවති.

ත්‍රිමාත්‍රික - පඤ්චමාත්‍රික - සප්තමාත්‍රිකාදි විෂමමාත්‍රා සඞ්ඛ්‍යා ඇති ඡන්දස්වල සම්ගුරු වෘත්තයක් නො ලැබේ. ඔවුන්ගේ ප්‍රස්තාරයෙහි පළමු කොට තැබිය යුත්තේ "— ◡ ◡" මෙබඳු වූ ආදි ලඝු වෘත්තයකි.

තවත් ඡන්දස් දෙකක ප්‍රස්තාරය මෙසේයි-

පඤ්චමාත්‍රික

— ◡ ◡ 1.
◡ — ◡ 2.
— — — ◡ 3.
◡ ◡ — 4.
— — ◡ — 5.
— ◡ — — 6.
◡ — — — 7.
— — — — — 8.

ෂ ණ් මා ත්‍රි කා.

| | | | |
|---|---|---|---|
| ⏑ ⏑ ⏑ | 1. | — — — ⏑ — | 8. |
| — — ⏑ ⏑ | 2. | ⏑ ⏑ — — | 9. |
| — ⏑ — ⏑ | 3. | — — ⏑ — — | 10. |
| ⏑ — — ⏑ | 4. | — ⏑ — — — | 11. |
| — — — — ⏑ | 5. | ⏑ — — — — | 12. |
| — ⏑ ⏑ — | 6. | — — — — — — | 13. |
| ⏑ — ⏑ — | 7. | | |

සෙසු ඡන්දස් ද නැවත නැවත ප්‍රස්තාර කරමින් ප්‍රගුණ කළ යුතුයි.

**ප්‍රස්තාර ප්‍රත්‍යය මෙතෙකින් සමාප්තයි.**

---

## 2. නෂ්ටප්‍රත්‍යය.

6 **සමවෘත්ත නෂ්ටය.** ගුරු - ලඝු නො පෙනී ගිය වෘත්තයාගේ ගුරු - ලඝු වින්‍යාසය සොයා ගැනීම ද, ප්‍රස්තාර යාගේ ශුද්ධා'ශුද්ධත්වය විමසීම ද, "නෂ්ටප්‍රත්‍යයාගේ" ප්‍රයොජනයයි. මෙනම් ඡන්දස්හුගේ හෝ මෙපමණ අකුරු ඇති ඡන්දස්හුගේ, මෙනම් සඞ්ඛ්‍යාව ඇති වෘත්තයාගේ ගුරු - ලඝු වින්‍යාසය කෙසේද? යි විචාළ කල්හි-

ඒ නෂ්ට (= ගුරු - ලඝු නො පෙනීගිය) වෘත්තයාගේ සඞ්ඛ්‍යාව අඩකළ (= දෙකින් බෙදිය) යුතුයි. දෙකින් බෙදිය නො හැකි තුන - පහ - සත - නවය ආදි විෂම සඞ්ඛ්‍යාවක් වුව හොත් එකක් එක් කොට දෙකින් බෙදිය යුතුයි. **සමසඞ්ඛ්‍යාව බෙදූ තැන** ලඝු "—" රේඛාවක් ද, එකක් එක් කොට **විෂමසඞ්ඛ්‍යාව බෙදූ තැන** ගුරු "⏑" රේඛාවක් ද, ලියා ගත යුතුයි. දෙකින් බෙදූ ලත් ඵලය නැවත ද සම වුව හොත් දෙකින් බෙදූ ලඝුවක් ද, විෂම වුව හොත් එකක් එක් කොට බෙදූ ගුරක් ද, ලියා ගතයුතුයි මෙසේ ඡන්දසෙහි අකුරු පමණින් සුදුසු අයුරු දෙකින් බෙදමින් ගුරු - ලඝු සටහන් කරගත් විට නෂ්ට වෘත්තයාගේ වින්‍යාසය පෙනේ.

**ප්‍රතිෂ්ඨා (= චතුරක්ෂර) ඡන්දසෙහි දසවැනි වෘත්තයාගේ ගුරු - ලඝු කෙසේ දැ? යි විචාළ හොත්- දසය සම සඞ්ඛ්‍යාවක් හෙයින් දෙකින් බෙදූ ලඝුවක් ලියනු.**

2 |10 ÷ 2
5 = — 1.
1
2 |6 ÷ 2
3 = ⌣ 2.
1
2| 4 ÷ 2
2 |2 = ⌣ 3.
1 = — 4.

දසය බෙදා ලත් ඵලය (5) විෂම හෙයින් එකක් එක් කොට දෙකින් බෙදා **ගුරක්** ලියනු. එහි ඵලය වූ තුන ද විෂම හෙයින් එකක් එක් කොට බෙදා **ගුරක්** ලියනු. එහි ඵලය වූ දෙක සම වූ හෙයින් දෙකින් බෙදා **ලඝුවක්** ලියනු. දැන් සතරවාරයක් බෙදූහෙයින් ඡන්දස සම්පූර්ණ විය. නැවත සෙවීමකුදු නැති. නෂ්ටවෘත්තය '— ⌣ ⌣ —' මෙසේ සිටී. පළමු දක්වූ ප්‍රස්තාරය බලනු.

ජගතිඡන්දසෙහි 1382 වෙනි වෘත්තයාගේ ගුරු - ලඝු වින්‍යාසය කෙසේ ද? යන ප්‍රශ්නයෙහි—

2 |1382 ÷ 2
691 = — 1.
1
2 |692
2 |346 = ⌣ 2.
173 = — 3.
1
2 |174
87 = ⌣ 4.
1
|88
44 = ⌣ 5.

2 |44
2 |22 = — 6.
11 = — 7.
1
2 |12
2 |6 = ⌣ 8.
3 = ⌣ 9.
1
2 |4 = ⌣ 10.
2 |2
1 = — 11.
1
2 |2
1 = ⌣ 12.

"1 2 3 4 5 6
— ⌣ — ⌣ ⌣ —
7 8 9 10 11 12
— ⌣ — ⌣ — ⌣"

මේ විචාල වෘත්තයාගේ වින්‍යාසයයි.

(වංශස්ථ වෘත්තය බලනු)

මේ දක්වන ලද්දේ පුරාණ පටන් ආචාර්‍ය්‍යාන්ඛයෙහි ආ නෂ්ටය සෙවීමේ ක්‍රම යයි. **ශිෂ්‍යයන්ගේ අවබොධයට ඉතා පහසු වූ** අනිත් ක්‍රමයකුදු මෙහි දක්වනු ලැබේ.

**"නඪස්ස'ඞ්ක භාජෙ තබ්බෙ- සමෙ ලො විසමෙ ගුරු**
**සෙසො එලෙන යොජෙතබ්බා - භාරෙයෙවං පුනප්පුන.**
**එලමෙවඞ්කං යදා හොති- නෙනො ඡන්දස්ස අක්ඛර**
**ගුරූහියෙව දාතබ්බා- නඪවුත්තං භවෙ තදා."**

නෂ්ටවෘත්තයාගේ අඞ්කය දෙකින් බෙදූ කල්හි සම වුව හොත් ලඝුවක් ද, විෂම (එකක් ඉතිරි) වුව හොත් ගුරක් ද ලියනු. **ශෙෂ ය වූ එක** දෙකින් බෙදා ලත් ඵලයට එක් කොට ඡන්දස පිරෙන තුරු නැවත මෙසේ කිරීමෙන් වින්‍යාසය සොයා ගත යුතුයි.

ඡන්දස පිරීමට මත්තෙන් දෙකින් බෙදූ ලත් ඵලය එකක් වුව හොත් එතැන් සිට ගුරුවලින් ඡන්දස පුරවා ගතයුතුයි.

මෙහි දී **දෙකින් බෙදිය යුත්තේ වර්ණච්ඡන්දසෙහි එක් එක් අකුරක ගුරු - ලඝු වශයෙන් භේද දෙකක් ම ඇති හෙයිනි. ශේෂය ඵලයට එක්කළයුත්තේ වෘත්ත සංඛ්‍යාව නො පිරිහීම පිණිසයි.**

2 |11 ÷ 2
5 — 1 = ⏑ 1.
1
2 |6 ÷ 2
2 |3 ÷ 2 = — 2.
1 — 1 = ⏑ 3.
1
2 |2 ÷
1 = — 4.

මේ ක්‍රමයෙන් ප්‍රතිෂ්ඨාච්ඡන්දසෙහි 11 වෙනි වෘත්තයෙහි වින්‍යාසය මෙසේ සොයනු. නෂ්ටයාගේ අඞ්කය වූ 11 දෙකින් බෙදූ එකක් ඉතිරි හෙයින් එහි **ගුරක්** ලියනු. ශේෂය ඵලයට එක් කළ විට සයක් වේ. එය බෙදූ විට ශේෂයක් නැත, එහෙයින් **ලඝුවක්** ලියනු. එහි ඵලය (3) බෙදූ විට ශේෂ විය, එහෙයින් එහි **ගුරක්** ලියනු. නැවත ශේෂය හා ඵලය එක් කළ විට දෙකක් වේ. එය බෙදූ විට ශේෂයක් නැති හෙයින් **ලඝුවක්** ලියනු. වෘත්තය " ⏑ — ⏑ — " මෙසේයි. ප්‍රස්තාරය බලනු. **මෙය සුකර වූ ද නො වරදිනා සුළු වූ ද ක්‍රමයකි.**

තව නිදසුනක්– ත්‍රිෂ්ටුප් ඡන්දසෙහි 439 වෙනි වෘත්තයේ වින්‍යාසය කෙසේ ද?

2 |439 ÷ 2
219 — 1 = ⏑ 1.
1
2 |220 ÷ 2
2 |110 ÷ 2 = — 2.
2 |55 ÷ 2 = — 3.
27 — 1 = ⏑ 4.
1
2 |28 ÷ 2
2 |14 ÷ 2 = — 5.
2 |7 ÷ 2 = — 6.
3 — 1 = ⏑ 7.
1
2 |4
2 |2 ÷ 2 = — 8.
1 = — 9.

මෙහි දක්වූ " ත්‍රිෂ්ටුප් " 11 වෙනි ඡන්දස හෙයින් ඡන්දස පිරීමට එකොළොස් වාරයක් බෙදිය යුත්තේය. එහෙත් නව වාරයක් බෙදූ විට ඵලය එකක් වීමෙන් නො බෙදිය හැකි විය. එහෙයින් ඉතිරි අකුරු දෙක ගුරු වලින් පුරවා ගත් විට වින්‍යාසය මෙසේයි–

| "1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ⏑ | — | — | ⏑ | — | — | ⏑ | — | — | ⏑ | ⏑" |

(දෙඛක වෘත්තය බලනු.)

මෙය නැවත නැවත ප්‍රගුණ කරනු.

---

**7 අර්ධසමවෘත්ත නෂ්ටය.** අර්ධසමවෘත්තයන්ගේ ද ගුරු - ලඝු නො පෙනී ගිය කල්හි පළමු දැක්වූ ක්‍රම දෙකින් පහසු ක්‍රමයක් ඇසුරු කොට නෂ්ටයාගේ සඞ්ඛ්‍යාව බෙදීමෙන් අර්ධයක ම වින්‍යාසය සොයා ගතයුතුයි.

ත්‍ර්‍යක්ෂර පාද ඇති ඡන්දස්හුගේ අර්ධසම ප්‍රස්තාරයෙහි 45 වෙනි වෘත්තයේ වින්‍යාසය කෙසේ ද ? ( මෙය පසුව දැක්වූ ක්‍රමයෙන් සොයා දක්වනු ලැබේ.)

2 | 45÷2
22--1 = ⏑ 1.
1
2 | 23÷2
11--1 = ⏑ 2.
1
2 | 12÷2
2 | 6÷2 = -- 3.
2 | 3÷2 = — 4.
1÷1 = ⏑ 5.
1
2 | 2÷2
1 = — 6.

“1 ⏑ 2 ⏑ 3 —, 1 -- 2 ⏑ 3 —” මෙසේ විචාළ වෘත්තයෙහි අර්ධයක වින්‍යාසය ලැබේ. මෙපරිද්දෙන් වින්‍යාසය සොයා ගත හැකි වන්නේ ප්‍රස්තාරය තුල පවත්නා සමවෘත්ත ද නො හැර ගත් කල්හිය. සමවෘත්ත හරින ලද්දේ නම් මෙය වැරදි වින්‍යාසයකි.

සෙසු තැන්හි ද මෙසේ මැයි.

---

**8. විෂමවෘත්ත නෂ්ටය.** විෂමවෘත්තයන්ගේ නෂ්ටය සෙවීමෙහිදී ද පළමු පරිද්දෙන් ම නෂ්ටවෘත්තයාගේ අඞ්කය බෙදිය යුතුයි. වෙනස නම්? පාදසතරෙහි ම වින්‍යාසය එක විට සෙවීම පමණකි. ප්‍රස්තාරයෙහි ද පාදසතර ම එක් කොට ගත් හෙයිනි.

ව්‍යක්ෂරපාද ඇති ඡන්දස්හුගේ විෂමවෘත්ත ප්‍රස්තාරයෙහි 189 වෙනි වෘත්තයාගේ වින්‍යාසය කෙසේ ද?- (මෙය ද පසුව කී ක්‍රමයෙන් සොයනු ලැබේ.)

2 | 189÷2
94—1 = ◡ 1.
1
2 | 95÷2
47—1 = ◡ 2.
1
2 | 48÷2
2 | 24÷2 = — 3.
2 | 12÷2 = — 4.
2 | 6÷2 = — 5.
2 | 3÷2 = — 6.
1—1 = ◡ 7.
1
2 | 2÷2
1 = — 8.

1. 2. 3. 4.

“◡ ◡ , — — , — — , ◡ —”

විචාලි වෘත්තයාගේ පාද සතරෙහි ම වින්‍යාසය මෙසේයි. මෙහි ද විෂමවෘත්ත ප්‍රස්තාරය තුල පවත්නා සම - අර්ධසමවෘත්ත නොහැර ගැනීමෙන් ම නිවරදවින්‍යාසය ලැබෙන බව සැලකිය යුතුයි. විෂමවෘත්ත ප්‍රස්තාරයෙහි අර්ධසම වේ යයි දක්වූ, 188 වැනි වෘත්තය බැලූ කල මෙහි දක්වූ වින්‍යාසය නිවරද බව පෙනේ.

---

**2. ආයතී නෂ්ටය.** යම් කිසි ආයතී වෘත්තයක ගුරු - ලඝු නොපෙනී ගිය කල්හි එහි වින්‍යාසය සොයා ගැනීම ද වර්ණ වෘත්තයන්ගේ නෂ්ටය සෙවීම පිණිස මේ ග්‍රන්ථයෙහි පසුව දක්වූ ක්‍රමයෙන් ම කළ යුත්තේය. මෙහි ඇත්තේ ගණස්ථාන විකල්පයන්ගේ අසමානත්වය හෙයින් ලැබෙන විශෙෂ යයි.

**“අද්ධිකාස'පි නඬ්ඪෙකා- ගණා'ඩ්ඪෙකාහි යථාසකං**
**භජෙ සෙසො ගණො ඤෙය්‍යො- කාරෙ තස්ස සරූපකං.**
**පුනප්පුනෙකසහිතං- විභජ්ජෙනා ද්දෙ ගණෙ**
**සෙසා'භාවෙ ලිඛෙ තස්ස- භාජකෙන සමං ගණං.**
**පුබ්බෙවෙකම්දත්වාන- විභජේය්‍ය යදා පන**
**හීනෙ අඩ්ඪෙක ගණඨානෙ- කාතබ්බො පඨමො ගණො”**

ආයතීනෂ්ට වෘත්තයාගේ අඞ්කය සතර – පහ ආදි ඒ ඒ ගණස්ථාන විකල්පයන්ගේ අඞ්කවලින් බෙදිය යුත්තේය. බෙදූ ශෙෂ වූ අඞ්කය එතැන්හි යෙදෙන ගණයාගේ අඞ්ක යයි එහෙයින් ශෙෂයට සමාන අඞ්කය ඇති ගණය ඒ ගණස්ථානයෙහි යෙදිය යුතුයි. මෙසේ ප්‍රථම ස්ථානගණ විකල්පයෙන් බෙදූ ලත් ඵලයට එකක් එක් කොට ද්විතීය ස්ථානගණ විකල්පයෙන් බෙදූ ශෙෂයට සමාන ගණය යෙදිය යුතුයි. (මේ මෙහි සාමාන්‍ය ක්‍රමයයි) යම් තැනෙක ශෙෂයක් නො ලැබුන හොත් එහි බෙදූ අඞ්කයට සමාන ගණය හෙවත් ඒ ස්ථානයෙහි යෙදෙන ගණයන් අතුරෙන් අන්තිම

ගණය යෙදිය යුතුයි **ශෙෂය නැති තැන ඵලයට එකක් එක් කිරීම ද නො කට යුතුයි.** විත්‍යාසය සම්පූර්ණවී මට මත්තෙන් නෂ්ටාඞ්කය ක්‍ෂය වී ගිය හොත් සර්ගුරුගණයෙන් වෘත්තය පුරවා ගතයුතුයි. එහෙත් නියත ගණාදිය යෙදෙන තැන ඒ ඒ ගණාදිය ම යෙදිය යුතුයි.

දෙකොටි පනස්නවලක්‍ෂ විසිඅටදහස් තිස්සතර (=2,59,28034) වන ආයඞ්ඛාවෙහි ගුරු - ලඝු විත්‍යාසය කෙසේ දැ? යි විචාළ කල්හි මෙසේ සෙවිය යුතුයි.

නෂ්ටවෘත්තයාගේ ප්‍රථමගණය සෙවීමට ප්‍රථම ස්ථාන විකල්පයන්ගෙන් අඞ්කය බෙදිය යුතුයි.

ප්‍රථමස්ථාන විකල්ප සතරකි- 4 | 25928034 ÷ 4

6482008—2=“- - ◡” 1 ගණය

සතරෙන් බෙදූ විට දෙකක් ඉතිරි විය; එය ප්‍රථමස්ථානයෙහි යෙදෙන ගණයාගේ අඞ්කය හෙයින් දෙවෙනි ගණය හෙවත් අන්ත ගුරු වූ සගණය එහි යෙදිය යුතුයි, දැන් ද්විතීයස්ථානයෙහි යෙදිය යුතු ගණය සෙවීම පිණිස බෙදූ ලැබුනු ඵලයට එකක් එක් කොට ද්විතීයස්ථානයෙහි ගණවිකල්ප වූ පසෙන් බෙදිය යුතුයි.

6482008 + 1

ද්විතීයස්ථාන විකල්ප- 5 | 6482009 ÷ 5

1296401—4 = „◡ -- —” 2 ගණය

පසින් බෙදූ විට සතරක් ඉතිරි විය. එය ද්විතීය ස්ථානයෙහි යෙදෙන ගණයාගේ අඞ්කය හෙයින් සතරවන ගණය හෙවත් ආදි ගුරු වූ භගණය යෙදිය යුතුයි. (මත්තෙහි ද මෙසේ ම බෙදූ ඉතිරි වූ සඞ්ඛ්‍යාවට සමාන වූ ගණය ඒ ඒ තැන්හි යෙදිය යුතුයි.)

1296401 + 1

1

තෘතීයස්ථාන විකල්ප 4 | 1296402 ÷ 4

324100--2 = “— -- ◡” 3 ගණය.

1

චතුර්ථස්ථාන විකල්ප 5 | 324101 ÷ 5

64820--1 = “◡ ◡” 4 ගණය.

1

පඤ්චමස්ථාන විකල්ප 4 | 64821 ÷ 4

16205—1 = “◡ ◡” 5 ගණය.

1

ෂෂ්ඨස්ථාන විකල්ප 2 | 16206 ÷ 2

8103--0 = “-- — — —” 6 ගණය.

දෙකින් බෙදූ විට ශෙෂයක් නො ලැබුන හෙයින් ෂෂ්ඨස්ථාන යෙහි යෙදෙන ගණ දෙක අතුරෙන් අන්තිම ගණය හෙවත් සර්ව ලඝු වූ නගණය එහි යෙදිය යුතුයි. මෙහිදී සත්වන ගණය සෙවීම පිණිස බෙදීමෙන් ලැබුනු ඵලය වූ 8103 ට එකක් එක් නො කළ යුතුයි (මෙසේ සියලු තැන්හි ම බෙදූ කල ශෙෂයක් නො ලැබුන හොත් අනතුරු ගණය සෙවීම පිණිස ඵලයට එකක් එක් නො කොට බෙදිය යුතුබව සලකනු.)

සප්තමස්ථාන විකල්ප, 4 | 8103 ÷ 4
2025—3 = "◡ — —" 7 ගණය.

සප්තමස්ථානය විෂම හෙයින් ජගණය නො යෙදේ. එහෙයින් එහි යෙදෙන ගණ අතුරෙන් තුන්වන ගණය වූයේ භගණයයි.

අෂ්ටමස්ථානය සියලු ආර්යාවන්ගේ නියත ගුරු අකුරක් වේ යයි කී හෙයින් එහි දී විමසීමක් නො කොට ගුරක් ම යොදා ගත යුතුයි. දැන් පූර්වාර්ධය සම්පූර්ණ විය. අපරාර්ධය සෙවීම පිණිස පූර්වාර්ධයෙහි සප්තමස්ථාන විකල්පවලින් බෙදා ලත් ඵලය ම එකක් සහිත කොට ප්‍රථමස්ථාන විකල්පවල පටන් පළමු සෙයින් ම බෙදිය යුතුයි.

(ද්විතීයාර්ධයෙහි) 2025 + 1
1

ප්‍රථමස්ථාන විකල්ප 4 | 2026 ÷ 4
506—2 = "— — ◡" 1. ගණය.
1

ද්විතීයස්ථාන විකල්ප 5 | 507 ÷ 5
101—2 = ' — — ◡" 2 ගණය.
1

තෘතීයස්ථාන විකල්ප 4 | 102 ÷ 4
25—2 = "— — ◡" 3. ගණය.
1

චතුර්ථස්ථාන විකල්ප 5 | 26 ÷ 5
5—1 = "◡ ◡" 4. ගණය.
1

පඤ්චමස්ථාන විකල්ප 4 | 6 ÷ 4
1—2 = "— — ◡" 5. ගණය.
1

සප්තමස්ථාන විකල්ප 4 | 2 ÷ 4
0—2 = "— — ◡" 7. ගණය.

අපරාඩියෙහි ෂෂ්ඨස්ථානය නියත ලඝුවක් හෙයින් විමසීමක් නැතිව ලඝුවක් ම යොදා ගතයුතුයි, අෂ්ටමස්ථානය ද නියත ගුරුයි දැන් අපරාඩිය ද සම්පූර්ණ විය. අඩි දෙක්හි ම ගණ වින්‍යාසය මෙසේයි

| | 1. | 2. | 3. | 4. | 5. | 6. | 7. | 8. |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රථමාඩිය–“ | - - ⌣, | ⌣ - -, | - - ⌣; | ⌣ ⌣. | ⌣ ⌣ | - - - -, | ⌣ - -, | ⌣” |
| ද්විතීයාඩිය–“ | - - ⌣, | ⌣ - -, | - - ⌣; | ⌣ ⌣, | - - ⌣, | -, | - - ⌣, | ⌣” |

මෙය පළමු විචාළ 2,59,28,034 යන සඞ්ඛ්‍යාව ඇති ආයම්ාවගේ ගුරු – ලඝු වින්‍යාසයයි. මතු දක්වන ආයම්ා උද්දිෂ්ටය ද බලනු.

---

10. **මාත්‍රාවෘත්ත නෂ්ටය.** මාත්‍රාවෘත්තයාගේ ගුරු - ලඝු නො පෙනී ගිය කල්හි එය සොයා ගැනීමේ ක්‍රමය පළමු දැක්වූ සමවෘත්තාදීන්ගේ නෂ්ට විධියට වඩා වෙනස් වේ. එය මෙහි දක්වන ක්‍රමයෙන් සෙවිය යුතුයි.

> “නෂ්ටං ඤාතාය ඡන්දස්ස– පඨමං සබ්බලහුං ලිඛෙ
> උපරූපරි අඞ්කාදි– පුබ්බපුබ්බඞ්කසිද්ධෙ සාෂර.
> ලද්ධ'ඞ්කා'නෙන හනෙ නට්ඨ– පුබ්බපුබ්බා'පි හාපයෙ
> ගුරුමෙති හනඞ්කා'ධො– පරෙන ලහුනා සහ.

මාත්‍රාවෘත්තයාගේ නෂ්ටවිධියෙහි ගුරු – ලඝු සොයා ගතයුතු වෘත්තය යම් ඡන්දසක නම්? ඒ ඡන්දස්හුගේ සර්වලඝු වෘත්තය පළමු කොට ලියා ගතයුතුයි. ඒ මාත්‍රාවන් මතුයෙහි එක – දෙක යනාදි ක්‍රමයෙන් පූර්ව පූර්වයෙහි මාත්‍රා දෙකක් දෙකක් උඩ සිටි අඞ්ක එක් කොට අපර අපර මාත්‍රා මතුයෙහි ලියා ගත යුතුයි. අනතුරුව නෂ්ටවෘත්තයාගේ අඞ්කය සඞ්ඛ්‍යානයෙන් හෙවත් අවසාන ලඝුව මත්තෙහි සිටි අඞ්කයෙන් අඩුකළ යුතුයි. ඉතිරි වූ සඞ්ඛ්‍යාව ගෙන එයින් අඩු කළ හැකි මාත්‍රාමතුයෙහි සිටි ඉතා වැඩි සඞ්ඛ්‍යාව අඩු කළ යුතුයි. මෙසේ අඩු වූ සඞ්ඛ්‍යාව යට සිටි ලඝුව අගින් සිටි ලඝුව සමග එක් කොට ගුරක් කළ යුතුයි. එවිට නෂ්ටවෘත්තයාගේ ගුරු – ලඝු ප්‍රකට වෙයි ඊට නිදසුන් මෙසේයි-

පඤ්චමාත්‍රිකච්ඡන්දසෙහි පස්වන වෘත්තයාගේ වින්‍යාසය කෙසේද? යන ප්‍රශ්නයෙහි-

පළමු කොට පඤ්චමාත්‍රිකච්ඡන්දසෙහි සර්වලඝු වෘත්තය “⌣ ⌣ ⌣ ⌣ ⌣” මෙසේ තබා ගත යුතුයි.

```
      +
1  2  3  5  8
—  —  —  —  —
      ⏑
```

සඞ්ඛ්‍යානය - 8
නෂ්ටවෘත්තය - 5
ඉතිරි 3

තුනෙන් අඩුකළ හැකි වැඩි ගණන තුන හෙයින් යට සිටිලඝුව ඊලඟලඝුව හා එක්ව ගුරක්විය) වෘත්තය මෙසේයි.
" — — ⏑ — "

ඊට පසු මුලින් සිටි ලඝුව මත්තෙහි එක (1) ලියා ගතයුතුයි දෙවන ලඝුව මත්තෙහි දෙක (2) ලියා ගත යුතුයි. තුන්වන ලඝුව මත්තෙහි මුලින් සිටි අඞ්ක දෙක එක් කොට තුන (3) ද, සතරවන ලඝුව මත්තෙහි ඊට මුලින් අඞ්ක දෙක එක් කොට පස (5) ද, පස්වන ලඝුව මත්තෙහි ඊට මුලින් අඞ්ක දෙක එක් කොට අට (8) ද ලියා ගත යුතුයි. (පඤ්චමාත්‍රිකාච්ඡන්දසෙහි සඞ්ඛ්‍යානය ද මෙය මැයි.)

විචාරනලද නෂ්ට වෘත්තයාගේ සඞ්ඛ්‍යාව වූ පස සඞ්ඛ්‍යානයෙන් හෙවත් අන්තිම ලඝුව උඩ සිටි අටෙන් අඩුකළ යුතුයි. එවිට තුනක් ඉතිරි විය, එසින් අඩු කළ හැකි මූල අඞ්ක අතුරෙන් ඉතා වැඩි අඞ්කය තුනයි. එය අඩුකොට ඊට යටින් සිටි ලඝුව ඉදිරියෙහි ලඝුවත් සමග එක් කොට (3 + 5) ගුරක් කළ යුතුයි. එවිට නෂ්ට වෘත්තයාගේ වින්‍යාසය පෙනේ.

ෂොඩශමාත්‍රිකාච්ඡන්දසෙහි 153 වන වෘත්තයාගේ වින්‍යාසය කෙසේද?

```
+     +                 +      +                              +.          +
1  2  3  5  8  13  21   34  55  89  144  233  377  610  987  1597
-  -  -  -  -  —   —    —   —   —   ——   ——   ——   ——   ——   ———
 ⏑     ⏑            ⏑           ⏑                    ⏑           ⏑
```

සඞ්ඛ්‍යානය. 1597
නෂ්ටවෘත්තය. 153

```
1597
 153
----
1444
 987
----
 457
 377
----
  80
  55
----
  25
  21
----
   4
   3
----
   1
   1
----
   0
```

විචාළ වෘත්තයාගේ වින්‍යාසය මෙසේයි
" ⏑ ⏑ — — ⏑ ⏑ — — ⏑ ⏑ "
උපචිත්‍රාව බලනු.

සෙසු මාත්‍රාවෘත්තයන්ගේ ද නෂ්ට විධිය මෙසේ ම විමසා බැලිය යුතුයි.

---

නෂ්ටප්‍රත්‍යය
මෙතෙකින් සමාප්තයි.

## 3. උද්දිෂ්ට ප්‍රත්‍යය.

11. **සමවෘත්ත උද්දිෂ්ටය.** යම් වෘත්තයක ලක්‍ෂණ දක්වා මේ වෘත්තය ප්‍රස්තාරයාගේ කතමස්ථානයෙහි ලැබේ දැ? යි විචාළ කල්හි එය සොයා ගැනිම උද්දිෂ්ටයාගේ ප්‍රයොජන යයි. ප්‍රස්තාරයාගේ ශුද්ධා'ශුද්ධත්වය මෙයින් ද විමසිය හැකි වේ.

මෙහි දී පළමු කොට දැක්වූ වෘත්තයාගේ ගුරු – ලඝු විත්‍යාසය ලියා ගත යුතුයි අනතුරුව ආදි අක්‍ෂරයෙහි පටන් රේඛා යට එක - දෙක ආදි ක්‍රමයෙන් දෙකින් දෙකින් වැඩි කරගත් අඞ්ක තැබිය යුතුයි. ලඝුඅකුරු යට සිටි අඞ්ක එකක් සමග එක් කළ විට දැක්වූ (= උදෙසු) වෘත්තයාගේ සඞ්ඛ්‍යාව ලැබේ. ඊට නිද සුන් මෙසේයි.

ජගණ – ගුරු යුක්තවූ "ලාසිනි" නම් වෘත්තය ප්‍රස්තාරයෙහි කිවැන්න ද? යන ප්‍රශනයෙහි–

"— ⏑ — ⏑" මෙසේ ගුරු - ලඝු ලියා මුල අකුර යට එක (1) ද, එය දෙකින් වැඩි කොට දෙවන අකුර යට දෙක (2) ද, එය පිගුණ කොට තෙවන අකුර යට සතර (4) ද, එය පිගුණ කොට සතරවන අකුර යට අට (8) ද, ලියා ගත යුතුයි. දැන් "$\underset{1}{—}\ \underset{2}{\smile}\ \underset{4}{—}\ \underset{8}{\smile}$" මෙසේ සිටී. ලඝු යට සිටි අඞ්ක එක් කළ විට (1+4=5) පසක් වේ. ඊට තවත් එකක් එක් කළ විට (5+1=6) සයකි. එහෙයින් "ලාසිනි" වෘත්තය "ප්‍රතිෂ්ඨා"ඡන්දසෙහි සයවැන්න බව පෙනේ. ප්‍රස්තාරය බලනු

උද්දිෂ්ට වෘත්තයාගේ අඞ්කය සෙවීමට තව ක්‍රමයක් දක්වනු ලැබේ. පළමු සේ ම අකුරු යට අඞ්ක ලියා ගුරු අකුරු යට සිටි අඞ්ක එක් කොට සඞ්ඛ්‍යානයෙන් අඩු කළ යුතුයි. එවිට ද උද්දිෂ්ටයාගේ සඞ්ඛ්‍යාව ලැබේ. පළමු උදෙසු ($\underset{1}{—}\ \underset{2}{\smile}\ \underset{4}{—}\ \underset{8}{\smile}$) වෘත්තයෙහි ම ගුරු යට සිටි අඞ්ක (2+8=10) එක් කළ විට දසයකි. චතුරක්‍ෂර (ප්‍රතිෂ්ඨා) ඡන්දසෙහි සඞ්ඛ්‍යානය 16 කි. එයින් දසය අඩු කළ විට (16–10=6) සයකි. එය උදෙසු වෘත්තයාගේ සඞ්ඛ්‍යාවයි.

මෙසේ ම "වංශස්ථ" වෘත්තය කිනම් ඡන්දසක කතමස්ථාන යෙහි ලැබේ ද? යන ප්‍රශනයෙහි–

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| "ව | ද | න්ති | වං | ස | ඨ | මි | දං | ජ | නා | ජ | රු" |
| — | ⏑ | — | ⏑ | ⏑ | — | — | ⏑ | — | ⏑ | — | ⏑ |
| 1, | 2, | 4, | 8, | 16, | 32, | 64, | 128, | 256, | 512, | 1024, | 2048, |

| |
|---|
| 1 |
| 4 |
| 32 |
| 64 |
| 256 |
| 1024 |
| 1381 |
| 1 |
| 1382 |

"වංශස්ථ වෘත්තය" ද්වාදශාක්ෂර වූ "ජගතී" ඡන්දසෙහි එක්දහස් තුන්සිය අසූදෙවැනි (= 1382) ස්ථානයෙහි ලැබේ. මෙය සොයන ලද්දේ ලඝු යට සිටි අඞ්ක එක් කිරීමෙනි. ගුරු අකුරු යට සිටි අඞ්ක එක් කළ කල්හි ද උද්දිෂ්ටයාගේ අඞ්කය සොයා ගත හැකිබැව් කියන ලදි. එහෙයින් ගුරු යට සිටි දෙක - අට ආදි අඞ්ක එක් කළ විට "2714" ක් වේ. මෙය ජගතීඡන්දසෙහි සඞ්ඛ්‍යානය වූ "4096" අඩු කළ කල්හි (= 4096 - 2714 = 1382) උද්දිෂ්ටයාගේ අඞ්කය ලැබෙන බැව් සැලකිය යුතුයි. **උද්දිෂ්ටයෙහි අන්තිම අකුර යට සිටි අඞ්කය ද්විගුණ කිරීම සඞ්ඛ්‍යානය සෙවීමෙහි ඉතා පහසු ක්‍රමයයි.** සෙසු තැන්හි ද මෙසේ ම උද්දිෂ්ටය සොයා පුගුණ කළ යුතුයි.

---

**12 - 13. අර්ධසම - විෂමවෘත්ත උද්දිෂ්ටය.** අර්ධසම වෘත්තයක හෝ විෂම වෘත්තයක ලක්ෂණ හෙවත් ගුරු - ලඝු වින්‍යාසය දක්වා මෙය ප්‍රස්තාරයෙහි කවර තැනෙක්හි සිටියේ දැ? යි විචාළ කල්හි ද අර්ධසමවෘත්තයාගේ අර්ධයක හා විෂම වෘත්තයාගේ පාද සතරෙහි ද ගුරු - ලඝු යට සුදුසු පරිදි අඞ්ක ලියා එකතු කිරීමෙන් පළමු සමවෘත්තයෙහි කී සෙයින් උදෙසූ වෘත්තයාගේ සඞ්ඛ්‍යාව සොයා ගත යුතුයි.

---

**14. ආර්‍යා උද්දිෂ්ටය.** යම් කිසි ආර්‍යාවක් දක්වා මෙය ප්‍රස්තාරයෙහි කතමස්ථානයක උපන්නේ දැ? යි විචාළ කල්හි එය මතු දක්වන ක්‍රමයෙන් සොයා ගතයුතුයි.

**"ඨානානු'ද්දිට්ඨවුත්තස්ස- ගණවිකප්පසඞ්ඛං ඨපෙ**
**චතුපඤ්චාදිකා සඞ්ඛ්‍යා- ඨානලද්ධා'ධො යථොචිතා.**

**ඵලසිද්ධා'දිමෙන'නෙනා- භාජෙය්‍යා'ධො ඨිතෙ ගණෙ**
**තථා යාවාදිමං කත්වා= වුත්තසඞ්ඛ්‍යං විනිද්දිසෙ."**

පළමු කොට උදෙසූ ආර්‍යාවෘත්තයාගේ ගණවින්‍යාසය කොට ප්‍රථම - ද්විතීයාදි ඒ ඒ ස්ථානවල යෙදෙන සතර පහ ආදි ගණ විකල්ප සඞ්ඛ්‍යාව වින්‍යාසය යට ලියා ගත යුතුයි. අනතුරුව අපරාර්ධයාගේ අන්තයෙහි සිටි විකල්ප සඞ්ඛ්‍යාව ඊට මුලින් සප්තමස්ථානයෙහි සිටි සඞ්ඛ්‍යාවෙන් ගුණ කරනු. සප්තමස්ථානයෙහි යෙදෙන ගණ අතුරෙන් කීවෙනි ගණය යෙදී තිබේ දැයි බලා එහි

තිබෙන ගණයට පහලින් සිටි ගණසඞ්ඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබුනු ඵලයෙන් අඩු කරනු. (සප්තමස්ථානයෙහි සගණය යෙදුනි නම්? ප්‍රස්තාරයෙහි ඊට යටින් ඇත්තේ තව ගණ තුනකි. විෂම හෙයින් ජගණය හළ විට ඉතිරිවූයේ ගණ දෙකකි, ඒදෙක අඩුකළ යුතුයි) සවැන්න නිත්‍ය ලඝු ස්ථානය හෙයින් සෙවිය යුත්තක් නැත. ඉක්බිති සප්තම ස්ථානයෙන් ඉතිරි වූ සඞ්ඛ්‍යාව පඤ්චම ස්ථානයෙහි විකල්ප සඞ්ඛ්‍යාවෙන් ගුණ කොට එහි ද යෙදී තිබෙන ගණයෙන් යට සිටි ගණයන් අඩු කළ යුතුයි. මෙසේ අපරාර්ධයෙහි ආදිම ගණය තෙක් සොයා නැවත පූර්වාර්ධයෙහි අවසානය පටන් ආදිය තෙක් වැඩි - අඩු කළ කල්හි අවසානයෙහි ලැබෙන්නේ උද්දිෂ්ට ආර්යාවගේ අඞ්කයයි. මෙය මතු දක්වන නිදසුන බලා අවබොධ කළ යුතුයි.

“කරුණාසීතලහදයං- පඤ්ඤාපජ්ජෝතවිහතමොහතමං
සනරාමරලොකගරුං- වන්‍දෙ සුගතං ගතිවිමුත්තං”

මේ ආර්යාව. ප්‍රස්තාරයෙහි කතමස්ථානයක ලැබේ ද? යන ප්‍රශ්න යෙහි - පළමු කොට ගණවින්‍යාසය හා විකල්ප සඞ්ඛ්‍යා මෙසේ තබාගත යුතුයි.

– – ◡ , ◡ – – , – – ◡ ; ◡ ◡ , ◡ ◡ , – – – – , ◡ – – , ◡ ,
1 – 4, 2 – 5, 3 – 4; 4 – 5, 5 – 4, 6 – 2, 7 – 4, 8-1

– – ◡ , – – ◡ , – – ◡ ; ◡ ◡ , – – ◡ , — , – – ◡ , ◡ ,
1 – 4, 2 - 5, 3 - 4; 4 – 5, 5 – 4, 6-1, 7 – 4, 8-1

මෙහි අපරාර්ධයාගේ අන්තයෙහි සිටි එක ඊට මුලින් සප්තම ස්ථානයෙහි විකල්ප සඞ්ඛ්‍යාව වූ සතරෙන් ගුණ කළ විට සතරක් ලැබේ. සප්තමස්ථානයෙහි සගණය යෙදුන හෙයින් ප්‍රස්තාරයෙන් ගණතුනක් ඉතිරි වේ. විෂම ස්ථාන හෙයින් ජගණය ද හළ විට ඉතිරි වූ ගණ දෙක සත රින් අඩු කරනු.

ෂෂ්ඨස්ථානය නිත්‍යලඝු හෙයින් හෙද නැත, එහෙ සින් විමසිය යුතු ද නො වේ.

සප්තමස්ථානයෙන් ඉතිරි වූ දෙක පඤ්චමස්ථාන විකල්ප සතරින් ගුණ කළ විට අටක් වේ. එහි ද සග ණය යෙදුන හෙයින් ඉතිරි ගණ දෙක අඩු කළ විට සයක් ලැබේ.

1 × 4
4
4—2
2
2 × 4
4
8—2
2
6 × 5
5
30—4
4
26 × 4
4

```
104—2
  2
-----
102 × 5
  5
-----
510—3
  3
-----
507 × 4
  4
-----
2028—2
   2
-----
2026
```

සය චතුර්ථස්ථාන විකල්ප පසෙන් ගුණ කොට එහි මගණය යෙදුන හෙයින් ඉතිරි ගණ සතර අඩු කළ යුතුයි. (සෙසු ස්ථාන ද මෙසේ ම සලකනු.)

ප්‍රථමස්ථාන විකල්ප සතරින් වැඩි කොට එහි සගණය යෙදුන හෙයින් ජගණ වර්ජිත ගණදෙක අඩු කළ විට "2026" ක් ඉතිරි විය. එය පූර්වාර්ධයාගේ අවසාන යෙහි නිත්‍ය ගුරු හෙයින් නො සොයා සප්තමස්ථාන විකල්ප සතරින් ගුණකළ යුතුයි. එහි භගණය යෙදුන හෙයින් ඉතිරි වූ තගණය අඩු කරනු.

```
2026 × 4
     4
--------
8104—1
     1
--------
8103 × 2
     2
--------
16206 × 4
      4
--------
64824—3
      3
--------
64821 × 5
      5
--------
324105—4
      4
--------
324101 × 4
       4
--------
1296404—2
       2
--------
1296402 × 5
        5
--------
6482010—1
        1
--------
6482009 × 4
        4
--------
25928036—2
        2
--------
25928034
========
```

සප්තමස්ථානයෙන් ඉතිරි වූ සඞ්ඛ්‍යාව ෂෂ්ඨ ස්ථාන විකල්ප දෙකින් ගුණ කළ යුතුයි.

සවැන්නෙහි අන්තිම වූ සර්වලඝුගණය යෙදුන හෙයින් එහි අඩු කළ යුත්තක් නැත.

දෙකින් ගුණ කිරීමෙන් ලත් ඵලය පඤ්චම ස්ථාන විකල්ප සතරින් වැඩි කොට එහි ද ඉතිරිවූ ගණ තුන අඩු කළ යුතුයි. මෙසේ ප්‍රථම ස්ථානය තෙක් වැඩි අඩු කිරීමෙන් ලැබුන සඞ්ඛ්‍යාව වූ "2,59,28,034" (දෙකොටි පනස්නවලක්ෂ විසිඅට දහස් තිස්හතර) "සරුණා සිතල" යනාදීන් උද්දිෂ්ටආර්‍යාව ප්‍රස්තාරයෙහි ලැබෙන ස්ථානයයි.

මේ ක්‍රමයෙන් ආර්‍යාවන්ගේ උද්දිෂ්ටය සොයා ප්‍රගුණකළ යුතුයි.

---

15. **මාත්‍රාවෘත්ත උද්දිෂ්ටය.** උදෙසනලද මාත්‍රා වෘත්තයාගේ ද ගුරු-ලඝු වින්‍යාසය කොට ප්‍රථම - ද්විතීයාදි මාත්‍රාවන්ගේ මතුයෙහි පිළිවෙළින් එක - දෙක ආදි අඞ්ක පළමු නෂ්ටයෙහි කී සෙයින් මුල මුල අඞ්ක එක් කොට ලියා ගත යුතුයි. (ගුරුඅකුරක මාත්‍රා දෙකක් ඇතිබව සලකනු.) " — ◡ ◡ " මේ පඤ්චමාත්‍රික වෘත්තයෙහි පළමුවන මාත්‍රාව මුල සිටි ලඝුවෙහි ද, දෙවන - තුන්වන මාත්‍රා දෙක දෙවැනි වූ ගුරෙහි ද, සතරවන - පස්වන මාත්‍රා දෙක තෙවැනි වූ ගුරෙහි ද සිටියේය. මේ වෘත්තයෙහි " 1, 2-3, 5-8 " මෙපරිද්දෙන් අඞ්ක යෙදෙත්. මෙසේ සිටි කල අඞ්ක මිශ්‍රවිය හැකි හෙයින් ද, උද්දිෂ්ටයාගේ සඞ්ඛ්‍යාව සොයා ගැනීමේ පහසුව පිණිස ද,—

1. 2. 5.
— ◡ ◡
3. 8.

මෙපරිද්දෙන් ගුරු අකුරක සිටි මාත්‍රා දෙක අතුරෙන් පූර්වමාත්‍රාවට අයිති හීන සඞ්ඛ්‍යාව ගුරට උඩින් ද, අපරමාත්‍රාවට අයිති අධික සඞ්ඛ්‍යාව යටින් ද ලියා ගත යුතුයි. ඊට පසු ගුරු අකුරු උඩ සිටි අඞ්ක එක් කොට සඞ්ඛ්‍යානයෙන් අඩු කරනු. එවිට උද්දිෂ්ට වෘත්තයාගේ සඞ්ඛ්‍යාව ලැබේ මෙද දක්වනු ලැබේ.

**"උද්දිට්ඨමත්තාවුත්තස්ස- අඞ්කා පුබ්බේ'ව යොජයෙ**
**යුගලෙ යුගලං තත්ථ- ධිකං හෙට්ඨා'ඤ්ඤමඤ්ඤථා.**

**ගුරූණං සංගතා සඞ්ඛ්‍යා- සඞ්ඛ්‍යාණෙ ලොපිතා තතො**
**යා සඞ්ඛ්‍යා සිස්සතෙ තත්ථ- සො'ද්දිට්ඨස්සා'ති දීපයෙ."**

මෙහි දක්වනලද්දට සාධක මෙසේයි. " ◡ — ◡ — " මෙසේ මාත්‍රා ඇති වෘත්තය ප්‍රස්තාරයාගේ කතමස්ථානයෙහි ලැබේ ද? යන ප්‍රශ්නයෙහි-

1. 3. 5. 13.
◡ — ◡ —
2. 8.

මෙහි මුලින් සිටි ගුරෙහි පළමුවන - දෙවන මාත්‍රා දෙකම විය, එහෙයින් පළමු වන මාත්‍රාවෙහි ලියයුතු එක උඩින් ද, දෙවන මාත්‍රාවෙහි ලියයුතු දෙක යටින් ද ලියනලදී, තුන්වන මාත්‍රාව ලඝුවකි. සතරවන - පස්වන මාත්‍රා ද ගුරකි, එහි ද පළමු සෙයින් හීනසඞ්ඛ්‍යාව උඩින් ද, අධික සඞ්ඛ්‍යාව යටින් ද ලියනලදී.

ගුරු මතුයෙහි එක - පහ යන අඞ්ක තිබේ. ඒ අඞ්ක එක් කළ විට ( 1 + 5 = 6 ) සයකි.

මේ ෂණ්මාත්‍රිකා ඡන්දසෙහි සංඛ්‍යානය තෙළෙසකි. එය සවෙනි මාත්‍රාව මතුයෙහි පෙනේ. ගුරු මතුයෙහි සිටි අඞ්ක එක් කිරීමෙන් ලත් සය සංඛ්‍යානයෙන් අඩු කළ විට (13—6=7) සතක් වෙයි. එහෙයින් උදෙසු වෘත්තය ප්‍රස්තාරයාගේ සප්තමස්ථාන යෙහි ලැබේ යයි කියයුතුයි. ප්‍රස්තාරය ද බලනු.

“ගල්‍යා‘ඪහි වෙ සා වුපචිත්තා” මේ වෘත්තය ප්‍රස්තාරයාගේ කතමස්ථානයෙහි ද? යි විචාළ කල්හි-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 3. | 8. | 13. | 21. | 55. | 144. | 233. | 377. | 987. | විත්‍යාසය හා |
| ⌣ | ⌣ | — | — | ⌣ | ⌣ | — | — | ⌣ | ⌣ | |
| 2. | 5- | | | 34. | 89. | | | 610. | 1597 | අඞ්ක පිහිටුවීම. |

| | |
|---|---|
| 1 | ගුරුමතුයෙහි අඞ්ක |
| 3 | |
| 21 | |
| 55 | |
| 377 | |
| 987 | |
| 1444 | ඓක්‍යය. |

| | |
|---|---|
| සංඛ්‍යානය | 1597 |
| ඓක්‍යය | 1444 |
| වෘත්තාඞ්කය | 153 |

උදෙසු උපචිත්‍රාව ෂොඩශ මාත්‍රිකා ඡන්දසෙහි ප්‍රස්තාරයාගේ 153 වන ස්ථානයෙහි ලැබේ යයි කිය යුතුයි. සෙස්ස ද මෙසේයි.

**උද්දිෂ්ටප්‍රත්‍යය මෙතෙකින් සමාප්තයි.**

---

## 4. ඒකද්ව්‍යාදි ගුරුක්‍රියාව.

16. **සමවෘත්ත ගුරුක්‍රියාව.** යම් ඡන්දසක් ප්‍රස්තාර කළ කල්හි ඒ ප්‍රස්තාරය තුල එකක් ගුරු වෘත්ත කොතෙක් ද ? දෙකක් ගුරුවෘත්ත කොතෙක් ද? යනාදීන් ඒ ඒ ඡන්දසෙහි ඇති තාක් වෘත්ත පහසුවෙන් සොයා ගැනීම මේ ප්‍රත්‍යයෙහි ප්‍රයොජන යයි.

යම් ඡන්දසක ගුරුක්‍රියාව සොයා ගතයුතු වී නම්? ඒ ඡන්ද සෙහි අකුරු ගණනට එකක් වැඩි කොට ඒකසංඛ්‍යා සරසට හා යටට ලියා ගතයුතුයි. එවිට ඒකසංඛ්‍යා ත්‍රිකොණයක් මෙන් සිටී

චතුරක්ෂරච්ඡන්දසෙහි ගුරුක්‍රියාව සිඬකරන විට ඒකසංඛ්‍යා මෙසේ ලියාගත යුතුයි.

| | | | | |
|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1 | 1 |
| 1 | | | | |
| 1 | | | | |
| 1 | | | | |
| 1 | | | | |

දැන් මෙහි සරසට අඞ්ක පේළි පසක් තිබෙන බව පෙනේ, එයින් පළමුවන පෙළ එකාඞ්කයන්ගෙන් සම්පූර්ණ විය. දෙවන පෙළේ මුල තිබෙන එක පළමුවන පෙළේ දෙවන අඞ්කය සමග එක් කොට ඊට යටින් ලියනු. නැවත එහි ලියූ අඞ්කය පළමුවනපෙළේ තුන්වන අඞ්කය සමග එක්කොට ඊට යටින් ද, එය සතර වන අඞ්කය සමග එක් කොට ඊට යටින් ද ලියනු. අවසානයෙහි සිටි අඞ්කය ඉතිරි කල යුතුයි. දෙවන පෙළ සම්පූර්ණවූ විට මෙසේ සිටී.

| | | | | |
|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1 | 1 |
| 1 | 2 | 3 | 4 | |
| 1 | | | | |
| 1 | | | | |
| 1 | | | | |

දැන් දෙවන පෙළ සම්පූර්ණවූ හෙයින් නැවත තුන්වන පෙළේ මුල සිටි එක දෙවන පෙළේ දෙවැන්න හා එක් කොට ඊට යටින් ද, එය තුන්වැන්න හා එක් කොට ඊට යටින් ද ලියනු. සතර වැන්න අන්තය හෙයින් ඉතිරි කරනු. සතරවන පෙළේ මුල සිටි එක තුන්වන පෙළේ දෙවැන්න හා එක් කොට යටින් ලියා ගත යුතුයි. දැන් චතුරක්ෂරච්ඡන්දසෙහි ගුරු ක්‍රියාව සම්පූර්ණ විය. ඒ මෙසේයි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1 | 1 | සර්වගුරු වෘත්ත | 1. |
| 1 | 2 | 3 | 4 | | එකක් ලඝු ,, | 4. තුනක් ගුරුවෘත්ත |
| 1 | 3 | 6 | | | දෙකක් ලඝු ,, | 6. දෙකක් ගුරු ,, |
| 1 | 4 | | | | තුනක් ලඝු ,, | 4. එකක් ගුරු ,, |
| 1 | | | | | | 1. සර්වලඝු වෘත්ත |
| | | | | | සඞ්ඛ්‍යානය | 16 |

මේ පඞ්ක්ති පසෙහි ම අන්තයෙහි සිටි අඞ්ක ගෙන ප්‍රතිෂ්ඨාච්ඡන්දසෙහි සර්වගුරු වෘත්ත 1. එකලඝු වෘත්ත 4. ද්විලඝු වෘත්ත 6. ත්‍රිලඝු වෘත්ත 4. සර්වලඝු වෘත්ත 1. යයි කිය යුතුයි. නැවත අන්තයෙහි සර්වලඝු වෘත්තය පටන් එකගුරු - ද්විගුරු - ත්‍රිගුරු වෘත්ත ද දැක්විය යුතුයි.

අනුෂ්ටුප් ඡන්දසෙහි ගුරුක්‍රියාව කෙසේ ද? යන ප්‍රශ්නයෙහි—

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | සර්වගුරු වෘත්ත — | 1 |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | | එකලඝු ,, — | 8 |
| 1 | 3 | 6 | 10 | 15 | 21 | 28 | | | ද්විලඝු ,, — | 28 |
| 1 | 4 | 10 | 20 | 35 | 56 | | | | ත්‍රිලඝු ,, — | 56 |
| 1 | 5 | 15 | 35 | 70 | | | | | චතුර්ලඝු ,, — | 70 |
| 1 | 6 | 21 | 56 | | | | | | පඤ්චලඝු ,, — | 56 |
| 1 | 7 | 28 | | | | | | | ෂඩ්ලඝු ,, — | 28 |
| 1 | 8 | | | | | | | | සප්තලඝු ,, — | 8 |
| 1 | | | | | | | | | සර්වලඝු ,, — | 1 |
| | | | | | | | | | සඞ්ඛ්‍යානය | 256 |

අන්තයෙහි සිට එක්ගුරු - ද්විගුරු වෘත්තාදිය දක්වනු.

**ගුරු ක්‍රියාව අන්‍ය ක්‍රමයකින්.** ගුරු ක්‍රියාව සෙවීමෙහි පහසු වූ අන්‍ය ක්‍රම යකුදු මෙහි දක්වනු ලැබේ. පළමු කොට ගුරු ක්‍රියාව විචාළ ඡන්දසෙහි අකුරු ගණනින් එක - දෙක යනාදි අනුලෝම ක්‍රමයෙන් අඞ්ක ලියා ගත යුතුයි. පඤ්චාක්ෂරච්ඡන්දස නම්? 1. 2. 3. 4. 5. මෙසේ ලියනු. නැවත ඒ අඞ්ක මතුයෙහි විලෝම ක්‍රමයෙන් අඞ්ක ලියා ගත යුතුයි. එවිට–

5. 4. 3. 2. 1.
1. 2. 3. 4. 5.

මෙසේ සිටී. අඞ්ක පිහිටුවා යට පඞ්ක්තියෙහි මුල සිටි එකෙන් ඒ මතුයෙහි සිටි පහ ගුණ කොට එකට යටින් ලියනු. නැවත තුන්වන පෙලේ ප්‍රථම අඞ්කය වශයෙන් ලියා ගත් පහ උඩ පෙලේ දෙවෙනි අඞ්කය වූ සතරෙන් ගුණ කොට ඊට යටින් සිටි දෙකින් බෙදූ ලැබුනු දසය දෙකට යටින් ලියනු. එය උඩ පෙලේ තුන්වන අඞ්කයෙන් ගුණ කොට දෙවන පෙලේ තුන්වන අඞ්කයෙන් බෙදූ ඊට යටින් ද, එය උඩ පෙලේ සතරවැන්නෙන් ගුණ කොට දෙවන පෙලේ සතරවැන්නෙන් බෙදූ ඊට යටින් ද, නැවත එය උඩ පෙලේ පස්වැන්නෙන් ගුණ කොට දෙවන පෙලේ පස්වැන්නෙන් බෙදූ ඊට යටින් ද ලියනු. එවිට–

5. 4. 3. 2. 1.
1. 2. 3. 4. 5.
5. 10. 10. 5. 1.

අඞ්ක පඞ්ක්තිය මෙසේ සිටී. මෙහි තුන්වන පෙලේ ආදියෙහි සර්වගුරු වෘත්තය පිණිස එකක් ලියා "1. 5. 10. 10. 5. 1." මෙසේ සකස් කොට සර්වගුරු වෘත්ත එකෙක, එක ලඝු වෘත්ත පසෙක, විලඝු වෘත්ත දසයෙක යනාදීන් ගුරුක්‍රියාව දක්විය යුතුයි.

මීට අධික අක්ෂර ඇති ඡන්දසක් වුවත් මේ අනුසාරයෙන් ම සිද්ධකරනු. "පඞ්ක්ති" ඡන්දසෙහි ගුරු ක්‍රියාව කෙසේ ද? යන ප්‍රශ්නයෙහි– (පඞ්ක්ති ඡන්දසට අකුරු දසයකි )

10. 9. 8. 7. 6. 5. 4. 3. 2. 1.
1. 2. 3. 4. 5. 6. 7. 8. 9. 10.
1. 10. 45. 120. 210. 252. 210. 120. 45. 10. 1.

**මේරුප්‍රස්තාරයෙහි වර්ණමේරුව.**

ගුරු ක්‍රියාව සිද්ධකරනු පිණිස ම ඡන්දස් වෛදිකයෝ මේරු ප්‍රස්තාරය ද දක්වූහ. හෙද ආධුනිකයන්ගේ ඡන්දොඥතාව විපුල කරනු පිණිස මෙහි දක්වනු ලැබේ.

මේරුප්‍රස්තාරය කරන කල්හි පළමු කොට සිවුරැස් කොටුවක් ඇඳ මේරුමස්තකය සාදා ගතයුතුයි. එතැන් සිට ප්‍රස්තාරය සඳහා එය මැදි කොට කොෂ්ඨපංක්ති සාදා ගතයුතුයි.



මෙසේ පළමුවන පෙළ අඳිනු. එය ඒකාක්ෂර ඡන්දසෙහි ගුරු ක්‍රියාව පිණිසයි. ඊට පසු දෙවන පෙළෙහි කොටු තුනක් ද, තුන්වන පෙළෙහි සතරක් ද, සතරවන පෙළෙහි පහක් ද, යනාදි වශයෙන් ගුරු ක්‍රියාව සෙවිය යුතු ඡන්දස හෙවත් පංක්ති ඇඳ මුදුනෙහි සිටි කොටුව හා දෙපස හෙවත් සියලු පංක්තිවල ම අග - මුල සිටි කොටුවල ඒකාංකය ලියනු.




මෙසේ දෙපස කොටුවල ඒකාංකය තැබූවිට මැදකොටු හිස්වේ. මැද කොටු අතුරෙන් යම් යම් කොටුවක් හිස් වේ නම්? එය ඊට උඩින් පෙළෙහි කොටු දෙකක් හා බඩවම සිටී. (නිදසුන බලනු) හිස් වූ දෙවන පෙළේ මැද කොටුව ඊට උඩ පෙළේ බැඳිසිටි කොටු දෙකේ අංක එක් කොට පුරවනු. තුන්වන පෙළේ හිස් වූ කොටු දෙක ද දෙවන පෙළේ බැඳිසිටි කොටුවල අංක එක්කොට පුරවනු එවිට–




මෙසේ සිටී. මෙහි ප්‍රථම - ද්විතීය - තෘතීය ඡන්දස්වල ගුරු ක්‍රියාව පෙනේ. පළමුවන පෙළේ උක්තාඡන්දසෙහි ඒකගුරු - ඒකලඝු වෘත්ත දෙකද, දෙවන පෙළේ අත්‍යුක්තා ඡන්දසෙහි (පිළිවෙළින්) සර්වගුරු වෘත්තය ඒකලඝු වෘත්ත දෙක හා සර්වලඝු වෘත්තය ද, තුන්වන පෙළේ මධ්‍යා ඡන්දසෙහි සර්වගුරු වෘත්තය ඒකලඝු වෘත්ත තුන ද්විලඝු වෘත්ත තුන හා සර්වලඝු වෘත්තය ද පෙනේ. මස්තකයෙහි සිටි ඒකාංකය නො සැලකිය යුතුයි.

මෙසේ පංක්ති සවිස්ස තෙක් ප්‍රස්තාර කළ කල්හි සවිසි ඡන්දසුන්ගේ ම ගුරුක්‍රියාව ලැබේ.

අනුෂ්ටුප් ඡන්දසෙහි ගුරු ක්‍රියාව මේරුප්‍රස්තාරයෙන් මෙසේ දතයුතු.

1
1. 1 | 1
2. 1 | 2 | 1
3. 1 | 3 | 3 | 1
4. 1 | 4 | 6 | 4 | 1
5. 1 | 5 | 10 | 10 | 5 | 1
6. 1 | 6 | 15 | 20 | 15 | 6 | 1
7. 1 | 7 | 21 | 35 | 35 | 21 | 7 | 1
8. 1 | 8 | 28 | 56 | 70 | 56 | 28 | 8 | 1

මෙහි ඒකාක්ෂර ඡන්දස පටන් අෂ්ටාක්ෂර ඡන්දස තෙක් ගුරු ක්‍රියාව පෙනේ. අභිමතවූ ඡන්දසෙහි සර්වගුරු වෘත්තය ඒකලඝු වෘත්ත ද්විලඝුවෘත්ත ආදියපළමු සෙයින් දක්විය යුතුයි.

---

**17. අර්ධසමවෘත්ත ගුරු ක්‍රියාව.** අර්ධ සමවෘත්තයන්ගේ ප්‍රස්තාරාදියෙහි අර්ධයක් ම පාදයක් වශයෙන් සලකන ලදී. එසේ ම අර්ධසමගුරු ක්‍රියාව සිද්ධකරන කල්හි ද අර්ධයක අක්ෂරයන්ට සමාන අකුරු ඇති ඡන්දසෙහි ගුරුක්‍රියාව සිද්ධ කළ යුතුයි. තැවත අර්ධසම ප්‍රස්තාරය තුල සමවෘත්තයන්ගේ විද්‍යමානත්වය කිහෙයින් සමවෘත්ත අස් කොට ගුරු ක්‍රියාව ශුද්ධ කර ගත යුතුයි.

ද්‍ව්‍යක්ෂර ඡන්දසෙහි අර්ධසම ගුරුක්‍රියාව සමවෘත්තයන්ගේ චතුරක්ෂර ඡන්දසට සමානව "1. 4. 6. 4. 1" මෙසේ සිටී. මෙහි සර්ව ගුරු – සර්වලඝු වෘත්ත දෙක හා සවෙනි එකොළොස්වෙනි විගුරු වෘත්ත දෙක ද සමවෘත්ත හෙයින් හළ යුතුයි. එවිට ශුද්ධ අර්ධසම ගුරුක්‍රියාව මෙසේ සිටී. "4. 4. 4" ද්‍ව්‍යක්ෂර ඡන්දස්හුගේ අර්ධසම ප්‍රස්තාරයෙහි එකක් ලඝුවෘත්ත 4 ක් ද, දෙකක් ලඝුවෘත්ත 4 ක් ද, තුනක් ලඝුවෘත්ත 4 ක් ද වේ.

1
1. 1 | 1
2. 1 | 2 | 1
3 1 | | | 1
4. 1 | 4 | 6 | 4 | 1

අර්ධසම ගුරුක්‍රියාව සමවෘත්ත අස් කොට ශුද්ධ කර ගතයුතු යයි කියනලදී. එය ශුද්ධ කිරීමෙහි දී මෙරු ප්‍රස්තාරය ඇසුරු කිරීම ප්‍රයොජනවත් වේ. සියලු අර්ධසම – විෂමගුරු ක්‍රියාවල සර්වගුරු – සර්වලඝු වෘත්ත තෝරා ගැනීම දුෂ්කර නොවේ. සෙසු වෘත්තයන් අතුරෙන් සමවෘත්ත ගුරුක්‍රියාවෙහි "ඒකලඝුවෘත්ත,' අර්ධසමගුරු ක්‍රියාවෙහි "ද්විලඝුවෘත්ත" සංඛ්‍යාව තුල පවතී. එහෙයින් සම වෘත්තයන්ගේ ඒකලඝුවෘත්ත සංඛ්‍යාව අර්ධසම වෘත්තයන්ගේ ද්විලඝු

වෘත්ත සඞ්ඛ්‍යාවෙන් අස් කළයුතුබව සලකනු. දක්වූ නිදසුනෙහි ද ව්‍යක්ෂරච්ඡන්දසෙහි සමවෘත්තයන්ගේ එකාලඝු වෘත්තදෙක අර්ධසමයන්ගේ ද්විලඝුවෘත්ත සයෙන් අඩු කළයුතුයි.

මේ නයින් සමවෘත්ත ගුරුක්‍රියාවෙහි ද්විලඝු - ත්‍රිලඝු - චතුර්ලඝු ආදි වෘත්ත අර්ධසම ගුරු ක්‍රියාවෙහි චතුර්ලඝු - ෂඩ්ලඝු - අෂ්ටලඝු ආදි වෘත්තයන්ගෙන් අඩු කළ විට අර්ධසම ගුරුක්‍රියාව ශුද්ධවන බව සැලකිය යුතුයි. සෙසු ඡන්දස් ද විමසා බැලිය යුතුයි.

---

**18. විෂමවෘත්ත ගුරුක්‍රියාව.** යම් ඡන්දසක විෂමවෘත්ත ගුරුක්‍රියාව කළ යුතු වී නම්? ඒ ඡන්දසෙහි පාදසතරට සමාන අකුරු ඇති ඡන්දසෙහි ගුරුක්‍රියාව සිද්ධ කොට වෘත්ත සඞ්ඛ්‍යා දක්විය යුතුයි.

ව්‍යක්ෂර ඡන්දසෙහි විෂමවෘත්ත ගුරුක්‍රියාව දක්වියයුතු කල්හි එහි පාදසතරෙහි අකුරු අටක් හෙයින් සමවෘත්ත අෂ්ටාක්ෂරච්ඡන්දසෙහි ගුරුක්‍රියාව සොයා සමාර්ධසමවෘත්තයන් අස් කොට වෘත්ත සඞ්ඛ්‍යා දක්විය යුතුයි.




මෙසේ උවමනා ඡන්දස හෙයක් මෙරුප්‍රස්තාරය කළ කල්හි ඒ ඒ ඡන්දස්වල සමාර්ධසම විෂම ගුරුක්‍රියාවන් එකවිට පෙනේ. පළමු අර්ධසම ගුරුක්‍රියාවෙන් සමවෘත්තයන් අස්කළාක් මෙන් සමවෘත්තයන් හා මිශ්‍රව සිටි අර්ධසම ගුරු ක්‍රියාවෙහි එකාලඝු - ද්විලඝු - ත්‍රිලඝු වෘත්තයන් පිළිවෙළින් විෂම ගුරුක්‍රියාවෙහි ද්විලඝු - චතුර්ලඝු - ෂඩ්ලඝු වෘත්ත සඞ්ඛ්‍යාවන්ගෙන් අස්කරනු. එවිට-

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 8. | 28. | 56. | 70. | 56. | 23. | 8 |
| | 4. | | 6. | | 4. | |
| 8. | 24. | 56. | 64. | 56. | 24. | 8 |

මෙසේ ව්‍යක්ෂරච්ඡන්දසෙහි ශුද්ධවූ විෂම වෘත්ත ගුරු ක්‍රියාවෙහි එකාලඝු වෘත්ත 8 ක් ද, ද්විලඝු- 24, ත්‍රිලඝු- 56, චතුර්ලඝු-54, පඤ්චලඝු 56, ෂඩ්ලඝු 24, සප්තලඝු වෘත්ත 8 ක් ද ලැබේ.

සෙසු ඡන්දස්වල ද මේ අනුසාරයෙන් විෂමවෘත්ත ගුරුක්‍රියාව ශුද්ධ කොට වෘත්තසඞ්ඛ්‍යා දැක්විය යුතුයි.

19. **ආර්‍යා ගුරුක්‍රියාව.** ආර්‍යා වෘත්තයන්ගේ ගුරුක්‍රියාව දැක්වීම දුෂ්කර හෙයින් ඡෙ හෝ ඡාන්දසිකයෝ උපෙක්ෂා වූහ. ආර්‍යාවන්ගේ මාත්‍රාසඞ්ඛ්‍යාව හා සැසඳෙන මාත්‍රාච්ඡන්දසෙහි ගුරුක්‍රියාව ම ආර්‍යා ගුරුක්‍රියාව වේ යයි කිසිවෙක් සැලකූ නමුත් හෙ ද මෙහි ලා නො යෙදේ. ආර්‍යාවන් හා මාත්‍රාවෘත්තයන්ගේ ප්‍රස්තාරක්‍රමය එකිනෙකට විසදෘශ හෙයිනි. මාත්‍රා සත්පනසක් ඇති ආර්‍යාව පිණිස සප්තපඤ්චාශන්මාත්‍රිකාච්ඡන්දසෙහි ගුරුක්‍රියාව දැක්වුව හොත් හාස්‍යජනක වෘත්තසඞ්ඛ්‍යාවකුදු ලැබේ.

---

20. **මාත්‍රාවෘත්ත ගුරුක්‍රියාව හා මාත්‍රාමේරුව.** මාත්‍රාඡන්දස් පිළිබඳ ගුරුක්‍රියාව මේරුප්‍රස්තාරයෙන් කට යුතුයි. මෙහිදී කොෂ්ඨපඞ්ක්ති සැදිය යුත්තේ වර්ණමේරුවෙහි සාදා ගත් කොටු විභක්කිරීමෙනි.



පළමු කොට සතරැස් කොටුවක් ඇඳ ඊට යටින් කොටු දෙකක් ඇති පඞ්ක්ති දෙකක් අඳිනු. ඊට යටින් කොටු තුනක් ඇති පඞ්ක්ති දෙකක් අඳිනු. මෙසේ අභිමත ඡන්දස තෙක් විස්තාරතලද කොෂ්ඨපඞ්ක්ති තබාගත යුතුයි.




ඉන් පසු මුදුනෙහි වූ කොටුව හා සියලු පෙළවල ම අවසාන කොටු එකාඞ්කවලින් පුරවනු. මූල සිටි කොටු අතුරෙන් විෂම පඞ්ක්තිවල ප්‍රථම ප්‍රථම කොටු එකාඞ්කවලින් ද, ද්විතීය ද්විතීය කොටු පිළිවෙළින් දෙක - තුන - සතර - පහ යනාදි අඞ්කවලින් ද මේ නිදසුනට අනුව පුරවනු.

මෙහි මැද හිස් ව තිබෙන කොටු පිරවීම ඉතා ප්‍රවේශමින් කළ යුතුයි. මේ නිදසුන පරිදි ප්‍රථම පඞ්ක්ති යුගමයෙහි "අ, ආ" දරන




කොටුවල අඞ්ක එක්කොට ද්විතීය යුගමයෙහි "ඊ" දරන හිස්කොටුව පුරවනු. "ඉ, ඊ" කොටු දෙකේ අඞ්ක එක්කොට "උ" දරන කොටුව පුරවනු. මේ අනුසාරයෙන් සෙස්ස ද විමසනු. ද්විතීය නිදර්ශනයෙහි හිස් කොටු සම්පූර්ණකළ කල්හි මෙසේ සිටී.

| | | | | |
|---|---|---|---|---|
| 1. | 1 | | | |
| 2. | 1 | 1 | | |
| 3. | 2 | 1 | | |
| 4. | 1 | 3 | 1 | |
| 5. | 3 | 4 | 1 | |
| 6. | 1 | 6 | 5 | 1 |
| 7. | 4 | 10 | 6 | 1 |

මෙහි මුදුනෙහි සිටි ප්‍රථම කොටුවෙහි එකමාත්‍රික ඡන්දසෙහි එකලඝු වෘත්තය ද, ද්විතීය පඞ්ක්තියෙහි ද්විමාත්‍රිකච්ඡන්දසෙහි එකගුරු වෘත්තය හා සර්වලඝු වෘත්තය ද, තෘතීය පඞ්ක්තියෙහි ත්‍රිමාත්‍රික ඡන්දසෙහි එකගුරු වෘත්ත දෙක හා සර්වලඝු වෘත්තය ද පෙනේ. සෙසු පඞ්ක්තිවල ද පිළිවෙළින් චතුර්මාත්‍රික - පඤ්චමාත්‍රික - ෂණ්මාත්‍රික - සප්තමාත්‍රික ඡන්දස්වල ගුරුක්‍රියාව පෙනේ.

තවද මෙහි වෘත්ත සඞ්ඛ්‍යා දක්වීමේදී පඞ්ක්තීන්ගේ ආදියෙහි පටන් සර්වගුරු - එකගුරු - ද්විගුරු යනාදීන් දක්විය යුතුයි. ත්‍රිමාත්‍රික - පඤ්චමාත්‍රික - සප්තමාත්‍රිකාදි විෂම මාත්‍රා සඞ්ඛ්‍යා ඇති ඡන්දස්වල සර්වගුරු වෘත්තයක් නැති හෙයින් එකගුරු ආදි වෘත්ත සඞ්ඛ්‍යා දක්විය යුතුයි. සර්වලඝු - එකලඝු - ද්විලඝු ආදි වශයෙන් අන්තයෙහි පටන් හෝ වෘත්තසඞ්ඛ්‍යා දක්වනු.

**එකාදව්‍යාදි ගුරුක්‍රියාව මෙතෙකින්**
**ස මා ප්ත යි.**

---

### 5. සඞ්ඛ්‍යාන ප්‍රත්‍යය.

**21. සමවෘත්ත සඞ්ඛ්‍යානය.** ඡන්දසක් ප්‍රස්තාර නො කොට ඒ ඡන්දසෙහි ලැබෙන වෘත්තසඞ්ඛ්‍යාව සොයා ගැනීම සඞ්ඛ්‍යාන ප්‍රත්‍යයෙහි ප්‍රයොජනයයි.

වර්ණච්ඡන්දසුන්ගේ සඞ්ඛ්‍යානය සොයා ගැනීමට පහසු ක්‍රම තිපයක් වෙති 1. පළමු දක්වූ ගුරුක්‍රියාවගේ අඞ්ක සමූහය එක් කිරීමෙන් සඞ්ඛ්‍යානය ලැබේ. චතුරක්ෂර ඡන්දසෙහි සමවෘත්ත ගුරුක්‍රියාව “1. 4. 6. 4. 1” මෙසේයි. මේ අඞ්කයන්ගේ ඓක්‍යය 16 කි. එය එම ඡන්දසෙහි වෘත්තසඞ්ඛ්‍යාවයි හෙවත් සඞ්ඛ්‍යානයයි.

2. උද්දිෂ්ටය සෙවීමේදී වර්ණයන්ගේ යට ලියාගත් අඞ්ක සමූහය එකක් සමග එක් කිරීමෙන් ද සඞ්ඛ්‍යානය ලැබේ. “— ◡ — ◡” මෙසේ උදෙසූ වෘත්තය කනමස්ථානයෙන් ලැබේ ද? යි සෙවීම පිණිස අකුරු යට ලියා ගත් අඞ්ක “1. 2. 4. 8.” යන මොහුයි, මොවුන්ගේ ඓක්‍යය “15” කි, ඊට එකක් එක් කළ විට සඞ්ඛ්‍යානය ලැබේ.

3. උද්දිෂ්ටාඞ්කයන් අතුරෙන් අවසානයෙහි සිටි අඞ්කය ද්විගුණ කිරීමෙන් ද සඞ්ඛ්‍යානය ලැබේ. මූලින් උදෙසූ වෘත්තයාගේ අන්ත්‍යවර්ණය යට සිටි සඞ්ඛ්‍යාව වූ අට ද්විගුණ කල විට (8 × 2 = 16) සඞ්ඛ්‍යානය ලැබෙනබව සලකනු. එසේම-

වංශස්ථ වෘත්තයාගේ අන්තයෙහි අඞ්කය "2048" කි. එය ද්විගුණ කළ කල්හි (2048 × 2 = 4096) "ජගතී" ඡන්දසෙහි සඞ්ඛ්‍යානය ලැබේ.

1. 2 × 2<br>
2<br>
2. 4 × 2<br>
2<br>
3. 8 × 2<br>
2<br>
4. 16<br>
2 × 2<br>
5. 32

වර්ණච්ඡන්දසුන්ගේ එක් වර්ණයක ගුරු - ලඝු වශයෙන් භෙද දෙකකි. පඤ්චාක්ෂර ච්ඡන්දසෙහි සඞ්ඛ්‍යානය කොතෙක් දැ?යි මේ ක්‍රමයෙන් සොයන විට ප්‍රථමාක්ෂරයෙහි භෙද දෙක දෙවන අකුරෙහි භෙද දෙකින් ගුණ කරනු. එහි ඵලය තෙවන අකුරෙහි භෙදවලින් දැ'යි මෙසේ පස්වන අකුර තෙක් ගුණ කිරීමෙන් පඤ්චාක්ෂර ච්ඡන්දසෙහි භෙද හෙවත් සඞ්ඛ්‍යානය ලැබේ. මෙසේ සවිසි වන අකුර තෙක් ගුණ කළ හොත් පිළිවෙළින් 2 - 4 - 8 - 16 යනාදීන් ඡන්දස් සවිස්සෙහි ම සඞ්ඛ්‍යානය ලැබේ.

---

**22 - 23. අර්ධසම - විෂම වෘත්ත සඞ්ඛ්‍යානය.**

ඒ ඒ ඡන්දසෙහි සමවෘත්ත සඞ්ඛ්‍යාව එම සඞ්ඛ්‍යාවෙන් ම ගුණ කළ කල්හි අර්ධසම වෘත්තයන්ගේ සඞ්ඛ්‍යානය ලැබෙන බැව් ප්‍රස්තාරයෙහි කියනලද්දේය. ගුරුක්‍රියාදීන්ගේ අඞ්ක එක් කිරීමාදියෙන් ද සඞ්ඛ්‍යානය සොයා ගතහැකි වුවත් සමවෘත්ත ගුණ කිරීමෙන් සඞ්ඛ්‍යානය සෙවීම සුකරබැව් සැලකිය යුතුයි.

චතුරක්ෂර ච්ඡන්දසෙහි සමවෘත්ත 16 කි. එය එකිනෙක ගුණ කළ විට (16 × 16 = 256) දෙසිය සපනසකි. මෙහි සමවෘත්ත ද ඇතුලත් වන හෙයින් අඩු කළ විට (256—16 = 240) ශුද්ධ අර්ධසම සඞ්ඛ්‍යානය දෙසිය සාලිසකි.

එම ඡන්දසෙහි ම විසමවෘත්ත සඞ්ඛ්‍යානය සෙවීමට අර්ධසමයන්ගේ මිශ්‍ර සඞ්ඛ්‍යානය වූ 256, එයින් ම ගුණ කරනු. එවිට මෙසේ සිටී. "256 × 256 = 65,536" මෙහි පෙනෙන විෂම වෘත්තයන්ගේ සඞ්ඛ්‍යානය සමාර්ධසමයන් හා මිශ්‍ර හෙයින් ඔවුන් අඩු කළ කල්හි (65536—256 = 65,280) ශුද්ධ විෂමවෘත්ත සඞ්ඛ්‍යානය හැටපන්දහස් දෙසිය අසූවකි. සෙස්ස ද මෙසේ මැයි.

---

24 – 25. **ආයාසී මාත්‍රා වෘත්ත සඞ්ඛ්‍යානය.** ආයසීංවන්ගේ සඞ්ඛ්‍යානය යට ආයසීංවෘත්ත අවස්ථාවෙහි ම දක්වන ලදී. ඒ ඒ ආයසීංවෙහි අඩියක් පාසා ලැබෙන සතර – පහ ආදි ගණස්ථාන විකල්ප එකිනෙක ගුණ කොට තැවත අඩි දෙක්හි ම විකල්ප ගුණකිරීමෙන් ලැබෙන ඒ ඒ ආයසීංවන්ගේ විකල්ප සඞ්ඛ්‍යාව ඔවුන්ගේ සඞ්ඛ්‍යානය ද වේ. එය ඒ ඒ ආයසීං විවෘතියෙහි දක්වූ පරිදි මැයි.

මාත්‍රාච්ඡන්දසුන්ගේ සඞ්ඛ්‍යානය ද මාත්‍රානෂ්ටෝද්දිෂ්ට දෙක්හි දක්වන ලද්දේය, නෂ්ටෝද්දිෂ්ටයන් සෙවීමෙහි දී මාත්‍රාමතුයෙහි ලියූ අඞ්ක අතුරෙන් අන්තයෙහි සිටි අඞ්කය තනමාත්‍රාසඞ්ඛ්‍යාව දරන ඡන්දසෙහි සඞ්ඛ්‍යානය ද වේ. හෙද නෂ්ටෝද්දිෂ්ටයන් බලා තේරුම් ගැනීම සුකර වේ.

**සඞ්ඛ්‍යාන ප්‍රත්‍යය මෙතෙකින්**
**සමාප්ත සි.**

---

### 6. අධ්වයොග ප්‍රත්‍යය.

26 – 30. **සමවෘත්තාදින්ගේ අධ්වයොගය.** ශාස්ත්‍රොක්ත පරිදි ඡන්දස්ක වෘත්ත පැතිරවීමට වුවමනා භූමි ප්‍රදෙශය සොයා ගැනීම අධ්වයොගයාගේ ප්‍රයොජන යයි. මෙහි ශාස්ත්‍රොක්තිය නම්? ගුරු – ලඝු රේඛා පිණිස අඟලක් ද, ඔවුන්ගේ අතර අඟලක් ද ගැනීමයි.

උක්තාදි සවිසි ඡන්දසුන්ගේ අක්ෂර සඞ්ඛ්‍යාව විගුණ කොට එකක් අඩුකල කල්හි ඒ ඒ ඡන්දස ප්‍රස්තාර කිරීමට වුවමනා භූමියෙහි පුළුල ද, වෘත්ත සඞ්ඛ්‍යාව විගුණ කොට එකක් අඩු කළ කල්හි දිග ද ලැබේ. ප්‍රතිෂ්ඨා ච්ඡන්දසෙහි අකුරු සතරක. එය විගුණ කොට එකක් අඩු කළ විට සතකි. එහි වෘත්ත සොළොස විගුණ කොට එකක් අඩු කළ විට එක්තිසකි. මෙසේ ප්‍රතිෂ්ඨාව ප්‍රස්තාර කිරීමට දිගින් අඟල් 31 ක් හා පුළුලින් අඟල් 7 ක් ඇති බිම්පෙදෙසක් වුවමනා කෙරෙයි.

අර්ධසම – විෂම ප්‍රස්තාරයන්හි අක්ෂර සඞ්ඛ්‍යාව හා වෘත්ත සඞ්ඛ්‍යාව අධික වන අයුරු යට ( ප්‍රස්තාරයෙහි ) දක්වන ලදී. සඳුහු සේ ඒ ඒ ඡන්දසට අයිති අක්ෂර – වෘත්තසඞ්ඛ්‍යා විගුණ කොට එකක් අඩු කිරීමෙන් අධ්වයොගය දැක්විය යුතුයි. මෙහි දී ද සමාර්ධසමයන් හා මිශ්‍රව සිටි වෘත්තසඞ්ඛ්‍යාව ම ගතයුතුයි. නිදසුන් සුකර හෙයින් නො දක්වමු.

ආර්‍යාවන්ගේ අධවයොගයෙහි වෘත්තසඞ්ඛ්‍යා වශයෙන් ආර්‍යාමය දක්විය හැකි වුවත් වෘත්තයන්ගේ අක්ෂර සඞ්ඛ්‍යා භින්නව සිටින හෙයින් එක ම සඞ්ඛ්‍යාවකින් පුලුල දක්විය නො හේ. එහෙයින් ඒ ඒ වෘත්තයෙහි අක්ෂර සඞ්ඛ්‍යාවට සුදුසු පරිදි පුලුල දක්වී ම යොග්‍ය වේ.

මාත්‍රාච්ඡන්දසුන්ගේ මාත්‍රා හා වෘත්තසඞ්ඛ්‍යාවන්ට යොග්‍ය සේ අධවයොගය දක්විය යුතුයි.

ඡන්දශ්ශාස්ත්‍රය නිපදවන ලද්දේ මෙකල මෙන් කඩදසි පෑන් ආදි ලිපිද්‍රව්‍ය නැති කලක වුවත් එකල වැදගත් ලිපිද්‍රව්‍ය වශයෙන් භාවිත වූ පුස්කොලයත් පන්හිඳත් සලකන කල්හි ගුරු – ලඝු චිහ්න හා ඔවුන්ගේ අන්තරය සඳහා අඟුලක් ම ප්‍රමාණ කරන ලද්දේ ලිපිද්‍රව්‍යයන්ගේ දුර්ලභත්වය සලකා යයි නො සිතිය යුතුයි. අඟුලක් පමණ කඩදසි කැබැල්ලක පෑනකින් හෝ පැන්සලකින් අඳින ගුරු – ලඝු චිහ්නයන්ට වඩා එපමණ පුස්කොල කැබැල්ලක පන්හිඳකින් අධික චිහ්නසමූහයක් ඇඳගත හැකි හෙයිනි.

ඡන්දස් කර්තෘක ආචාර්‍යවරයෝ ශාස්ත්‍රයාගේ සාධුත්වය සලකා ව්‍යවහාරයෙහි ද සුකර වන පරිදි මේ අඞ්ගුලප්‍රමාණය ම ගත්හ මේ අධවයොගය ප්‍රගුණ කිරීම ද සෙසු ප්‍රත්‍යයන් මෙන් ම ශිෂ්‍යයන්ගේ බුද්ධිය පෘථුල වීමට හේතුවන්නේය.

**අධවයොග ප්‍රත්‍යය මෙතෙකින්**
**ස මා ප්ත යි.**

---

**ශ්‍රී සඞ්ඝරක්ෂිත මහාස්ථවිරපාදයන් විසින් රචනා කරනලද**

**"වුත්තෝදය" නම් වූ**

**මාගධ ඡන්දශ්ශාස්ත්‍රයෙහි ෂට්ප්‍රත්‍යයවිභාග නම් වූ**

**ෂෂ්ඨපරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.**

1. සෙලන්තර'යතනවාසිකසීලථෙර-
පාදෙ ගුරූ ගුණගුරූ ජයතං මමෙ'සො
යස්සප්පභාවමවලම්බ මයෙ'දිසො'පි
සම්පාදිතො'භිමතසිද්ධිකරො පරත්ථො.

2. පරත්ථසම්පාදනතො- පුඤ්ඤෙනා'ධිගතෙන'හං
පරත්ථසම්පාදනකො- භවෙය්‍යං ජාතිජාතියං

---

මෙසේ ග්‍රන්ථපරිසමාප්තිය කිරීමෙන් "තතො මාගධභාසාය" යනාදීන් කළ ප්‍රතිඥාවෙන් මිදුනාහු ශ්‍රී සඞ්ඝරක්ෂිත මහාස්ථවිරපාදයෝ ස්වා'චාර්‍ය්‍යසෙනාත්‍ර පූජක ප්‍රාර්ථනාව කරනුවෝ "සෙලන්තර" යනාදීන් නිගමනය කෙරෙත්.

1. **යස්ස**= යම් ආචාර්‍ය්‍ය ස්ථවිර කෙනෙකුන්ගේ' **පභාවං**= (ත්‍රිපිටකධරත්වාදි) මහිමය; **අවලම්බ**= ඇසුරු කොට; **අභිමතසිද්ධිකරො**= (ජිඥෙයජිඥසූන්ගේ ජිඥෙයඥන සඞ්ඛ්‍යාත) ඉෂ්ටාර්ථ පරිනිෂ්පත්තිය කරන්නාවූ; **ඊදිසො**= මෙබඳු වූ හෙවත් මාගධික ව්‍යඤ්ජනද ශාස්ත්‍රයාගේ නිෂ්පාදන ස්වරූප වූ; **පරත්ථො**= පරාර්ථයෙක්; **මයා අපි**= මා විසිනු දු; **සම්පාදිතො**= සම්පාදනය කරන ලද්දේ ද; **එසො**= මේ; **ගුණගුරූ**= (ශීලාදි) ලෞකික ගුණසම්පත්තියෙන් මහත් වූ; **මම**= මාගේ; **ගුරූ**= ආචාර්‍ය්‍ය වූ; **සෙලන්තරආයතනවාසික**= ශෛලාන්තරායතන (=ගලතුරුමූලවිහාර) වාසි වූ; **සීලථෙරපාදෙ**= "සීල" නම් ස්ථවිරපාද තෙමේ; **ජයතං**= (සර්වෝත්කර්ෂයෙන්) ජයග්‍රහණය කෙරේවා.

වි:- **සෙලන්තර'යතනවාසිකසීලථෙරපාදෙ**- යන තන්හි "සෙලන්තරායතන" යි ලෝකසම්මත වූ අෂ්ටායතනයන් අතුරෙහි එක් ආයතනයෙක් දක්වති. ස්වාචාර්‍ය්‍යයන්ගේ එහි වාසිත්වය දැක්වීමෙන් තුමූත් සෙලන්තරායතනමූල (=ගලතුරුමූල) නම් භික්ෂු ගණායතන වූහ'යි ස්වකීය ප්‍රව්‍රජ්‍යාත්වය දක්වති.

"සීලථෙරපාදෙ" යි ආචාර්‍ය්‍යයන්ගේ අභිධෙය දක්වති, මෙහි "පාද" ශබ්දය අත්‍යන්තාදරයෙහිය.

**ගුණගුරූ**- මෙයින් ශීලශ්‍රැත ප්‍රඥාදි ලෞකික ගුණසමූහයෙන් පාෂාණච්ඡත්‍රයක් මෙන් ගුරුත්වයට හෝ මහත්වයට පැමිණියෝ යයි ආචාර්‍ය්‍යයන් පසසති.

**පභාවං**- යන මෙයින් පිටකත්‍රය ධරත්වය විවිධ ශාස්ත්‍රයන් පූර්ණය ආදිමහිමය හෙවත් ආනුභාවය දක්වති.

3. අවලොකිතමත්තෙන- යථා ඡප්පච්චයා මයා
සාධිතා සාධයන්තෙ'ව- මිච්ඡිත'ත්ථම්පි පාණිනො.

**වුත්තොදයං නිට්ඨිතං.**

---

**ඊදිසො**- මෙයින් මෙම ඡන්දශ්ශාස්ත්‍රය නිදර්ශනය කෙරෙයි. "අපි" ශබ්දය ස්වකීය නිරහඞ්කාරත්වය දක්වනු පිණිසයි. මා විසි නුදු ඡන්දශ්ශාස්ත්‍ර නිෂ්පාදනයෙන් මහත් වූ පරාර්ථයෙක් සිද්ධකරන ලද්දේය. හේ මාගේ මහිමයෙක් නො ව ආචාර්‍ය්‍යයන්ගේ ශ්‍රැත ධරත්වාදි මහිමයෙන යනා එයි.

2. **පරත්ථසම්පාදනතො**= (මෙසේ) පරාර්ථ නිෂ්පාදනය හෙතු කොට ගෙන; **අධිගතෙන**= ලබනලද; **පුඤ්ඤෙන**= පින කරණ කොට ගෙන; **අහං**= මම; **ජාතිජාතියං**= භවයක් පාසා; **පරත්ථ සම්පාදනකො**= (ලෞකික ලොකොත්තර සඞ්ඛ්‍යාත) පරාර්ථ නිෂ්පාදනය කරන්නෙක්; **භවෙය්‍යං**= වෙම්වා.

**වි:-** මෙයින් තමන්ගේ අන්තර්ලීන වූ බුද්ධත්ව ප්‍රාර්ථනය පහළ කෙරෙත්.

3. **ඡප්පච්චයා**= (ප්‍රස්තාරාදි) ෂට්ප්‍රත්‍යයයෝ; **අවලොකිත මත්තෙන**= (නිබන්ධයන්) අවලොකනය කිරීම් මාත්‍රයකින්; **මයා**= මා විසින්; **යථා**= යම් සේ; **සාධිතා**= සිද්ධකරන ලද්දාහු ද; **එවං**= එපරිද්දෙන්; **පාණිනො අපි**= (ලොකවාසී) සත්වයෝ ද; **ඉච්ඡිතත්ථං**= (ලෞකික ලොකොත්තර සුඛසඞ්ඛ්‍යාත) ඊප්සිතාර්ථය; **සාධයන්තු**= සිද්ධ කෙරෙත්වා.

**වි:- අවලොකිතමත්තෙන**- යනාදීන් තමන්ගේ අලාමක වූ ප්‍රතිභාන සම්පත්තිය දක්වන ලද්දේය. ඒ එසේ මැයි- ෂට්ප්‍රත්‍යය සාධනය අන්‍යයන් විසින් ගුරූපදෙශ රහිතව දුෂ්කරය. එතකුදු වුවත් මා විසින් නිබන්ධදර්ශන මාත්‍රයෙන් සිද්ධකරන ලදැයි අචින්ත්‍ය වූ ප්‍රතිභාමහිමය සූචිතයි.

**සාධයන්තු**- යනාදීන් තමන්ගේ ප්‍රතිභා මහිමය හෙතු කොට ප්‍රත්‍යය සාධනය යම්සේ නිදුකින් කරන ලදද, එපරිද්දෙන් ලොකවාසීහු ද අභිමත වූ ලෞකික ලොකොත්තර අර්ථසාධනය නිදුකින් කෙරෙත්වා'යි මෛත්‍රීපූර්වක ආශංසනය කළහ.

**ලඞ්කානන්ද ව්‍යාඛ්‍යා නම් වූ වුත්තොදය අර්ථවර්ණනාව මෙතෙකින් සමාප්තයි.**

---

**සිද්ධිරස්තු.**

1. යෙ= යම් ආචාර්ය්‍ය කෙනෙත් තුමූ; අනන්තතන්ත= නො එක් ශාස්ත්‍ර වැනි වූ දේ හෝ නොහොත් ශාස්ත්‍ර නමැති; රතනාකර මත්ථෙනන= රත්නාකරයාගේ මථනය හෙතුකොටගෙන; මන්ථාචල= මන්දර පර්වතය මෙන්; උල්ලසිත= ප්‍රකට වූ; ඤාණවරෙන= උත්තම වූ ඥානයෙන්; ලද්ධා= ලබනලද; සාරමත්ථා– අර්ථසාරය වැනි වූ දේ හෝ නොහොත් අර්ථසාරය නමැති; අමතා= අමෘතය ඇත්තාහු; අති සුඛිතා= අතිශයින් සුඛිත වූවාහු ද; අඤ්ඤෙ ච= සෙසු අතවැසි ජනයන් ද; සුඛයන්ති= සුඛිත කෙරෙත් ද; ගුණෙහි= (ශීලශ්‍රැතාදි ලෞකික) ගුණයන්ගෙන්; ගුරවො= මහත් වූ; මෙ= මාගේ; තෙ ගුරවො= ඒ ගුරුවරයෝ; ජයන්ති= (සර්වෝත්කර්ෂයෙන්) ජයග්‍රහණය කෙරෙත්.

2. තෙන පුඤ්ඤෙන= ඒ (.......) පුණ්‍යය හෙතුකොටගෙන; යදා= යම් කලෙක්හි; ජිනපත්ති= සර්වඥපදප්‍රාප්තිය; භවෙය්‍ය= වින් නේ ද; තාව= ඒ තාක්; අහං= මම; සාරිතනුජෙ + ඉව= ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙන්; සතිමතිමා= සමෘතිප්‍රඥා ඇත්තෙක් ද; තෙජො= තෙජස් ඇත්තෙක් ද; තිහෙතුපටිසන්ධි= ත්‍රිහෙතුක ප්‍රති සන්ධියෙන්; අමොසරූපී= නොසිස්පියවි ඇත්තෙක් ද; ලක්ඛ්‍යා= ශ්‍රියෙන් හා; ධිතිබල= ධෛර්‍ය්‍යයෙන් හා බලයෙන් ද; පසත්ථගුණො= ප්‍රශස්ත වූ ගුණඇත්තෙක්; භවෙය්‍යං= වෙම්වා.



